# සිංහල

# භාෂාව හා සාහිත්‍යය

## 07 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

| | |
|---|---|
| පළමුවන මුද්‍රණය | 2015 |
| දෙවන මුද්‍රණය | 2016 |
| තෙවන මුද්‍රණය | 2017 |
| සිව්වන මුද්‍රණය | 2018 |
| පස්වන මුද්‍රණය | 2019 |

සියලු හිමිකම් ඇවිරිණි

ISBN 978-955-25-0270-5

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
අංක. 107ඩී, හැව්ලොක් පාර, කොළඹ 05 දරන ස්ථානයෙහි පිහිටි
සොෆ්ට්වේව් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් (පුද්) සමාගමෙහි මුද්‍රණාලයේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අතිසෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර දා නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

**ආනන්ද සමරකෝන්**



"අලුත් වෙමින්, වෙනස් වෙමින්, නිවැරැදි දැනුමෙන්
රටට වගෙ ම මුළු ලොවට ම වෙන්න නැණ පහන්"

## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

ගෙවී ගිය දශක දෙකකට ආසන්න කාලය ලෝක ඉතිහාසය තුළ සුවිශේෂී වූ තාක්ෂණික වෙනස්කම් රැසක් සිදුවූ කාලයකි. තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය ප්‍රමුඛ කරගත් සෙසු ක්ෂේත්‍රවල ශීඝ්‍ර දියුණුවත් සමග වත්මන් සිසු දරු දැරියන් හමුවේ නව අභියෝග රැසක් නිර්මාණය වී තිබේ. අද සමාජයේ පවතින රැකියාවල ස්වභාවය නුදුරු අනාගතයේ දී සුවිශේෂී වෙනස්කම් රැසකට ලක් වනු ඇත. එවන් වටපිටාවක් තුළ නව තාක්ෂණික දැනුම සහ බුද්ධිය කේන්ද්‍ර කරගත් සමාජයක වෙනස් ආකාරයේ රැකියා අවස්ථා ද ලක්ෂ ගණනින් නිර්මාණය වනු ඇත. ඒ අනාගත අභියෝග ජයගැනීම වෙනුවෙන්, ඔබ සවිබල ගැන්වීම අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස මගේත්, අප රජයේත් ප්‍රමුඛ අරමුණයි.

නිදහස් අධ්‍යාපනයේ මාහැඟි ප්‍රතිලාභයක් ලෙස නොමිලේ ඔබ අතට පත් වන මෙම පොත මනාව පරිශීලනය කිරීමත්, ඉන් අවශ්‍ය දැනුම උකහා ගැනීමත් ඔබේ ඒකායන අරමුණ විය යුතු ය. එමෙන් ම ඔබේ මවුපියන් ඇතුළු වැඩිහිටියන්ගේ ශ්‍රමයේ සහ කැපකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය විසින් නොමිලේ පාසල් පෙළපොත් ඔබ අතට පත් කරනු ලබන බව ද ඔබ වටහා ගත යුතු ය.

ලෝකය වේගයෙන් වෙනස් වන වටපිටාවක, නව ප්‍රවණතාවලට ගැළපෙන අයුරින් නව විෂය මාලා සකස් කිරීමටත්, අධ්‍යාපන පද්ධතිය තුළ තීරණාත්මක වෙනස්කම් සිදු කිරීම සඳහාත් රජයක් ලෙස අප කටයුතු කරන්නේ රටක අනාගතය අධ්‍යාපනය මතින් සිදු වන බව අප හොඳින් ම අවබෝධ කරගෙන සිටින බැවිනි. නිදහස් අධ්‍යාපනයේ උපරිම ප්‍රතිඵල භුක්ති විඳිමින්, රටට පමණක් නොව ලොවට ම වැඩදායී ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස නැඟී සිටින්නට ඔබ ද අදිටන් කරගත යුතු වන්නේ එබැවිනි. ඒ සඳහා මේ පොත පරිශීලනය කිරීමෙන් ඔබ ලබන දැනුම ද ඉවහල් වනු ඇති බව මගේ විශ්වාසයයි.

රජය ඔබේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන අතිවිශාල ධනස්කන්ධයට වටිනාකමක් එක් කිරීම ද ඔබේ යුතුකමක් වන අතර, පාසල් අධ්‍යාපනය හරහා ඔබ ලබා ගන්නා දැනුම හා කුසලතා ඔබේ අනාගතය තීරණය කරන බව ද ඔබ හොඳින් අවබෝධ කර ගත යුතු ය. ඔබ සමාජයේ කුමන තරාතිරමක සිටිය ද සියලු බාධා බිඳ දමමින් සමාජයේ ඉහළ ම ස්තරයකට ගමන් කිරීමේ හැකියාව අධ්‍යාපනය හරහා ඔබට හිමි වන බව ද ඔබ හොඳින් අවධාරණය කර ගත යුතු ය.

එබැවින් නිදහස් අධ්‍යාපනයේ උපරිම ප්‍රතිඵල ලබා, ගෞරවනීය පුරවැසියකු ලෙස හෙට ලොව දිනන්නටත් දේශ දේශාන්තරවල පවා ශ්‍රී ලාංකේය නාමය බබළවන්නටත් ඔබට හැකි වේවා! යි අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස මම ශුභ ප්‍රාර්ථනය කරමි.



**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

# පෙරවදන

ලෝකයේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා තාක්ෂණික සංවර්ධනයත් සමඟ අධ්‍යාපන අරමුණු වඩා සංකීර්ණ ස්වරූපයක් ගනී. මිනිස් අත්දැකීම්, තාක්ෂණික වෙනස්වීම්, පර්යේෂණ සහ නව දර්ශක ඇසුරෙන් ඉගෙනීමේ හා ඉගැන්වීමේ ක්‍රියාවලිය ද නවීකරණය වෙමින් පවතියි. එහිදී ශිෂ්‍ය අවශ්‍යතාවලට ගැළපෙන ලෙස ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කරමින් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා විෂය නිර්දේශයේ දැක්වෙන අරමුණුවලට අනුකූලව, විෂයානුබද්ධ කරුණු ඇතුළත්ව පෙළපොත සම්පාදනය වීම අවශ්‍ය ය. පෙළපොත යනු ශිෂ්‍යයාට ඉගෙනීමේ උපකරණයක් පමණක් නොවේ. එය ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමටත් නැණ ගුණ වර්ධනයටත් චර්යාමය හා ආකල්පමය වර්ධනයක් සහිතව ඉහළ අධ්‍යාපනයක් ලැබීමටත් ඉවහල් වන ආශීර්වාදයකි.

නිදහස් අධ්‍යාපන සංකල්පය යථාර්ථයක් බවට පත්කරමින් 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සියලු ම පෙළපොත් රජයෙන් ඔබට තිළිණ කෙරේ. එම ග්‍රන්ථවලින් උපරිම ඵල ලබන අතර ම ඒවා රැක ගැනීමේ වගකීම ද ඔබ සතු බව සිහිපත් කරමි. පූර්ණ පෞරුෂයකින් හෙබි, රටට වැඩදායී යහපත් පුරවැසියකු වීමේ පරිචය ලබා ගැනීමට මෙම පෙළපොත ඔබට උපකාරී වෙතැයි මම අපේක්ෂා කරමි.

මෙම පෙළපොත් සම්පාදනයට දායක වූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්ටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පළ කර සිටිමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක,**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2019.04.10

| | |
|---|---|
| **නියාමනය හා අධීක්ෂණය** | ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක<br>අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| **මෙහෙයවීම** | ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි<br>අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| **සම්බන්ධීකරණය** | ප්‍රගීතිකා ජයසේකර<br>සහකාර කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**සංස්කාරක මණ්ඩලය**

| | |
|---|---|
| 1. රත්නසිරි අරංගල | මහාචාර්ය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 2. සඳගෝමි කෝපරහේවා | මහාචාර්ය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 3. පී. ඒ. ඩී. රුවනි සිසිජා | සහකාර කථිකාචාර්ය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| 4. ශ්‍රියානි අබේවික්‍රම | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>භාෂා හා මානව ශාස්ත්‍ර අංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| 5. ප්‍රගීතිකා ජයසේකර | සහකාර කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**භාෂා සංස්කරණය**

මහාචාර්ය රත්න විජේතුංග

**අවසාන ඇගයීම**

මහාචාර්ය පී. බී. ඒකනායක

## ලේඛක මණ්ඩලය

1. එස්. ඕ. ප්‍රනාන්දු — විශ්‍රාමික අධ්‍යක්ෂ
ජාතික අධ්‍යාපන ආයතනය

2. ජයතිලක සෙනෙවිරත්න — විශ්‍රාමික විදුහල්පති

3. පී. ජේ. කළුආරච්චි — ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුරය.

## සෝදුපත් කියවීම

ජයත් පියදසුන් — කර්තෘ මණ්ඩලය, සිළුමිණ
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

## චිත්‍ර නිර්මාණය

ගාමිණී මුහන්දිරම් — ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුරය.

## පිටකවර නිර්මාණය

ඉන්දික ගුණවර්ධන

## පරිගණක අක්ෂර සංයෝජනය

ජේ. එච්. මනෝරිකා ප්‍රියංගනී — පරිගණක තාක්ෂණික සහායක
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

එස්. වී. ජී. එරංගා දිල්රුක්ෂි — පරිගණක තාක්ෂණික සහායක
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# සංස්කාරක සටහන

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂය නිර්දේශයට අනුකූල ව මේ 7 ශ්‍රේණිය පෙළ පොත සකස් කර ඇත්තේ ඔබට සිංහල භාෂාව හා සාහිත්‍යය හැදෑරීම සඳහා අත්වැලක් සැපයීමට යි. මේ පෙළ පොතේ පාඩම් අනුපිළිවෙළ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් නිර්දේශිත ඉගැන්වීම් අනුක්‍රමයට අනුකූල වෙයි.

මෙහි එන ඇතැම් පාඩම් විවිධ ලේඛකයන්ගේ කෘතිවලින් උපුටා ගෙන 7 ශ්‍රේණියේ සිසුන්ට යෝග්‍ය පරිදි සංස්කරණය කරනු ලැබ ඇති අතර මේ පොත සඳහා ම අලුතින් සම්පාදනය කරන ලද පාඩම් කිහිපයක් ද මෙහි ඇතුළත් වෙයි. විවිධ භාෂා කුසලතා වර්ධනයටත් සාහිත්‍ය රස වින්දනයෙන් ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත් මේ පොත පරිශීලනය වැදගත් වේ. එහිදී ඔබේ ගුරුවරයාගේ හෝ වැඩිහිටියන්ගේ හෝ සහාය අවශ්‍ය විය හැකි ය.

තනිව කියවා රස විඳිය හැකි කතන්දර, කවි, ලිපි ආදිය ද මෙහි අන්තර්ගත වෙයි. ඒ අතරින් බොහොමයක් විවිධ පොත්වලින් උපුටා ගත් කොටස් ය. ඒ පොත පත සොයා ගෙන කියවන්න.

මෙහි උපුටා ගෙන ඇති ලිපි ලේඛන රචනා කළ ලේඛකයන්ට අපගේ ගෞරව පූර්වක ප්‍රණාමය පිරිනමමු. එමෙන් ම මෙහි ඇතුළත් වන ලෝහ තාක්ෂණය පිළිබඳ ලිපිය සම්පාදනයේ දී උපදේශ ලබා දීම සහ ඡායාරූප ලබා දීම වෙනුවෙන් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අර්ජුන තන්තිලගේ මහතාටත් පුස්තකාලයට පිය නගමු පාඩම සම්පාදනයට සහාය වූ කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියක වන සමන්ලතා මැණිකේ අධිකාරි මහත්මියටත් නන් අයුරින් දායක වූ සියලු දෙනාටත් කෘතඥතාව පළ කරමු.

පෙර නුවණ ලැබූ අය<br>
        ලියා තුබුවෝ පත් – පොත්<br>
අප නුවණ වැඩි කැරුමට<br>
        මහත් පිහිටෙකි ඒ දැන්

ඒ පත – පොතින් වැඩ<br>
        ගැනුමට නම් මෙ කල්හි<br>
සිහි නුවණින් යෙදී සිට<br>
        අකුරු සතර උගත යුතු

**කුමර ගී**, කුමාරතුංග මුනිදාස

සෙසු විෂයයන් ඉගෙනීමේ දී ද භාෂා දැනුම අත්‍යවශ්‍ය වේ. එමෙන් ම සාහිත්‍යය පරිශීලනයෙන් දැනුම හා ප්‍රකාශන ශක්තිය දියුණු කර ගනිමින් සමබර පෞරුෂයෙන් යුතු මිනිසකු වීම ද ඔබේ අනාගත සාර්ථකත්වයට පිටිවහලක් වනු නො අනුමාන ය.

# පටුන

පිටු අංකය


| | | |
|---|---|---|
| 1 | ගොවි බිරියගේ නුවණ | 1 |
| | ප්‍රස්තාව පිරුළු සහ ඉඟි වැකි | 6 |
| 2 | සසුන බැබළවූ සරණංකර සඟරජ තෙරණුවෝ | 8 |
| | සමානාර්ථ පද | 12 |
| 3 | අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය | 14 |
| 4 | ඔයි රයිරේ ඔයි රාමා | 28 |
| | නාම පද | 37 |
| | වචන භේදය | 37 |
| | පුරුෂ භේදය | 40 |
| | ලිංග භේදය | 42 |
| 5 | ශ්‍රී ලංකාවේ අභිකුණ්ඩික ජනතාව | 45 |
| | උක්ත අනුක්ත භේදය | 49 |
| 6 | මේ කාගේ දෝ කමතා | 51 |
| | විරුද්ධාර්ථ පද | 55 |
| 7 | දෙව්දම් ඇදුරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි | 57 |
| | ක්‍රියා පද | 64 |
| | අවසාන ක්‍රියා | 64 |
| | අනවසාන ක්‍රියා | 64 |
| 8 | කතා බහට සංයමයක් | 68 |

| | | |
|---|---|---|
| 9 | තිලමුට්ඨි ජාතකය | 74 |
| 10 | අපේ ලෝහ තාක්ෂණයේ යටගියාව | 80 |
| 11 | ප්‍රායෝගික ලේඛන | 87 |
| | රාජකාරි ලිප | 88 |
| | ආරාධනා පත | 90 |
| 12 | සිනා කුමරි | 92 |
| | රස කවි ගොතමු කවි රස විඳිමු | 95 |
| 13 | වාක්‍ය රචනය | 106 |
| 14 | නිවේදන | 114 |
| | මාතෘකානුකූල කතා | 119 |
| 15 | ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය | 121 |
| | පුවත්පත් ලිපි | 124 |
| | බිත්ති පුවත්පත් ලිපි | 125 |
| | සඟරා | 126 |
| | පද බෙදීම | 126 |
| 16 | සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර | 129 |
| | තනි පද | 135 |
| 17 | සුදන ගුණ | 138 |
| 18 | මා දුටු මුල් හිරු පෙන්නු ලංකා | 143 |
| 19 | දුං දුමටයි අඟුරු මටයි | 146 |
| | විශේෂණ පද | 152 |
| 20 | සකස් කඩ නො කී කට | 154 |
| | විරාම ලකුණු | 158 |
| 21 | පුස්තකාලයට පිය නගමු | 163 |
| 22 | තොප්පි වෙළෙන්දා | 167 |
| | ළමා නාට්‍ය පිටපත් රචනය | 180 |
| 23 | යහළුවෝ | 182 |
| 24 | පොල් ලඳ සැටි | 187 |
| | රසවත් කතා ගොතමු | 193 |



# ගොවි බිරියගේ නුවණ

# 1

ජන කතා යනු මිනිසුන් ලිවීමේ ක්‍රමයක් නො දැන සිටි අවධියේ සිට කටින් කට පැවත එන, ජනයා අතර ම නිර්මාණය වූ කතා විශේෂයකි. ලෝකයේ සෑම රටක ම පාහේ ඒ රටට ආවේණික වූ ජන කතා සම්ප්‍රදායක් දැකිය හැකි ය. ජන ව්‍යවහාරයේ පවතින විවිධ යෙදුම්, විශ්වාස ආදිය ජන කතාවල ඇතුළත් වේ. පසු කාලයක දී මෙබඳු ජන කතා ලේඛනගත කෙරිණි. අද වන විට අප රටට ආවේණික ජන කතා පමණක් නො ව වෙනත් රටවල ජන කතා ද සිංහල භාෂාවෙන් පළ වී ඇත. මෙම පාඩමට ඇතුළත් වන්නේ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ මෙහෙයවීමෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද, ළමයින් සඳහා ආසියානු ජන කතා දෙවන පොතෙන් උපුටා ගත් කතාවකි. ආසියානු ජන කතා දෙවන පොත, ජපානයේ යුනෙස්කෝ ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානය විසින් පළ කරන ලද *Folk tales from Asia for Children Everywhere - Book Two* නම් ග්‍රන්ථයෙහි සිංහල පරිවර්තනය යි. 'ගොවි බිරියගේ නුවණ' පාකිස්ථාන ජන කතාවකි.

දිනක් එක් ගොවියෙක් හරක් බාන ද දක්කා ගෙන කුඹුර සෑමට ගියේ ය. මුල් ම හී විට නිම කරන විට ම ව්‍යාඝ්‍රයෙක් ඔහු ළඟට ඇවිත් ආචාර කොට, "ආයුබෝවන් යහළුව, මේ උදෑසන කෙසේ ද ඔබගේ සුව දුක්?" යි ඇසී ය.

ගොවියා බියෙන් වෙවුලන්නට විය. එහෙත් විනීතව කතා කිරීම වඩා නුවණට හුරු යැයි සිතා ගත් ඔහු, "ආයුබෝවන්, ස්වාමීනි. ඔබ වහන්සේට පින් අත් වේවා! ගැත්තා ඉතා සුවයෙන් සිටින බව දන්වා සිටිමි" යි කී ය.

"ඒ බව ඇසීම මට මහත් ප්‍රීතියක්. දෙවියන්ගේ අණ පරිදි මම ඔබගේ හරක් බාන බිලි ගැනීමට ආමි. ඔබ දේව අණට කීකරු තැනැත්තකු බව මම දනිමි. එහෙයින් හරක් බාන වහා ම මුදා හරින්නැ" යි ව්‍යාඝ්‍රයා කී ය.

ව්‍යාඝ්‍රයාගේ අදහස තමා මරා කෑමට නො ව හරක් බාන මරා කෑමට බව තේරුම් ගත් ගොවියා ධෛර්යවත් වී, "ස්වාමීනි, යම් වැරැද්දක් සිදු වී ඇති බවක් පෙනෙයි. දෙවියන්ගේ අණින් මම මේ කුඹුර සෑමට ආමි. ඉතින්, හරක් නැතිව මම කෙසේ නම් කුඹුර සාම් ද? ස්වාමීනි, ආපසු ගොස් මේ ගැන තව ටිකක් සොයා බැලීම හොඳ නො වේ දැ?" යි ඇසී ය.

"පමා වීමට කිසි ම වුවමනාවක් නැහැ. එහෙයින් හරකුන් මුදා හැරියොත් මම තව මොහොතකින් ඔවුන් මරා කමි" යි කියා ව්‍යාඝ්‍රයා භය උපදවන අන්දමින් උගේ දතුත් නියත් මුවහත් කරන්නට පටන් ගත්තේ ය.

හරකුන් මරා නො කන ලෙස ගොවියා වඳිමින් යදිමින් ඉතා බැගෑපත් ලෙස ව්‍යාඝ්‍රයාගෙන් ඉල්ලා සිටියේ ය. ඔවුන් නො මරා හරින්නේ නම් ඒ වෙනුවට ඔහුගේ බිරියගේ කදිම තරබාරු කිරි එළ දෙන දීමට පොරොන්දු විය.

ව්‍යාඝ්‍රයා ඊට එකඟ විය. ආරක්ෂාව සඳහා ඔහු හරකුන් ද දක්කා ගෙන වහ වහා ගෙදර බලා ගියේ ය. මෙතරම් වේලාසනින් ඔහු ආපසු එනු දුටු ඔහුගේ කඩිසර කාර්යශූර බිරිය, "කම්මැළි රාල! මම වැඩ පටන් ගත්තා විතර යි. දවසේ වැඩ ඉවර කරලාත් එනවා දැ?" යි ඈත දී ම ඇසී ය.

ව්‍යාඝ්‍රයා හමු වූ හැටිත් හරකුන් බේරා ගැනීම සඳහා එළ දෙන දීමට පොරොන්දු වූ හැටිත් ඔහු ඇට විස්තර කෙළේ ය. ඒ ඇසූ ගොවි බිරිය, "ඇත්තක් වෙන්න පුළුවනි. ඒ වුණත් ඔබේ ඔය ජඩ ගොන් දෙන්නා බේරා ගන්නට මගේ යස එළ දෙන දෙන්නට පොරොන්දු වූ හැටි! එළ දෙන නැති වුණාම ළමයින්ට කිරි ලැබෙන්නේ කොහෙන් ද? වෙඬරු නැතිව උයන්නේ කොහොම දැ?" යි ඔහුට බැණ වැදුණා ය.

“ඇත්ත, ඇත්ත. ඒ වුණාට, ධාන්‍ය නැතිව පාන් හදන්නේ කොහොම ද? කුඹුරු හාන්න හරක් නැති වුණා ම ධාන්‍ය ලැබෙන්නේ කොහෙන් ද? පාන් නැතිව ඉන්නවාට වඩා නරක ද කිරි යි වෙඬරු යි නැතිව ඉඳීම? ඉක්මනට ගිහින් එළ දෙන ලිහන එක හොඳ යි” කියා ගොවියා ඇනුම්පද කී ය.

“මහ මෝඩයා! යම්තම් වත් මොළේ තියෙනවා නම් මේ අමාරුවෙන් ගැලවෙන්නට විදියක් කල්පනා කරනවා නො වැ?” යි ඈ අවලාද කීවා ය.

“ඇයි, ඉතින්, ගැලවෙන විදියක් ඔබ ම කල්පනා නො කරන්නේ ?” යි ගොවියා තරහෙන් කී ය.

“හොඳයි. මම මින් ගැලවෙන විදියක් කියන්නම්. හැබැයි, මා කියන හැටියට ම කරන්න ඕනෑ. මට දෙකක් කරන්නට බැහැ” යි පිළිතුරු දුන් බිරිය, “වහා ම ව්‍යාඝ්‍රයා ළඟට යන්න. එළ දෙන ඔබ සමඟ නො එන නිසා මා ඈ දක්කා ගෙන එන බව ඔහුට කියන්න” යි කීවා ය.

මහත් බියසුල්ලකු වූ ගොවියා හිස් අතින් ව්‍යාඝ්‍රයා ළඟට ආපසු යෑමට කිසි සේත් ම කැමති නො වී ය. එහෙත් කළ හැකි අන් කිසිවක් හිතට නො ආ හෙයින් ඔහු බිරිය කී ලෙසට ම කළේ ය. ඔහු යන විටත් ව්‍යාඝ්‍රයා දතුත් නියත් මුවහත් කරමින් ම සිටියේ ය. ඔහු හිටියේ එතරම් ම බඩ ගින්නේ යි. තවත් ටික වේලාවක් කෑම පමා වන බව ඇසූ ව්‍යාඝ්‍රයා ඉතා බියකරු අන්දමින් ගොරවන්නටත් වලග ගසන්නටත් මුහුණේ දිගු රෝම කරකවන්නටත් විය. බියෙන් ගැහුණු ගොවියාගේ දණ හිස් එකට වදින්නට විය.

ගොවියා ගිය පසු ඔහුගේ බිරිය අස් හලට ගොස් පෝනියකු පිළියෙල කර ගත්තා ය. ඈ ඇගේ ස්වාමියාගේ හොඳ ම ඇඳුමක් ඇඳ ගෙන හැකි තරම් ම උසට පෙනෙන්නට තලප්පාව උස් කොට බැඳ පෝනියා පිට නැඟී ව්‍යාඝ්‍රයා සිටින කුඹුර දෙසට ගියා ය.

ඈ මිනිසකු මෙන් ඉතා ආඩම්බර ලීලාවෙන් පෝනියා පිටින් ගොස් කුඹුරට හැරෙන තැන සිට, “සියලු දෙවියන්ගේ පිහිටින් මට මේ කුඹුරේ දී ව්‍යාඝ්‍රයෙක් හමු වේවා! ඊයේ උදේ හීලට ව්‍යාඝ්‍රයන් තුන් දෙනකු කෑවායින් පසු තව ම ව්‍යාඝ්‍ර මස් රස බලන්නට බැරි වී ය” යි අභීත ස්වරයෙන් හඬ ගෑවා ය.

ඒ ඇසූ ව්‍යාඝ්‍රයා එසේ හඬ ගෑ තැනැත්තා කිසි ම බියක් සැකක් නැතිව තමා දෙසට එනු දැක බියෙන් තැති ගෙන පසු පස හරවා කැළයට දුවන්නට විය. මෙසේ කලබලයෙන් වේගයෙන් දුවන ඔහුට තමාගේ සේවක හිවලාගේ

ඇගේ හැප්පෙන්නට යන බව පවා නො හැඟිණ.

හිවලා පැත්තකට පැන, "ස්වාමීනි, ස්වාමීනි, මේ තරම් කලබලයෙන් මේ කොහේ ද දුවන්නේ?" යි ඇසී ය.

"දුවමු දුවමු" යි ව්‍යාඝ්‍රයා හති ලෑ ය; "කිසි ම තැකීමක් නැතිව උදේ හීලට ව්‍යාඝ්‍රයන් තුන් දෙනකු කන යක්ෂ අසරුවෙක් අර කුඹුරේ සිටී" යි කී ය.

හිවලා අතින් කට මුවා කර ගෙන සිනා සෙන්නට විය. "ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේගේ ඇස් ඉරු එළියට අඳුරු වී ගියා විය යුතු යි. ඒ මොන අසරුවෙක් ද? පිරිමි ඇඳුම් ඇඳ ගත් ගොවි බිරිය නො වැ?" යි කී ය.

ව්‍යාඝ්‍රයා මඳක් නැවතී, "හොඳට ම විශ්වාස ද?" යි ඇසී ය.

"ස්වාමීනි, මට හොඳට ම විශ්වාස යි. ඔබ වහන්සේගේ ඇස් ඉරු එළියට අඳුරු නො වුණා නම්-මෙසේ කියනවාට කමා කළ මැනවි-ඔබ වහන්සේටත් තලප්පාව අස්සෙන් එල්ලෙන කොණ්ඩ අග පෙනෙනවා නො වැ?" යි හිවලා කී ය.

"එහෙත් ඔබටත් වරදින්නට බැරි නෑ. ඈ පෙනුමට නම් මහ යක්ෂ අසරුවෙක්" යි බියසුලු ව්‍යාඝ්‍රයා පැවසී ය.

"කවුද, ඈට බය? ගැහැනියකට බයේ කෑම නො කා පලා යනවා යැ? හොඳ යි අපි දෙන්නා ම යමු" යි හිවලා යෝජනා කෙළේ ය.

"බැහැ, බැහැ, ඔබ මා එතැනට කැඳවා ගෙන ගොස් පැන දුවාවි" යි ව්‍යාඝ්‍රයා බියෙන් ගැහෙමින් කී ය.

"එහෙ නම් මට දුවන්නට බැරි වෙන්නට අපි වලිග ගැට ගසා ගනිමු" යි කැදර හිවලා කී ය.

ව්‍යාඝ්‍රයා ඊට එකඟ විය. ඔවුහු තදින් වලිග එකට ගැට ගසා ගෙන අතිනත ගෙන යන්නට වූහ.

ගොවියාත් ඔහුගේ බිරියත් ඔවුන් යෙදූ උපාය සාර්ථක වීම ගැන සතුටින් සිනා සෙමින් උන්හ. වලිග ගැට ගසා ගෙන ඔවුන් දෙසට එන ව්‍යාඝ්‍රයාත් හිවලාත් ඔවුන්හට හදිසියේ ම පෙනිණ.

"අපි නැහුණා! අපි නැහුණා. දුවමු, දුවමු" යි ගොවියා කෑ ගැසී ය.

“මොන දිවිල්ලක් ද? කෑ නො ගහා ඉන්නවා. මා කියන දේ ඇහෙන්නේ නෑ” යි බිරිය ඔහුට කිසි කලබලයක් නැතිව කී ය.

ඇගේ කට හඬ ඇසෙන තරමට සතුන් දෙ දෙනා ළං වූ පසු ඈ ඉතා හිතවත් ලෙසට, “ආ, හිවල් හාමි, මේ තරම් කදිම, තර ව්‍යාඝ්‍රයකු රැගෙන ඒම කොයි තරම් හොඳ ද? ඉක්මනින් ම මම මගේ කොටස කා දමමි. වැඩි පමාවක් නැතිව ඔබට ඔබේ කොටස ලැබේවි” යි කී ය.

මේ ඇසුණු විට ම ව්‍යාඝ්‍රයා ඉතා ම බිය පත්ව හිවලා ගැනත් ඔවුන්ගේ වලිග එකට ගැට ගසා ඇති බව ගැනත් මුළුමනින් ම අමතක වී හිවලාත් ඇද ගෙන හැකි තරම් වේගයෙන් දුවන්නට විය. දඩාස් බඩාස් යනුවෙන් ගල් මුල්වල හැපෙමින් ස්රාස් ස්රීස් යනුවෙන් කටු ළැහැප්වල මැදෙමින් හිවලා බිම දිගේ ඇදී ගියේ ය.

හිවලා මර ළතෝනි නඟමින් මොර ගෑවේ ය. පිටු පසින් එන ඒ හඬ නිසා තව තවත් බිය පත් වූ ව්‍යාඝ්‍රයා කඳු පල්ලම් නො තකා හිස හැරුණු අතේ කැළෑව බිඳ ගෙන දිවී ය; විඩාවෙන් ඇද වැටෙන තෙක් ම දිවී ය. ඒ වන විට හිවලා තැළුම් පෙළුම්වලින් මිය ගොස් බොහෝ වේලාවක් විය.

ඉන් පසු කවරදා වත් ගොවියාටත් ඔහුගේ භාර්යාවටත් ව්‍යාඝ්‍රයාගෙන් කිසි ම කරදරයක් නො වී ය.

## අවබෝධය

1. ව්‍යාඝ්‍රයා ගොවියා වෙත පැමිණියේ කුමන අරමුණකින් ද?
2. ගොවියා ව්‍යාඝ්‍රයාට පොරොන්දු වූයේ කුමක් ලබා දීමට ද?
3. මේ කතාවට අනුව, පාන් නිෂ්පාදනයේ දී ගවයාගේ දායකත්වය ලැබෙන්නේ කුමන කාර්යයක් උදෙසා ද?
4. අසරුවකුගේ වෙස් ගත්තේ ගොවි බිරිය බව හිවලා හඳුනා ගත්තේ කෙසේ ද?
5. මෙම කතාවෙන් යුගල පද දෙකක් උපුටා දක්වන්න.

## ප්‍රස්තාව පිරුළු සහ ඉඟි වැකි

ජන කියමන් විශේෂයක් වන ප්‍රස්තාව පිරුළු සාම්ප්‍රදායික යෙදුම් ගණයට අයත් වෙයි. මේවා, කථා කිරීමේ දී හා ලිවීමේ දී අවස්ථාවට අනුව කිසි යම් කාරණයක් පැහැදිලි කිරීම උදෙසා භාවිත කෙරෙන පොදු කියමන් වර්ගයක් ලෙස ද සැලකේ. ප්‍රස්තාව පිරුළක් යනු 'තැනට ඔබින කියමනකි'. කිය යුතු කාරණය කෙටියෙන්, පැහැදිලිව හා රසවත්ව කීමට ප්‍රස්තාව පිරුළු ඉවහල් වේ.

ප්‍රස්තාව පිරුළු බෙහෙවින් ම නිර්මාණය වී ඇත්තේ කතන්දර ඇසුරු කර ගෙන ය.

- අබරා සිල් ගත්තා වගෙයි,
- කළුවා මාරපන් ගියා වගෙයි,
- පුහුල් හොරා කරෙන් දැනෙයි,
- ගමරාල දිව්‍ය ලෝකෙ ගියා වගෙයි,

එබඳු ප්‍රස්තාව පිරුළු කිහිපයකි.

- අනුන්ට කළ දේ තමන්ට පල දේ,
- පතින්ට පෙර සිතා බලනු,
- උත්සාහවන්තයා ජය ගනී,
- ඉවසීමෙන් සැනසීම ලැබේ,
- කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතු ය

ආදි පිරුළු උපදේශාත්මක ස්වරූපයක් ගනී.

ප්‍රස්තාව පිරුළු ගණයෙහි ලා ගත හැකි යෙදුම් ද ඇතුළත් තවත් සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් සිංහල ව්‍යවහාරයේ පවතී. මේවා රූඩී හෙවත් ඉඟි වැකි නමින් හැඳින්වේ. මතු පිට අර්ථය ඉක්මවා වෙනත් අර්ථයක් අඟවන ඉඟි වැකි ද භාෂාවේ පෝෂණයට ඉවහල් වෙයි. ඉඟි වැකි හෙවත් රූඪිවල විශේෂත්වයක් වන්නේ ඒවාට අර්ථයක් ආරෝපණය කර නැත හොත් ආරූඪ කර තිබීම යි. මෙම පාඩමේ ඇතුළත් කතාවේ සඳහන් 'හිස් අතින්' , 'හිස හැරුණු අතේ' වැනි යෙදුම් ද ඉඟි වැකි ලෙස සැලකිය හැකි ය.

- තරු පෙනුණා (අනපේක්ෂිත ගැටලුවකට මුහුණ දීම)
- කිඹුල් කඳුළු (බොරුවට ඇඬීම)
- කුකුළා අතින් අරන් (උදෑසනින් ම)
- කරල පැහුණා (වාසියක් සිදු වීම)
- බළලා මල්ලෙන් එළියට පැන්නා
  (සැඟවීමට උත්සාහ ගත් දෙයක් එළිදරව් වීම)

  වැනි කියමන්, ඉඟි වැකි හෙවත් රූඪී සඳහා නිදසුන් කිහිපයකි.

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල අදහස ලියන්න.**

   i. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගෙයි
   ii. බීරි අලින්ට වීණා ගායනා කරනවා වගෙයි
   iii. ඉගුරු දී මිරිස් ගත්තා වගෙයි
   iv. ඉබ්බා දියේ දැම්මා වගෙයි
   v. මඩේ සිටුවූ ඉන්න වගෙයි

2. **පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන යෙදුම් වෙනුවට ගැළපෙන රූඪියක් ඇතුළත් කර නැවත ලියන්න.**

   උදාහරණ: ගොවියා **උදැසනින්** ම කුඹුරට ගියේ ය.
   ගොවියා **කුකුළා අතින්** ගෙන කුඹුරට ගියේ ය.

   i. කමල් **බොරු පුරසාරම් කියන්නෙකි.**
   ii. විභාගය සමත් වීම මගේ **ඉමහත් ප්‍රීතියට** හේතු විය.
   iii. පන්ති නායකයා මගේ **හොඳ මිත්‍රයෙකි.**
   iv. අසල්වැසියන් සමග කිසිදු **සුහදතාවක්** නැතැයි ඇය කීවා ය.
   v. අප ගමන් කළ රථය තිරිංග ක්‍රියාත්මක වීම නිසා **අවසාන මොහොතේ අනතුරින් බේරිණි.**

3. **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල හෝ රූඪිවල හෝ අදහසට සමීප අර්ථයක් දෙන ප්‍රස්තාව පිරුළක් හෝ රූඪියක් හෝ ලියා දක්වන්න.**

   i. නිකිණි හොයනවා
   ii. හිස හැරුණු අතේ යනවා
   iii. අනූනවයෙන් බේරුණා
   iv. අතු කඩා මොර කන්නා වගෙයි
   v. ඇඟෙන් ඇටයක් ගන්නවා වගෙයි

## ප්‍රායෝගික අභ්‍යාස

1. **ප්‍රස්තාව පිරුළු පහක් සහ ඒවාට මුල් වූ කතන්දර ඇතුළත් කර පොත් පිංචක් සකස් කරන්න.**

2. **රූඪි සහ ඉඟි වැකි එක් රැස් කර ලේඛනයක් සකස් කරන්න.**



# 2 සසුන බැබළවූ සරණංකර සඟරජ තෙරණුවෝ

සෙංකඩගල යුගය සමාජීය, දේශපාලන, ආගමික හා ශාස්ත්‍රීය කටයුතු අතින් පිරිහීමට පත් වූ වකවානුවක් විය. යුරෝපීයයන් වූ පුර්තුගීසි හා ලන්දේසි ජාතික ආක්‍රමණිකයන්ගේ තාඩන පීඩනවලට මෙරට වැසියෝ ලක්ව සිටියහ. එකල බෞද්ධයන්ටත් භික්ෂූන් වහන්සේලාටත් නොයෙක් හිරිහැර තර්ජනවලට මුහුණ පෑමට සිදු විය.

මෙසමයෙහි ලක්දිව බුදු සසුන සහ අධ්‍යාපනය නගා සිටුවීමට කටයුතු කළ අය අතර වැලිවිට සරණංකර සංඝරාජ හිමියෝ ප්‍රමුඛ වෙති.

උන් වහන්සේගේ චරිතයෙහි කැපී පෙනෙන සුවිශේෂ අවස්ථා කීපයක් මේ පාඩමට ඇතුළත් වේ. මේ පාඩම සකස් කර ඇත්තේ කොටගම වාචිස්සර හිමියන්ගේ සරණඞ්කර සඞ්ඝරාජ සමය හා තිරාණගම රතනසාර හිමියන්ගේ සඟරජ වතගොත කෘති ඇසුරෙනි.

සරණංකර හිමියන්ගේ උපත සිදු වූයේ II වන විමලධර්මසූරිය (1687-1706) රජතුමාගේ කාලයේ දී ය. තුම්පනේ ප්‍රදේශයේ උපත ලද උන් වහන්සේගේ ගිහි නාමය කුලතුංග බව පොත පතෙහි සඳහන් වෙයි.

කුලතුංග දරුවා මූලික අධ්‍යාපනය ලැබුවේ එරමුදු ලියද්දේ උපාසක රාල නම් ගුරුතුමාගෙනි. **නම් පොත, මඟුල් ලකුණ, සකස්කඩය, නවරත්නය** ආදි පොත් ද පුස්කොළවල අකුරු ලිවීම ද ඔහු තම ගුරුවරයා වෙතින් උගත්තේ ය. එරමුදු ලියද්දේ උපාසක රාලගේ ඥාතියකු වූ සූරියගොඩ රාජගුරු හිමියන් වෙත යොමු කිරීමෙන් අනතුරුව දෙමාපිය ආශීර්වාදය ද ඇතිව ඔහු වැලිවිට සරණංකර නමින් පැවිදි කෙරිණි.

සූරියගොඩ හිමියන් යටතේ සිය දැනුම දියුණු කර ගැනීමට කටයුතු කළ සරණංකර සාමණේරයන් වහන්සේ එපමණකින් සෑහීමකට පත් නො වූහ. විවිධ කාරණා නිසා මේ කාලය වන විට ලංකාවේ භාෂා, සාහිත්‍ය ක්ෂේත්‍රයන්හි පරිහානි තත්ත්වයක් උද්ගත වී තිබිණි. එබැවින් උන් වහන්සේට පාලි භාෂාව ඉගෙනීම සඳහා එවකට සිරගතව සිටි ලෙව්කේ රාල වෙත යෑමට සිදු විය. අලගල්ලේ කන්ද පාමුල කඩිගමුව ප්‍රදේශයේ වෙසෙමින් මාකෙහෙල්වල සිරගත කර සිටි ලෙව්කේ රාල වෙත දිනපතා යමින් **බාලාවතාරයේ** නාම කාණ්ඩය අවසානය දක්වා ඉගෙනීමට සරණංකර සාමණේරයෝ කටයුතු කළහ. තමන් උගත් දේ සිටිනාමළුවේ සිල්වත් තැන නැමති ස්වකීය මිත්‍රයකුට ඉගැන්වූ බව ද සඳහන් වේ. පසු කලෙක පල්කුඹුරේ අත්ථදස්සී හිමියන්ගේ ඇසුරෙහි **බාලාවතාරය** සම්පූර්ණයෙන් ම උගත් උන් වහන්සේ ඉගෙනීමට දැක්වූ උනන්දුව පිළිබඳ කියැවෙන ජනප්‍රවාද රැසකි. උන් වහන්සේ සැතපෙන විට හිසට පොල් කටුවක් තබා ගත් බව එබඳු එක් කතාවකි. එයින් හිසට ඇති වන වේදනාව නිසා එක දිගට සැතපීමට නො හැකිව අවදි වූ සෑම අවස්ථාවක ම පාඩම් කිරීමට හා භාවනා කිරීමට කටයුතු කළ බව කියැවේ.

මේ වකවානුව ලක්දිව සඟ සසුන පිරිහී ගොස් ගෘහ ජීවිත ගත කරන 'ගණින්නාන්සේලා' නම් කණ්ඩායමක් සංඝයාගෙන් ඉටු විය යුතු මෙහෙවර බාර ගෙන සිටි අවධියකි. සරණංකර හිමියෝ මෙම ක්‍රමය වෙනුවට පිණ්ඩපාතික සිල්වත් භික්ෂු පරපුරක් ඇති කිරීමට පෙරමුණ ගත්හ. උන් වහන්සේ අනුගමනය කළ සාමණේරවරුන් අයත් කණ්ඩායම 'වැලිවිට සමාගම' නමින් ද සාමණේරවරු 'සිල්වත් තැන්' යන නමින් ද හඳුන්වන ලදහ. ඒ වන විට පරිහානියට පත් වෙමින් පැවති අධ්‍යාපනය නඟා සිටුවීමට කටයුතු කළ වැලිවිට සමාගම බෞද්ධ ජනයාගේ ප්‍රසාදයට පත් විය. මේ පිළිබඳව

ඊර්ෂ්‍යාවට හා අමනාපයට පත් අයගේ පැමිණිලි හේතුවෙන් නරේන්ද්‍රසිංහ රජු විසින් සරණංකර සාමණේරයන් ප්‍රමුඛ සිල්වත්තු ලග්ගල ප්‍රදේශයට පිටුවහල් කරන ලදහ.

මේ සමයෙහි ඉන්දියාවේ සිට පැමිණි බමුණකු විසින් පවසන ලද සංස්කෘත ශ්ලෝකයක් තේරුම් ගැනීමට නරේන්ද්‍රසිංහ රජු විසින් ගෙන්වන ලද කිසිවකුට නො හැකි වූ බවත් සරණංකර හිමියන්ට මේ පුවත සැල වී අදාළ ශ්ලෝකයේ අරුත සිය සිසුන්ට පැහැදිලි කර දුන් බවත් පොත පතෙහි සඳහන් වේ. ඒ බමුණා ඉදිරියේ බණ කීමට සමත් කෙනෙකු නො වූයෙන් පලිපාන මොහොට්ටාලගේ කීමෙන් සරණංකර හිමියන් කැඳවීමට රජු කටයුතු කර ඇත. එහි දී උන් වහන්සේ පාලි, සංස්කෘත, සිංහල භාෂා තුනෙන් ම බණ කී අතර රජුගේ අප්‍රමාණ ප්‍රසාදයට පාත්‍ර වූහ. එතැන් පටන් රජුගේ විශ්වාසය හා ගෞරවය දිනා ගත් උන් වහන්සේ උපසම්පදාව මෙරටට ගෙන්වා ගැනීම සඳහා බුරුමය, සියම ආදි රටවලට දූතයන් යැවීමට කටයුතු කළහ. මුලින් යවන ලද දූත කණ්ඩායම් දෙක ම අසාර්ථක වූ නමුදු කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ දී තෙවන වර සියමට යැවූ දූතයන් මගින් ලක්දිවට උපසම්පදාව ගෙන්වා ගැනීමට සරණංකර හිමියෝ සමත් වූහ.

උන් වහන්සේ උපසම්පදාව ලැබුවේ පනස් පස්වන වියේ දී ය. සියම් රටේ සිට පැමිණි උපාලි නම් භික්ෂුවගේ මූලිකත්වයෙන් උපසම්පදා කර්මය සිදු කෙරුණු අතර මෙහි වැඩම කළ සියම් භික්ෂූහු සිල්වතුන් මහණ කරමින් ද, සාමණේරවරුන් උපසපන් කරමින් ද මෙරට සසුන දියුණු කළහ. මේ සියල්ලට ම මූලිකත්වය ගෙන ක්‍රියා කළ සරණංකර හිමියෝ මල්වතු විහාරයෙහි වැඩ විසූහ. මින් පසු කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් කෝට්ටේ ශ්‍රී වීදාගම මෛත්‍රේය සංඝරාජ හිමියන්ගෙන් පුරප්පාඩුව පැවැති සංඝරාජ තනතුර වැලිවිට සරණංකර හිමියන් වෙත පිරිනමන ලදි.

තමන් වහන්සේට සඟරජ පදවිය හිමි වන බව සරණංකර හිමියන්ට කලින් දැන ගන්නට ලැබී ඇත. ඒ අවස්ථාවේ පන්සලේ උළුවස්සේ "උඩගු නො ව මහණ, උඩගු නො ව මහණ" යනුවෙන් තෙවරක් ලියා තැබීමට උන් වහන්සේ කටයුතු කළ බව ප්‍රකට ය. මේ පුවත ඇසූ රජතුමා සතුටට පත් වූ බව ද කියැවේ. සරණංකර හිමියන්ගේ නිහතමානීභාවය ඉස්මතු කරන මේ කතාව අපගේ ජීවිතවලට ද මහඟු ආදර්ශයකි.

මෙකල මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර පවත්වන ලද්දේ දෙවියන් සඳහා වූ සතර දේවාල පෙරහැරක් වශයෙනි. එහි දී දළදා වහන්සේට පූජෝපහාරයක් නො පැවැත්විණි. දළදා වහන්සේට පූජෝපහාරයක් වශයෙන් දළදා කරඬුව රැගත් මාළිගාවේ පෙරහැරක් ඉදිරියෙන් ම ගමන් කළ යුතු යැයි යෝජනා කර ක්‍රියාත්මක කරන ලද්දේ සරණංකර හිමියන් විසිනි. අද දක්වා පවතින **මහනුවර දළදා පෙරහැර** ඇරඹුණේ ඒ අනුව ය.

උන් වහන්සේ විසින් ලියන ලද ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසකි. **මුනිගුණ අලංකාරය, සාරාර්ථ සංග්‍රහය, භේසජ්ජ මංජුසා සන්නය, මහා බෝධිවංශ සන්නය, සතරබණවර සන්නය** ඉන් කිහිපයකි. උන් වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධය නිසා ම සුපේශල ශික්ෂාකාමී සඟ පරපුරක් මෙරට බිහි විය. අද පවත්නා ශාසන පුනර්ජීවයේ පුරෝගාමියා වනුයේ ද **පිණ්ඩපාතික, අසරණසරණ, රාජගුරු වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ** ය.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| බාලාවතාරය | පාලි ව්‍යාකරණ ග්‍රන්ථයකි. |
| සුපේශල ශික්ෂාකාමී | මනා සේ හික්මුණු/මනා පැවතුම් ඇති |
| පුනර්ජීවය | නැවත පණ ගැන්වීම |
| පුරෝගාමියා | මුල් වූ තැනැත්තා |

## අවබෝධය

**පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. **සරණංකර හිමියන් ඉගෙනීමට දැක්වූ දැඩි උනන්දුව පිළිබඳ කියැවෙන සිදුවීමක් පාඩමෙන් උපුටා දක්වන්න.**
2. **සරණංකර හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.**
3. **සරණංකර හිමි ලග්ගලට පිටුවහල් කරන ලද්දේ කුමන හේතුවක් නිසා ද?**
4. **මෙරටට උපසම්පදාව ගෙන ආ රට හා ඒ සමග පැමිණි ප්‍රධාන භික්ෂූන් වහන්සේගේ නම ලියන්න.**
5. **මහනුවර ඇසළ පෙරහැරෙහි සරණංකර හිමියන් විසින් කරන ලද වෙනස කුමක් ද?**

## සමානාර්ථ පද

කිසියම් පදයකට අර්ථයෙන් සමාන අනෙකුත් පද සමානාර්ථ පද ලෙස හැඳින්වේ. ලේඛන කුසලතා වර්ධනය කර ගැනීම සඳහා සමානාර්ථ පද හඳුනා ගැනීම වැදගත් වේ. එමගින් ලේඛනයක් මනාව සකස් කිරීමට දායකත්වය ලැබෙන බැවිනි. රචනා ලිවීමේ දී අවස්ථාවට ගැළපෙන වචන යෙදීම සඳහා සමානාර්ථවත් පද දැන සිටීම වැදගත් ය.

උදාහරණ:

සඳ - චන්ද්‍රයා, නිශාකර, තරුපති
මව - අම්මා, මෑණියෝ

### ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් පදවලට සමානාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.**

| | | | |
|---|---|---|---|
| i. ග්‍රන්ථය | - | ii. ප්‍රවෘත්තිය | - |
| iii. ඖෂධ | - | iv. උද්යෝගය | - |
| v. සමර්ථ | - | vi. ශාසනය | - |

2. **පාඩමේ යෙදී ඇති පහත සඳහන් පදවලට සමානාර්ථ පද සොයා ලියන්න.**

| | | | |
|---|---|---|---|
| i. විවිධ | - | ii. භාෂා | - |
| iii. අවසානය | - | iv. ප්‍රසාදය | - |
| v. සමයේ | - | vi. වියේ | - |

3. **වරහනට පිටින් දී ඇති වචනය වෙනුවට යෙදිය හැකි වචන තුනක් වරහන් තුළ ඇත. නො ගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

i. අහස (ගගන, ගුවන, නුබ, පවන)
ii. ගෙය (නිවස, මැඳුර, භුවන, විමන)
iii. දත් (දන්ත, චූර්ණ, දසන්, දළ)
iv. මුහුද (සමුදුර, සයුර, රුවන්, සිඳු)
v. මුහුණ (වත, සිසි, මුව, වුවන)

4. වරහනට පිටින් දී ඇති පදයට සමානාර්ථ පදයක් වරහන් තුළ ඇත. එම වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. ප්‍රගතිය (පුහුණුව, සුගතිය, දියුණුව, විරතිය)
ii. කීර්තිය (අයස, අපකීර්තිය, අභිමානය, යසස)
iii. නියත (නිරත, නියම, නිර්යාත, නිර්මිත)
iv. ප්‍රවීණ (ප්‍රාචීන, නිපුණ, ප්‍රතීචීන, නවීන)
v. ආවාස (නිවාස, ප්‍රාකාර, ප්‍රසාද, උද්‍යාන)

## ප්‍රායෝගික අභ්‍යාස

1. පාඩම ශබ්ද නගා කියවන්න.
2. මෙම පාඩම ඔබේ මිතුරකුට/වැඩිහිටියකුට හඬ නගා කියවන්නට දී හොඳින් අසා සිටිමින් වැදගත් කරුණු සටහන් කර ගන්න.
3. සරණංකර හිමියන් පිළිබඳ තවත් ජීවන තොරතුරු ඔබේ ගුරුතුමා/ගුරුතුමියගෙන් අසා දැන ගන්න.
4. සරණංකර හිමියන්ගේ චරිතයෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ පිළිබඳ මාතෘකානුකූල කතාවකට කරුණු එක්රැස් කරන්න. එම කතාව පන්තියට/සාහිත්‍ය සමිතියට ඉදිරිපත් කරන්න.
5. සරණංකර හිමියන් වැනි පහත සඳහන් විශිෂ්ට ගණයේ භික්ෂූන් වහන්සේ පිළිබඳ තොරතුරු සොයා පංතියට ඉදිරිපත් කරන්න.
   - තොටගමුවේ රාහුල හිමි
   - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
6. වචන රැස් කර ඒවාට සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද ලියා පොත් පිංචක් සකස් කරන්න.



# 3 අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය

භාෂාවක් සෑදී ඇත්තේ ශබ්දවලින් බවත් එම ශබ්ද ඇසට පෙනෙන පරිදි ලියා දැක්වීමට අක්ෂර - එනම් අකුරු - යොදා ගන්නා බවත් ඔබ ඉගෙන ගෙන ඇත. වර්තමානයේ ලිවීම සඳහා සම්මත කර ගෙන ඇති සිංහල අක්ෂර මාලාවේ ඇති අකුරු ගණන 60කි. ඒ අකුරු හැට ස්වර හා ව්‍යඤ්ජන යනුවෙන් වර්ග කෙරෙන බවත් ස්වර නියෝජනය කිරීමට පිලි හෙවත් පිල්ලම් යොදා ගන්නා ආකාරයත් ඔබ දැනට මත් හදාරා ඇත. අක්ෂර මාලාව හෙවත් හෝඩිය සම්බන්ධව තව දුරටත් දැන ගත යුතු කරුණු කිහිපයක් මේ පාඩමෙහි ඇතුළත් වෙයි.

මෙහි අක්ෂර වින්‍යාස රීති ඇතුළත් කොටස සම්පාදනය කර ඇත්තේ මහාචාර්ය සඳගෝමි කෝපරහේවාගේ සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය කෘතිය ඇසුරෙනි.

**ස්වර:**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඉ | ඊ | උ | ඌ |
| එ | ඒ | ඔ | ඕ | | |

**ව්‍යඤ්ජන:**

| | | | |
|---|---|---|---|
| ක | ග | ජ | |
| ට | ඩ | ණ | |
| ත | ද | න | |
| ප | බ | ම | |
| ය | ර | ල | ව |
| ස | හ | ළ | |
| අං | | | |

ඉහත දැක්වෙන්නේ ඔබ ප්‍රාථමික ශ්‍රේණිවල දී උගත් අක්ෂර මාලාව යි. අප සතුව පවතින පැරණි ම ව්‍යාකරණ ග්‍රන්ථය වන **සිදත් සඟරාව** නමැති පොතේ දැක්වෙන්නේ ද මෙම අක්ෂර මාලාව යි. එම අක්ෂර මාලාව සිදත් සඟරා හෝඩිය නමින් හැඳින්වෙයි. එය පද්‍ය රචනය සඳහා භාවිත වූ අක්ෂරවලින් පමණක් සමන්විත බව උගතුන්ගේ මතයකි.

සිදත් සඟරාව ලියවී ඇත්තේ අදින් වසර 800කට පමණ පෙර ය. ඊට ආසන්න කාලයේ ගද්‍ය ග්‍රන්ථ ලිවීමේ දී මෙම අක්ෂර මාලාවේ ඇතුළත් නො වූ වෙනත් අක්ෂර ද භාවිත කර ඇත. ඒ කාලයේ ලියැවුණු **සද්ධර්මරත්නාවලිය** නමැති කෘතියෙන් උපුටා ගත් පහත සඳහන් පාඨ විමසා බලමු.

“දහසක් රසින් බබළන අ**භි**නව සූර්යයා මෙන්....”

“**ඵු**ල්ල තිස්ස තෙරුන් වහන්සේ නම් **ශු**ද්**ධෝ**දන රජ්ජුරුවන්ගේ නැඟණි කෙනෙකුන්ගේ පුතණුවන් වහන්සේ ය. මහණව රූක්**ෂ** ප්‍රතිපත්ති නමැති රළු පරළු දෙය හැර... ”

“...පි**ධා**නයක් හරන කලක් මෙන් මු**ඛ** පද්මය විවෘත කොට...”

මෙම පාඨවල තද කළු පැහැයෙන් දක්වා ඇත්තේ, පාඩමේ ඉහත දැක්වුණු අක්ෂර මාලාවේ නියෝජනය වී නැති අකුරු ය. මහාප්‍රාණ අකුරු, තාලුජ ‘ශ’ හා මූර්ධජ ‘ෂ’ යන අකුරු ඒ අතර වෙයි.

අතීතයේ පද්‍ය රචනා කිරීමේ දී මහාප්‍රාණ අක්ෂර භාවිතයක් දක්නට නො ලැබිණි.

"තමා වරදස නොදිස්නේ - මෙරමා දොස් මැ දිස්නේ"
**කව්සිළුමිණ**

"දෙමාපිය සිනෙහැති - වඳිනුව පා පියුම් පෙති
එකුමරු නැමී ගති - ඔවුන් කඳුළින් පිට තෙමී ගති"
**කාව්‍යශේඛරය**

එවකට ලියැවුණු පද්‍ය ග්‍රන්ථවල නො යෙදුණ ද ගද්‍ය ග්‍රන්ථයන්හි මහාප්‍රාණ අක්ෂර යෙදුණු බව ඉහත සඳහන් කෙරිණි. මහාප්‍රාණ අකුරු හා ශ, ෂ, අකුරු හමු වන්නේ පාලි හා සංස්කෘත යන භාෂාවල පමණි. සිංහල ගද්‍ය කෘතිවල පාලි හා සංස්කෘත වචන යොදා ඇති බැවින් අපට මහාප්‍රාණ හා ශ, ෂ වැනි අකුරු ඒවායින් හමු වෙයි. 'ච' අක්ෂරය ද හමු වන්නේ පාලි හා සංස්කෘත වචනවල පමණි. සිංහල පද්‍යයේ නො යෙදුණු, සිදත් සඟරා හෝඩියෙහි නො දැක්වෙන තවත් අකුරු කිහිපයක් ද ගද්‍ය ග්‍රන්ථවල හමු වෙයි. ගද්‍ය ලේඛනය සඳහා භාවිත කෙරෙන මහාප්‍රාණ අකුරුත්, ශ, ෂ, ච යන අකුරුත් ඇතුළත් අක්ෂර මාලාව මිශ්‍ර සිංහල හෝඩිය යනුවෙන් හැඳින්වේ.

වර්තමානයේ භාවිත කෙරෙන මිශ්‍ර සිංහල අක්ෂර මාලාව අකුරු හැටකින් සමන්විත ය. එහි සඤ්ඤක අක්ෂර ද ඇතුළත් වේ.

## වර්තමානයේ භාවිත කෙරෙන සිංහල අක්ෂර මාලාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ස්වර | අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| | උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| | එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| ව්‍යඤ්ජන | (අ)ං | (අ)ඃ | | | | |
| | ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| | ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| | ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| | ත | ථ | ද | ධ | න | ඳ |
| | ප | ඵ | බ | භ | ම | ඹ |
| | ය | ර | ල | ව | | |
| | ශ | ෂ | ස | හ | ළ | ෆ |

අද භාවිත කෙරෙන සිංහල හෝඩියට අකුරු හැටක් ඇතුළත් වී ඇත්තේ කලින් කල භාෂාවේ සිදු වූ වෙනස්කම්වල ප්‍රතිඵල වශයෙනි.

පාලි, සංස්කෘත භාෂාවල බලපෑම නිසා ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ යන ස්වරත් මහාප්‍රාණ අක්ෂර හා ඞ, ච, ඤ, මූර්ධජ ෂ, තාලුජ ශ, (අ)ඃ යන ව්‍යඤ්ජනත් සිංහල අක්ෂර මාලාවට එක්ව තිබේ. හෝඩිය අවසානයෙහි දැක්වෙන ෆ සංකේතය ඉංගිරිසි හා ඕලන්ද වැනි භාෂාවල F/Ph යනුවෙන් ලියා දක්වනු ලබන ශබ්දය සිංහල ලේඛනයේ දැක්වීමට සකස් කර ගත්තකි.

සඤ්ඤක අක්ෂර සිංහල භාෂාවට ම අනන්‍ය වූ අක්ෂර විශේෂයකි.

## අල්පප්‍රාණ - මහාප්‍රාණ අක්ෂර භාවිතය

වර්තමානයේ භාවිත කෙරෙන සිංහල හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර අතර මහාප්‍රාණ අක්ෂර 10ක් හා ඊට අනුරූප අල්පප්‍රාණ අක්ෂර 10ක් තිබේ.

- **අල්පප්‍රාණ අක්ෂරඃ**

| | |
|---|---|
| ක | ග |
| ච | ජ |
| ට | ඩ |
| ත | ද |
| ප | බ |

උච්චාරණය කිරීමේ දී අඩු හඬකින් ශබ්ද වන මේ අකුරු අල්පප්‍රාණ ලෙස හැඳින්වේ.

- **මහාප්‍රාණ අක්ෂරඃ**

| | |
|---|---|
| ඛ | ඝ |
| ඡ | ඣ |
| ඨ | ඪ |
| ථ | ධ |
| ඵ | භ |

මහාප්‍රාණ යන්නෙහි අරුත 'උච්චාරණයේ දී ශ්වසන වායුව වැඩි ප්‍රමාණයක් පිට කරමින් ශබ්ද කරන' යනු යි. මහාප්‍රාණ ශබ්ද උච්චාරණයේ දී මුඛයෙහි

ක්‍රියාකාරිත්වය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ඔබට අල්පප්‍රාණ-මහාප්‍රාණ භේදය යනු කුමක් දැයි නිරාකරණය කර ගැනීම පහසු වනු ඇත. අල්පප්‍රාණ ශබ්දය මුවින් පිට වන විට ඒ සමග නිකුත් වන වායු ධාරාවේ ප්‍රමාණයට වඩා වැඩි වායු ධාරාවක් මහාප්‍රාණ ශබ්ද උච්චාරණයේ දී නිකුත් වනු හැඳින ගත හැකි ය.

සිංහල ලේඛනයෙහි මහාප්‍රාණ අක්ෂර හමු වන්නේ පාලි හා සංස්කෘත භාෂාවලින් ගත් ඇතැම් වචන ලිවීමේ දී පමණි.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා: | ඛ | - ලේඛන | ඝ | - | සංඝ |
| | ඡ | - සාකච්ඡා | ඣ | - | සජ්ඣායනා |
| | ඨ | - පාඨශාලාව | ඪ | - | ගූඪ |
| | ථ | - ග්‍රන්ථ | ධ | - | වර්ධන |
| | ඵ | - ප්‍රතිඵල | භ | - | ප්‍රභවය |

## සඤ්ඤක අක්ෂර භාවිතය

මිශ්‍ර සිංහල හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර අතර "සඤ්ඤක" යනුවෙන් හැඳින්වෙන අකුරු 5ක් ඇත. ඒවා නම් ඟ, ඦ, ඬ, ඳ, ඹ යන අකුරු යි. මෙයින් සඤ්ඤක ඦ යන්න වර්තමාන ලේඛන ව්‍යවහාරයේ දක්නට නැත. සඤ්ඤක අකුරු පදයක මුල නො යෙදෙන අතර හල් වී යෙදෙන්නේ ද නැත.

පහත දැක්වෙන කවියෙහි සඤ්ඤක අකුරු සහිත වචන යෙදී ඇති ආකාරය නිරීක්ෂණය කරන්න.

නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි
පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬි
සල සුදු සෙමෙර සේසත් ගිජිඳුනොද වැඩි
බල සුබ නිමිති පෙරමඟ නැකතටත් වැඩි

නිසි පරිදි සඤ්ඤක නො යෙදීමෙන් වචනවල අර්ථ වෙනස් විය හැකි ය.

අග - අඟ
අඩ - අඬ
අද - අඳ
අබ - අඹ

# අක්ෂර වින්‍යාස රීති

ලේඛනයේ එන කිසියම් පදයකට අයත් අක්ෂර එකිනෙකට ගළපා ලියනු ලබන අනුපිළිවෙළ අක්ෂර වින්‍යාසය යනුවෙන් හැඳින්වේ. පොදුවේ සිංහල ලේඛකයන් අතර පිළිගැනීමට ලක් වී ඇති අක්ෂර වින්‍යාස රීති හෙවත් රටා සමූහයක් සිංහල ලේඛන ව්‍යවහාරයේ හඳුනා ගත හැකි ය. එහෙත් ඇතැම් පදවල අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති දැක්විය නො හැකි ය.

නූතන සිංහල ලේඛන ව්‍යවහාරයේ අක්ෂර වින්‍යාස පිළිබඳ පොදු රීති මාලාවක් පහත දැක්වේ.

## න, ණ අක්ෂර භාවිතය

"ණය" යන වචනය හැරුණු විට, වෙනත් කිසිදු නූතන සිංහල වචනයක ආරම්භයෙහි "ණ" කාරය නො යෙදෙයි.

ණය, ණයකාරයා, ණයගැති, ණයමුදල්

පදයක අවසානයේ ''ණ'' කාරය යෙදෙතත් එය හල් වී නො යෙදේ. පදාවසානයේ හල් වී යෙදේ නම් එය අනිවාර්යයෙන් ම දන්තජ ''න්'' විය යුතු ය.

| | | | |
|---|---|---|---|
| අත්සන් | (අත්සන) | ඉක්මන් | (ඉක්මන) |
| කන් | (කන) | පහන් | (පහන) |

නාම පදවල හා විශේෂණ පදවල "ර" යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරය යි.

| | | | |
|---|---|---|---|
| ර | ණ | අධිකරණ | අසාධාරණ |
| | | උපකරණ | පුරාණ |
| | | පරිණාමය | දරුණු |

හල් "ර" යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරය යි.

| | | | |
|---|---|---|---|
| ර් | ණ | කර්ණ | අසම්පූර්ණ |
| | | වර්ණ | සංකීර්ණ |

රකාරාංශය සහිත අක්ෂරයකට පසුව ද යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරය යි.

| | |
|---|---|
| ආමන්ත්‍රණ | ප්‍රණාම |
| මුද්‍රණ | ශ්‍රේණිය |

ගැටය සහිත ඇලපිල්ලට පසුව ද මූර්ධජ “ණ” කාරය යෙදෙයි.

සෘණ තෘණ

- **ඉහත සඳහන් රටාවලට අනුකූල නො වන අවස්ථා කීපයක් ද සිංහල ලේඛන ව්‍යවහාරයේ හමු වෙයි.**

“ර” යන්නට පසුව “ණ” කාරය යෙදෙතත්, “ර” යන්නට පසුව යෙදෙන “න” අක්ෂරය පදයේ අවසාන අකුර නම් එය දන්තජ “න්” අකුර ම වෙයි.

| | | | |
|---|---|---|---|
| ර/න් | පුරන් | මිතිරන් | තොරන් |
| | රන් | බමරුන් | මසුරන් |

“ත” “ථ” “ද” “ධ” “න” යන අකුරකට මුලින් හල් වී යෙදෙන්නේ දන්තජ “න්” අක්ෂරය යි.

| | | | | | |
|---|---|---|---|---|---|
| න් | ත | න්ත | : | ප්‍රාන්ත | චිරන්තන |
| | ථ | න්ථ | : | ග්‍රන්ථ | ග්‍රන්ථීය |
| | ද | න්ද | : | මකරන්ද | චන්දන |
| | ධ | න්ධ | : | අන්ධ | සුගන්ධ |
| | න | න්න | : | ඔටුන්න | පැරැන්නෝ |

ක්‍රියා පදවල “ර” කාරයට පසුව යෙදෙන්නේ දන්තජ “න” කාරය යි.

කරනවා - කරනු - කරන
දරනවා - දරනු - දරන
හදාරන - හදාරනු - හදාරන

ඉංග්‍රීසි, අරාබි වැනි භාෂාවලින් සිංහලයට පැමිණි පදවල “ර” කාරයට පසුව දන්තජ “න” කාරය ලිවිය යුතු ය.

අර්නස්ට් (Earnest) වර්නන් (Vernan)
කුරානය (Quaran) ඉරානය (Iran)
නියුරෝනය (Neuron) ලර්නර්ස් (Learners)

මූර්ධජ “ෂ” කාරයට පසුව යෙදෙන්නේ මූර්ධජ “ණ” කාරය යි.

| | | | |
|---|---|---|---|
| ෂ | ණ | තෘෂ්ණාව | පාෂාණ |
| | | දූෂණ | භික්ෂුණී |

තාලුජ "ශ" කාරයට පසුව යෙදෙන්නේ දන්තජ "න" කාරය යි.

| ශ | න | | |
|---|---|---|---|
| | | දේශන | ප්‍රශ්න |
| | | දර්ශන | විමර්ශන |

දන්තජ ස-යන්නට පසුව යෙදෙන්නේ දන්තජ "න" යන්න යි.

අස්සන　　　　වස්සාන
අස්න　　　　ලස්සන

එහෙත් "ශ" යන්නෙහි රකාරාංශයක් සහිත නම් එතැන යෙදෙන්නේ මූර්ධජ "ණ" යන්න යි.

මිශ්‍රණ　　　ශ්‍රේණි　　　සම්මිශ්‍රණ

"ට" "ඨ" "ඩ" "ඪ" "ණ" යන මූර්ධජ අක්ෂරවලට මුලින් මූර්ධජ "ණ" අකුර යෙදේ.

| ණ් | | |
|---|---|---|
| | ට | සණ්ඨාර, කණ්ටක |
| | ඨ | අභිගුණ්ඨික, කණ්ඨජ |
| | ඩ | අඛණ්ඩ, ආණ්ඩු |
| | ණ | තම්බපණ්ණි, වණ්ණනා |

- **එසේ වුව ද පහත දැක්වෙන පද තුන් වර්ගය කෙරේ ඉහත රීතිය බල නො පායි.**

යුරෝපීය භාෂාවලින් ආ පද :

ඇන්ටෙනාව (antenna)　　　කැලැන්ඩරය (calander)
ටෙන්ඩරය (tender)　　　වැලන්ටයින් (valentine)

පහත දැක්වෙන වර්ගයට අයත් ක්‍රියා පද :

කරන්ට　　　කරන්ඩ
සිතන්ට　　　සිතන්ඩ

"ට" යන්නෙන් සම්බන්ධ වන නාම පද :

දරුවන්ට　　　ඔවුන්ට
කාන්තාවන්ට　　　මිනිසුන්ට

ගෞරවාර්ථය හැඟවීමට භාවිත කෙරෙන පදවල මූර්ධජ "ණ" යන්න යෙදේ.

පියාණෝ, පියාණන් පුතණුවෝ, පුතණුවන්
දියණියෝ, දියණියන් පුතණ්ඩ, මලණ්ඩ

පහත දැක්වෙන වර්ගයේ ක්‍රියා පදවල මූර්ධජ "ණ" කාරය යෙදේ.

i. ලැබිණ, ලැබිණි වැටිණ, වැටිණි දැනිණ, දැනිණි
ii. ලැබුණ, ලැබුණු ඇසුණ, ඇසුණු යෙදුණ, යෙදුණු
iii. ලැබුණා ය, ලැබුණාහ, ලැබුණෙමි, ලැබුණෙමු, ලැබුණේ ය
ලැබුණොත්, ලැබුණෝ ය

පහත දැක්වෙන ආකාරයේ අතීත කාල ක්‍රියා පදවල මූර්ධජ "ණ" කාර දෙකක් යෙදේ.

ඇමිණිණ, ඇමිණිණි ඇමුණුණ, ඇමුණුණු
ගැණිණ, ගැණිණි ගැණුණ, ගැණුණු
පැමිණිණ, පැමිණිණි පැමුණුණ, පැමිණුණු
විකිණිණ, විකිණිණි විකිණුණ, විකිණුණු

"-න්න" යනුවෙන් අවසන් වන ඒක වචන නාම පදවල, යෙදෙන්නේ දන්තජ "න" කාරය යි.

| | | | |
|---|---|---|---|
| ඉන්න | : ඉනි | ගින්න | : ගිනි |
| ඔටුන්න | : ඔටුනු | දුන්න | : දුනු |
| ඇතින්න | : ඇතිනි | යකින්න | : යකිනි |

දෙමළ බසින් ආ පදවල හමු වන මූර්ධජ "ණ" කාරය ඒ ආකාරයෙන් ම නිරූපණය කිරීම හෝ ඒ වෙනුවට දන්තජ "න" කාරයකින් ලිවීම හෝ කළ හැකි ය.

කණ්ණාඩි/කන්නාඩි (දෙ. කණ්ණාඩි)
වණ්ණම/වන්නම (දෙ. වණ්ණම්)

## ල, ළ අක්ෂර භාවිතය

මූර්ධජ "ළ" යන්නෙන් ආරම්භ වන පද ඒවායේ අර්ථ අනුව ප්‍රභේද කීපයකට වෙන් කළ හැකි ය.

i. **හෘදය, හදවත, සිත, පපුව යන අර්ථය දෙන පද :**
ළබැඳි, ළමැද, ළය, ළැම, ළෙන්ගතු

ii. **ළපටි, බාල, නො මේරූ යන අර්ථය දෙන පද :**
ළද, ළදැරිය, ළපලු, ළහිරු, ළාබාල

iii. **සමීප, ආසන්න, නුදුරු යන අර්ථය දෙන පද :**
ඊළඟ, ළං (වෙනවා), ළඟ, ළඟින්

iv. **වෙනත් පද :**
ළඳ (කාන්තාව), ළමා, ළැහැබ, ළිඳ, ළැව්

පදයක අවසානයේ "ළ" කාරය යෙදෙතත්, පද අවසානයෙහි හල් වී යෙදෙන්නේ දන්තජ "ල" අකුර මිස මූර්ධජ "ළ" අකුර නො වේ.

කකුල (කකුල්)      තොල (තොල්)

"ල්ල" යන ආකාරයට යෙදෙන පදවල යෙදෙන්නේ දන්තජ "ල" අකුර යි.

ඇඟිල්ල - ඇඟිලි      සියල්ල - සියලු
මහල්ලා - මහලු      මල්ල - මලු

"පිළි" යන්නෙන් ආරම්භ වන පද මූර්ධජ "ළ" කාරය සහිතව ලිවිය යුතු ය.

පිළිගන්නවා      පිළිතුරු
පිළිබඳ      පිළිවෙළ

'පොළ' යන්න මූර්ධජ "ළ" කාරය සහිතව යෙදේ.

අඹන්පොළ      වෙළඳපොළ
ගම්පොළ      වැඩපොළ
දුම්රිය පොළ      ගුවන් තොටුපොළ

දෙමළ බසින් ආ පදවල හමු වන මූර්ධජ "ළ" කාරය ඒ ආකාරයෙන් ම නිරූපණය කිරීම හෝ ඒ වෙනුවට දන්තජ "ල" කාරයකින් ලිවීම හෝ සිදු කළ හැකි ය.

කළපුව/කලපුව (දෙ. කළප්පු)
මාළිගාව/මාලිගාව (දෙ. මාළිකෛ)

## ශ, ෂ, ස අකුරු භාවිතය

තාලුජ "ශ" යන්නෙන් ඇරඹෙන වචන රාශියක් මිශ්‍ර සිංහලයේ ඇත.

| | | |
|---|---|---|
| ශබ්ද | ශස්‍ය | ශාස්ත්‍ර |
| ශතක | ශල්‍ය | ශිඛර |
| ශරීර | ශක්‍ර | ශුද්ධ |

"ව" යන්නට මුලින් "ශ" යෙදේ.

අශ්වයා, ආශ්වාස, විශ්වය, විශ්වාස

"ච" යන්නට මුලින් "ශ" යෙදේ.

| | |
|---|---|
| ආශ්චර්යය | නිශ්චල |
| පශ්චාත් | පශ්චිම |

ශ, ෂ අකුරු එක ළඟ යෙදෙන විට "ශ" යන්න මුලින් යෙදේ.

| | |
|---|---|
| විශේෂ | ශිෂ්ටාචාරය |
| ශිෂ්‍යයා | අවශේෂ |

"ශ" අකුරු දෙකක් එකට යෙදීම

| | |
|---|---|
| නිශ්ශබ්ද | දුශ්ශීල |

ට, ඨ, ක, ප අක්ෂරවලට මුලින් මූර්ධජ "ෂ" යෙදේ.

ට : විශිෂ්ට, දුෂ්ට, අනිෂ්ට
ඨ : කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ධර්මිෂ්ඨ
ක : ශුෂ්ක, දුෂ්කර, අපේක්ෂක, නිෂ්ක්‍රීය
ප : පුෂ්ප, නිෂ්ඵල, වාෂ්ප, නිෂ්පාදන

“ත” යන්නට මුලින් දන්තජ “ස” යන්න යෙදේ.

පුස්තකාල
ප්‍රස්තාර
වස්තු
විස්තර
සමස්ත
ප්‍රස්තාව
වාස්තු

වෙනත් අවස්ථා

ආභාසය
විස්මය
ආස්වාදය
කොට්ඨාස

## අවබෝධය

1. පැරණි හෝඩියේ නොමැති වුවත් වර්තමානයේ භාවිත සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් අක්ෂර වර්ග දෙකක් නම් කරන්න.
2. සිදත් සඟරා හෝඩියේ ඇති ස්වර අකුරු ලියා දක්වන්න.
3. සඤ්ඤක අකුරු ලියා දක්වන්න.
4. සිංහල අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර කීය ද? ඒ මොනවා ද?
5. සිදත් සඟරා හෝඩියේ ඇතුළත් නො වූ නමුත් එය ලියැවුණු යුගයේ පොත පතෙහි යෙදුණු ස්වරයක් පාඩම ඇසුරෙන් නම් කරන්න.

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන කවියෙහි යෙදී ඇති සඤ්ඤක අකුරු සහිත පද උපුටා දක්වන්න.

සල් සපු කිණිහිරි දොඹ රැ රඟ නා මිදෙලී
පුල් එරහැඳි හෝපලු මී අඹ පළොලී
පොල් පුවකුඟු රඹ මල බුලත සලිමලී
නිල් ගන සා සෙවණලු දෙතෙර මනකලී

2. **පහත සඳහන් පාඨය කියවා එහි යෙදී ඇති මහාප්‍රාණ අක්ෂර සහිත වචන උපුටා දක්වන්න.**

"ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන මේ ශ්‍රී ලංකාද්වීපයෙහි සතුරු ගනඳුරු බිඳ හැර ධවල ඡත්‍ර නැංවූ ශ්‍රේෂ්ඨ නරපතියකු වූ වට්ටගාමිණී අභය මහ රජුගේ රාජ්‍ය සමයේ මාතලේ අලු ලෙනේ දී මහා සංඝ රත්නය විසින් ත්‍රිපිටක ධර්ම සංගායනාවක් පවත්වා අඛණ්ඩව ආරක්ෂා කර ගැනීම සඳහා ග්‍රන්ථාරූඪ කර තැබීම ශාසන ඉතිහාසයේ වඩාත් ප්‍රතිඵල දායක වූ සංසිද්ධියකි."

3. **පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට සුදුසු වචනය ඉදිරියේ ඇති වරහනින් තෝරා වාක්‍යය සම්පූර්ණ කරන්න.**

i. සම්ප්‍රදායානුකූලව පොල් තෙල් ..................... දල්වා උත්සවය ආරම්භ කෙරිණි. (පහණ - පහන)

ii. සඳ ..................... පතිතව කුමුදු මල් පිපෙයි. (කිරන - කිරණ)

iii. ..................... ජීවීන් රැක ගැනීම අපේ යුතුකමකි. (වන - වණ)

iv. හිරු බැස යත් ම ..................... අඳුර පැතිරෙන්නට විය. (ගණ -ගන)

v. නැණ ..................... පිරිපුන් දරුවන් හදමු. (නුවණින් - නුවනින්)

vi. හමන මඳ ..................... ගිමන නිවයි. (නළ - නල)

vii. ඔහුගේ ගායනය සිත් ඇද ගන්නා ..................... විය. (සුළු - සුලු)

viii. දේශනයේ දී ඔහු ..................... කළ අදහස් කවුරුත් අගය කළහ. (පල - පළ)

ix. පිපී වැනෙන ..................... පියුම් වනය වැවෙහි අසිරිය කියා පායි. (හෙල - හෙළ)

x. සමහරු ..................... යට ගිනි මෙන් සිතෙහි වෛරය රැක ගනිති. (අලු - අළු)

4. **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා ලියන්න.**

i. ශිෂ්ඨාචාරය, ශිෂ්ටාචාරය, ශිස්ටාචාරය
ii. විශ්මය, විෂ්මය, විස්මය
iii. නිෂ්ඵල, නිශ්පල, නිස්ඵල
iv. ආශ්වාද, ආෂ්වාද, ආස්වාද
v. කොට්ඨාශය, කොට්ඨාසය, කොට්ඨාෂය
vi. දුෂ්ට, දුශ්ට, දුස්ට
vii. ප්‍රස්තාර, ප්‍රශ්තාර, ප්‍රෂ්තාර
viii. ආහාෂය, ආහාශය, ආහාසය
ix. නිස්ශබ්ද, නිශ්ශබ්ද, නිෂ්ශබ්ද
x. විශේෂණ, විෂේශණ, විසේසන

5. **පහත දැක්වෙන ඡේදවල අක්ෂර වින්‍යාස දෝෂ සහිත ස්ථාන නිවැරදි කර ලියන්න.**

i. කඩපොලට ගිය තාත්තා එන තුරු මම කඩුල්ල ලග බලා සිටියෙමි. ඒ ඔහු මට ටොපි දෙකක් රැගෙණ එනු ඇතැයි යන විෂ්වාසයෙනි. අදුර ගලා එද්දී ඈත අහසේ හද පායා එනු පෙනුණි.

i. භාශාවේ විෂේශත්වයක් වන්නේ ලේඛණයට හා කතනයට බාවිත කල හැකි වීම යි. සිංහල බාශාව සැලකූ විට එහි කතන ස්වරූඵයේ ලේඛණ ස්වරූපයට වඩා වෙනස්කම් පවතින බව පෙණේ.

6. **පහත සඳහන් වචන ඇතුළත් අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.**

i. ප්‍රදාන ii. නුවණ
iii. නුබ iv. කඳ

## ප්‍රායෝගික අභ්‍යාස

1. **සිංහල අක්ෂර මාලාව විවිධ අක්ෂර වර්ග සඳහා විවිධ වර්ණ සහිතව ලියා සටහනක් පිළියෙල කරන්න.**

2. **පුවත්පතක ලිපියක් තෝරා ගෙන එහි අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන තිබේ නම් නිවැරදි කරන්න.**



# 4 ඔයි රයිරේ ඔයි රාමා

භූගෝලීය සාධක, පාරිසරික විශේෂතා, නිෂ්පාදන ක්‍රම, ජීවන ක්‍රම ඇදහිලි, විශ්වාස, සිතුම් පැතුම් ආදි හේතු නිසා විවිධ වූ ව්‍යවහාර රැසක් සිංහල භාෂාවට එකතු වී ඇත. වී ගොවිතැන හා බැඳුණු සිරිත් විරිත් හා ඒ ආශ්‍රිත ජන වහර මේ අතුරෙන් විශේෂිත ය. 'වී' බුද්ධ භෝගයක් ලෙස සැලකේ. කමත හා වී අතර බුදුන් වහන්සේගේ හා දෙවියන්ගේ සම්බන්ධතාවක් ඇතැයි සිංහලයෝ විශ්වාස කරති. වී ගොවිතැන හා බැඳුණු බස් වහර හා සිරිත් විරිත් මොනවා දැයි හඳුනා ගන්නට මේ පාඩම ඔබට උපකාරී වනු ඇත.

අනුරාධ, ඔහුගේ මවත් සමග ගමට ගියේ දින තුනක නිවාඩුව ගත කිරීමට ය. තම මාමාගේ පුතා වන සිරිමල් සමග සෙල්ලම් කිරීම තරම් සතුටක් ඔහුට නැත. මේ නිවාඩුව ලැබීමේ සතුට දෙගුණ තෙගුණ වූයේ මාමලාගේ කුඹුරේ ගොයම් පෑගීම ද මෙදිනට ම යෙදී තිබීම නිසා ය.

හිරු අවරට යන්නට පෙර දාවිත් රාලහාමි ඇතුළු ගොවි පිරිස කමතට යන්නට සූදානම් වූහ. සිරිමල් හා අනුරාධත් ඔවුන් හා එක් වූහ.

"පුතේ, අම්මාගෙන් යතුර ඉල්ලගෙන එන්න."

"හොඳයි අප්පච්චි"

"මොකට ද අයියේ කුඹුරට යතුරක්" අනුරාධ ඇසී ය.

"මල්ලී, ගොයම් පාගන තැන කතා කරන්නේ ගෙදර කතා කරන වචනවලට වඩා වෙනස් වචන. කමතේ වචන හරි ම වෙනස්. දැන් අප්පච්චි මට ගේන්න කිවුවේ කුල්ල. කුල්ලට තමයි කමතේ දී යතුර නැත්තම් යතුරු ගොයියාව කියන්නේ."

"අම්මේ යතුර කෝ? අප්පච්චි ගේන්න කිවුවා"

"යතුර වී බිස්ස ළඟ එල්ලලා ඇති පුතේ, මේ රතු ගගුලත් කමතට ගෙනියන්න. මල්ලිත් එක්ක" කියමින් බණ්ඩාර මැණිකේ හකුරු සමග තේ කහට පෝච්චියක් සිරිමල්ට දුන්නා ය.

"අයියේ, තේ කහටවලට නේද, රතු ගගුල කියන්නේ?"

"ඔව්, මල්ලී, හකුරුවලට කියන්නේ 'රස බෝය' කියලා. අපි ඉක්මනට යමු. දැන් අප්පච්චි අරක් වළේ, අරක් වස්තු තැන්පත් කරන්න ලෑස්ති වෙනවා ඇති."

"අයියේ, කමතේ දී මට අරක් වළ පෙන්නන්න හොඳේ."

කමත අසලට පැමිණ තේ කහට සහ හකුරු භාජනය මැස්ස මත තැබූ සිරිමල්, අනුරාධගේ අතින් අල්ලා ගත්තේ ය.

"මල්ලී, ගොයම් පාගන්න පැදුරු එළලා තියන තැනට කියන්නේ 'පාවර' කියලා. 'කමත' කියන්නේ කොළ මඩවන මුළු බිමට ම. කමතට 'කලවිට' කියලත් කියනවා. අර කමත මැද අප්පච්චි ඉන්න තැන තමයි අරක් වළ තියෙන්නේ. යමු එතැනට."

"අප්පච්චි, මේ අනුරාධ මල්ලිට අරක් වළ ගැන කියලා දෙන්නකෝ"

"එන්න පුතේ, ගොයම් කමතෙන් තියන නැකතත් ළඟ යි. මෙන්න මෙතැන තමයි අරක් වළ" යි කියමින් ඔහු කමත මැද, අරක් වළ මත තැන්පත් කරන්නට සූදානම් කර ඇති අරක් වස්තු ගැන ද පැහැදිලි කළේ ය.

මුලින් ම කහ වතුර ඉහලා හඳුන් කිරි පැන් ඉහලා තමයි නිදන් වස්තු තියන්නේ. අරක් වළ මැද 'ගොන් කණුව' හිටවනවා. මේවා තමයි අරක් වස්තු. මේ කටු හක් බෙල්ලාට කියන්නේ. 'අරක් බෙල්ලා' කියලා. මේ ඖෂධ පොට්ටනියට කියන්නේ 'අරක් මුත්තා' කියලයි. යකඩ කෑල්ලකුත් තැන්පත් කරන්න ඕනෑ. ඒ නිසා තමයි, අපි මේ 'ලියන්නාව' තියන්නේ'යි කියමින් දාවිත් රාලහාමි දෑකැත්තක් පෙන්වී ය. බුලත් සහ පුවක් ද එතැනින් තැබූ ඔහු,

"පුතේ මේ සේරම අපේ චාරිත්‍ර. පාවර ආරක්ෂා කරන්නටයි මේ සිරිත් කරන්නේ. දැන් වෙලාව හරි. පුතාලා පාවරෙන් එහාට වෙලා බලා ගෙන ඉන්න." දාවිත් රාලහාමි අරක් වස්තු නිදන් කර වැඳුම් පිදුම් ආරම්භ කළේ ය.

"අන්න අයියේ, මාමා අළුවලින් මොකක් ද අඳිනවා."

"ආ...ඒ අඳින්නේ කමත් යන්තරේ. ඔය යන්තරේට 'අටමගල' කියලත් කියනවා. 'අළුහන් වඩනවා' කියන්නේ ඔය චාරිත්‍රයට තමයි."

"අර ලොකු ගොයම් ගොඩ ළඟට යමු අයියේ."

"එතැනට දැන් ම යන්න බැහැ. ඒ ගොයම් ගොඩට කියන්නේ 'වට මළුව' කියලා. 'ගොයම් කොළය' කියලත් කියනවා. ඔයා බලා ගෙන ඉන්නකෝ දැන් අප්පච්චි මොකද කරන්නේ කියලා."

දාවිත් රාලහාමි වට මළුව වෙත ගොස් එහි හතර පැත්තෙන් 'උප්පිඩ' බැගින් ගෙන අරක් වළ වසා ඇති සුදු පිරුවටය මත තබා වී කරල් අතින් පොඩි කර ගොයමින් වෙන් කර ගත් වී ඇට කමත පුරා ඉස්සේ ය.

"ඇයි අයියේ කමත පුරා වී ඉහින්නේ?"

"ඒකත් චාරිත්‍රයක්. ඒකට කියන්නේ 'බැත වඩනවා' කියලා. හැබැයි කමතේ දී වීවලට කියන්නේ 'බැත' කියලා. දැන් වට මළුවේ ගොයම්, පාවරට ගෙනෙයි. බෝලත්තෙන් කමත අතු ගාලා කහ වතුර ඉහලා තමයි 'මහප්පිඩ' මුලින් ම පාවරෙන් තියන්නේ."

“සිරිමල් පුතේ, සියාතු මාමාත් එක්ක මුදුනා පාවරට අරගෙන එන්න.”

දාවිත් රාලහාමි කමතට ගෙනා මුදුනා අරක් වළ මැද සිටුවා ඇති ගොන් කණුවේ බැන්දේ ය. මුදුනා සමග අම්බරුවෝ සතර දෙනෙක් ආදින ලදහ. දාවිත් ඇතුළු ගොවි පිරිස පාවරට වැද, කොළ ගොන් ගැහීම ආරම්භ කළහ. අම්බරුවන් දක්කමින් ගොයම් මැඩීමට ආසාවෙන් බලා සිටි අනුරාධ, සිරිමල් සමග පාවරට පය තැබී ය.

“එන්න මල්ලී අපි ගොන්කාරයෝ වෙමු” යි කියමින් සිරිමල් කෙවිට අතට ගත්තේ ය. අනුරාධගේ අතට ද දිග කෝටුවක් දුන් සිරිමල්, “මල්ලිත් මේ කෙවිට ගන්න” යි කියමින් ඕසේ ඇදීම ඇරඹී ය. අඬහැරයේ හඬ වෙල් යාය පුරා දෝංකාර දෙන්නට විය.

“හෝ.......හෝ.......අම්මා......යා........න්........අප්පා......ඔයි......රයිරේ.......ඔයි රාමා......කොළ මැඩපා....න්.....හොයි......රාමෝ......”

“අයියේ, ඔන්න, ඔන්න,” කියමින් අනුරාධ පසෙකට වූයේ මුහුණ හකුළා ගෙන, නැහැය ද වසා ගනිමිනි.

“ආ....හරි, හරි” කියමින්, සිරිමල් මැඩුවන් ටිකක් දැතට ගෙන අම්බරුවන් හෙළන ගොම්පස් අල්ලා ඒවා පාවරට වැටීම වළක්වා කමතෙන් පිටතට වීසි කළේ ය.

“අයියෝ මල්ලී, ඒවට කැත හිතලා බෑ. ගොම්පස් පාවරට වැටෙන්න දෙන්නේ නෑ. බැතට ගොම්පස් වැටෙන එක හොඳ නෑ. අන්න, මල්ලී අර කලාතයා පාවරෙන් පිට යන්නේ. ඌව මෙහාට ගන්න.”

“කවුද අයියේ? කොහේ ද, කලාතයා ඉන්නේ?”

“ආ.....මට ඒක කියලා දෙන්න බැරි වුණා. මේ ගොන් කණුව ළඟ ම ඉන්නේ මුදුනා. එයා තමයි මේ ඇඳුත්තේ නායකයා.”

“ඊ ළඟට කොළමුත්තා. ඊ ළඟට එළිවිස්සා. ඊ ළඟට මට්ටයා. අන්තිමයා තමයි කලාතයා. එයා හැම තිස්සේ ම පාවරෙන් එළියට යන්න බලනවා. මේ හැමෝට ම කමතේ දී කියන්නේ හරක් කියලා නෙවෙයි, ‘අම්බරුවෝ’ කියලා.”

"හා..හා.. යමු දරුවනේ, සේදැරි කරමු. සේදැරි කරමු."

හෝ.....හෝ.....අම්මා.....යා.....න්......අප්පා.......

කියමින් සියාතු අම්බරුවන් දක්කන්නට විය.

"මල්ලී අපි වැඩ ඉක්මන් කරමු. සියාතු මාමා අපට කිවුවේ ඒකයි."

මේ කතාබහ අතර කොළමුත්තා ගොයම් කන්නට විය. එය දුටු සිරිමල්,

"මල්ලී, ඔය කොළමුත්තා ගොයම් 'සාත්තු' වෙනවා, කෙවිටෙන් තට්ටු කරලා ගමන ඉක්මන් කරවන්න."

මදුරුවන්ගෙන් ආරක්ෂා වීමේ හා ආලෝකය ලබා ගැනීමේ අරමුණින් කමතෙන් පිට ගිනිමැළ ගැසීම සාමාන්‍යයෙන් සිදු වන්නකි. සාදිරිස් උන්නැහේ ගිනි මොළවන්නට කොළ රොඩු හා දර රැස් කළේ ය. කමතේ දී මේ ක්‍රියාව හඳුන්වන්නේ 'රත්තා බෝ කිරීම' යනුවෙනි. සාදිරිස් රත්තා බෝ කරද්දී විලියම් පැඟිරි බෝය පුරන්නට විය. 'පැඟිරි බෝය පිරීම' යනු බුලත් විට කෑම යි. මේ අතර බණ්ඩාර මැණිකේ, බිසෝ මැණිකේ, මැගිලින් සහ අනුරාධගේ මව ඇඹුල රැගෙන කමතට සේන්දු වූහ. එහෙත් කාන්තාවන්ට කමත තහංචි ය.

කෑමවල සුවඳ දැනුණු විට අනුරාධගේ බඩගින්න පෙරට ආවේ ය.

"අයියේ, අපිත් බත් කමු."

"මල්ලී, කමතේ බත් නෑ."

"කමත් බතට කියන්නේ 'ඇඹුල' කියලා. සමහරු 'මුත්තෙට්ටුව' කියලත් කියනවා. කමතේ දී කන්නේ නෑ, සප්පායම් වෙනවා, නැත්නම් සාත්තු වෙනවා. පොඩ්ඩක් ඉන්න. අප්පච්චි කතා කරන තුරු."

"සිරිමල් පුතේ, අම්බරුවන් පිට කමත් කරන්න" කියමින් දාවිත් රාලහාමි ඇඹුල තබා ඇති මැස්ස දෙසට ගියේ ය.

"මල්ලී, අම්බරුවන් කමතෙන් පිටට දක්කමු. උන් 'ඉපනැල්ල' උලා කකා ඉඳීවි." සිරිමල් මෝල්කඩින් අම්බරුවන් කුඹුරට දක්කා ඇඹුල රස බලන්නට ආවේ අනුරාධ ද කැටුව ය.

"මල්පාවර කරන්න කලින් සප්පායම් වෙමු. මැණිකේ ඇඹුල පේ කළා නම්

හොඳයි" කියමින් දාවිත් රාලහාමි 'කුඹල් ගෙඩිය' අතට ගත්තේ එහි වතුර පිරී ඇත්දැයි දැන ගැනීමට ය. බණ්ඩාර මැණිකේ ඇඹුල බෙදීම ආරම්භ කළා ය. මුලින් ම 'අත්තමට' පැමිණි ගොවීන්ට සංග්‍රහ කරන්නට ඇය දාවිත් රාලහාමි සමග එක් වූවා ය. සිරිමල් හා අනුරාධ ද කමත් බතෙහි රස බැලූහ.

සප්පායම අහවර වූ පසු ඉතිරි අඩුම කුඩුම එක් රැස් කර ගත් කාන්තාවෝ ආපසු යන්නට සැරසුණහ.

"අපි ගිහින් එන්නම් රාලහාමි. තව ටිකකින් 'කළු ගගුල' එවන්නම්. සිරිමල් පුතා ගෙදර එවන්න."

"මැණිකේ, හීල් අඩුක්කුවට 'කිරි කබළු' ටිකක් සූදානම් කරන්න."

"හොඳයි රාලහාමි"

"අයියේ, මොනවද කිරි කබළු කියන්නේ"

"උදේ කෑමට කමතේ දී කියන්නේ හීල් අඩුක්කුව. හීල් අඩුක්කුවට ආප්ප හදන්න කියලා තමයි අප්පච්චි අම්මට කිවුවේ. ඔන්න ඔයාට උදේට ආප්පත් කන්න පුළුවන් හොඳේ. තව ටිකකින් අපි යමු කළු ගගුල ගේන්න. ඔයා හිතන්නේ මොනවද කළු ගගුල කියන්නේ?"

"කෝපි වෙන්න ඇති. ඇයි අපි එන කොට ගෙනාවෙ රතු ගගුල නේ. රතු ගගුල කියන්නේ තේ කහට නම් කළු ගගුල කියන්නේ කෝපි වෙන්න ඕනෑ."

"හරියට හරි මල්ලී"

දෙදෙනා ම නැවත පාවරට ගියේ ඊළඟ මැඩවීමට මුල පුරන්නට ය.

"මල්ලී, මේ ගොයම් ගස්වල තිබුණු වී ඇට ඔක්කොම දැන් පාවරට හැලිලා. මේ මැඩවුණු ගොයමට කියන්නේ 'මැඩුවන්' කියලා. මේවායේ තියෙන වී ඇට පාවරට වැටෙන විදියට මැඩුවන් හල හලා කමතෙන් පිටට දානවා. අර බලන්න අප්පච්චි අතේ තියෙන්නේ මොකක් ද කියලා. ඒකට කියන්නේ 'දැති ගොයියාව' කියලයි. ඒකෙන් තමයි මැඩුවන් අවුස්සලා දෙන්නේ."

"ඒක ලීවලින් හදපු එකක් නේ ද?"

ඔව්. කරුවක් තියෙන ලීයකින් තමයි දැති ගහ හදන්නේ. පළමුවෙනි මැඩුවන් හලා බෑමට කියන්නේ 'මල් පාවර' කරනවා කියලයි.

“ඒ කියන්නේ දැන් වැඩ ඉවර ද?”

“නෑ..නෑ.., අප්පච්චිලා ආයෙමත් ‘වට දානවා.’ ඊට පස්සෙයි අපි දෙන්නට වැඩ තියෙන්නේ.”

“මොනව ද වටේට දාන්නේ?”

“කමත වටේ තුනී වෙලා විසිරිලා තියෙන ගොයම් පාවරට දානවට කියන්නේ වට දානවා කියලා.”

“අම්බරුවන්ට නො පෑගුණු ගොයම දෙවැනි සැරේ කොළ ගොන් ගහන කොටයි පෑගෙන්නේ. ගොයම හොඳින් මැඩවෙන කොට බැත පාවරට වැටෙනවා.”

“අන්න, විලියම් මාමා අම්බරුවන් අරගෙන එනවා.”

“ඇයි අයියේ, අම්බරුවන් ඒ පාරෙන් ම ගේන්නේ”

“එහෙම තමයි මල්ලී. හැම පැත්තෙන් ම හැම තැනින් ම අම්බරුවන් කමතට ගන්නේ නෑ. අම්බරුවන් කමතට ඇතුළු වන පාරට කියන්නේ ‘මෝල්කඩ’ කියලයි.”

“මගේ කෙවිට කෝ සිරිමල් අයියේ?”

“ආ...මේ තියෙන්නේ. ඔන්න මල්ලී මේ සැරේ නම් ගොම්පස් අල්ලන්න වෙයි...”

“හරි, හරි, දැන් මට පුළුවන්”

“පුතේ සිරිමල්, කෝ....මේ ගොන්කාරයෝ දෙන්නා” දාවිත් රාළහාමි වට පිට බලද්දී සිරිමල් හා අනුරාධ අඬහැර පාන්නට වූහ.

“හෝ....හෝ....අම්මා.....
හෝ....හෝයියා...අප්පා....
ඔයි රයිරේ....ඔයි....රාමා
කොළ මැඩපා....න් ඔයි රා....මෝ....”

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| බිස්ස | ධාන්‍ය තැන්පත් කර තැබීමට සකසන විශාල පෙට්ටිය |
| උප්පිඩ | අතට හසු වන තරම් ප්‍රමාණයක ගොයම් මිට |
| පිරුවටය | පිරිසිදු සුදු රෙද්දක් |
| මහප්පිඩ | කමතේ තබන මුල් ම උප්පිඩ |
| ඇඳුත්ත | එකිනෙකාට ඈඳා ඇති හරක් |
| ගොන් කණුව | කමතේ හරක් ගැට ගහන කණුව |
| අඬහැරය | අම්බරුවන් දිරිමත් කරන හඬ ගෑම |
| ගොම්පස් | ගොම |
| මුත්තෙට්ටුව | කමත් ආහාරය/කමත් බත |
| තහංචි | තහනම |
| ඉපනැල්ල | ගොයම් කැපීමෙන් පසු ගොයම් ගසේ ඉතිරි කොටස |
| කුඹල් ගෙඩිය | කළය/වතුර භාජනය |
| ඇඹුල පේ කිරීම | කමතේ ආහාර බෙදීම ආරම්භ කිරීම |
| අත්තම | උදව්වට වැඩ කර දීම |
| සප්පායම | ආහාර අනුභව කිරීම |
| හීල් අඩුක්කුව | උදේ ආහාරය |
| සේදැරි කරනවා | ඉක්මන් කරනවා |

## අවබෝධය

1. අනුරාධගේ නිවාඩුව ප්‍රීතිමත්ව හා ඵලදායීව ගත වන්නට හේතු වූ කරුණු මොනවා ද?
2. සිරිමල් අනුරාධට පැහැදිලි කර දුන්නේ කුමන කාර්යයක් ගැන ද?
3. පාවර රැක ගැනීම සඳහා කරන චාරිත්‍ර කෙටියෙන් පැහැදිලි කරන්න.
4. අත්තමට වැඩ කිරීම සඳහා කමතට පැමිණි දෙදෙනකු නම් කරන්න.
5. ආහාර පාන කිහිපයක් සඳහා විශේෂ යෙදුම් මේ පාඩමේ ඇතුළත් වේ. ඒ මොනවා ද?

## ලිඛිත අභ්‍යාස

1. 'අ' තීරුව හා 'ආ' තීරුව යා කරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| ගොන්කාරයෝ | ඉක්මන් කරනවා |
| අරක් මුත්තා | ඇඳුත්තේ අන්තිමයා |
| සේදැරි කරනවා | මැඩවීම |
| මුත්තෙට්ටුව | අම්බරුවන් දක්කන්නෝ |
| රත්තා බෝ කිරීම | බුලත් විට කනවා |
| මල් පාවර කිරීම | අරක් වළෙහි තැන්පත් කරන ඖෂධ පොට්ටනිය |
| පැඟිරි බෝය පුරනවා | උදේ ආහාරය |
| කලාතයා | කමත් බත |
| කොළ ගොන් ගැහීම | මුල් ම මැඩුවන් හැලීම |
| හීල් අඩුක්කුව | ගිනිමැළ ගැසීම |

3. කමත් භාෂාවේ පහත සඳහන් යෙදුම් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පද ලියන්න.

i. යතුර -
ii. බැත -
iii. කෙවිට -
iv. කළු ගගුල -
v. රස බෝය -
vi. ලියන්නාව -
vii. කුඹල් ගෙඩිය -
viii. ඇඹූල -
ix. මැඩුවන් -
x. පැඟිරි බෝය -
xi. ගොම් පස් -
xii. සප්පායම -
xiii. සේදැරි -
xiv. කිරි කබළු -

## ප්‍රායෝගික අභ්‍යාස

1. පාඩමෙහි ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.
2. කමතේ දී භාවිත කෙරෙන විශේෂ යෙදුම් පිළිබඳව බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරන්න.

# නාම පද

සචේතනික හා අචේතනික සියලු වස්තු හඳුන්වන පද ‘නාම පද’ වෙයි. මේ නාම පද කෙරෙහි, වචන භේදය හෙවත් සංඛ්‍යා භේදය, හා ලිංග භේදය බල පායි.

## වචන භේදය (සංඛ්‍යා භේදය)

ගණනය කළ හැකි දේවල් ‘එකක්’ හෝ ‘එකට වැඩි’ යනුවෙන් කාණ්ඩ කළ හැකි යි.

උදාහරණ :

මල (එක යි) මල් (එකට වැඩි යි)
කුරුල්ලා (එක් කෙනා යි) කුරුල්ලෝ (එක් කෙනාට වැඩි යි)

මෙහි දී එක් අයකු හෝ එක් දෙයක් හෝ හැඳින්වෙන නාම පද ඒක වචන නාම පද ලෙසත් එක් දෙයකට වැඩියෙන් ඇති දේවල් හෝ එක් අයෙකුට වැඩියෙන් සිටින කණ්ඩායමක් හෝ හැඳින්වීමට යොදන නාම පද, බහු වචන නාම පද ලෙසත් හැඳින්වේ.

පාඩමේ ඇතුළත්ව ඇති නාම පදත් ඒ නාම පද බහු වචන නාම පද බවට හැරවෙන ආකාරයත් බලමු.

| ඒක වචන | බහු වචන |
|---|---|
| I ක්‍රමය | |
| අම්මා<br>මාමා<br>අයියා<br>පුතා | අම්මලා<br>මාමලා<br>අයියලා<br>පුත්තු |

| II ක්‍රමය | |
|---|---|
| කුඹුර<br>යතුර<br>පැදුර | කුඹුරු<br>යතුරු<br>පැදුරු |

| III ක්‍රමය | |
|---|---|
| කමත | කමත් |
| ගොයම | ගොයම් |
| බුලත | බුලත් |
| සිරිත | සිරිත් |

| IV ක්‍රමය | |
|---|---|
| චාරිත්‍රය | චාරිත්‍ර |
| යන්ත්‍රය | යන්ත්‍ර |
| පිරුවටය | පිරුවට |

| V ක්‍රමය | |
|---|---|
| කුල්ල | කුලු |

| VI ක්‍රමය | |
|---|---|
| වළ | වළවල් |
| මෝල්කඩ | මෝල්කඩවල් |

| VII ක්‍රමය | |
|---|---|
| අඩුක්කුව | අඩුක්කු |
| කඩාඩුව | කඩාඩු |

| VIII ක්‍රමය | |
|---|---|
| අම්බරුවා | අම්බරුවෝ |
| මදුරුවා | මදුරුවෝ |

ඒක වචන නාම පදයක් බහු වචන නාම පදයක් බවට හරවා ගන්නට ක්‍රම කීපයක් තිබෙන බව ඔබට වැටහෙනු ඇත.

## ලිඛිත අභ්‍යාස

1. එක් එක් ක්‍රමය යටතේ ඒක වචන නාම පද පහ බැගින් ලියා ඒවා බහු වචන නාම පද බවට හරවා ලියන්න.

2. පහත සඳහන් වගුවෙහි හිස් තැන්වලට සුදුසු පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| ඒක වචන | බහු වචන |
|---|---|
| සිංහයා | ............................. |
| .................................... | ලේන්නු |
| .................................... | පොත් |
| අක්කා | ............................. |
| කඩය | ............................. |
| .................................... | පතුරු |
| .................................... | කවර |
| පෙට්ටිය | ............................. |
| දවටනය | ............................. |
| ..................................... | මහල්ලෝ |

3. ත්‍රිකෝණය තුළ ඇති නාම පද ඒක වචන හා බහු වචන යනුවෙන් වර්ග කර වගුවක ඇතුළත් කරන්න.

මම,
කරාබුව,
තොපි, ගවුම,
වහලය, පුටු, පැන,
පත්තර, ඉබ්බෝ, ගෙවල්,
කණ්ණාඩි, සණ්ටාරය,
කම්කරුවෝ, ගුරුතුමිය, වලාකුළ,
ලේඛකයෝ, කර්තෘ, අට්ටාල, තරු,
නිවේදකයා, ක්‍රීඩකයෝ, පොත්, අල්මාරි,
කතුරු, වට්ටිය, පෙදරේරුවෝ, කළමනාකරු,

## ප්‍රායෝගික අභ්‍යාස

1. දිය ගොඩ ක්‍රීඩාව (ක්‍රීඩකයෝ දසදෙනෙකි.) දිය යනුවෙන් ඒක වචන ද ගොඩ යනුවෙන් බහු වචන ද හැඳින්වෙන බවට කණ්ඩායම ම තීරණය කරන්න. කණ්ඩායම් නායකයා ඒක වචන නාම පදයක් කියද්දී 'දිය' යනුවෙන් නාම පුවරුවක් ගසා ඇති කොටසට යා යුතු ය. බහු වචන නාම පදයක් කියද්දී 'ගොඩ' යනුවෙන් නාම පුවරුවක් ගසා ඇති කොටසට යා යුතු ය. අවධානයෙන් සිටියොත් ඔබ දිනුම්.
2. එක් එක් ක්‍රමය යටතේ ඒක වචන පද, බහු වචන පද බවට හරවා ලියන ලද නාම පද පුවරුවක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
3. බහු වචන පදයක් සකස් කර ගන්නා ක්‍රමවල දී ඒක වචන නාම පදය වෙනස් වන ආකාරය අවබෝධ කර ගන්නට උත්සාහ කරන්න. යහළුවන් සමග සාකච්ඡා කරන්න.

## පුරුෂ භේදය

ක්‍රියා පදවල පුරුෂ භේදය පිළිබඳව ඔබ 6 ශ්‍රේණියේ දී උගෙන ඇත. එම ක්‍රියා පද සහිත වාක්‍යවල යෙදෙන නාම පද අදාළ පුරුෂය යටතේ පහත දැක්වේ. උත්තම පුරුෂ හා මධ්‍යම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද සීමිත වූවත් ප්‍රථම පුරුෂ ක්‍රියා පද සමග යෙදිය හැකි නාම පද රැසකි. ඒ අතුරින් කිහිපයක් පමණක් පහත වගුවේ දැක්වේ.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| උත්තම පුරුෂ | මම<br>මා | අපි<br>අප |
| මධ්‍යම පුරුෂ | නුඹ<br>තෝ | නුඹලා<br>තොපි/තෙපි |
| ප්‍රථම පුරුෂ | හේ/ඔහු<br>ඕ/ඈ/ඇය<br>ළමයා<br>අම්මා<br>ගෙවිලිය<br>අම්බරුවා<br>කුරුල්ලා | ඔවුහු<br>ඔවුහු<br>ළමයි<br>අම්මලා<br>ගෙවිලියෝ<br>අම්බරුවෝ<br>කුරුල්ලෝ |

## ලිඛිත අභ්‍යාස

1. i. **පහත දැක්වෙන අංක 01 රූපයේ ඇතුළත්ව ඇති නාම පද, නියමිත වර්ගයට අනුව අංක 02 රූපය තුළ සඳහන් කරන්න.**

නාගයා, ඔබ, ගුරුතුමා, තොපි,
නුඹ, අපි, වෛද්‍යවරයා, මම,
පූජකතුමා, හෙදිය,
කම්කරුවෝ, නීතිඥයා, නිළිය,
නුඹලා, ලේකම්තුමා, ක්‍රීඩකයෝ

01 රූපය

උත්තම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද


මධ්‍යම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද

ප්‍රථම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද

02 රූපය

## ප්‍රායෝගික අභ්‍යාස

1. ක්‍රියා පදයේ පුරුෂ තුන සමග යෙදෙන නාම පද පහත සඳහන් ආකාරයේ මැක්රම් සැරසිල්ලක ඇතුළත් කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.




## ලිංග භේදය

නාම පදවල ලිංග භේදයක් ද වෙයි. පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග හා නපුංසක ලිංග යනුවෙනි. පුරුෂයින් ගැන කියැවෙන නාම පද පුරුෂ ලිංග හෙවත් පුරුෂ වාචී නාම පද වෙයි. ස්ත්‍රීන් ගැන කියැවෙන නාම පද ස්ත්‍රී ලිංග හෙවත් ස්ත්‍රී වාචී නාම පද වෙයි. අප්‍රාණවාචී නාම පද, නපුංසක ලිංග හෙවත් නපුංසක වාචී නාම පද වෙයි.

පුරුෂ වාචී නාම පද, ස්ත්‍රී වාචී නාම පද බවට හරවා ගන්නා ආකාරය ඉගෙන ගනිමු.

| පුරුෂ වාචී | ස්ත්‍රී වාචී |
|---|---|
| I විධිය | |
| කුමරා<br>මැති<br>රජ | කුමරි<br>මැතිනි<br>රැජිනි |

| II විධිය | |
|---|---|
| එළුවා<br>සිටු<br>හංසයා<br>සිංහයා | එළු දෙන<br>සිටු දේවි<br>හංස ධේනුව<br>සිංහ ධේනුව |

III විධිය

| | |
|---|---|
| ළමයා<br>මහත්මයා | ගැහැනු ළමයා<br>නෝනා මහත්මයා |

IV විධිය

| | |
|---|---|
| එළුවා<br>මීයා | එළිච්චී<br>මීච්චී |

V විධිය

| | |
|---|---|
| අශ්වයා<br>මොනරා<br>රජ | වෙළඹ<br>සෙබඩ<br>බිසව |

VI විධිය

| | |
|---|---|
| සොර<br>කවුඩු<br>කුකුළු | සෙර<br>කැවිඩි<br>කිකිළි |

ඉහත සඳහන් වන්නේ පුරුෂ වාචී නාම පද, ස්ත්‍රී වාචී නාම පද බවට හරවා ගන්නා විධි කීපයකි.

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් පුරුෂ වාචී නාම පදවල ස්ත්‍රී වාචී නාම පද ලියන්න.

| | | | |
|---|---|---|---|
| ඉබ්බා | - | ලේඛක | - |
| කුරුල්ලා | - | පිරිමි | - |
| වස්සා | - | කපුටා | - |
| පුතා | - | ඇතා | - |
| අලියා | - | නරියා | - |

## ප්‍රායෝගික අභ්‍යාස

1. ස්ත්‍රී වාචී පද, පුරුෂ වාචී පද හා නපුංසක වාචී පද වෙන් වෙන් වශයෙන් වර්ග කරමින් කුඩා පොතක් සකස් කරන්න.

2. ස්ත්‍රී වාචී, පුරුෂ වාචී හා නපුංසක වාචී පද සඳහන් පුවරු බිත්තියේ ප්‍රදර්ශනය කරන්න.

3. තද කළු අකුරෙන් මුද්‍රිත වචන කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් වාක්‍ය කියවන්න.

   **මම** සරුංගලය **යවමි.**<br>
   **අපි** සරුංගල් **යවමු.**<br>
   **නුඹ** පොත **බලහි.**<br>
   **නුඹලා** පොත් **බලහු.**<br>
   **ඔබ** පත්තරය **කියවහි.**<br>
   **නුඹලා** පත්තර **කියවහු.**<br>
   **සෙබළා** රට **රකියි.**<br>
   **සෙබළු** රටවල් **රකිති.**<br>
   **මල්ලී** කමිසය **අඳියි.**<br>
   **මල්ලිලා** කමිස **අඳිති.**<br>
   සංගීත **විශාරදයා** ගීතය **ගයයි.**<br>
   සංගීත **විශාරදයෝ** ගීත **ගයති.**<br>
   **මිනිසා** දොර විවෘත **කරයි.**<br>
   **මිනිස්සු** දොරවල් විවෘත **කරති.**<br>
   **වඩුවා** ලී පතුර **කපයි.**<br>
   **වඩුවෝ** ලී පතුරු **කපති.**<br>
   **තාරකාව** ආලෝකය නො **දෙයි.**<br>
   **තාරකා** ආලෝකය නො **දෙයි.**<br>
   **ලේනා** කුඩුව **තනයි.**<br>
   **ලේන්නු** කුඩු **තනති.**



# ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනතාව

# 5

අහිකුණ්ඨික ජනයා ලෙස හැඳින්වෙන්නේ කණ්ඩායම් වශයෙන් තැන තැන සංචාරය කරන, ස්ථිර වාසස්ථානවල නො වසන ජන කණ්ඩායමකි. පන්සිය පනස් ජාතක පොතේ 'චම්පෙය්‍ය ජාතකය' ද සද්ධර්මාලංකාරයේ 'අහිකුණ්ඨික වත්ථු' ද අතීතයේ පවා ගමින් ගම ඇවිදිමින් නයි නටවමින් දිවි ගෙවූ අහිකුණ්ඨික නම් ගෝත්‍රයක් පැවති බවට සාක්ෂ්‍ය ලෙස සැලකේ. කෙසේ වුව ද ලංකාවේ අහිකුණ්ඨික ජනයා ඉන්දීය කුරවර් ගෝත්‍රයට සමානකම් දක්වන බව පර්යේෂකයන්ගේ අදහස යි. ලංකාවේ උතුරු මැද, සබරගමු හා නැගෙනහිර පළාත්වල බහුලව ම සැරිසරන අහිකුණ්ඨික ජනයාට ඔවුන්ට ම ආවේණික වූ බස් වහරක්, සිරිත් විරිත් ආදිය තිබේ. ඒ පිළිබඳව කරුණු ඇතුළත් මේ පාඩම සිංහල විශ්වකෝෂය ඇසුරෙන් සකස් කර ඇත. විවිධ ජන කණ්ඩායම් පිළිබඳ තොරතුරු දැන ගෙන ලබන අවබෝධයෙන්, වඩා යහපත් සමාජයක් නිර්මාණය කිරීමට ඔබට හැකි ය.

අහිකුණ්ඨික ජනයා සාමාන්‍යයෙන් වෙසෙන්නේ තල් කොළවලින් තනා ගන්නා තාවකාලික පැල්පත්වල ය. එක් තැනක දින කිහිපයකට වඩා නො රැඳෙන බැවින් ඔවුන් මේ නිවාස සකස් කරන්නේ තැනින් තැන ගෙන යා හැකි ආකාරයට ය. උස අඩි පහක් පමණ වන මේ පැල්පතක් දිගින් අඩි නවයක් හා පළලින් අඩි හතක් පමණ වේ. කරත්ත අඹරාවක හැඩය ගන්නා මේ පැල්පත්වල තමා සතු උපකරණ සියල්ල තබා ගැනීමට ඔවුහු කටයුතු කරති. මස්කත් (පිහිය), රෝලු (වංගෙඩිය), තාලෙ (බේසම), ඉරමන් (හිරමනය), සත් (කුල්ල), පස්රායි (ඇඹරුම් ගල), කදව (කළය), කුණ්ඩ (කෑම පිසින වළඳ), පිපෙට්ටි (පේළාව, නයි පෙට්ටිය) සහ නයි නළාව ඔවුන්ගේ උපකරණ කිහිපයකි. ජීවනෝපාය සඳහා නටවන නයා ද බඩු ගෙන යෑම සඳහා උපකාර වන බූරුවා ද ආරක්ෂාව ලබා දෙන සහ දඩයමේ දී සහාය වන බල්ලා ද මොවුන්ගේ ජීවිතය හා බැඳුණු සත්තු වෙති. මේ සතුන් ආදරයෙන් රැක බලා ගැනීම ඔවුන්ගේ සිරිත යි. මේ අතරින් නාගයා ඔවුන්ගේ ආගමික විශ්වාස සමග ද බැඳී සිටියි. තමා වෙසෙන නිවාස 'නාග ගෘහය' යන අරුතැති 'නා ඉල්ල' නමින් හඳුන්වන අහිකුණ්ඨික ජනයා නාගයාට විශේෂ සැලකිල්ලක් දක්වති. බෝධිසත්ත්වයන්ගේ නාග ආත්මයක් සඳහන් වන 'භූරිදත්ත ජාතකය' පිළිබඳව දන්නා ඔවුහු එය තම වර්ගයාගේ ආඩම්බරයට හේතුවක් ලෙස සලකති.

හින්දු ආගම ඔවුන් සාමාන්‍යයෙන් අදහන ආගම වුව ද බෞද්ධාගමික විශ්වාසය මත පදනම්ව පෝය දිනවල සතුන් මැරීමෙන් වැළකී සිටිනු දැකිය හැකි ය. විෂ්ණු, කතරගම, පත්තිනි ආදි දෙවිවරුන් ඇදහීම ද ඔවුන් අතර වෙයි. දඩයම් සඳහා පිටත්ව යෑමේ දී වනයට අරක් ගත් දෙවියන්ට කුකුළු බිල්ලක් පුද කිරීම ද ඔවුන්ගේ සිරිතකි.

වැඩිවිය පත් වන ගැහැනු ළමයකු බාල සහෝදරියක සමග කොළවලින් තැනූ පැලක දින හතක් වෙන් කොට තැබෙන අතර ඉන් පසු දින පහක් තල් පත් පැලක රඳවා පස් වන දිනයේ දී නැන්දා විසින් නාවා පිරිසිදු කිරීමෙන් පසු සමාජයට පිළිගැනීම මොවුන්ගේ චාරිත්‍රය යි. අහිකුණ්ඨික විවාහය නෑනා - මස්සිනා අතර සිදු වන්නකි. සිය රැහේ සුදුසු අයකු නොමැති අවස්ථාවක අන් රැහැකින් සුදුස්සකු සොයා ගැනීමට සිදු වෙයි. ඉරිදා, සඳුදා සහ අඟහරුවාදා විවාහයට සුබ දවස් සේ සැලකේ. මංගල දිනයේ දී මනාලිය සුදු පැහැ වස්ත්‍රවලින් සැරසී රිදී සහ වීදුරු ඇට මාල ආදිය පලඳින අතර මනාලයා කහ කමිසයක් සහ සරමක් හැඳ ජටාවක් හිසේ බැඳ කළු ඇට මාලයකින් සහ අත්

වළලුවලින් සැරසෙයි. මනාලියගේ මුහුණ සහ හිස සුදු පැහැ රෙදි කඩකින් ආවරණය කෙරේ. මනාල යුවළගේ දකුණත්වල කහ කැබැල්ලක් බැඳ මුහුණට කහ දියර ඉසීමෙන් පසු පූසාරිවරයාගේ ආශීර්වාද ශ්ලෝක ගායනය මධ්‍යයේ මනාලයා මනාලියගේ ගෙලෙහි තැලිය බඳියි. අනතුරුව මාමා කෙනෙක් යුවළගේ සුළැඟිලි එක් කොට බැඳ පිත්තල සෙම්බුවකින් අතපැන් වත් කරයි. මනාලයා මෙදින මනාලියගේ අතේ වළල්ලක් පැලඳවිය යුතු අතර දැතෙහි ම වළලු පලඳින්නේ විවාහක ස්ත්‍රීන් පමණි. කෙසෙල් කොළවල තබා පිළිගන්වන මංගල භෝජනය වළඳා ගී ගයා නටා ප්‍රීතිවීමෙන් මංගල උත්සවය නිමා වන අතර විවාහයෙන් පසු එළඹෙන පළමු බෘහස්පතින්දා ඥාතීන්ගෙන් මනාල යුවළට තෑගි ලැබෙයි. දෑවැද්ද වශයෙන් පේළාවක බහා ලූ නයකු හෝ දෙන්නකු ද බූරුවකු, බල්ලකු හා අඳින පලඳින දේ ද දීම අහිකුණ්ඨික චාරිත්‍රයකි.

අහිකුණ්ඨික පුරුෂ පක්ෂය නයි නැටවීම හා රිළවුන් නැටවීම ජීවනෝපාය කර ගනිද්දී අහිකුණ්ඨික ස්ත්‍රීහු අත බලා සාස්තර කීම ජීවනෝපාය කර ගනිති. සර්ප විෂ උරා ගැනීමට සමත් කෘත්‍රිම ගල් විශේෂයක් ඔවුන් ළඟ තිබේ. ඒවා සාදා ගන්නා ක්‍රමය ගෝත්‍රයේ පාරම්පරික රහසක් සේ සැලකේ. සිය කණ්ඩායමේ විශ්වාසය දිනා ගත්, පාලනයට දක්ෂ, අපක්ෂපාතීව කටයුතු කරන, මනා අවබෝධයකින් යුක්ත, තිස් විය ඉක්මවූ වැඩිහිටියකු සියලු දෙනාගේ ම කැමැත්තෙන් කණ්ඩායමේ නායකයා හෙවත් ආරච්චි ලෙස පත් කර ගැනීමට අහිකුණ්ඨික ජනයා කටයුතු කරති. ඔහුගේ තීරණය සියලු දෙනා පිළිගන්නා අතර අධිකරණ නායකයා වන්නේ ද ඔහු ය. අයහපත් ලෙස කටයුතු කරන්නේ නම් ඔහු වෙනුවට වෙනත් අයකු පත් කිරීමට හැකියාව ඇත.

ආරවුල් තමා අතර ම නිරාකරණය කර ගැනීමට අහිකුණ්ඨික ජනයා ක්‍රියා කරති. පැමිණිල්ලක් ඉදිරිපත් වූ විට ආරච්චි ප්‍රමුඛ කණ්ඩායම් රැස්වීමක් පැවැත්වෙන අතර එය අධිකරණ සභාව වෙයි. එම සභාව සිය සිරිත් විරිත් හා සම්ප්‍රදායන් මත පිහිටා ලබා දෙන තීන්දුව බොහෝ විට දෙපාර්ශ්වයට ම පිළිගත හැකි එකකි. යම් හෙයකින් එසේ පිළිගැනීමට එක් පාර්ශ්වයක් අකමැති වූ විට 'කෝරළමාව' නම් විනිසුරු වෙත ඉදිරිපත් කෙරේ. කණ්ඩායම් හතකට එක් කෝරළමාවෙක් සිටියි. මීට අමතරව කැකෑරෙන තෙල් බඳුනක දකුණතේ දබරැඟිල්ල බහා ලීම, රත් වූ යකඩයක් ඇල්ලීමට දීම ආදි දිවුරුම් ක්‍රම ද වෙයි. පැමිණිලිකරු වෙනුවෙන් එක් සැළියක් ද විත්තිකරු වෙනුවෙන්

තව සැළියක් ද ලෙස එක සමාන සැළි දෙකක සහල් හා වතුර සම සමව දමා එක ප්‍රමාණයට ම දර දැමූ ළිප් දෙකක තබා එක විට ම ගිනි මොළවා, කලින් පැසුණු බත හිමි තැනැත්තා නිවැරදිකරු ලෙස සැලකීමේ ක්‍රමයක් ද තිබේ.

සංචාරක ජීවන රටාවත් සරල පැවැත්මත් අහිකුණ්ඨික ජනයාගේ විශේෂ ලක්ෂණ සේ සැලකිය හැකි ය. ඔවුන්ට ම ආවේණික වූ සිරිත් විරිත් රැසක් තිබේ. තෙලුගු බසින් නිපදවා ගත් බස් වහරක් භාවිත කරන අහිකුණ්ඨික ජනයාට සිංහල හා දෙමළ භාෂා හැසිරවීමේ හුරුවක් ද ඇත.

වර්තමානය වන විට අහිකුණ්ඨික ජනයාගේ ජීවන රටාව ඉහත දැක්වුණු පැරණි ජීවන රටාවෙන් වෙනස් වී ඇත. ඔවුන් ස්ථිර වාසස්ථානවල ජීවත් වෙමින් පැරණි ජීවනෝපායන් වෙනුවට වෙනත් රැකියාවල නිරත වන ආකාරය ද දැකිය හැකි ය.

### අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| කරත්ත අඹරාව | කරත්තයේ වහල |
| ජීවනෝපාය | රැකියාව |
| රැහේ | කණ්ඩායමේ |
| පාරම්පරික | පරම්පරාවෙන් පැවතෙන |
| තෙලුගු | දකුණු ඉන්දියාවේ ආන්ධ්‍ර ප්‍රදේශයේ ප්‍රධාන භාෂාව |

### අවබෝධය

1. **අහිකුණ්ඨික ජනයා තාවකාලික පැල්පත්වල වාසය කරන්නේ කුමන හේතුවක් නිසා ද?**
2. **අහිකුණ්ඨික ජනයාගේ ජීවිතයට සමීප සතුන් නම් කරන්න.**
3. **පාඩමේ දැක්වෙන ආකාරයට අහිකුණ්ඨික ජනයාගේ ආගමික විශ්වාස ඉස්මතු වී පෙනෙන කාර්යය කුමක් ද?**
4. **භූරිදත්ත ජාතකය අහිකුණ්ඨික ජනයාට විශේෂ වන්නේ ඇයි?**
5. **අහිකුණ්ඨික ජනයා සිය ආරවුල් විසඳා ගැනීමට යොදා ගන්නා ක්‍රමය පාඩම ඇසුරෙන් පැහැදිලි කරන්න.**

# උක්ත අනුක්ත භේදය

ගුරුවරු ළමයින් යහමග යවති.
ඔවුහු සතුන් දඩයම් කරති.

ඉහත වාක්‍යවල තද කළු අකුරෙන් දැක්වෙන පද විමසා බලන්න. එම වාක්‍යවල ‘යවති’, ‘කරති’ යන ක්‍රියාවලින් පිළිවෙළින් කියැවෙන්නේ ‘ගුරුවරු’ සහ ‘ඔවුහු’ යන පද යි. වාක්‍යයක ප්‍රධාන වන, ක්‍රියාවෙන් කියැවෙන පද උක්ත පද ලෙස හැඳින්වේ. ඒ අනුව ඉහත වාක්‍යයන්හි උක්ත පද වන්නේ ‘ගුරුවරු’ සහ ‘ඔවුහු’ යන පද යි.

එම වාක්‍යවල යෙදී ඇති ‘ළමයින්’, ‘සතුන්’ යන පද ක්‍රියාවට යටත් වන කර්ම පද වෙයි. ඒවා අනුක්ත පද වශයෙන් හැඳින්විය හැකි ය.

මෙබඳු වාක්‍ය නිර්මාණයේ දී වාක්‍යයක ප්‍රධාන වන ක්‍රියාවෙන් කියැවෙන නාමය උක්ත ස්වභාවයෙන් ද එම ක්‍රියාවට යටත් වන නාමය අනුක්ත ස්වභාවයෙන් ද තැබීම පිළිගත් ක්‍රමය යි.

නාම පද කිහිපයක් උක්ත අනුක්ත භේදය යටතේ පහත වගුවේ දක්වා ඇත.

| උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|
| මම | මා |
| අපි | අප |
| ඔබ (තෝ) | ඔබ (තා) |
| තොපි | තොප |
| ඔහු | ඔහු |
| ඔවුහු | ඔවුන් |
| කුරුල්ලා | කුරුල්ලා |
| කුරුල්ලෝ | කුරුල්ලන් |
| ළමයි | ළමයින් |
| මිනිස්සු | මිනිසුන් |
| ගුරුවරු | ගුරුවරුන් |
| ළමයෙක් | ළමයකු |
| හාවෙක් | හාවකු |
| මනාලියක් | මනාලියක |
| සහෝදරියක් | සහෝදරියක |

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන උක්ත පදවල අනුක්ත පදය ලියන්න.**

| | | | |
|---|---|---|---|
| අපි | - | දෙවියෙක් | - |
| මම | - | දරුවෙක් | - |
| ඔවුහු | - | දැරියක් | - |
| ඔබ | - | කාන්තාවක් | - |
| සමනලයෝ | - | ගුරුවරියක් | - |

2. **උක්ත හා අනුක්ත පද යොදා පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.**

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| කුමාරයෝ | ............................ |
| ............................ | ඔවුන් |
| ඔහු | ............................ |
| සමනලයෙක් | ............................ |
| වෛද්‍යවරු | ............................ |
| ............................ | දරුවකු |

3. **පාඩමේ ඇතුළත් උක්ත නාම පද සහ අනුක්ත නාම පද පහ බැගින් ලියන්න.**

## ප්‍රායෝගික අභ්‍යාස

1. **අභිකුණ්ඨික ජනයා නාගයා හා රිළවා නැටවීමට යොදා ගන්නා නොයෙක් නොයෙක් ක්‍රීඩා ගැන ඔබ දුටු අවස්ථාවක් ඇසුරින් විස්තර කරන්න.**
2. **මෙම පාඩම ඇසුරින් "ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනයා" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.**



# මේ කාගේ දෝ කමතා

6

ජනතාව අතර ම නිර්මාණය වී පැවත එන ජන කවි සම්ප්‍රදායයක් අප රටේ ද දක්නට ලැබේ. ස්වකීය අත්දැකීම් රසවත් ප්‍රකාශන ලෙස සමාජයට දායාද කිරීමට ගැමි ජනයා සතු වූ කුසලතාව ජන කවියෙන් ප්‍රකට වේ. පාදක වූ අවස්ථා අනුව ජන කවි කමත් කවි, පැල් කවි, පාරු කවි ආදි වශයෙන් වර්ගීකරණයට ලක් කරනු දැකිය හැකි ය.

මෙම පාඩමට ඇතුළත් වන්නේ කමත් කවි කිහිපයකි. ගොයම් කපා කොළ මැඩීමේ දී ගොවියෝ මෙබඳු කවි ගායනය කරති. ගොයම් කෙතටත් නෙළා ගත් අස්වැන්නටත් ඔවුන් දැක්වූයේ ඉමහත් ගෞරවයකි. කමතේ සිරිත් විරිත් පැරණි ඇදහිලි ක්‍රම හා මිශ්‍ර වී ඇත. මහත් වෙහෙස ගෙන දෙන ගොයම් මැඩීමේ කාර්යයේ විනෝදයෙන් නියැලීමට කමත් කවි උපකාරී වේ.

කොළ මැඩීමේ යෙදෙන ගොනුන්ට දයාවෙන් අමතමින්, සාම්ප්‍රදායික විශ්වාසවලට ගරු කරමින් ගොවියා සිය කාර්යය ඉටු කර ගන්නා ආකාරය මෙම කවිවලින් පිළිබිඹු වේ.

## ජන කවි හඳුනා ගැනීම

ජනතාව අතරේ ම ඇති වී ජනතාව අතරේ ම ආරක්ෂා වී පැවත එන කවි, ජන කවි නමින් හැඳින්වේ. මේ ජන කවි, පොත්වල ලියවීමට පෙර පැවතුණේ ඒවා භාවිත කළ මිනිසුන්ගේ මතකයේ ය. එහෙයින් කාලයෙන් කාලයට භාෂාව වෙනස් වීමත් සමග ම ජන කවිය ද වෙනස් වීම ස්වාභාවික ය. පොත් පත්වල ලිවීමෙන් පසුව වුව ද බහුල වශයෙන් මිනිසුන් අතර භාවිත වන නිසා ඒවා තව දුරටත් වෙනස් වෙයි.

ජන කවිවල කතුවරයා හඳුනා ගත නො හැකි ය. පළමුවෙන් කියූ තැනැත්තා නො දන්නා නමුත් ඒවා ජනතාව අතර කාලයක් තිස්සේ භාවිත වීමෙන් පොදු අයිතියට පත්ව ඇත්තේ ය. ජනතාව අතර නිරායාසයෙන් පහළ වී ඔවුන් අතර ම පැතිර ගිය ජන කවියට වස්තු විෂය වී ඇත්තේ බෙහෙවින් ම ඔවුන්ට සමීප අත්දැකීම් ය. ඔවුන්ගේ එදිනෙදා අත්දැකීම්, ඇදහිලි විශ්වාස, ජීවනෝපාය, ක්‍රීඩා හා විනෝදාස්වාද මාර්ග, හැඟීම් ආදිය ඒ අතර බහුලව ම හමු වන තේමා ය.

සිංහල ජන කවිවල සුවිශේෂ ගුණාංග අතර අව්‍යාජත්වය, සරලත්වය සහ සංක්ෂිප්තභාවය හැඳින්විය හැකි ය. අලුත් උපමා රූපක භාවිතය ද ජන කවියාගේ ප්‍රතිභාව විදහා දක්වන ලක්ෂණයක් ලෙස සැලකේ. හැඟීම් ප්‍රකාශනයේ දී දැක්වූ සංයමය ද ඇතැම් ජන කවියක විශිෂ්ටත්වයට හේතු වී ඇත.

"අපේ ජන කවි සාමූහික ජීවන රටාවේ වැදගත් ම දායාදයක් වැන්න. තනිව ම කියන ජන කවියක් අපට නැත. දරු නැළවිල්ල පවා කියන්නේ ඉතා අඩු වශයෙන් දෙදෙනෙකු වත් ඉන්නා තැනක ය. පැල් කවිය වුවත් පැලේ ඉඳ කියන විට රාත්‍රි පාළුව හා නිසංසලකම මකා ගෙන, පැල් රකිනා අවශේෂ උදවියගේ දෙසවන පතිත වන්නේ ය. ඒ අයගෙන් කෙනෙක් නිසැකව ම තවත් පැල් කවියකින් ඊට උත්තර සපයන්නේ ය. ඔරු පාරු කවි ගැන කිව යුත්තේ ද ඒ ටික ම ය. සාමූහික රටාවෙන් විනිර්මුක්ත වූ ජන කවියක් සිංහලයා අතර නො වී ය."

නන්දසේන රත්නපාල, **ජනශ්‍රැති විද්‍යාව**

පහත දැක්වෙන කමත් කවි ද සාමූහික ක්‍රියාකාරකමක් වන කොළ මැඩීම හා සම්බන්ධ ය. මිනිසුන්ට පමණක් නො ව දෙවියන් සේ ඇදහූ ස්වභාව ධර්මයට ද කොළ මැඩීමට දායක වන ගවයන්ට ද එම කවිවලින් කමතට ඇරයුම් කෙරෙයි.

මේ කාගේ මේ  කමතා
ඉරු දෙවියන්ගේ  කමතා
ඉරු දෙවියෝ බිම්  බඳිතා
බිම් බැඳි තැන කොළ  බඳිතා

මේ කාගේ දෝ  කමතා
සඳ දෙවියන්ගේ  කමතා
සඳ දෙවියෝ වැඩි  කමතා
සඳ දෙවියන් බැත  දෙවතා

මේ කාගේ මේ  කමතා
සැම දෙවියන්ගේ  කමතා
සැම දෙවියෝ බිම්  බඳිතා
බිම් බැඳි තැන කොළ  බඳිතා

මේ කොතනින් ගෙනා  ගොනා
දෙවුන්දරින් ගෙනා  ගොනා
ඒ මොනවට ගෙනා  ගොනා
කොළ මඩනට ගෙනා  ගොනා

කැලිය කොළ බැන්ද  මටා
මදු කොළ බැන්දේ  කුමටා
ඒ මට කළ හොඳ  කමටා
කොළ මැඩවා දෙන්  සොඳටා

ගලක් පළා ගලක්  දුටිම්
එගල පළා රිදී  දුටිම්
පැන් බොන්නට ළිඳක්  දුටිම්
බැත උඩ සිට මුහුද  දුටිම්

අටු කොටුවල තියෙන බැතා
ඉහළ පහළ තියෙන බැතා
ලබු ගෙඩිවල තියෙන බැතා
ගෙන පුරවා මේ කමතා

බුදුන් වඩින වේලාවයි
කිරි උතුරන වේලාවයි
කොළ මඩවන වේලාවයි
කමත පිරෙන වේලාවයි

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| කමත | ගොයම් පාගන භූමිය/ස්ථානය/කලවිට |
| කොළ බඳිතා | කමත් බිමේ මැද කොළ වර්ග තැන්පත් කිරීම |
| බැත | වී |
| බිම් බඳිතා | කොළ මැඩීම සඳහා බිම සැකසීම, කිරි සහිත කොළ වර්ග හා උපකරණ වටේට තබා බිම සකස් කෙරේ |
| කොළ මැඩීම | ගොයම් පෑගීම |
| කැලිය කොළ | පඳුරු වශයෙන් වැවෙන කිරි සහිත පැළෑටියකි; නාග බැවිල/කොහු කිරිල්ල/ගස් කැලිය |
| මදු කොළ | හරකුන් කෑමට ප්‍රිය කරන ගිරිතිල්ල කුලයේ වැල් විශේෂයක්. මේවා හරකුන්ට කෑම සඳහා කමතෙහි තබනු ලැබේ. |

## අවබෝධය

1. කමතට දේවාශීර්වාදය ලබා ගැනීමට උත්සාහ කර ඇති බවට උදාහරණ දෙකක් දෙන්න.
2. කොළ මැඩීමේ දී ගොනා වැදගත් බව ප්‍රකාශ වන කවිය ලියන්න.
3. “බැත උඩ සිට මුහුද දුටිමි” යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
4. කොළ මැඩීම මහත් ආශීර්වාදයක් බව පැවසෙන්නේ කුමන කවියෙන් ද?
5. කමත පුරවන්න යැයි කියන්නේ කුමන බැතවලින් ද?

# විරුද්ධාර්ථ පද

කිසි යම් පදයකින් ඉදිරිපත් කෙරෙන අර්ථයට, විරුද්ධ වූ අර්ථයක් වෙනත් පදයකින් ගෙන හැර දක්වන්නේ නම් එය **විරුද්ධාර්ථ පදයකි.**

උදා : ඇත - මැත, දුක - සැප, හොඳ - නරක

සිංහල භාෂාවේ විරුද්ධාර්ථ පද කිහිප ආකාරයකට සෑදේ.

- නාම පදයකට හෝ ක්‍රියා පදයකට හෝ මුලින් උපසර්ගයක් යෙදීමෙන්
  උදා : නම්බුව - අවනම්බුව
- නාම පදයකට හෝ ක්‍රියා පදයකට හෝ මුලින් **නිපාත** පදයක් යෙදීමෙන්
  උදා : වෙනස් - නො වෙනස්
- වෙනත් පදයක් භාවිත කිරීමෙන්
  උදා : ඇති - නැති
  යන - එන

**ලිඛිත අභ්‍යාස**

1. **පහත සඳහන් පදවලට සුදුසු විරුද්ධාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.**

   i. ඉහළ -
   ii. නො ගෙනා -
   iii. නරක -
   iv. අවේලාව -
   v. යට -

2. **වරහනට පිටතින් දී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

   i. අවමාන (අසමාන, විමාන, සම්මාන)
   ii. අන්ත (අන්තර, සමාන්තර, අනන්ත)
   iii. අභ්‍යන්තර (නිරන්තර, බාහිර, අන්තර)
   iv. මෛත්‍රී (කරුණා, ක්‍රෝධ, වෛරී)
   v. යහගුණ (අවගුණ, අගුණ, දෙගුණ)

vi. උත්තම (උසස්, අධම, පහත්)

vii. ජාතික (විජාතික, අවජාතික, සහජාතික)

3. **තද කළු අකුරින් යෙදී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පදය හිස්තැනට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

 i. ගොවීහු ........................ කාලයේ ගොයම් කපා **රාත්‍රි** කාලයේ කොළ මැඩීම කරති.

 ii. කමතේ දී ගොනුන්ට අමතන්නේ ........................... නො ව **ආදරයෙනි.**

 iii. පොළව ........................... වුවත් පොහොර යොදා **සරු** අස්වැන්නක් ලබා ගත හැකි ය.

 iv. සමහර ගොවීහු මිනිසුන් ........................... කළත් දෙවියන් කෙරෙහි **විශ්වාසය** තබා කටයුතු කරති.

 v. කොළ මැඩීමේ කටයුතු සාර්ථකව කළ හැක්කේ **කම්මැළි** මිනිසුන්ට නො ව ........................... අයට ය.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **කවි පෙළ තාලානුකූලව ගායනා කරන්න.**
2. **කෘෂිකාර්මික ජීවිතයට සම්බන්ධ ජන කවි එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.**
3. **කමත් භාෂාවට අයත් වචන දහයක් සොයා ලියන්න.**



# දෙව්දම් ඇදුරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි

# 7

සිංහල භාෂාවට මුල් කාලයේ බෙහෙවින් ම බලපෑවේ පාලි, සංස්කෘත භාෂා බව උගතුන්ගේ පිළිගැනීම යි. බටහිර ජාතීන්ගේ පැමිණීමෙන් පසු ක්‍රිස්තියානි ආගම මෙරට පැතිර යෑම හේතුවෙන් හීබ්‍රෑ, ලතින්, ග්‍රීක ආදි භාෂාවල බලපෑම සහිත අලුත් වචන සිංහල භාෂාවට එක් විය. එමෙන් ම ක්‍රමයෙන් සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයක් ද ගොඩ නැගිණි.

සිංහල භාෂාවෙන් ක්‍රිස්තු ධර්මයට අදාළ ලිපි ලේඛන මෙන් ම සිංහල සංස්කෘතිය සම්බන්ධ ලිපි ලේඛන ද සම්පාදනය කළ පූජකවරුන් අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගන්නා රදගුරු එඩ්මන්ඩ් පීරිස් හිමිපාණන් (1897-1989) පිළිබඳව මෙම පාඩම සකස් වී ඇත. සිංහල භාෂාව පමණක් නො ව වෙනත් භාෂා රාශියක් ද දැන සිටි එතුමා සිංහල භාෂා සාහිත්‍යයට කළ මෙහෙවර අපරිමේය වේ. සිංහල භාෂාව හා සාහිත්‍යය පෝෂණයට දායක වූ මෙබඳු චරිත හඳුනා ගැනීම සහ එම චරිතවල ශ්‍රේෂ්ඨ ගුණාංග අපේ ජීවිතයට එක් කර ගැනීම යහපත් ය.

"රජගුරු එඩ්මන්ඩ් පීරිස් පියතුමා මහා පඬුවෙකි. පර්යේෂණයේ ශූරයෙකි. ලේඛකයෙකි. ගත්කරුවෙකි. නොයෙක් තරාතිරමේ මුල් තැන් ඉසුලූ පියතුමෙකි. රන් පදක්කම් ලාභියෙකි. කලා ශූරියෙකි. හෙළ සිරිතට අත හිත දුන් ශ්‍රේෂ්ඨයෙකි. ජාතික දේ අගේ කරමින් පුන්කලසට ගොක් සැරසිල්ලට දෙව් මැඳුරෙත් සැලකිය යුතු අවස්ථාවල දී සුදුසු තැන් දුන් කලාකාමියෙකි. හෙළ බසට දිවිය දුන් තැනැත්තෙකි."

**පූජිත ජීවිත -** ගරු මර්සලීනු ජයකොඩි පියතුමාගේ ලිපිය

ගත සිත සනසන සීතල උඳුවප් මහේ සාමයේ කුමරුන්ගේ උපත පිළිබඳ පණිවුඩය රැගෙන මඳ නල දසත හමා යද්දී උදා වූ අසිරිමත් නත්තලෙහි ප්‍රීතියෙන් මුළු ලොව ම නැහැවී ගියේ ය. සාමය හා සතුට පිළිබඳ මිහිරි හැඟීම් සමඟ ලොව පුරා කිතුනු ජනතාව ජේසු බිලිඳාණන්ගේ උපත මහත් බැතියෙන් අනුස්මරණය කළ 1897 වර්ෂයේ නත්තල් සමය යි, ඒ. එළඹි නත්තල වෙනුවෙන් නෑ හිතවතුන්ට තෑගි බෝග පිරිනැමීම සතුට බෙදා හදා ගැනීමේ මගකි. හලාවත ප්‍රදේශයේ මවු පිය යුවළකට ද දෙවියන් වහන්සේගෙන් අපූරු නත්තල් ත්‍යාගයක් ලැබුණි. ඒ 1897 දෙසැම්බර් 27 දින ඔවුන්ට පුත් කුමරකු ලැබීම යි. මේ දරු උපත එම යුවළට, එම ගම් පියෙසට, මුළු සිරිලකට මතු නො ව මුළු ලොවට ම ලැබුණු මහගු ත්‍යාගයක් වූවා සේ ය.

එම වාසනාවන්ත දෙමවුපියන් වූයේ මිහිඳු කුලසූරිය එච්. දියෝගෝ පීරිස් මහතා සහ මිහිඳු කුලසූරිය ඒ. ක්ලේරා මහත්මිය යි. උපන් කුමරුට එඩ්මන්ඩ් යයි නම් තබන ලදි. තම එක ම දරුවා අනාගතයේ දී මවු බිමේ නම රැන්දූ කීර්තිමත් උගතෙක් වේ යයි එදා ඒ මවුපියන් සිහිනෙනුදු නො සිතන්නට ඇත.

පාසල් වියට පා තබන්ටත් පෙර ම ළදරු එඩ්මන්ඩ් කුමරුන්ට මවු සෙනෙහස අහිමි වූයේ මවගේ හදිසි වියෝව හේතුවෙනි. මෙරට ඉංග්‍රීසි පාලන සමයේ උපන් එඩ්මන්ඩ් පීරිස් කුමරුන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ හලාවත සාන්ත මරියා ඉංග්‍රීසි පාසලෙනි. පාසල් වේලාවෙන් පසු එඩ්මන්ඩ් දවසේ වැඩි කාලයක් ගත කළේ ඔහුගේ සීයා සමඟ යි. එකල හලාවත පිස්කල් නිලධාරියකු ලෙස සේවය කළ අලෙන්සු පීරිස් ඔහුගේ සීයා විය. ඔහු සිංහල, දෙමළ, ඉංගිරිසි භාෂාවන් ලිවීමට හා කියවීමට සමත් උගතකු වීම එඩ්මන්ඩ් පීරිස් කුමරුගේ පෙර වාසනාවක් විය. සීයාගෙන් එම භාෂා උගත් ඔහු එම භාෂාවලින් ලියැවුණු පොත පත කියවීමට ඇල්මක් දැක්වී ය. අනාගතයේ දී මහ පඬිරුවනක් වීමේ මූලික අඩිතාලම එසේ සකස් විය.

ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කළ කුඩා එඩ්මන්ඩ් පීරිස් කොළඹ සාන්ත ජෝසප් විද්‍යාලයට ඇතුළත්ව එහි දීප්තිමත් ශිෂ්‍යයකු වශයෙන් උසස් ලෙස සමත්කම් දක්වමින් ද්විතීයක අධ්‍යාපනය නිම කළේ ය. 1921 වර්ෂයේ දී පෙර-පූජක පුහුණුව ලැබීම සඳහා බොරැල්ලේ පිහිටි සාන්ත බර්නාඩ් දෙව් සත් සලට ඇතුළු විය. ගම් ප්‍රධානීන් වූ එතුමාගේ පවුලේ ඥාතීන් හා ගමේ දේවස්ථානය අතර පැවති සමීප සම්බන්ධතාවෙහි ප්‍රතිඵලයක් ලෙස එතුමාට මතු පූජකවරයකු වීමේ අවස්ථාව නිර්මාණය වී තිබුණි. 1924 දී දෙව් සත් හලේ අධ්‍යාපනය නිමා කොට එහි දී ම අතිඋත්තම අන්තෝනි කුරේ කොළඹ අගරදගුරුතුමාගෙන් නිර්මල මරිය නිකායේ පියතුමකු ලෙස පූජාත්වරය ලැබ එඩ්මන්ඩ් පීරිස් පියනම වශයෙන් ප්‍රකට විය.

එතැන් පටන් උන් වහන්සේ පූජකවරයකු වශයෙන් තම දහම් සේවාව ආරම්භ කළහ. කොළඹ, හංවැල්ල, මොරටුව, කළුතර, මග්ගොන ආදි ප්‍රදේශයන්හි දේවස්ථානවල කිතුනු බැතිමතුන්ගේ සියලු ආගමික අවශ්‍යතා ඉටු කරමින් සේවාවෙහි නිරත වෙමින් ජනාදරයට පාත්‍ර වූහ. එතුමාගේ සහජ හැකියා හා කුසලතා හඳුනා ගත් කතෝලික සභාව විසින් 1926 දී එතුමා සාන්ත බර්නාඩ් පූජක දෙව් සත් හලේ කථිකාචාර්යවරයකු වශයෙන් පත් කරන ලදි. අනතුරුව සාන්ත ඇලෝසියස් ජෝෂ්ඨ පූජක දෙව් සත් සලේ අධ්‍යක්ෂ ධුරයට ද පත් කරන ලදි. 1933 දී වැඩි දුර අධ්‍යාපනය සඳහා එංගලන්තයේ ලන්ඩන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ භාග්‍යය එතුමාට උදා විය.

1936 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍ර විශාරද උපාධිය ලබා පෙරළා දිවයිනට සපැමිණි එතුමා සාන්ත ඇලෝසියස් දෙව් සත් හලේ අධ්‍යක්ෂ ධුරයේ කටයුතු කරන අතර ම සාන්ත ජෝසප් විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් ද සේවය කළේ ය. 1936 දී කොළඹ රදගුරු පදවියෙන් වෙන් කොට වයඹ පළාත සඳහා හලාවත රදගුරු පදවියක් නම් කරන ලද අතර එහි රදගුරුතුමන් ලෙස පත් කරන ලද ගරු ඇලෝසියස් පියතුමා තනතුර භාර ගැනීමට ප්‍රථම ස්වර්ගස්ථ වූ නිසා එම තනතුර සඳහා නම් කරන ලද්දේ එඩ්මන්ඩ් පීරිස් (නි.ම.නි) පියතුමා ය. එම පත්වීමෙහි විශේෂත්වය වන්නේ හලාවත උපන් එතුමා හලාවත මීසමේ ප්‍රථම කිතුනු පූජකතුමා වීමත් හලාවත පදවියේ ප්‍රථම රදගුරුතුමා වීමත් මුළු ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල රදගුරුතුමා වීමත් ය. 1940 අප්‍රේල් මස 25 වන දින උන් වහන්සේ හලාවත ආසන දෙව් මැඳුරේ දී හලාවත අභිනව රදගුරුතුමා ලෙස අභිෂේක ලැබූහ. එතැන් සිට 1972 දෙසැම්බර් 27 දින දක්වා එම පදවියෙහි සේවය කොට හැත්තෑපස්වන වියේ දී විශ්‍රාම ලැබූහ.

අතිගරු එඩ්මන්ඩ් පීරිස් පියතුමාගේ ජීවන චරිතයෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ රාශියකි. බාල වියෙහි සිට ම පොත පතට ඇලුම් කළ එතුමා ඉගෙනීමෙහි ශූරයෙක් විය; විසිහතර පැයේ ම කාලසටහනකට අනුව වැඩ කළේ ය; ආගමික මෙහෙවරට මුල් තැන් දුන් අතර විවේකයක් ඇති හැම විට ම හිරු දෙසට හැරෙන සූරියකාන්ත මලක් මෙන් පොත පතට ම නැඹුරු විය. එහි ප්‍රතිඵලය වූයේ උන් වහන්සේ සිංහල, පාලි, සංස්කෘත, දෙමළ ආදි පෙරදිග භාෂාවන් හා ඉංගිරිසි, ග්‍රීක, ලතින්, ප්‍රංස, පුර්තුගීසි, ජර්මන්, ඕලන්ද ආදි අපරදිග භාෂාවන්හි හසළ දැනුමැති ප්‍රාඥයකු වීම යි. එම භාෂා ඥානය එතුමාගේ ලේඛන කාර්යයේ දී මෙන් ම පර්යේෂණ කාර්යයන්හි දී ද එතුමාට මහත් රුකුලක් වන්නට ඇත. සිංහල, දෙමළ, ඉංගිරිසි භාෂා සාහිත්‍යයන්හි හා ඉතිහාසය, පුරාවිද්‍යාව, තර්ක ශාස්ත්‍රය, සංගීතය ආදි විෂය ක්ෂේත්‍ර ගණනාවක පැතිරී ගිය එතුමාගේ දැනුමෙහි නිම්වළලු පුළුල් වීමට ද විවිධ භාෂා හා සංස්කෘති පිළිබඳ දැනුම හේතු වී ඇත.

ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූ අවධියේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙහි තිබූ ශ්‍රී ලංකාවේ පුර්තුගීසි ලන්දේසි යුගවලට අයත් දුර්ලභ කෘති හැදෑරීමට අවස්ථාව ලබා ගත් එතුමා ශ්‍රී ලංකාවේ ඉතිහාසයත් සංස්කෘතියත් ඉස්මතු කරමින් එරට පළ වූ සඟරාවලට ලිපි සපයමින් දෙස් විදෙස් උගතුන්ගේ අවධානය ඒ කෙරෙහි යොමු කිරීමට උත්සාහ ගත්තේ ය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තිබී එතෙක් කිසිවෙකුගේ අවධානයට ලක් නො වූ මහනුවර යුගයට අයත් **මග සලකුණ** නම් අප්‍රකට කාව්‍ය ග්‍රන්ථයක අත් පිටපතක් ලැබී එය සංස්කරණය කොට ඉදිරිපත් කිරීමෙන් විද්වතුන්ගේ මහත් පැසසුමට ලක් විය. කිතු දහම, සාහිත්‍ය ඉතිහාසය මුල් කර ගෙන එතුමා විසින් රචිත ග්‍රන්ථ රාශියකි. **සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය, සිරිලක මරිය බැතිය, මහනුවර ගිවිසුම, ලංකා ඉතිහාසයේ මූලික ග්‍රන්ථ, පෘතුගීසි සමය හා ඕලන්ද සමය** ඉන් ග්‍රන්ථ කිහිපයකි. එතුමාගෙන් සිංහල භාෂා සාහිත්‍යයට සිදු වූ විශිෂ්ට සේවයට උපහාරයක් ලෙස කැලණිය විශ්වවිද්‍යාලය 1979 වර්ෂයේ දී එතුමාට "සාහිත්‍ය චක්‍රවර්ති" සම්මාන උපාධිය පිරිනැමුවේ ය.

සමකාලීන ගිහි පැවිදි ප්‍රවීණ වියතුන්ගේ සභා මැද වැඩ හිඳ උදාර ජාතික මෙහෙවරක නිරත වීමට ද උන් වහන්සේට අවස්ථාව ලැබුණි. අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල උත්තර සභාව, ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය, රාජ්‍ය ලේඛනාගාර මණ්ඩලය, සිංහල ශබ්දකෝෂ උපදේශක මණ්ඩලය, රාජකීය ආසියාතික සංගමය ආදි ජාතික වශයෙන් අතිශයින් වැදගත් මණ්ඩල හා ආයතනවල උපදේශකවරයකු හා සභිකයකු වශයෙන් කටයුතු කිරීමේ භාග්‍යය ද එතුමාට හිමි විය.

එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමාගේ ආගම් පිළිබඳ සංකල්පය ඉතා පුළුල් එකක් විය. ආගමික සහජීවනය ඉහළින් ම අගය කළ එතුමා සෑම ආගමක ම සංස්කෘතික හරයන්ට ගරු කළේ ය. වියත් බෞද්ධ භික්ෂූන් ඇසුරු කරමින් නිතර ම ආගම්වල පොදු ගුණාංග පිළිබඳව සාකච්ඡා කළේ ය.

එතුමාගේ රදගුරු පදවි අභිෂේක උත්සවය ඊට සහභාගි වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ කසාවතින් බැබළුණු බව සඳහන් වීමෙන් මේ සම්බන්ධතාවේ ස්වභාවය පැහැදිලි වෙයි. සිංහලයකු වශයෙන් ජාතිකාභිමානයෙන් ඔද වැඩී ගිය එතුමාණෝ සිංහල භාෂාව හා සංස්කෘතිය නගා සිටුවීමට පුරෝගාමී මෙහෙවරක් කළහ. කිතු දහම හා සිංහල සංස්කෘතිය සංකේතවත් කරමින් තම රදගුරු ලාංඡනය ලෙස කුරුසයක් අතින් ගත් සිංහයකු යොදා ගත්හ. මෙරට කතෝලික සංස්කෘතිය කිතු දහමේ හා සිංහල සංස්කෘතියේ සංකලනයක් විය යුතු බව විශ්වාස කළ එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා එය ගොඩ නැඟීමට මුල් තැන දී කටයුතු කළේ ය. හලාවත රදගුරු පදවියට පත් වීමෙන් පසු කතෝලික වත් පිළිවෙත් හැකි තාක් දුරට දේශීය හා ජාතික ලක්ෂණ ඇතිව සකස් කිරීමට එතුමා උත්සාහ කළේ ය.

එතුමාගේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස මෑත භාගයේ දී කතෝලික සංස්කෘතිය තුළ දේශීය සංස්කෘතික ලක්ෂණ ඉස්මතු වන්නට පටන් ගෙන ඇත. විවාහ මංගල අවස්ථාවන්හි ජයමංගල ගාථා ගායනය හා මඟුල් පෝරුව කතෝලික ආගමට හා ආකල්පයන්ට ගැළපෙන අයුරින් සකස් කොට පවත්වනු ලැබේ. ගොක් රැන, පුන්කලස, මඟුල් බෙර, චාරිත්‍රානුකූල පොල් තෙල් පහන් දැල්වීම, උඩරට පහතරට නැටුම් ආදි සංස්කෘතික අංග කතෝලික උත්සව අවස්ථාවන්හි දී යොදා ගන්නා ආකාරය දක්නට ලැබේ.

මානව දයාවෙන් පිරිපුන් මනසින් යුතු වූ එතුමා දිළිඳුකම, නූගත්කම හා සමාජ විෂමාචාර හේතුවෙන් අසරණ වූවන්ට පිහිට වීම සඳහා පදවියට අයත් ප්‍රදේශයේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළේ ය. පාසල් නො යන දිළිඳු ළමුන් සඳහා වූ පුත්තලමේ මුත්තුකුමාර නිවාසය ආරම්භ කිරීම එබඳු සත් කාර්යයකි. මාවතගම, පොල්ගහවෙල, කුලියාපිටිය ආදි ප්‍රදේශවල අනාථ දරුවන් සඳහා ළමා නිවාස ඉදි කිරීම ද ලංසිගම මහලු නිවාසය ඉදි කිරීම ද අසරණයන් වෙනුවෙන් එතුමා විසින් කරන ලද මෙහෙවර පිළිබඳ කදිම සාක්ෂි වෙයි. අධ්‍යාපනය පිළිබඳව විශේෂ උනන්දුවක් දැක් වූ රදගුරුතුමා ප්‍රදේශයේ එවක පැවති පාසල් වැඩි දියුණු කළ අතර එතුමාගේ මහත් පරිශ්‍රමයෙන් ආරම්භ කළ මාරවිල ශාන්ත සේවියර් විදුහල ප්‍රදේශයේ ප්‍රමුඛ විද්‍යායතනයක් බවට පත් කළේ ය.

ජාති ආගම් භේදයකින් තොරව පොදු ජන හිත සුව පිණිස ඇප කැප වී කටයුතු කළ මේ උතුම් මානව හිතවාදියාණෝ පදවියෙන් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව ජීවිතයේ සැඳෑ සමය ගම්පහ සිරිකුරුස කන්‍යාරාමයේ විවේක සුවයෙන් ගත කොට 1989 සැප්තැම්බර් මස 4 වන දා ස්වර්ගස්ථ වූහ.

> පඬිදෙකි වියත් බුදු සවුවන් ඇසුරු කළ
> තවුසෙකි සිසිල් ගුණයෙන් හද සුවඳ කළ
> කුමරෙකි කිතු සසුන් රජගෙහි ලත් කිරුළ
> බලයෙකි මෙවන් දන ඉපැදුම රටට හෙළ
>
> \- අරිසෙන් අහුබුදු

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| අගරදගුරු | අගරදගුරු පදවියක් ලෙස නම් කරන ලද ප්‍රදේශයක ප්‍රධාන පූජකවරයා. ගෞරව නාමයකි.<br>උදා: කොළඹ අගරදගුරුතුමා |
| රදගුරු | රදගුරු පදවියක් ලෙස නම් කරන ලද ප්‍රදේශයක ප්‍රධාන පූජකවරයා. ගෞරව නාමයකි.<br>උදා: හලාවත රදගුරුතුමා |
| පූජාත්වරය | පූජක භාවය |
| දෙව් සත් සල | දේව ශාස්ත්‍ර ශාලාව (සෙමනේරිය); පූජකවරුන් පුහුණු කරන අධ්‍යාපන ආයතනය |
| මීසම | පදවි ප්‍රදේශයක් තුළ එක් පාලන ඒකකයක් |
| රදගුරු අභිෂේක උත්සවය | අදාළ පුද සිරිත් සමග පදවිය සංකේතවත් කරන ශීර්ෂ පලඳනාව, රතු පාට බඳ පටිය, සැරයටිය, මුදුව ආදිය සහිතව කරන උත්සවය |
| මඳ නල | සෙමින් හමන සුළඟ |
| අනුස්මරණය | සිහි කිරීම |
| පියෙසට | ප්‍රදේශයට |
| මතු නො ව | පමණක් නො ව |
| වියෝව | වෙන් වීම |

| | |
|---|---|
| ද්විතීයක අධ්‍යාපනය | 6 ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය දක්වා අධ්‍යාපනය |
| ප්‍රකට | ප්‍රසිද්ධ |
| ස්වර්ගස්ථ | මරණයෙන් පසු දෙව්ලොව උපත ලැබීම |
| අභිනව | අලුත් |
| පෙරදිග | නැගෙනහිර |
| අපරදිග | බටහිර |
| හසළ | මනා ලෙස පුරුදු පුහුණු කළ |
| ප්‍රාඥයකු | ප්‍රඥාව ඇත්තකු |
| භාෂා ඥානය | භාෂා දැනුම |
| රැකුලක් | උදව්වක් |
| අවධියේ | කාලයේ, යුගයේ |
| ප්‍රවීණ | නිපුණ, දක්ෂ |
| සහජීවනය | සහයෝගයෙන් ජීවත් වීම |
| සංකලනයක් | මනා එකතුවක් |
| සත් කාර්යයක් | යහපත් කටයුත්තක් |
| පරිශ්‍රමයෙන් | වෙහෙස වීමෙන් |

## අවබෝධය

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. i. භාෂා දැනුම එතුමාට මහත් රැකුලක් වූයේ කුමක් සඳහා ද?
   ii. එතුමා විසින් සොයා ගෙන එළි දැක්වූ අප්‍රකට ග්‍රන්ථය කුමක් ද?
   iii. එතුමා තම රදගුරු ලාංඡනය ලෙස යොදා ගත්තේ කුමක් ද?

2. එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා හලාවත පදවියෙහි රදගුරුවරයා ලෙස පත් වීමේ ඇති විශේෂත්වය කුමක් ද?

3. උගතුන් අතර උගතකු වූ එතුමාගේ ජාතික මෙහෙවර පිළිබඳව ඉදිරිපත් කළ හැකි සාක්ෂි මොනවා ද?

4. එතුමාගේ චරිතයෙහි ඔබ හඳුනා ගත් ආදර්ශයට ගත හැකි විශේෂ ලක්ෂණ මොනවා ද?

5. කතෝලික සංස්කෘතිය දේශීයත්වයට පත් කිරීමට එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා ගත් පියවර මොනවා ද?

## ක්‍රියා පද

කිරීමක් හෝ සිදු වීමක් හෝ විඳීමක් හෝ ගැන කියැවෙන පද ක්‍රියා පද ලෙස ඔබ 6 ශ්‍රේණියේ දී හඳුනා ගෙන ඇත. එහි දී ක්‍රියා පදවල කාල භේදය, පුරුෂ භේදය, වචන භේදය ගැන ද හදාරා ඇත. තව දුරටත් ක්‍රියා පද සම්බන්ධ බෙදීම් ගැන මෙහි දී අවධානය යොමු කෙරේ.

ක්‍රියා පදවල මූලික බෙදීම් දෙකක් ඇත.

1. අවසාන ක්‍රියා
2. අනවසාන ක්‍රියා

### අවසාන ක්‍රියා

වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන්නේ අවසාන ක්‍රියාව යි. පහත දැක්වෙන උදාහරණ දෙස බලන්න.

අක්කා මල් **නෙළයි.**
ළමයි වතුරට **පනිති.**
මල්ලී සඳ දෙස **බලයි.**
ගොවියෝ ගොයම් **කපති.**

මෙම වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන පද වාක්‍යයේ අවසානය දක්වන ක්‍රියා පද ලෙස යෙදී ඇත. මේ නිසා ඒවා අවසාන ක්‍රියා ලෙස හැඳින්වේ.

### අනවසාන ක්‍රියා

වාක්‍යයක ඇතුළත් වන ආඛ්‍යාතය ලෙස නො යෙදෙන ක්‍රියා අනවසාන ක්‍රියා ලෙස හැඳින්වේ. එබඳු ක්‍රියා පද වර්ග දෙකක් පිළිබඳව මේ පාඩමේ දී ඉගෙන ගනිමු.

i. මිශ්‍ර ක්‍රියා
ii. පූර්ව ක්‍රියා

## මිශ්‍ර ක්‍රියා

අවසාන ක්‍රියාව සමග සිදු වන තවත් ක්‍රියාවක් වේ නම් එය මිශ්‍ර ක්‍රියාවක් ලෙස හැඳින්වේ.

උදා : අක්කා මල් **නෙළමින්** වට්ටියට එකතු කළා ය.
ළමයි වතුරට **පනිමින්** සෙල්ලම් කළහ.
මල්ලී සඳ දෙස **බලමින්** සිනාසෙයි.
ගොවියෝ ගොයම් **කපමින්** කවි කියති.

මෙම වාක්‍යවල යෙදී ඇති නෙළමින්, පනිමින්, බලමින්, කපමින් යන ක්‍රියාවලින් වාක්‍යයේ අවසානයක් ගැන නො කියැවේ. අවසාන ක්‍රියාව සමග කළ වෙනත් ක්‍රියාවක් ගැන කියැවේ. ඒවා මිශ්‍ර ක්‍රියා නම් වේ.

## පූර්ව ක්‍රියා

අවසාන ක්‍රියාවට පෙර සිදු වූ හෝ සිදු කරන ලද හෝ ක්‍රියා පූර්ව ක්‍රියා නම් වේ.

උදා : අක්කා මල් **නෙළා** වට්ටියට එකතු කළා ය.
ළමයි වතුරට **පැන** සෙල්ලම් කළහ.
මල්ලී සඳ දෙස **බලා** සිනාසුණි.
ගොවියෝ ගොයම් **කපා** කමතට ඇදිති.

මෙම වාක්‍යවල යෙදී ඇති නෙළා, පැන, බලා, කපා යන ක්‍රියා පදවලින් ද වාක්‍යයේ අවසානයක් නො කියැවේ. අවසාන ක්‍රියාවට පෙර කර්තෘ විසින් කොට නිමවන ලද ක්‍රියා පූර්ව ක්‍රියා නම් වේ.

ඉහත වාක්‍යවල යෙදී ඇති ක්‍රියා පද මෙසේ වගු ගත කළ හැකි ය.

| අවසාන ක්‍රියා | මිශ්‍ර ක්‍රියා | පූර්ව ක්‍රියා |
|---|---|---|
| නෙළයි | නෙළමින් | නෙළා |
| පනිති | පනිමින් | පැන |
| බලයි | බලමින් | බලා |
| කපති | කපමින් | කපා |

ඇතැම් විට පූර්ව ක්‍රියාවක් ද්විත්ව වූ විට (දෙවරක් යෙදෙන විට) මිශ්‍ර ක්‍රියා අර්ථය ගෙන දෙයි.

උදා : නෙළ නෙළා = නෙළමින්    පැන පැන = පනිමින්
බල බලා = බලමින්    කප කපා = කපමින්

## ලිඛිත අභ්‍යාස

**1. පහත දැක්වෙන ඡේදයෙහි යෙදී ඇති මිශ්‍ර ක්‍රියා පද සහ පූර්ව ක්‍රියා පද පහ බැගින් සොයා ලියන්න.**

කෙත් වතු පසු කොට, වන රොදක් මැදින් ඇද්දා වූ ලණු පටක් සේ කෙළින් පිහිටි පාරකට බැස්සා වූ සේනාවගේ පෙරමුණ ගමන් කරන ගැල් පැද්දෙන හඬ අසා නින්දෙන් අවදි වූ වඳුරෝ කෑ-කෝ ගසමින් ගසින් ගසට පැන පලා යෙති. වන හිස එළිය කරමින් පියෑඹූ කණමැදිරියෝ වඳුරන් පැනීමෙන් පාත් වී උස් වන අතුවල හැපී ගිනි පුපුරු හැළෙන්නාක් මෙන් තණ කොළ වසමින් බිම වැටී, රත් පලසක වතළ මැණික් මෙන් බබළති. වඳුරන්ගේ පෙරළියෙන් බිය ගත් මුවෝ, ගෝන්නු, වල්ඌරෝ වන රොද බිඳිමින් පලා යෙති... බෙර දවුල් වැයීමක් නැතත් සේනාවෙහි ඇතැමෙක් ගී-සින්දු කියති... තවත් එකෙක් බොරු කථා ගොතා කියමින් අන්‍යයන් සිනස්සයි...දේදුන්නෙහි සියලු පැහැ එක් කොට ගෙන හිරු රැසින් අනා කළ දේට නිගා කළ, විසිතුරු පැහැයෙන් බබළන සිනිඳු පියාපත් ඇති සමනලයෝ, වන මල් පඳුරුවලට වඩාත් ළංව අහසේ පියාඹති. ගල් බැඳ කැටයම් කරන ලද රන් කෙවෙනි පොකුරක් වැනි, හීන් වන මල් පොකුරකට පාත් වී, පියාපත් සෙමින් උස් පාත් කරමින් මල් පැණි උරන සමනලයකු දකින හූනෙක් සෙමින් බඩ ගා-ගොස් ඌ දෙසට පනියි. හූනාට අසු නොවන සමනලයා, හිරු රැස් හා මිශ්‍රව අතුරුදහන් වන්නාක් මෙන් වහා පියාඹා පලා යේ. ඈත පිහිටි වෙල් යායවල කොක්කු, කොරවක්කු, ගැල් පැද්දෙන හඬින් බියව අහසට නැඟ, දුනු දියෙන් ගිලිහුණ ඊයක වේගයෙන් ඉවත පියාඹති. මඩෙහි ලැග උන් මී හරක් නැඟී සිට දෙකන් උඩ හිඳුවා ගෙන, ගමන් ගත් සේනාව දෙස විස්මයෙන් මෙන් බලති. ඇතැම් ගවයෙක් මඩ වගුරු කලඹ කලඹා දුවයි.

**රෝහිණී, මාර්ටින් වික්‍රමසිංහ**

ii. **පහත සඳහන් ඡේදයෙහි හිස් තැන් පිරවීමට සුදුසු පූර්ව ක්‍රියා පද වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කොට ලියන්න.**

"තාත්තා උදෙන් ම කුඹුරෙහි ලියදිවලට වතුර .......................... වක්කඩවල් .......................... ගෙදර ආවේ ය. කරෙහි වූ උදැල්ල බිම .......................... හිසෙහි වූ තොප්පිය අතට .......................... ළිඳ ළඟට .......................... වට පිට .......................... තොප්පිය දෙහි ගසෙහි .......................... ළිඳෙන් වතුර .......................... ඇඟ සේදුවේ ය. රෙදි .......................... වැලෙහි .......................... අම්මා ද ළිඳ ළඟට ආවා ය."
(සෝදා, තබා, බලා, බැඳ, හරවා, ගෙන, එල්ලා, වනා, ඇද, ගොස්)


iii. **පහත සඳහන් ඡේදයෙහි හිස්තැන් පිරවීම සුදුසු මිශ්‍ර ක්‍රියා පද වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කොට ලියන්න.**

දෙතුන් දිනක සිට තද වැසි .................... පැවතිණි. පෙරදිග සිට ආ සුළඟ වේගයෙන් හමා ගියේ ය. දිවා රෑ ඇති වූ කුණාටු නිසා බට පඳුරු 'සිරි සිරි' .................... පැවතිණි. බට පඳුරුවල මුදුන් කෙළවරවල් පොළොව සිඹින්නට විය. අහසේ ඉඩක් නැති තරමට වලාකුළු ගොඩ ගැසිණ. විටින් විට කලින් පැවතුණාට වඩා අඳුර .......................... පැවතිණ. ඈත අහසේ කොහේ දෝ තැනක සුර අසුරන්ගේ මහා සංග්‍රාමයක් ඇරඹී ඇති ලෙසක් පෙනේ.

දෙවියන් එවන ගිනි ගෙන දැවෙන හෙණ සැර, ගිනි .......................... ඇසි පිය හෙළන නිමේෂයකින් කාල වර්ණ සතුරු සේනාව සුනු විසුනු කර දමන නමුත් එයිනුත් විනාශ නො වූ සතුරෝ කාලවර්ණ සෙවණැලිවලින් අහසත් පොළවත් .................... සැරි සරති.

දිවා රෑ 'චිරි චිරි' හඬ නො කඩවා පැවතිණි. ගංගාවේ දිය වැඩිවෙමින් පැවතිණ. මේ ටිකට කොපමණ ගෙවල් දොරවල් කැඩී බිඳී ගොස් ඇද්ද? ගොඩ බිම සැම තැන ම ඇති ජලයත් ගංගාවේ ජලයත් එකට එකතු වී තිබිණි. ගව මහිෂාදීහු ගස් යට ද, බට පඳුරු යට ද ගෙමිදුල්වල ද හොඳට ම .................. සිටිති. ඇසෙන්නේ කුණාටුවේ හඬත් එක දිගට ම වහින හඬත් පමණි. අපූ පිලට අවුත් වහ වහා තෙමුණු හිසකෙස් .......................... දුර්ගා සමග කථා කළේ ය.
(අඳුරු කරමින්, සන වෙමින්, වසිමින්, පිස දමමින්, තෙමෙමින්, පිට කරමින්, හඬ දෙමින්, දුවමින්)

**මාවතේ ගීතය, චින්තා ලක්ෂ්මි සිංහාරච්චි**



# 8 කතා බහට සංයමයක්

'එකෝමත් එක රටක හිටියා ලස්සන කුමාරිකාවක්' යනුවෙන් කතන්දරයක් කියා දෙන්නට සැරසෙන ආත්තම්මාට හෝ සීයාට හෝ නෙත් අයා ගෙන මුව අයා ගෙන සවන් දෙන පොඩිත්තන් ඒ කතන්දරවල අග මුල හාරා අවුස්සන්නේ නොයෙකුත් ප්‍රශ්න නගමිනි. සවන් දීමේ පුරුද්ද කෙනෙකුගේ කථනය ද හැඩ ගස්වයි. සවන් දීමෙන් අවබෝධය පහසු වෙයි. අවබෝධය නොමැති වූ විට ප්‍රතිචාර දැක්වීම පහසු නො වනු ඇත.

මනාව සවන් දීමෙන් අනෙකාගේ හැඟීම් තේරුම් ගත හැකි ය. ප්‍රතිචාර දැක්වීමේ දී පුද්ගලයාගේ ස්වභාවය තේරුම් ගෙන ඒ අනුව හා ඊට ගැළපෙන ලෙස හඬ හා වචන භාවිත කළ යුතු ය. එසේ නො වුව හොත් බොහෝ ගැටලු මතු වෙයි. සංවාදයක දී සංයමයෙන් හා ආචාරශීලීව කරන කතා බහ, යහපත් මිනිසුන් නිර්මාණය කිරීමට හේතු වෙයි. සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී අප අතර සුහදතාව වර්ධනය කර ගැනීම ඉතා වැදගත් වෙයි.

විවේක කාලය අවසන් වූ බව දැනුම් දෙන සීනුව නාද වීමත් සමග ගුරුතුමිය පන්තියට පැමිණියා ය.

ගුරුතුමිය: " මම අද මේ දරුවන්ට පැහැදිලි කරන්නට සූදානම් වෙන්නේ අදහස් හුවමාරු කර ගැනීමේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු ගැන යි. ඉඳුනිලුත්, මහේන්ද්‍රත්, පූර්ණිමාත්, චාමින්දත් එන්න පන්තිය ඉස්සරහට. මම දැන් මේ හතර දෙනාට භාර දෙනවා සකස් කර ගත් සංවාද හතරක්. සංවාදය ඉදිරිපත් කරන්න යහළුවනුත් සම්බන්ධ කර ගන්න."

## පළමුවැනි සංවාදය

| | |
|---|---|
| ස්ථානය: | ජියුගාවෝකා දුම්රිය නැවතුම් පොළ. (ටිකට් දොරටුවෙන් පිට වීමට මව, ටොට්ටෝ චංගේ අතින් අල්ලා ගනී.) |
| ටොට්ටෝ චං: | "මම මේක තියා ගන්න ද?" (අතේ මිරිකා ගෙන සිටි අගනා ටිකට් පත, ටිකට් එකතු කරන්නාට දීමට මැළිව අසයි.) |
| ටිකට් එකතු කරන්නා: | "බැහැ, ඔයාට ඒක තියා ගන්න බැහැ" |
| ටොට්ටෝ චං: | "මේ ඔක්කොම ඔයාගෙ ද?" (ටිකට් පත්වලින් පිරුණු පෙට්ටිය දෙස බලමින් අසයි.) |
| ටිකට් එකතු කරන්නා: | "නෑ, නෑ, ඒවා අයිති දුම්රිය ස්ථානයට." |
| ටොට්ටෝ චං: | "මං ලොකු වුණා ම ටිකට් විකුණන කෙනෙක් වෙන්න ඕනෑ." |
| ටිකට් එකතු කරන්නා: | "මගේ චූටි පුතාටත් දුම්රිය පොළේ රස්සාවක් ඕනෑ ලු. ඔව්, ඔයාටත් එයත් එක්ක වැඩ කරන්න පුළුවන්." |
| ටොට්ටෝ චං: | "මං ලොකු වුණා ම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා" (ඈතින් නැවතී සිටි මවට හඬ ගා කියයි) |
| මව: | "මං හිතුවේ ඔයා ඔත්තුකාරියක් වෙන්න යනවා කියලා." |
| ටොට්ටෝ චං : | "ඔත්තු බලන ගමන් ම ටිකට් විකුණන කෙනෙකුත් වෙන්න මට බැරි ද?" |

ගුරුතුමිය: මේ සංවාදය සකස් කර ගත්තේ, දශකාර ජපන් දැරියක හා අසිරිමත් පාසලක් පිළිබඳව ලියැවුණු ජපන් ජාතික ටෙට්සුකෝ කුරොයානගී ලියූ ලීලානන්ද ගමාච්චි මහතා පරිවර්තනය කළ **හරි පුදුම ඉස්කෝලේ** කියන පොත ඇසුරෙන්. ඒ සංවාදය ගැන ඔබේ අදහස් ඉදිරිපත් කරන්න."

උත්පලා: "ටොට්ටෝ චං ටිකට් පතට ආසාවෙන් ටිකට් පත් එකතු කරන්නා සමග කළ කතා බහ හරි ම අපූරුයි. දෙදෙනා ම එකිනෙකාට සාවධානව ඇහුම්කන් දීම නිසා සුහදව වෙන් වුණා. ටොට්ටෝ චංගේ මවත්, ඒ දෙදෙනා අතරට නො පැන දෙදෙනාගේ සංවාදයට සවන් දුන්නා. ටොට්ටෝ චං ටිකට් එකතු කරන්නාගේ තත්ත්වය තේරුම් ගත්තා. ඒ සංවාදය අපූරුවට ඉදිරිපත් කළ සහෝදර සහෝදරියන්ට ස්තුති යි."

## දෙවැනි සංවාදය

ස්ථානය: නිමල්ගේ නිවස

"පුතා, උඹ යන්ට කැමති ද නුවර?"

"නෑ"

"ඇයි?"

"මට මෙහෙ හොඳයි"

"එහෙ ගියොත් සුදු අප්පොත් එක්ක සෙල්ලම් කරතැකි"

"මෙහි හිටියොත් අප්පච්චිගේ වැඩට උදවු කරන්ට පුළුවෙනි නොවැ"

"ඒකට කමක් නෑ. උඹ පලයන් නුවර. ගෙදර ගිහිල්ලා අම්මාට කියලා මොකක්වත් ඇඳ ගෙන කාරිය වරෙන්"

"කවදා ද අප්පච්චි මං ආයෙ එන්නේ?"

"මැණිකෙලා කී දවසක වරෙන්"

"අප්පච්චි කියන්නේ මට යන්ට ම කියල ද?"

"ඔව්, ගිහින් වරෙන්. නැත්තං කුමාරිහාමිලා තරහ වෙයි."

ගුරුතුමිය: මේ සංවාදය සකස් කර ගත්තේ ටී.බී. ඉලංගරත්න මහතා විසින් රචනා කරන ලද **අඹ යහළුවෝ** නවකතාව ඇසුරෙන්. නවකතාවට අනුව නිමල් සහ පියා අතර ඇති වූ කතාබහක් තමයි දැන් ඉදිරිපත් කළේ. නිමල් තමන්ගේ

තාත්තා සමග කතාබහ කරන්නේ ඉතා ම ගරුසරුව. ඒ වාගේ ම ළෙන්ගතුව බව ඔබ දකින්න ඇති. නිමල් නුවර යාමට අකමැති වුණත් එය ප්‍රකාශ කරන්නේ තරහකින් නො වෙයි. බොහෝ ම ආචාරශීලීව, කරුණාවන්තව. ඒ සංවාදය ඉදිරිපත් කළ දරුවන්ටත් අපි අත්පොළසන් නාදයක් ලබා දෙමු.

## තුන්වැනි සංවාදය

ස්ථානයඃ ගැමි නිවසක්

"අම්මේ, අපි ගිහින් එන්නම්."

"මගේ පුතාට තුනුරුවන් පිහිටයි"

"අක්කේ"

"මොකද මල්ලී, මොනවත් බැරි වුණා ද?"

"ඕක තමයි. මම ඊයේ රෑත් කිවුවේ, ගෙන යන ඒවා හොඳ සිහියෙන් දා ගන්න කියලා"

"නෑ මං කතා කළේ මල් පාත්තිය බලා ගන්න කියන්න."

"අක්කට බැරි නම් ලොකු නංගිටවත් කියලා වතුර දම්මවන්න ඕනෑ"

"නෑ මල්ලියෙ, මට පුළුවන් ඔය මල් පාත්තියට සාත්තු කරන්න."

ගුරුතුමියඃ මේ සංවාදය සකස් කර ගත්තේ මඩවල එස්. රත්නායක මහතාගේ **අක්කර පහ** කෘතියෙන්. එක් සහෝදරයකු නිවසින් පිටව යද්දී අනෙක් සහෝදර සහෝදරියන් වගකීම් භාර ගැනීමට ඉදිරිපත් වන අවස්ථාවක්. සහෝදර සහෝදරියන් අතර පවතින බැඳීම මත කෙනෙකු අනෙකා වෙනුවෙන් කටයුතු කරන්නට පෙලඹෙන්නේ එම ඉල්ලීමෙහි පවතින කාරුණිකභාවය නිසා යි. අණ කිරීමකට වඩා ඉල්ලීමකට ප්‍රතිචාර දක්වන්නට ඕනෑ ම කෙනෙක් කැමති යි. මේ සංවාදයෙන් ඒ බව පැහැදිලි වෙනවා. මේ දූලා පුතාලටත් බොහෝ ම ස්තුති යි. මේ සංවාදයට සහභාගි වුණාට.

## හතරවැනි සංවාදය

ස්ථානයː පරගොඩ පන්සල
(බෝධි පූජාව සඳහා පැමිණි සැදැහැවත්හු බෝ මළුව අමදින්නට වූහ)

විහාරාධිපති ස්වාමීන් වහන්සේː "උපාසක මහත්තයෝ, අද බෝධි පූජාවේ ප්‍රධාන දායක තැන කවුද?"

උපාසක තැනː "අවසරයි, ලොකු හාමුදුරුවනේ, අද බෝධි පූජාව විදානෙ රාලහාමිගේ ගෙදරින්."

විහාරාධිපති ස්වාමීන් වහන්සේː "විදානෙ රාලහාමි පැමිණිලා ද?"

උපාසක තැනː "එහෙයි, හාමුදුරුවනේ. උන්නැහේ බුද්ධ පූජාවට ගිලන්පස සූදානම් කරනවා."

විහාරාධිපති ස්වාමීන් වහන්සේː "ඒ කටයුතු අහවර වුණා ම ආවාස ගෙට ඇවිත් මාව බැහැ දකින්ඩ කියනවා හොඳයි. පොඩි හාමුදුරුවෝ පූජාවට වඩියි."

උපාසක තැනː "එහෙමයි, අපේ හාමුදුරුවනේ. මට යන්ඩ අවසර"

විහාරාධිපති ස්වාමීන් වහන්සේː "හොඳ යි. ගොහින් එන්ඩ."

ගුරුතුමියː මේ සංවාදය අපි මීට පෙර ඉදිරිපත් කළ සංවාදවලට වඩා වෙනස්. මේ පූජ්‍ය පක්ෂය සමග කෙරෙන සංවාදයක් ලෙස නිර්මාණය කර ගත් දෙබසක්. මෙහි දී යොදා ගත් වාංමාලාව වෙනස්. සාමාන්‍ය පුද්ගලයන් සමග කතා බහ කිරීමට යොදා ගන්නා භාෂාව පූජක උතුමන් සමග කතා බහ කරද්දී යොදා ගන්න බැහැ. ඉතා ම සංවරව ආචාරශීලීව ගෞරවාන්විතව තමයි අප කතා කළ යුතු වන්නේ. ඒ සංවාදය ඉදිරිපත් කළ දරුවන්ටත් බොහෝම ස්තුති යි.

කතා බහේ දී අනෙකාට සවන් දීම ඔහුට කරන ලොකු ම ගෞරවය යි. සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස හඬ පාලනය කර ගත යුතු යි. නැත්නම් අනවශ්‍ය ඝෝෂාවක් ඇති වෙනවා. සංවාදයේ දී අනෙක් තැනැත්තාගේ හිත රිදවීම අයහපත් හැසිරීමක්. ඒ අයගේ ගෞරවය රැකෙන

පරිදි ඉතා ම විනීතව, සංවරව සංයමයෙන් කතා කිරීම තමන්ගේ හික්මුණු බව හා යහපත් හැදියාව පෙන්වන කැඩපතක්. අදහස් හුවමාරු කර ගැනීමේ දී මේ කරුණු හොඳින් මතකයේ රඳවා ගන්න. දැන් හැම දෙනා ම නැගිටින්න. ආයුබෝවන්! දරුවනේ."

ළමයි: "ආයුබෝවන් ! ගුරුතුමියනි."

## ලිඛිත අභ්‍යාස

1. පාසල් භූමියේ, තම පන්තියට අදාළ කොටස පිරිසිදු කිරීම හා අලංකාර කිරීම නිසි ලෙස පවත්වා ගෙන යෑමට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව කෙරෙන සාකච්ඡාවක් ඇසුරෙන් සංවාදයක් ගොඩ නගන්න.
2. ලියුමක්, ලියාපදිංචි තැපෑලෙන් යැවීම සඳහා තැපැල් කන්තෝරුවට යන ඔබ එහි සේවය කරන නිලධාරියකුගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගන්නා ආකාරය සංවාදයකට නගන්න.
3. දහම් පාසලේ පැවැත්වෙන උදය රැස්වීම ආරම්භ කිරීම සඳහා ප්‍රධානාචාර්යතුමාට ආරාධනා කරමින් එතුමා සමග කරන කතා බහ ඇසුරෙන් සංවාදයක් නිර්මාණය කරන්න.
4. තම ආදරණීය මව හෝ පියා හෝ කනගාටුවෙන් සිටින අවස්ථාවක ඇය හෝ ඔහු හෝ සමග කරන සුහද කතා බහ සංවාදයකට නගන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ගැන අවධානය යොමු නො කිරීමෙන් සිදු වුණු කලබැගෑනියක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.
2. සන්නිවේදනයේ දී ශ්‍රවණය හා කථනය යහපත් ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් 'පුවරු වැකි' ලෙස නිර්මාණය කර පාසලෙහි ප්‍රදර්ශනය කරන්න.
3. ඔබ නිර්මාණය කළ සංවාද වාචිකව ඉදිරිපත් කරන්න.
4. පාඩමෙහි ඇතුළත් සංවාද රංගනය කරන්න.



# 9 තිලමුට්ඨි ජාතකය

බෝධිසත්ත්වයන්ගේ පෙර ආත්මවල කතා ලෙස නිර්මාණය කරන ලද ජාතක කතා ඇතුළත් පන්සිය පනස් ජාතක පොත පැරණි සිංහල පත පොත අතර වැදගත් පොතක් සේ සැලකෙයි. මිනිස් චරිත පමණක් නො ව සත්ත්ව චරිත ද යොදා ගනිමින්, ජීවිතය සාර්ථක කර ගැනීමට උපදේශ සපයන ග්‍රන්ථයක් ලෙස ද ජාතක පොත සැලකිය හැකි ය. කුරුණෑගල රාජධානි සමයේ වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ ඉල්ලීමක් පරිදි රචනා කරන ලදැයි සැලකෙන පන්සිය පනස් ජාතක පොතේ ඇත්තේ කතා 547කි. ආසන්න දහයේ ගුණාකාරයට වැටයීමෙන් කතා 550ක් සේ ගත් බව සිතිය හැකි ය. ජාතක කතා පොතෙන් උපුටා ගත් 'තිලමුට්ඨි ජාතකය' මේ පාඩමට ඇතුළත් වේ.

යට ගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බ්‍රහ්මදත්ත නම් රාජ කුමාර කෙනෙක් ඇත්තාහ. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් තමන්ගේ පුතණුවන්ට මස්සෙන් දහසක් හා පිළී සඟලක් හා පත් කුඩයක් හා වහන් සඟලක් හා බත් මුළක් ආදි වූ දෙය දී "දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගෙන එව" යි යැවූහ.

එකියන කුමාරයාත් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරී දකින්නට ගිය වේලාවට දිසාපාමොක් ආචාරීහු ශිෂ්‍යයන් ශිල්ප ශාස්ත්‍ර උගන්නා මිදුලෙහි සක්මන් කොට සිටියාහ. ඒ වෙලාවට රාජ කුමාරයන් ළඟ එන්නා දැක "ඇයි තොප කුමට අවුදැ" යි විචාරා "ශිල්ප උගන්නට ආමි" යි කී කල්හි ආචාරීන්ට වස්තු දී ශිල්ප දැක උගනු ද? කුලියට උගනු ද? යි විචාළ කල්හි රාජ කුමාරයෝත් ආචාරී භාගයක් පළමු කොට තබා වැඳ හොත්තාහ. එවිට දිසාපාමොක් ආචාරීහු "රාජ කුමාරවරුන් නම් කල් යවා ශිල්ප උගන්නට බැරි ය, වහා ශිල්ප උගත මැනැවැ" යි කියා සාමාන්‍ය නකත් සලස්වා ශිල්ප උගන්නට පටන් ගැන්වූහ. එක් දවසක් රාජ කුමාරයන් පිටි පස්සේ ලා ගෙන නාන්නට වැවට යමින් සිටියාහ. ඒ වේලාවට එක්තරා මැලි ස්ත්‍රියක් එළ කරපු තල අව්වේ වනා වියළමින් සිටියා ය. ඒ වේලාවට දිසාපාමොක් ආචාරී පස්සේ යමින් සිටි රාජ කුමාරයෝත් එකියන එළ තල දැක කන්න අභිප්‍රාය ඇතිව ගාණක් අතට කා පූහ. එකියන මැලි ස්ත්‍රීත් ඒ දැක "කුඩා කොල්ලා හෙයින් බඩ සයින් කා පුව මැනැවැ" යි සිතා බැණ නො නැඟී සිටියාහ.

දෙවන දවසුත් එපරිද්දෙන් ම රාජ කුමාරයෝත් එළ තල ගාණක් ඇර ගෙන ගියාහ. තුන් වන දවසුත් එපරිද්දෙන් ම ඇර ගත්තාහ.

එවිට ස්ත්‍රී සිතන්නී "මේ නියායෙන් දවස් පතා කත් නම් මාගේ තල නිමා යෙයි" කියා සිතන්නී "දිසාපාමොක් ආචාරීන් වහන්ස, තමන් වහන්සේගේ අතවැස්සන් ලවා මගේ තල ගන්නා සේකැ" යි මොර ගෑව. එවිට දිසාපාමොක් ආචාරී "ඇයි මෑණියනි, මම කුමන අන්‍යායවක් කෙළෙම් ද" යි කී ය. එවිට ස්ත්‍රී කියන්නී, "නුඹ වහන්සේ පස්සේ යන අතවැසි තුන් වාරයක් මාගේ තල ඇර ගෙන ඉනිබ්බේත් තල ගනිත් නම් මාගේ තල නිමන්නේ ය" යි කියා මොර ගා කී ය. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු "ඊට තොප වික්ෂේප නො ව; තොපගෙන් කෑ තලවලට මම මිල දෙමි" යි කීහ.
එවිට ස්ත්‍රී කියන්නී "කෑ තලයට මිල එපයි; ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව" යි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු "ඉදිරියේ

දී පාටව කෙරෙමි" යි කියා අතවැස්සන් දෙන්නකුන් ලවා දෑත් තර කර අල්ලා උණ පත්තෙන් පාර ගණනක් ගස්වා පාටව කරවූහ.

එවිට රජ කුමරාත් දෑස් රත් කොට උරණව මුහුණ බලා වෛර බැන්දේය. දිසාපාමොක් ආචාරීහු තමන් කෙරේ වෛර බැඳි නියාව දත්හ; දැන දැනත් සියලු ශාස්ත්‍ර උගන්වා නිපුණ කරවූහ. ඒ රාජ කුමාරයෝත් දිසාපාමොක් ආචාරීන් වැඳ නුවරට යන්නාහු "ආචාරීන් වහන්ස, මම සැප සේ රාජ්‍යයට පැමිණියෙම් වීම් නම් නුඹ වහන්සේ කැඳවා එවමි; එවිට අව මැනැවැ" යි කියා තමන්ගේ රටට ගොස් තමන්ගේ පිය රජ්ජුරුවන්ට ශිල්ප දැක්වූහ.

එවිට රජ්ජුරුවෝ සමාධිව "මා ඇස් හමුයේ මොහුගේ රාජ්‍යශ්‍රීය දකිමි" යි සිතා රාජ්‍යශ්‍රීය දුන්නාහ. එකියන රාජ කුමාරයෝත් රාජ්‍යයට පැමිණ දිසාපාමොක් ආචාරීන්ට පාටව කරන්නා කැමැතිව ආචාරීන් වහන්සේ මා කෙරේ සැක නො සිතා වහා එන්නේ යහපතැ යි කියා යැවූහ. එපවත් දිසාපාමොක් ආචාරීන් වහන්සේ අසා "රජ්ජුරුවන් වහන්සේ මා කැඳවා එවන්නේ මට ස්නේහයෙන් නො වෙයි; මා ගැසු පාරට නිග්‍රහ කරන්නට ය" යි සිතා දැන කුමාරයෝ බාලයෝ ය; එසේ හෙයින් මා කියන අවවාද දැන් අසන්නෝ නො වෙති. පසුව වැඩිමාලු වයසට පැමිණි කල යෙමි යි සිතා නො ගොස් කල් යාමක් කොට රජ්ජුරුවන් වැඩිමාලුව ගිය පසු දිසාපාමොක් ආචාරීහු නො කැඳවා ම තුමූ ගියහ. ගොස් වාසල සිට තමන් ආ පවත් කියා යැවූහ. එපවත් අසා රජ්ජුරුවෝ "යහපත ආචාරීන් වහන්සේ කැඳව" යි කියා කැඳවා කියන්නාහු "ඇයි ආචාරීනි, තොපි මරණ නළලේ තබා අවු ද? එදවස් තොප විසින් මා තල කෑව යි කියා දෙන්නකුන් ලවා අත් දෙක අල්ලා උණ පත්තෙන් තැල්වූ පාර තව දක්වා මගේ පිටේ රිදෙන්නේ ය" යි කියා "අමාත්‍යයෙනි, මේ දිසාපාමොක් මරව" යි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු රජ්ජුරුවෙනි, එදවස් තොප කෑ තලයට පාරක් නො ගැසී නම් දෙවෙනි දවස් අනික් සොරකමක් කරනා සේක. එවිට යම් කෙනෙක් මරා දමා පූ නම් මේ රාජ්‍යශ්‍රීය ලබන්නට නැත්තේ වේ ද? එසේ හෙයින් හික්මවීම පිණිස කළ පාටවයට උත්තමයෝ වෛර නො බඳිති" යි කියා කීහ.

එපවත් අසා බොහෝ අමාත්‍යයෝත් "එසේ ම ය දේවයන් වහන්ස, දිසාපාමොක් ආචාරීන් වහන්සේ පිණිස රාජශ්‍රීය නුඹ වහන්සේ ලද සේකැ"යි කීහ. රජ්ජුරුවෝ ඒ කාරණය සිතා ගෙන ආචාරීන්ගේ බොහෝ ගුණ සඳහන් කොට කියන්නාහු "දිසාපාමොක් ආචාරීනි, රාජ්‍යයට පැමිණියේ තොප පිණිස ය; එසේ හෙයින් රාජ්‍යය පිළිගනුව" යි කීහ. එපවත් අසා දිසාපාමොක් ආචාරීහු

රාජ්‍යය නො ගිවිස්සාහ. රජ්ජුරුවෝත් තමන්ගේ මිනිසුන් යවා ආචාරීන්ගේ අඹුදරුවන් ගෙන්වා ගෙන තමන්ගේ නුවර ලා ආචාරීනට බොහෝ තරම් පදම් සලස්වා තමනට පුරෝහිත තනතුරෙහි තිබුවේ දැයි වදාරා මේ තිලමුට්ඨි ජාතකය නිමවා වදාළ සේක.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| මස්සෙන් දහසක් | මසුරන් දාහක්/රන්කාසි දාහක් |
| පිළී සඟළක් | රෙදි යුගලයක්/ඇඳුම් දෙකක් |
| පත් කුඩයක් | හිසට අල්ලා ගෙන යන තල්පතක් |
| වහන් සඟළක් | පාවහන් යුගලයක් |
| ආචාරී භාග | ගුරු පඬුරු |
| සාමාන්‍ය නකත් සලස්වා | ශුභ වේලාවක් බලා |
| පිටිපස්සේ ලා ගෙන | පසු පසින් කැඳවා ගෙන |
| මැලි ස්ත්‍රියක් | මහලු ස්ත්‍රිය |
| එළ තල | කළු පැහැති පියලි ඉවත් කළ තල |
| ගාණක් අතට | අතට අල්ලන ප්‍රමාණය/මිටක් |
| බඩ සයින් | බඩගිනි බැවින් |
| කා පුව මැනවයි | කෑවාට කමක් නැතැයි |
| බැණ නො නැඟී | කතා නො කොට |
| මේ නියායෙන් | මෙපරිද්දෙන්/මේ ක්‍රමයෙන් |
| අතවැස්සන් | අන්තේවාසිකයන්/යටත් වැසියන්/ශිෂ්‍යයන් |
| අන්‍යාවක් | අවනීතියක්/නුසුදුසු ක්‍රියාවක් |
| ඉනිබ්බේත් | ඉන් පසුවත් |
| වික්ෂේප නො ව | ශෝක නො කරව/පසුතැවිලි නො ව |
| පාටව කෙරෙමි | දඬුවම් කරමි |
| උණ පත්තෙන් | උණ පතුරකින් |
| උරණව | කෝප වී |
| නිපුණ කරවූහ | පුහුණු කළහ |
| අභිප්‍රාය ඇතිව | කැමැත්ත ඇතිව/අදහස ඇතිව |

| | |
|---|---|
| සමාධිව | සතුටට පත්ව |
| ස්නේහයෙන් | ආදරයෙන්/සෙනෙහසින්/කරුණාවෙන් |
| වැඩිමාලු | වයස්ගත වූ/වයසින් මුහුකුරා ගිය |
| නිග්‍රහ | අවමාන |
| බොහෝ තරම් පදම් සලස්වා | බොහෝ සම්පත් දී සුදුසු තත්ත්වයේ පිහිටුවා/ පුරෝහිත තනතුරෙහි පිහිටුවා |

## අවබෝධය

1. මේ කතාවේ ප්‍රධාන චරිත මොනවා ද?
2. රාජ කුමාරයා තල කෑවේ කුමන කාර්යයක් සඳහා යමින් සිටිය දී ද?
3. මහලු ස්ත්‍රිය, කුමරා කෑ තල වෙනුවෙන් බලාපොරොත්තු වූයේ මොනවා ද?
4. රාජ කුමාරයාගේ පණිවුඩය ලැබුණ ද දිසාපාමොක් ආචාරීන් ඔහු හමුවට නො ගොස් සිටියේ මන්ද?
5. තමා මැරීමට රජ කුමරු නියෝග දුන් අවස්ථාවේ දිසාපාමොක් ඇදුරුතුමා, නිදහසට කරුණු වශයෙන් පැවසුවේ කුමක් ද?

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් ශීර්ෂ යටතේ තිලමුට්ඨි ජාතක කතාව සරලව ලියා දක්වන්න.

   i. කුමරු දිසාපාමොක් ආචාරීන් වෙත යෑම
   ii. තල කෑමේ සිද්ධිය
   iii. ආචාරීන්ට පණිවුඩ යැවීම
   iv. ආචාරීන් රජු හමුවට යෑම

2. වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

   i. දිසාපාමොක් (ආචාරීහු/ආචාරීන්) බ්‍රහ්මදත්ත කුමරුට ශිල්ප ඉගැන්වූහ.
   ii. (රාජ කුමාරයන්/රාජ කුමාරයා) නාන්නට වැවට ගියේ ය.
   iii. (කාන්තාවක්/කාන්තාවක) තල වේළමින් සිටියා ය.
   iv. (අතවැස්සන්/අතවැස්සෝ) කුමරුගේ දෑත් අල්ලා ගත්හ.
   v. (අමාත්‍යයන්/ආමාත්‍යයෝ) දිසාපාමොක් ආචාරීන්ගේ ගුණ කීහ.

## ප්‍රායෝගික අභ්‍යාස

1. තිලමුට්ඨි ජාතකයෙන් ජීවිතයට ලැබිය හැකි ආදර්ශ පිළිබඳව පන්තිය ඉදිරියේ කතාවක් කරන්න.

2. වෙනත් ජාතක කතාවක් සොයා ගෙන කියවන්න. ඒ කතාවේ සහ තිලමුට්ඨි ජාතකයේ දැකිය හැකි සමානතා විමසා බලන්න.



# 10 අපේ ලෝහ තාක්ෂණයේ යටගියාව

මිනිසා සත්ත්ව ලෝකයේ සෙසු සාමාජිකයන්ගෙන් වෙනස් වන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ විවිධ මෙවලම් හා උපකරණ භාවිතය යි. මෙවලම් හා උපකරණ තැනීමට ආදි මානවයා ගල්, දැව, සත්ත්ව ඇට කටු හා මැටි වර්ග භාවිත කළේ ය. මානව පරිණාමයේ සන්ධිස්ථානයක් සලකුණු කරමින් ඔහු විවිධ ලෝහ වර්ග භාවිත කරමින් තමන්ට අවශ්‍ය උපකරණ හා මෙවලම් තැනීමට හුරු විය.

ලෝහ තනා ගත්තේ ඒ ඒ ලෝහය අඩංගු පාෂාණ නිස්සාරණය කිරීමෙනි. මිනිසා මුලින් ම භාවිත කළ ලෝහ වර්ග වන්නේ තඹ, රන්, රිදී, ඊයම් ආදිය යි. යකඩ ලෝහය සොයා ගැනුණේ මිනිසා ලෝහ සොයා ගැනීමෙන් වසර තුන් දහසකට පමණ පසුව ය. කාර්යක්ෂම උපකරණ තැනීම සඳහා ලෝහ කිහිපයක් මිශ්‍ර කොට සකස් කරන ලද ලෝකඩ, පිත්තල, වානේ ආදි මිශ්‍ර ලෝහ නිපදවා ගැනීමට ද මිනිසා කටයුතු කර ඇත. වසර දහස් ගණනක් ගල් යුගයේ විසූ මිනිසා ලෝහ භාවිතයට නැඹුරු වීමත් සමග ශීඝ්‍ර දියුණුවක් අත් පත් කර ගත්තේ ය. කෘෂිකර්මාන්තය දියුණු වී විශාල නගර නිර්මාණය වූයේ එහි ප්‍රතිඵල වශයෙනි. ලක්දිව ලෝහ තාක්ෂණයේ ඉතිහාසය පිළිබඳ මේ පාඩම පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අර්ජුන තන්තිලගේ මහතාගේ උපදේශකත්වයෙන් සම්පාදනය කෙරුණකි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ලක්දිව ආදි මානවයා පිළිබඳ සාධක ක්‍රිස්තු පූර්ව 37000 පමණ කාලයෙහි පටන් දැක ගත හැකි වෙයි. එදා පටන් ක්‍රිස්තු වර්ෂ පළමු සහස්‍රකය තෙක් ඔහු විසින් බහුලව භාවිත කරන ලද්දේ ශිලා මෙවලම් ය. යකඩ තාක්ෂණය ඉන්දියානු අර්ධද්වීපය ඔස්සේ මෙරටට පැමිණි බවට මතයක් වෙයි.

ලංකාවේ ඓතිහාසික යුගයට අයත් ආදි මානව ක්‍රියාකාරකම් වාර්තා කරන ආදි බ්‍රාහ්මී ලෙන් ලිපිවල කබර, තබකර, තුලදර වැනි යෙදුම් හමු වෙයි; මේවා යකඩ, තඹ, රන් කර්මාන්තවල නියැලුණු ශිල්පීන් හැඳින්වීමට යෙදුණු නම් කිහිපයකි. ආදි ලංකාවේ ග්‍රාම නාම අතර ද රිදීගම, තුලාධාර ගම, තම්බපිට්ටි ග්‍රාම වැනි නම් හමු වීමෙන් පෙනී යන්නේ එම ප්‍රදේශ ඒ ඒ ලෝහ වර්ගය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇති බව යි. බ්‍රාහ්මී ලෙන් ලිපි ලියැවුණේ ද ලෝහ උපකරණ භාවිතයෙනි.

ලෝහ තාක්ෂණය පිළිබඳ පුරාවිද්‍යා පර්යේෂණවලින් පෙනී යන්නේ ලෝහ අඩංගු පාෂාණ හඳුනා ගැනීමට හා ඒවා ඇසුරෙන් ලෝහ නිෂ්පාදනයට ශ්‍රී ලාංකිකයා සමත් වූ බව යි. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික ඥානය මෙන් ම ශිල්පීය ප්‍රාගුණ්‍යයත් ඔවුන් සතුව පැවති බව මෙයින් අනාවරණය වෙයි.

දිවයින පුරා බෞද්ධ ශිෂ්ටාචාරය ව්‍යාප්ත වීමත් සමග මෙවලම් හා උපකරණ සඳහා මෙන් ම විහාරාරාමවල ගෘහ නිර්මාණ අංග සඳහා ද ලෝහ භාවිතයට ගත් බවට සාධක හමු වෙයි.

ඓතිහාසික තොරතුරු අනුව ලංකාවේ යුද කටයුතුවල දී ලෝහ ආයුධ භාවිත කළ බව සඳහන් වේ. විජයගේ සිරීසවත්ථු ආක්‍රමණය, පණ්ඩුකාභයගේ සටන් වැනි පුරාවෘත්ත මෙන් ම ඓතිහාසික සිද්ධියක් සේ සැලකිය හැකි දුටුගැමුණු රජුගේ අනුරාධපුර සංග්‍රාමය ආදි සටන් සඳහා යොදා ගත් දුනු, හී, කඩු, පලිහ, හෙල්ල, තෝමර ආදි ආයුධ සඳහා ලෝහ භාවිත කළ බව පෙන්වා දිය හැකි ය. දුටුගැමුණු රජු විජිතපුර බළකොටුව ජය ගැනීමට පැමිණි විට සතුරු සේනා කණ්ඩුල ඇතා මතට උණු කළ ලෝහ වත් කළ බව ද ඉතිහාසයේ දැක්වෙයි.

ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ දුටුගැමුණු රජ සමයේ මහා විහාරයේ පෝය ගේ වශයෙන් ඉදි කෙරුණු සත් මහල් ගොඩනැගිල්ල ප්‍රචලිත වූයේ ලෝහ පාසාද හෙවත් ලෝවා මහා පාය නමිනි. එහි අරුත වන්නේ 'ලෝහයෙන් තැනූ ගොඩනැගිල්ල' යනු යි. මෙහි පියස්සට යොදන ලද්දේ තඹ උළු බව පැවසේ.

ක්‍රි.ව. පළමුවන සියවසේ වසභ රජුගේ කාලයට අයත් අකුරු ලියූ රන් තහඩුවක් හමු වී තිබේ. එය සොයා ගැනුණේ යාපනය දිස්ත්‍රික්කයේ වල්ලිපුරම් නම් ගම් ප්‍රදේශයෙනි. මෙය, ලෝහ තහඩු මත අකුරු ලිවීමේ සම්ප්‍රදායක් පැවති බව සනාථ කරයි. මීට පෙර ක්‍රි.ව. තුන්වන සියවසේ දී දේවානම්පියතිස්ස රජු දවස රන් පතක වාක්‍යයක් ලියවා තැබූ බවත්, ක්‍රි.පූ. පළමුවන සියවසේ වළගම්බා රජු දවස ත්‍රිපිටකය රන් පත්වල ලියවූ බවත් වෘත්තාන්තවල දැක්වෙයි.

විවිධ ලෝහ භාවිතයෙන් අතීත ලාංකිකයා නිර්මාණය කළ විවිධ කලා නිර්මාණ රාශියක් අප අතට පත් වී තිබේ. ඒ අතුරෙන් බුද්ධ ප්‍රතිමා, විවිධ බෝධිසත්ත්ව හා දේව ප්‍රතිමා සහ විවිධ කරඬු ප්‍රමුඛස්ථානය උසුලයි. මේ ප්‍රතිමා බොහෝමයක් පිත්තල හෝ ලෝකඩ හෝ යොදා ගෙන නිර්මාණය කර තිබේ. ඇතැම් ප්‍රතිමා රන් ආලේප කොට තිබේ. තඹ හා ලෝකඩ යන ලෝහවලින් තැනූ පාත්‍ර ආදියේ අවශේෂ ද හමු වී ඇත. ලෝහ උපයෝගි කර ගනිමින් කාසි නිෂ්පාදනය කළ බවට ද සාධක හමු වෙයි. මේ සඳහා ලෝකඩ, තඹ මෙන් ම රිදී හා රන් ද යොදා ගෙන තිබේ.

අභයගිරි සහ ජේතවන ආරාම හා සම්බන්ධ ලෝහ භාණ්ඩ නිෂ්පාදනය කරන කම්හල් පැවති බව පුරාවිද්‍යාත්මක සාධකවලින් හෙළි වෙයි. විවිධ ලෝහ භාවිත කරමින් ආගමික අගයක් සහිත කලා කෘති නිෂ්පාදනය කළ බවට සාධක මේවායින් හමු වේ. අභයගිරියේ ලෝහ කර්මාන්ත පරිශ්‍රයෙන් ලැබුණු තවත් වැදගත් සාධකයක් වන්නේ කාසි නිෂ්පාදනය සඳහා භාවිත කළ අච්චු හා ඒ සඳහා යොදා ගත් රන් පිඬු යි.

රන් ආදි වටිනා ලෝහ භාවිත කරමින් විවිධ කලා කෘති නිෂ්පාදනය කිරීම ප්‍රචලිතව පැවතුණු බැවින් ‘දඹ රන්’ හෙවත් අමිශ්‍ර රන් භාවිත කරමින් තනන ලද පිළිම ආදිය ඇති බවට වැරදි විශ්වාසයක් ප්‍රචලිතව තිබේ. එහෙත් අමිශ්‍ර රන් භාවිතයෙන් කුඩා තහඩු වැනි යමක් හැරෙන්නට විශාල පිළිම තැනිය නො හැකි ය. රන් ලෝහයේ අඩු දෘඪතාව හේතුවෙන් පිළිම හා කාසි ආදිය නිෂ්පාදනයේ දී තඹ හා රිදී වැනි ලෝහ සමග මිශ්‍ර කර ගැනීමට සිදු වේ.


## පැරණි ලෝහ නිස්සාරණය

ලෝකයේ බොහෝ ලෝහ වර්ග ස්වාභාවිකව පරිසරයේ ශුද්ධ ලෝහ ලෙස නො පවතින අතර ඔක්සිජන්, සල්ෆර් වැනි මූලද්‍රව්‍ය සමග සංයෝගව ඛනිජ ද්‍රව්‍ය ලෙස පවතී. මෙම ඛනිජ වර්ග නිස්සාරණයට භාජන කිරීම මගින් ලෝහ ලබා ගැනේ. අතීතයේ යකඩ නිස්සාරණය සිදු කර ඇත්තේ යකඩ අඩංගු


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඛනිජයක් වන හීමටයිට් (මෙය බොහෝ විට කළු පැහැති තද ගතියෙන් යුත් කැට ලෙස කබොක් සමග පවතී) භාවිතයෙනි.

හීමටයිට් දැව අඟුරු සමග මිශ්‍ර කර උඳුනක් තුළට දමා දර මගින් ඉහළ උෂ්ණත්වයට රත් කිරීමෙන් යකඩ නිස්සාරණය කෙරේ. මෙහි දී අපද්‍රව්‍ය බොර ලෙස වෙන් වේ. පුරාවිද්‍යාඥයෝ යකඩ නිස්සාරණය කළ පුරාණ ස්ථාන හඳුනා ගැනීමට මෙම බොර විසිරී තිබීම යොදා ගනිති.




(පැරණි ලෝහ උඳුනක හරස් කඩක්)

## ශ්‍රී ලංකාවේ පැරණි ලෝහ නිස්සාරණය පිළිබඳ සාධක

ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳ මුල් ම සාධක ක්‍රි.පූ. 900ට පමණ අයත් බව අනුරාධපුර ඇතුළු නුවර කැණීමෙන් සොයා ගෙන ඇත. දිවයිනේ ඉපැරණි යකඩ නිෂ්පාදන ස්ථාන දහස් ගණනක් වියළි කලාපයෙහි හා අතරමැදි කලාපයන්හි දැක ගත හැකි ය. ශ්‍රී ලංකාවේ පැරණි යකඩ නිස්සාරණය සඳහා භාවිත උඳුනක් දැනට සීගිරිය කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. සීගිරිය උඳුන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වාතය මයිනහමක් ආධාරයෙන් ලබා දී ඇතැයි විශ්වාස කෙරේ. බළංගොඩ සමනල වැව ප්‍රදේශයෙන් සොයා ගෙන ඇති පැරණි යකඩ උඳුනේ විශේෂත්වය වන්නේ එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වාතය ස්වාභාවික සුළං මාර්ගයෙන් ලබා ගැනීම යි. මේ සඳහා මෙම උඳුන් කඳු බෑවුම්වල සුළං දිශාවට මුහුණ ලා තනා ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනය 2014 වර්ෂයේ සේරුවිල සිදු කළ පර්යේෂණ මගින් ශ්‍රී ලංකාව අතීතයේ මෙම කලාපය තුළ තඹ නිෂ්පාදනය පිළිබඳ ඉතාමත් වැදගත් මධ්‍යස්ථානයක්ව පැවති බව අනාවරණය කර ගන්නා ලදි. මෙහි දී සොයා ගත් තඹ උඳුන ක්‍රි.පූ. 400ට පමණ අයත් බව කාබන් 14 කාල නිර්ණයන්ගෙන් සනාථ වී ඇත. සේරුවිල ප්‍රදේශයේ වාණිජ මට්ටමින් විශාල වශයෙන් නිෂ්පාදනය කළ තඹ අපනයනය කර ඇති බව තඹ නිෂ්පාදන ප්‍රදේශයට ආසන්නව ඉලංකතුරෙයි පැරණි අන්තර්ජාතික වරාය පිහිටා තිබීමෙන් පැහැදිලි වේ.

## අරුත් පැහැදිලි කිරීම්

| | |
|---|---|
| සහස්‍රකය | දහසකින් සමන්විත ඒකකය |
| ශිෂ්ටාචාරය | නාගරික සංවර්ධන ලක්ෂණ සහිත දියුණු සමාජයක් |
| පුරාවිද්‍යාඥයෝ | පෞරාණික වස්තු පිළිබඳව පරීක්ෂා කරන්නෝ |
| බ්‍රාහ්මී ලෙන් ලිපි | ගල් ගුහාවල කොටා තිබෙන බ්‍රාහ්මී අක්ෂරවලින් ලියැවුණු ලිපි |
| කබර | යකඩ කර්මාන්තයේ නියුක්ත ශිල්පියා |
| තබකර | 'තඹ හා සම්බන්ධ' යන අර්ථය දෙන පැරණි වදනකි; තඹ කර්මාන්තයේ නියුක්ත ශිල්පියා |
| තුලදර | තුලාධාර; රන් කර්මාන්තයේ නියුක්ත ශිල්පියා |
| තාක්ෂණික ඥානය | වෙනස් වීමට ලක් වන විද්‍යාත්මක දැනුම |
| ශිල්පීය ප්‍රාගුණ්‍යය | ශිල්පය පිළිබඳ විශේෂ පළපුරුද්ද |
| ව්‍යාප්ත වීම | පැතිරීම |
| සිරීසවත්ථු | පැරණි ලංකාවේ පැවති බව කියන නගරයක නමකි. |
| පුරාවෘත්ත | පැරණි කතා පුවත් |
| ත්‍රිපිටකය | බුද්ධාගමේ මූලික ග්‍රන්ථ (සූත්‍ර, විනය, අභිධර්ම) |
| අවශේෂ | ඉතිරි වූ කොටස් |
| ප්‍රචලිත | ප්‍රසිද්ධ |
| පරිශ්‍රය | භූමිය; ප්‍රදේශය |
| නිස්සාරණය | ලෝපස් යකඩ බවට පත් කිරීමේ ක්‍රියාවලිය |
| ශුද්ධ ලෝහ | වෙනත් ලෝහ සමග මිශ්‍ර නොවූ ලෝහ |
| ඛනිජ ද්‍රව්‍ය | පොළොවෙන් ලබා ගන්නා ලෝහ ද්‍රව්‍ය |
| දැව | ලී |
| මයිනහම | ගිනි උඳුනෙහි ගින්දර ඇවිලවීම සඳහා සුළං යවන උපකරණය |
| කාබන් 14 කාල නිර්ණය | කාබන් නැමැති මූල ද්‍රව්‍යයේ විකිරණශීලී සමස්ථානිකයකි. කාබනික ද්‍රව්‍යයක් සහිත පුරාවස්තුවක කාලය මැනීමට කාබන් මූල ද්‍රව්‍යයේ වෙනස් වීම පදනම් කර ගනු ලැබේ. |
| අපනයනය | වෙනත් රටවලට යැවීම |

## අවබෝධය

**පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. යකඩ මෙවලම් භාවිතයට පෙර මෙරට භාවිතයේ පැවතියේ කුමන මෙවලම් ද?
2. ලෝහ තාක්ෂණය හා බැඳුණු පුරාණ ග්‍රාම නාම දෙකක් සඳහන් කරන්න.
3. පැරණි ලංකාවේ ලෝහ තහඩු මත අකුරු ලිවීමේ සම්ප්‍රදායක් පැවති බවට පවතින සාධක මොනවා ද?
4. පුරාවිද්‍යාඥයන් පැරණි යකඩ නිස්සාරණ ස්ථාන හඳුනා ගැනීම සඳහා භාවිත කරන්නේ කුමක් ද?
5. සමනල වැව ප්‍රදේශයෙන් හමු වූ වර්ගයට අයත් යකඩ උඳුන් කඳු බෑවුම්වල සුළං දිශාවට මුහුණ ලා තනා ඇත්තේ ඇයි?

## ලිඛිත අභ්‍යාස

1. **උක්ත පදය, කර්ම පදය, ආඛ්‍යාත පදය නිවැරදිව යොදා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.**
   - i. ළමයා ____________ කියවයි.
   - ii. ලේන්නු අඹ ____________.
   - iii. යමන්නා ____________ උණු කරයි.
   - iv. ____________ ගෙදර ගියා ය.
   - v. වෛද්‍යවරයා ලෙඩුන් ____________.
   - vi. ____________ යකඩ තළති.
   - vii. ____________ කුඹුරු කොටයි.
   - viii. මිනිස්සු ____________ කපති.

2. **උක්ත පදය නිවැරදිව යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**
   - i. ____________ රූපවාහිනිය නරඹයි.
   - ii. ____________ වෙහෙරට වැඩි සේක.
   - iii. ____________ වාත්තු වැඩ කරති.
   - iv. ____________ පය ලිස්සා වැටුණා ය.
   - v. ____________ නගරයට ගියෙමි.
   - vi. ____________ දෙවියන් පුදති.
   - vii. ____________ බුදුන් වැන්දෙමු.
   - viii. ____________ බස් නැවතුම් පොළට ගියා ය.

3. පහත සඳහන් වගුවෙහි හිස් තැන් පුරවන්න.

| ආඛ්‍යාතය | කාලය | වචනය |
|---|---|---|
| උදා: යති | වර්තමාන | බහු |
| යමු | ................................ | ................................ |
| ගියේ ය | ................................ | ................................ |
| කෑවේ ය | ................................ | ................................ |
| කපති | ................................ | ................................ |
| ගත්තෝ ය | ................................ | ................................ |
| පිපුණේ ය | ................................ | ................................ |
| බඳිමි | ................................ | ................................ |
| විකුණුවා ය | ................................ | ................................ |

4. පහත සඳහන් වාක්‍යවල ආඛ්‍යාත පද අතීත කාලයට හරවා ලියන්න.

i. බමුණෝ යාග කරති.
ii. කම්මල්කරුවෝ ආයුධ තනති.
iii. බළංගොඩ යපස් මතු වෙයි.
iv. ශිල්පීහු තම වැඩකටයුතුවල නියැලෙති.
v. දෙදෙනෙක් මයිනහම අදිති.

5. පහත සඳහන් වාක්‍යවල ආඛ්‍යාත පද අනතීත කාලයට (වර්තමාන/අනාගත) හරවා ලියන්න.

i. පුරාවිද්‍යාඥයා කරුණු අනාවරණය කළේ ය.
ii. සල් ගසෙහි මල් පිපුණේ ය.
iii. මාමා අප බලන්නට පැමිණියේ ය.
iv. අම්මා පුතුට කිරි පෙව්වා ය.
v. අපි මිහිරි හඬින් ගී කීවෙමු.

## ප්‍රායෝගික අභ්‍යාස

1. පාඩම හොඳින් කියවන්න.
2. ලෝහ තාක්ෂණයට අදාළ වචන ගොනුවක් සකස් කරන්න.
3. "ශ්‍රී ලංකාවේ ලෝහ තාක්ෂණය" මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
4. ලෝහ තාක්ෂණය පිළිබඳ ලිපි එක් රැස් කරන්න.
5. තඹවලින් සාදන ලද භාණ්ඩ ලේඛනයක් පිළියෙල කරන්න.




# ප්‍රායෝගික ලේඛන

# 11

අපේ ජීවිතයට අදාළව එදිනෙදා කටයුතු සඳහා අපට බොහෝ විට ලිපි ලිවීමට සිදු වෙයි. තොරතුරක් දැනුම් දීමට හෝ තොරතුරක් ලබා ගැනීමට ඇති එක් සන්නිවේදන මාධ්‍යයක් වන්නේ ලියුම් හුවමාරුව යි. ලියුම්වලට අමතරව ආරාධනා පත්‍ර, දැන්වීම්, අත්පත්‍රිකා, පෝස්ටර් ආදිය ද සන්නිවේදනයේ දී භාවිත වේ. මේ සියල්ල ලේඛනය මගින් කළ යුතු වෙයි. ඒ නිසා භාෂාව නිවැරදිව හා නිරවුල්ව භාවිත කිරීමත් සුදුසු ආකෘති හා ශිල්පීය ක්‍රම යොදා ගැනීමත් අවශ්‍ය වේ. මේ පාඩමේ දී රාජකාරි ලිපි ලිවීම හා ආරාධනා පත්‍ර සකස් කිරීම පිළිබඳ මග පෙන්වීමක් කෙරෙයි.

# රාජකාරි ලිපි

## රාජකාරි ලිපි ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- කිව යුතු දේ පැහැදිලිව තීරණය කළ යුතු යි.
  කිව යුතු දේ ඔබට පැහැදිලි නම් පමණ යි ඔබ ලියන ලිපියේ කරුණු පැහැදිලිව කියවන්නාට අවබෝධ වන්නේ. මේ නිසා කිව යුතු කරුණු පිළිබඳව මුලින් ම දළ සටහනක් සකසා ගැනීම ප්‍රයෝජනවත් වේ.
- කිව යුතු දේ ක්‍රමානුකූලව තර්කානුකූලව පෙළ ගැස්විය යුතු ය.
- එක් මූලික කරුණක් සඳහා එක් ඡේදයක් බැගින් යොදා ගත යුතු ය.
- ලිපිය කුමන විෂයයක් සම්බන්ධයෙන් දැයි විවෘත කළ විගස කියවන්නාට දැන ගැනීමට හැකි වන ලෙස ලිපියට මාතෘකාවක් යෙදිය යුතු ය.
- ලිපිය ලබන්නා ලිපිය කියවූ පසු ඒ සම්බන්ධයෙන් කුමක් කළ යුතු දැයි නිශ්චිත ක්‍රියා මාර්ගයකට යොමු කිරීමක් ලිපිය මගින් කළ යුතු ය.
- කෙටි සරල වාක්‍ය හා වචන භාවිත කළ යුතු ය.
- විරාම ලක්ෂණ නිසි පරිදි යෙදිය යුතු ය.
- ලිපියේ දෙපස තීරුවල අදාළ ඉඩ ප්‍රමාණය තබන්න. ගොනුගත කිරීමේ පහසුව හා අදාළ සටහන් ආදිය තැබීම සඳහා.
- ලිපියේ ක්‍රමානුකූල බව හා පිරිසිදු බව රැක ගත යුතු ය.

## රාජකාරි ලිපියක මූලිකාංග

* යවන්නාගේ නම, තනතුර, ලිපිනය, දූරකථන අංකය හා දිනය
* ලබන්නාගේ තනතුර හා ලිපිනය
* ආමන්ත්‍රණය
* මාතෘකාව
* අදාළ කරුණු

**ඉදිරි පිටුවෙහි දැක්වෙන ලිපිය ඇසුරෙන් රාජකාරි ලිපියක ආකෘතික ලක්ෂණ හඳුනා ගන්න.**

| | |
|---|---|
| ① යවන්නාගේ ලිපිනය | ⑤ මාතෘකාව |
| ② දිනය | ⑥ අන්තර්ගතය |
| ③ ලබන්නාගේ ලිපිනය | ⑦ ස්තුතිය |
| ④ ආමන්ත්‍රණය | ⑧ අත්සන |

ප්‍රසන්න ජයවීර, ①
ලේකම්,
"පරිසර මිතුරෝ" සංවිධානය,
පැණිවෙළුරව මහා විද්‍යාලය,
හිඹුටුගොල්ල.
දුරකථන අංකය 098 2243875

2016.01.10 ②

කෘෂි පර්යේෂණ හා සංවර්ධන නිලධාරි, ③
පැණිවෙළුරව උතුර,
ගොවිජන සේවා මධ්‍යස්ථානය,
හිඹුටුගොල්ල.

මහත්මයාණෙනි, ④

**ආදර්ශ ගොවිපොළක් ආරම්භ කිරීම** ⑤

⑥

අප පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රායෝගික තාක්ෂණ කුසලතා හා කෘෂිකර්මය යන විෂයයන්ට අදාළව ඉදිරි මාස් කන්නයේ දී පරිසර හිතකාමී ආදර්ශ ගොවිපොළක් ආරම්භ කොට පවත්වා ගෙන යෑමට අදහස් කොට ඇත. මේ සඳහා විදුහල්පතිතුමාගේ පූර්ණ අනුමැතිය ද ලැබී තිබේ.

ඒ අනුව බිම සකස් කර ගැනීම, භෝග තෝරා ගැනීම හා සපයා ගැනීම, භෝග රෝපණය කිරීම හා පොහොර යෙදීම ආදි කරුණු සම්බන්ධයෙන් ඔබතුමාගේ උපදෙස් අපේක්ෂා කරමු. පහසු දිනයක් හා වේලාවක් දුරකථනයෙන් දැනුම් දී පාසලට පැමිණ අපට අවශ්‍ය උපදෙස් සපයන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තූති යි, ⑦

⑧

..........................
ලේකම්

..........................
සභාපති

## ආරාධනා පත්‍ර


පාසලක ආරාධනා පත්‍ර සකස් කිරීමට සිදු වන අවස්ථා බොහෝ ය. නිවාසාන්තර ක්‍රීඩා උලෙළ, වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය, වාර්ෂික පිංකම්, විවිධ ප්‍රසංග, නාට්‍ය, පිළිගැනීම්, සමු ගැනීම්, උපහාර, විවෘත කිරීම්, ප්‍රදර්ශන, දේශන ආදිය ඒ අතර වෙයි.

පාසලෙන් බැහැර සමාජ ජීවිතයේ දී විවිධාකාර අවස්ථා සඳහා ආරාධනා පත්‍ර සකස් කිරීමට ද සිදු වෙයි. මංගල උත්සව, විවිධ ආගමික උත්සව, ගෙවැදීම්, පවුලේ උත්සව, සමිති සමාගම් හා සම්බන්ධ විවිධ අවස්ථා ඒ අතර වෙයි.

ආරාධනා පත්‍ර සකස් කිරීමේ දී පිළිපැදිය යුතු ඒ සඳහා ම විශේෂ වූ රීතියක් හෝ ආකෘතියක් හෝ නැත. ආරාධනා පත්‍රය එය සකස් කරන්නාගේ කැමැත්ත අනුව නිර්මාණාත්මකව සකස් කළ හැකි ය. එහෙත් ආරාධනා පත්‍රයක් සකස් කිරීමේ දී එහි අඩංගු විය යුතු මූලික කරුණු ඇතුළත් වී තිබිය යුතු ය.

* අරමුණ
* දිනය
* වේලාව
* ස්ථානය
* ප්‍රධාන ආරාධිතයා
* ආරාධනා කරන්නේ කවුරු ද?
* ආරාධනා කරන්නේ කොහි සිට ද?
* ආරාධනාව කරන දිනය

**ඉදිරි පිටුවෙහි දැක්වෙන නිදර්ශක ආරාධනා පත්‍රය ඇසුරෙන් ඉහත කියන ලද කරුණු හඳුනා ගන්න. නිර්මාණශීලීව සිත් ගන්නා ආකාරයෙන් ආරාධනා පත්‍ර සකස් කරන්න.**



## ආරාධනා

සඳුන්ගම රාහුල මධ්‍ය මහා විද්‍යාලයේ

**ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උලෙළ**

විද්‍යාලයේ දීප්තිමත් ආදි ශිෂ්‍යයකු වන

බ්‍රිගේඩියර් සාලිය මුදුන්ගොඩ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්

2017 ජනවාරි 24 වන දින

පෙ.ව. 10.00ට විද්‍යාලයීය රැස්වීම් ශාලාවේ දී

අභිමානවත් ලෙස පැවැත්වේ.

එම අවස්ථාවට සහභාගි වන ලෙස

ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට

ගෞරවයෙන් ආරාධනා කරමු.

විදුහල්පති හා සංවිධායක මණ්ඩලය
රාහුල මධ්‍ය මහා විද්‍යාලය
සඳුන්ගම
2017.01.14

## ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා/නායිකාව ලෙස සිතා පාසල් සේවා බස් රථය නිසි වේලාවට ධාවනය නො වීම හේතුවෙන් පාසලට පැමිණීමේ දීත් පාසල අවසානයේ නිවෙස් කරා යෑමේ දීත් ඇති වන කාල ප්‍රමාදය නිසා පාසල් දරුවන් මුහුණ දී ඇති දුෂ්කරතා පැහැදිලි කරමින් එම ගැටලුවට ඉක්මන් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා විදුහල්පතිතුමා මගින් ඩිපෝ අධිකාරිතුමාට යවන රාජකාරි ලිපියක් ලියන්න.
2. ඔබ පාසලේ "පරිසර මිතුරෝ" සංවිධානයේ ලේකම් යැයි සිතා පාසල අසල භූමියකට නගරයේ කැලි කසළ බැහැර කිරීම නිසා සිදු වී ඇති පරිසර දූෂණය හේතුවෙන් පාසල් දරුවන් මුහුණ පා ඇති දුෂ්කරතා පැහැදිලි කරමින් එම ගැටලුවට වහා විසඳුමක් ලබා දෙන ලෙස ප්‍රදේශීය සභාවේ සභාපතිතුමා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපියක් ලියන්න.
3. ඔබ පාසලේ පැවැත්වීමට නියමිත කවර හෝ උත්සවයක් මුල් කර ගෙන ඒ සඳහා සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වන්නන් වෙත යැවීමට සුදුසු ආකාරයේ නිර්මාණාත්මක ආරාධනා පත්‍රයක් සකස් කරන්න.



# 12 සිනා කුමරි

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ (1913-1964) කවියකු, ගීත නාටක රචකයකු මෙන් ම පුවත්පත් කලාවේදියකු ලෙස ද කීර්තියක් දිනුවෙකි. බෙලිඅත්ත ශ්‍රී පඤ්ඤානන්ද විදුහලින් අධ්‍යාපනය ලද එතුමා පසුව ඉන්දියාවට ගොස් වංග සහ හින්දි යන භාෂා උගෙන භාරතීය සංස්කෘතිය ගැන ද හැදෑරී ය.

චන්ද්‍රරත්න මානවසිංහ මහතා විසින් රචනා කරන ලද කෝමල රේඛා පද්‍ය සංග්‍රහයෙන් උපුටා ගන්නා ලද 'සිනා රැල්ල' නමැති කවි පංතිය ඇසුරෙන් මෙම පාඩම සැකසී ඇත. 'කෝමල රේඛා' පද්‍ය සංග්‍රහයේ ප්‍රස්තාවනාවට අනුව එතුමා කාව්‍යකරණයට නැඹුරු වූයේ තමා අවට පරිසරය හා බැඳුණු අත්දැකීම් සහිතව ය. තම නිර්මාණය රස ගැන්වූයේ ඒ අත්දැකීම් පාදක කර ගනිමිනි.

'සිනා කුමරි' රචනා වී ඇත්තේ ද එවැනි ම වූ අත්දැකීමක් ඇසුරෙනි. රසවත් කවියක් නිර්මාණය කරන්නට තම අත්දැකීම් හා කවිය රසවත් වන යෙදුම් භාවිත කරන ආකාරය ගැන ද අවබෝධයක් තිබිය යුතු ය. ඒ පිළිබඳව ඔබට අවබෝධයක් ලබා දීම මෙම පාඩමේ අරමුණ යි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

චන්ද්‍රරත්න මානවසිංහ මහතා ගීත, ගීත නාටක, කාව්‍ය සංග්‍රහ නිර්මාණය කිරීමෙන් පමණක් නො ව **හෙළදිව** හා **ලංකාදීප** යන පුවත්පත්වල කතුවරයකු, සංස්කාරකවරයකු ලෙස ද සිංහල භාෂාවට හා සාහිත්‍යයට ඉටු කර ඇති සේවාව අගනේ ය.

මානවසිංහ මහතා විශේෂ දක්ෂතාවක් දැක්වූයේ කාව්‍ය සහ ගීත නාටක නිර්මාණයෙහි ය. **මනෝහාරී** නමැති ගීත නාටකයත් **සේපාලිකා** නමැති ළමා ගීත නාටකයත් එතුමාගේ නිර්මාණ වන අතර 'මී කිරි', 'වෙසක් මිහිර', 'ගුරු ගෙදරට යන අතර මග', 'ඇත් ගාලේ දරු පෙම', 'මගේ රට' ආදිය එතුමාගේ ප්‍රකට කාව්‍ය නිර්මාණ කිහිපයකි. මහ බෝ වන්නම, සරස්වතී අභිනන්දනය වැනි ගී පද රචනා ද එතුමා විසින් නිර්මාණය කෙරිණි.

**කෝමල රේඛා** නම් වූ චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ නිර්මාණ එකතුවෙන් මෙම පද්‍ය පන්තිය උපුටා ගන්නා ලදි. අපි එම පද්‍ය පන්තිය මිහිරි ලෙස ගායනා කරමු.

සිලිලාරෙක හෙල් මැලී
පෙති අතරින් සැලි සැලී
කනට නොයෙන සිතට දැනෙන
සිලි සිලියක පැටලිලා,

නෙලුම් කොළේ නොම ඇලී
දිය බිඳුවක ගැලි ගැලී
පෙරළි පෙරළි සෙල්ලම් කොට
දිය රැල්ලට එක් වෙලා,

ළා අඹ දළු නව නවා
දම් පාටින් ඔප දමා
සඳ කැන් මිණි කැට අස්සෙන්
උල්පත්වල කිමිදිලා,

ගහ කොළ නිදි අතරෙදී
ලොව නිහඬව තිබියදී
රස ගීයක් අකුළා ගෙන
සිහිනවලට වැදි වැදී

කෙසෙල් ගසින් මතු වෙලා
ගොබය වටින් දැවටිලා
කිරි පාටට ඔපලා ගෙන
අහසට පැන පා වෙලා,

මතුපිට නැග සුදු වලා
හිම කඳු පිට ගැවසිලා
හඳ එළියේ නිල් අහසේ
ඒ මේ අත ඇවිදලා

නෙලුම් මලේ පෙතිසලා
පුබුදුවමින් නොම තළා
බට්ට වටේ රේණු පොකුර
රතු පැහැයෙන් සරසලා,

සිනිඳු කොපුව ඇද හෙළා
පුවක් මලක් විහිදලා
ඇත් දත් පාටින් මල් ඇට
කිනිති දිගේ අලවලා

අතරේ දිග බඩවැටී
වැලි කහ මල්වල ගැටී
ඉඳුනිල් මිණි එළියක් දී
දැවටී දැවටී එක සැටී

සේපාලික මල් ගුලා
රෑට හොරෙන් හොලවලා
නැටි රතු කර හෙවණැලි යට
බිම හැම තැන විසුරුවා

බැස යන ගඟුලැල් පුරා
පෙණ පිඬුවල සැරි සරා
ගිරි ලෙන්වල කඳු ගුල්වල
අඳුර සමග නො කොඳුරා

දඟ කරමින් නට නටා
ඇවිදින මුළු ලොව වටා
ගඳඹ කුමරියකි මොළකැටි
ඇති සුරතල් ගති නුරා

මිණිතලයෙක තරු හෙළා
සඳුගෙන් ඇන අඹරලා
එම දූවිලි කුඩු පිඹ පිඹ
දේදුනුවල වැඩ දමා,

ඇය දුටු දන තුටු වෙතී
‘සිනා’ නමින් අමතතී
ඈ වෙත ළැදි නොවන කෙනෙකු
මේ මුළු ලොවෙහි ම නැතී

මගෙ තුන්මැසි දියණිගේ
රසවත් සිහිනය දිගේ
සිනා කුමරි නටන කලට
දිටිමි සියලු රුව ඇගේ

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| සිලිලාර | ජල තලාව |
| හෙල්මැලි | දියේ පිපෙන සුදු පැහැති මල් වර්ගයක් |
| ගොබ | දිග හැරෙන්නට පෙර කෙසෙල් දල්ල |
| ඔප | දිස්නය; කාන්තිය; බැබළීම |
| කොපුව | ආවරණය; වැස්ම |
| ගිරිලෙන් | කඳුවල පිහිටි ගුහා; ගල් ලෙන් |
| ගඳඹ | ගායන වාදන කරන දේව කොට්ඨාසයක් |
| ඉඳුනිල් මිණි | ඉන්ද්‍රනීල මාණික්‍ය |
| ගඟුලැල් | ගංගා, දිය ඇලි |

## අවබෝධය

1. මෙම පද්‍ය පන්තියෙන් වර්ණනා කෙරෙන්නේ කුමක් ද?
2. ඉඳුනිල් මැණිකක එළියට සමාන කර ඇත්තේ මොනවා ද?
3. දේදුන්නට පාට ලැබී ඇත්තේ කෙසේ ද?
4. මුළු ලෝකය ම ගීතවත් වී ඇති බව පවසන කවිය උපුටා දක්වන්න.
5. සියල්ලන් ම ළැදියාවක් දක්වන මේ තැනැත්තිය කවියා හඳුන්වන්නේ කුමන නමකින් ද?

## රස කවි ගොතමු
## කවි රස විඳිමු

දොයි දොයි දොයි දොයිය පුතා - බයි බයි බයි බයිය පුතා
ඔන්න බබෝ ඇතින්නියා - ගල් අරඹේ සිටින්නියා
ගලෙන් ගලට පනින්නියා - බබුට බයේ දුවන්නියා.

බසෙහි රස නො හඳුනන කුඩා කල දී පවා ඔබ කවියක රස විඳි බව මතක ද? අම්මාගේ, අත්තම්මාගේ, නැන්දාගේ, පුංචි අම්මාගේ හෝ ලොකු අම්මාගේ උකුළෙහි නැළැවෙමින් ඇයගේ මිහිරි හඬින් සැනසුණු අයුරු ඔබට සිහිවනු ඇත. නැළවිලි ගී ලයාන්විතව ගැයෙද්දී නින්ද දරුවා වෙතට එන්නේ එහි රිද්මය හා තාලය නිසයි.

පහත සඳහන් කවි ගායනා කරන්න.

ගොඩ ඉතා
ලොකු සතා
බලව තා
බල ඇතා

අපේ වැවේ වී
හොඳින් වැ වේවී
අටු කොටු බෝ වී
බඩගිනි නේ වී

හා හා හරි හාවා
කැලේ මැදින් ආවා
හිට ගෙන ගඟ ගාවා
වට පිට ඇහැ ලැවා

මුනිදාස කුමාරතුංග

මා වැනි බිලින්දා
වර වර ළඟට කැන්දා
දුක් සැප කුමන් දා
අසන නිරිඳෝ වෙන කොයින් දා

**තොටගමුවේ ශ්‍රී රාහුල හිමි**

මේ එක් එක් කවිය ගායනා කරන්නේ එකිනෙකට වෙනස් රිද්මයකට හා තාලයකට අනුව යි. එය එසේ සිදු වන්නේ ඒ ඒ කවියෙහි අක්ෂර හෙවත් අකුරු යොදා ඇති ආකාරය අනුව යි. මේ ශබ්ද රටාව ‘විරිත’ යනුවෙන් හැඳින්වේ. කවියක් විරිතකට අනුව රසවත්ව ගයන විට මධුර වූ හඬක් මතු වෙයි. එහි ශබ්දය රසවත් වෙයි.

පහත සඳහන් කවි ගායනා කරන්න.

දවල් තිස්සෙ
පඳුරු අස්සෙ
හැංගෙන පොඩි
හාවා
පාට දුඹුරු
ඇස් වටකුරු
ලෝම තිබෙන
හාවා
කට දෙපැත්තෙ
කෙඳි බුරුත්ත
දිගට ඇදුණු
හාවා

**ඇස්. මහින්ද හිමි**

මේ කවි පෙළෙහි,

තිස්සෙ - අස්සෙ
දුඹුරු - වටකුරු
දෙපැත්තෙ - බුරුත්ත

යනුවෙන් යෙදී ඇති පදවල විශේෂයක් ඔබට දැනෙනු ඇති. මෙලෙස සමාන ශබ්ද එක තැන යෙදීම නිසා එම කවියෙන් රසවත් ශබ්දයක් ජනිත වෙයි. අපි තවත් උදාහරණයක් ගෙන බලමු.

පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන් වට
නො ව පැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වදු කැලණිය පුර වරට

මෙම කවියෙහි ද සරණිය, පැමිණිය, කිකිණිය, ගිහිණිය, පැරණිය, රමණිය, ලිහිණිය, කැලණිය යනුවෙන් සමාන ශබ්ද එකිනෙකට නින්නාද වන අයුරින් යොදා ඇත. මෙම කාව්‍ය උපක්‍රමය අප හඳුන්වන්නේ අනුප්‍රාස නමිනි. 'අනුප්‍රාස' භාවිතයෙන් ද ශබ්දය රසවත් වෙයි.

එමෙන් ම මෙම කවියෙහි මුල දී 'ය' අක්ෂරයෙන් ද මැද දී 'ය' අක්ෂරයෙන් ද අග දී 'ට' අක්ෂරයෙන් ද පද හතර ම අවසන් කර ඇත. 'එළිවැට' හා 'එළිසමය' යනුවෙන් හඳුන්වන්නේ එක ම අක්ෂරයකින් පද හතර ම අවසන් කරන මේ කාව්‍ය ලක්ෂණය යි. මුල දී හා මැද දී මෙම කාව්‍ය ලක්ෂණය ආරක්ෂා කර ගන්නට සමත් වන්නේ ඉතා ම දක්ෂ කවියෙක් පමණි. මේ කාව්‍ය ලක්ෂණය ද හේතු වන්නේ කවියක ශබ්දයට මධුර මනෝහර හඬක් එක් කරන්නට ය. ශබ්දය රසවත් කරන්නට ය. ශබ්දය රසවත් කළ යුත්තේ අර්ථය ද රැකෙන ආකාරයට ය. ශබ්ද රසය රැක ගැනීම සඳහා අර්ථයක් නොමැති ශබ්ද ගැළපීමෙන් හොඳ කවියක් නිර්මාණය කළ නො හැකි ය.

මනා ලෙස පද ගැළපීමෙන් කවියක ශබ්දය රසවත් කරන්නට හැකි බව මෙයින් පැහැදිලි වනු ඇත. මෙවැනි යෙදුම් මගින් කවියකට මධුර ස්වරයක්, මිහිරි හඬක් එක් කළ හැකි ය.

සිනා කුමරි පද්‍ය පන්තිය ගායනා කරද්දී ශබ්දය වඩ වඩාත් රසවත්ව දැනෙන්නේ එහි ඇතුළත් අනුප්‍රාසවත් යෙදුම් නිසයි.

"දිය බිඳුවක ගැලී ගැලී
"පෙරළි පෙරළි සෙල්ලම් කොට"
"ඇත් දත් පාටින් මල් ඇට"
"එම දූවිලි කුඩු පිඹ පිඹ"
"සිනා කුමරි නටන කලට"

එමෙන් ම 'සිනා කුමරි' කවි පන්තියේ එළිසමය රැක ගන්නට කවියා සමත් වී තිබීමෙන් එහි ශබ්ද රසය වඩාත් රසවත් වේ. මුල් පද දෙකත් අවසාන පදයත් එක ම අකුරකින් අවසන් කරන්නට කවියා උත්සාහ කර තිබීමෙන් කවි

පන්තිය රසවත් වී ඇත. මේ කවි එකින් එක ගයන විට සමාන හඬක් මතු වන වචන කීපයක් එක ළඟ යෙදී ඇති බවක් පෙනෙයි. එක සමාන ශබ්ද එක ළඟ යෙදීමෙන් ශබ්දය රසවත් වෙයි.

"කෙසෙල් ගසෙන් මතු වෙලා
ගොබය වටින් දැවටිලා"

"නෙලුම් කොළෙහි නොම ඇලී
දිය බිඳුවක ගැලි ගැලී"

"ඇය දුටු දන තුටු වෙතී
සිනා නමින් අමතතී"

කවියක් රසවත් වන්නේ එම කවිය මගින් කියැවෙන අදහසත් රසවත් වුව හොත් පමණකි. කවියේ අදහස හෙවත් අර්ථය රස ගන්වන්නට ද නිර්මාණකරුවා රසවත් යෙදුම් භාවිත කරයි. පහත සඳහන් කවිය ගායනා කරන්න.

දිලිහි දිලිහි ආකාසේ බබළන මල්
තාරුකා
බැබළි බැබළි ආකාසේ දිලිසෙන මල්
තාරුකා
ගන්ටත් බෑ දෙන්ටත් බෑ පුංචි රුවන්
තාරුකා

**ආනන්ද රාජකරුණා**

මෙම කවියෙහි යෙදී ඇති 'මල් තාරුකා' යන යෙදුම අපූරු යෙදුමකි. මල් වගේ තාරුකා හෝ මල් වැනි තාරුකා යනුවෙන් හෝ නො කියා මල් තාරුකා ලෙස යොදා ඇත. මෙන්, සේ, වැනි, වගේ, අයුරු යනාදි නිපාත නො යොදා යමක් යමකට සමාන කරන මෙවැනි යෙදුම් හඳුන්වන්නේ 'රූපක' යනුවෙනි.

මහ පුදුමෙකි
මලක මලෙකි
නැහැ එහි සකි
සමනලයෙකි

මෙම කවියෙහි 'මලෙක මලෙකි' යන යෙදුමෙහි අදහසත් මලක් වගේ සමනලයෙක් යන්න යි. එහෙත් 'වගේ' යන පදය නොමැතිව යෙදී ඇති

බැවින් එය ද රූපකයකි. රූපකවලින් අලංකාර වන්නේ කවියේ අර්ථය යි. දැන් අපි තවත් කවි කීපයක් ගායනා කරමු. ඒ කවිවල යෙදී ඇති රූපක අලංකාර හඳුනා ගන්නට උත්සාහ කරමු.

නිල් රෙද්දක රන් තැටියක්
හංගන හැටි මෙන්න කියා
රන්වන් අපෙ ඉරු දෙවියෝ
හැංගෙති මහ මුහුදු කුසේ

වත සුපිපි පියුමෙකි
නෙත සුනිල් මිණි යුවළෙකි
ගත ගන රන් රුවෙකි
වනත නත මුත් කවුරු වෙති හැකි

මේ කවිවල,

ඉරු දෙවියෝ - රන් තැටියකි
මහ මුහුද - නිල් රෙද්දකි
වත - පියුමකි
නෙත - මිණි යුවළකි
ගත - රන් රුවකි

යනුවෙන් රූපක යොදා ඇති ආකාරය ඔබට පැහැදිලි වනු ඇත.

පහත සඳහන් කවි ගායනා කරන්න.

ගස වතුසුදු
වී පිරිසිදු
පොහොය නැතිදු
සිල්ගත් බඳු

**මුනිදාස කුමාරතුංග**

ජම්බු ගහට රත    පොරවන්නී
බක්මී ගහ කහ    අන්දන්නී
අඹ දලු ළා රත    තවරන්නී
ලෝ කත විසිතුරු    කරලන්නී

**අරිසෙන් අහුබුදු**

මෙම කවිවලින් කියැවෙන්නේ ස්වාභාවික සිදුවීම් කීපයකි. වතුසුදු ගස වැසී යන තරම් සුදු පැහැ මල් පිපී තිබීම, ජම්බු ගස රතු පැහැති ගෙඩිවලින් පිරී තිබීම, බක්මී ගස මල් පිපී කහ පාටින් වැසී යාම, අඹ දලු ලා රතු පැහැයෙන් බැබළීම යන සිදුවීම් ස්වාභාවික ය. එහෙත් කතුවරයා මේ සිදුවීම් ගැන කියන්නේ සජීවී මිනිස් ක්‍රියාකාරකම් ලෙස යි. මේ දක්ෂ කවීන් තම නිර්මාණ රසවත් කරන්නට යොදා ගන්නා තවත් කාව්‍ය උපක්‍රමයකි.

"වතුසුදු ගහ සිල් අරගෙන"
"කවුරුන් හෝ ජම්බු ගහට රතු පාට රෙද්දක් පොරවාලා"
"බක්මී ගහටත් කහ රෙද්දක් අන්දලා"
"අඹ දලුවල ළා රතු පාට තවරලා"

යනුවෙන් මිනිස් ක්‍රියාකාරකම් ලෙස මේ ස්වාභාවිකව සිදු වන දෑ ඉදිරිපත් කිරීම, මෙහි අර්ථය රසවත් කරන්නට මෙන් ම ඒ ඒ සිදුවීම් හා අවස්ථා අප ඉදිරියේ මැවෙන්නට ද හේතු වේ.

ගන නිල් කොළ පිරුණු ගසක්
කිරි වතුරින් නාවන ලෙස
කඳු හිස් දවටා මීදුම්
පහළට බසිතී

**ඇස්. මහින්ද හිමි**

මෙම කවියෙහි ද කියැවෙන්නේ කඳු මුදුන් වටා ඇති මීදුම් පහළට ගලා යාම කවුරුන් හෝ කරන ක්‍රියාවක් ලෙස යි. එය ගසක් කිරි වතුරෙන් නැහැවීමට සමාන කර දක්වා ඇත. මෙයින් සිදු වන්නේ ද අර්ථය රසවත් වීමකි.

සිනා කුමරි පද්‍ය පන්තියේ ඇතුළත් පහත සඳහන් කවිය ගායනා කරන්න.

සිනිඳු කොපුව ඇඳහෙළා
පුවක් මලක් විහිදලා
ඇත් දත් පාටින් මල් ඇට
කිනිති දිගේ අලවලා

පුවක් මලක කොපුව ඇද දමා මල් කිනිති දිගේ පුවක් මල් ඇට අලවනු ඔබ දැක තිබේ ද? කිසි විටෙක් එවැන්නක් සිදු නො වේ. එහෙත් කවියා කියන්නේ එවැනි ක්‍රියාවක් ගැන යි. මේ සිනා කුමරියගේ ක්‍රියාවකි. දක්ෂ කවීහු මෙවැනි ස්වාභාවික සිදුවීම් මිනිස් ක්‍රියාකාරකම් ලෙස වර්ණනා කරති.
ඔබ හොඳින් ම දන්නා තවත් කාව්‍ය උපක්‍රමයක් වන්නේ උපමා යෙදීම යි. පහත සඳහන් කවි ගායනා කරන්න.

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණ කොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

මගෙ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනි බිංදුත්
හඳමු එකක් ඒ වාගේ

"ආතාගේ රැවුළ දිගයි.
කිරි වාගේ සුදු ම සුදුයි"

"ඉරුගේ පොඩි පැටවුන් මෙන්
බබළන රන්වන් මල් ඇති
මේ කිණිහිරි ගහ බලන්න
මහණ වෙලා වගේ නේ ද"

මෙම කවිවල යෙදී ඇති උපමා හඳුනා ගනිමු.

තරු පායා ඇති අහස - සමන් පිච්ච මල් ඉහිරුණු පිට්ටනියක් වගෙ යි
වැටෙන පිනි බිංදු - අක්කාගේ මාලේ මුතු ඇට වගෙ යි
ආතාගේ රැවුල - කිරි වගෙ යි,
රන්වන් මල් - හිරුගේ පැටවුන් වගෙ යි

යමක් යමකට සමාන කර දැක්වීමේ දී වගේ, වැනි, බඳු යනාදි නිපාත යෙදීමෙන් උපමාව නැමැති කාව්‍ය උපක්‍රමය සැකසේ. ඒ මගින් ද සිදු වන්නේ කවියක අර්ථය රසවත් වීම යි.

කවියක් නිර්මාණය කිරීමේ දී ශබ්දයත් අර්ථයත් රසවත් ලෙස ඉදිරිපත් කිරීම හා මැනවින් සංයෝග කිරීම දක්ෂ කවියාගේ කාර්යභාරය යි. එවිට එම කවි කියවා රස විඳින්නන් තුළ ද කිසි දා අමතක නො වන රසයක් ඇති වෙයි. රස විඳින්නටත් රස කවි ගොතන්නටත් අප පුරුදු විය යුතු යි.

පහත සඳහන් කවි ගායනා කරන්න.

| | |
|---|---|
| බලනු මේ වේ | යා |
| ලොකු සතකු නොවේ | යා |
| සමගිය ම වේ | යා |
| උගෙ බලය ලොවේ | යා |

| | |
|---|---|
| කෙන්ද පොල් | ඉතා |
| සුළු දෙයකි සැක | නැතා |
| කඹය ඉන් | ගොතා |
| ගෙන, බැන්ද හැකි | ඇතා |
| | |
| මහනෙල් සුවඳ ම | ය |
| කුඩමසු පිළී ගඳ ම | ය |
| දෙකට එක දිය ම | ය |
| හොඳට නරකට දෙකට කට ම | ය |

මේ කවි නිර්මාණය වී ඇත්තේ අප එදිනෙදා දකින පරිසරය ඇසුරෙනි. එහෙත් ඒ මගින් දී ඇති පණිවුඩය හා උපදෙස බලන්න. රසවත් කවියකින් මෙවැනි උපදෙස් දී ජීවිතය හැඩ ගස්වන්නට ද කවියා සමත් වෙයි.

කවියක් නිර්මාණය කිරීමේ දී අප බොහෝ දේ දැන සිටිය යුතු බව ඔබට වැටහෙනු ඇති. කවියක් නිර්මාණය කරන්නට අප සිත තුළට තදින් දැනුණු සිදුවීමක් හෝ අවස්ථාවක් හෝ සිතුවිල්ලක් තිබිය යුතු යි. එවැනි හැඟීම් නිරන්තරයෙන් සිත තුළ කල්පනාවට නැගෙයි. නැවත නැවත කල්පනාවට නැගෙන ඒ හැඟීම තවත් අයට දැනෙන ලෙස කවියට නැගිය හැකි ය. ඒ අත්දැකීම රසවත් කවියක් ලෙස නිර්මාණය කරන්නට උත්සාහ ගත යුතු යි.

නිවසට වී කාලය ගත කිරීමෙන් කවි නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සිතුවිලි හා අත්දැකීම් පහළ නො වෙයි. ඉර පායන හැටි, ඉර බසින හැටි, හඳ පායන හැටි, තරු බැබළෙන හැටි හා එහි අපූරු බව විස්මය දනවන සුලු බව ඔබ අත් විඳිය යුතු ය.

මුහුදේ රළ බිඳෙන හඬට, ගංගාවේ ජලය ගලෙන් ගලට වැටෙන හඬට ඔබ කන් දිය යුතු ය. වනාන්තරයේ ගහ කොළ සෙලවෙන රිද්මය, ඔබ හඳුනා ගත යුතු ය. නිවසේ ඔබ හා ජීවත් වන අම්මාට, තාත්තාට, සහෝදර සහෝදරියන්ට, ආච්චිට, සීයාට ආදරය කරමින් ඔවුන්ගේ ආදරය, සෙනෙහසට සංවේදී විය යුතු ය. එසේ ම නිවසේ ඇති කරන සුරතලාගේ ක්‍රියාකාරකම් දෙසත් ඔබේ ගෙවත්තේ සැරිසරන සතුන් ගැනත් ඔබ විමසිලිමත් විය යුතු ය. එවිට ඔබට ද කවි නිර්මාණය කරන්නට අවශ්‍ය අත්දැකීම් ලැබෙනු ඇත. මේ කවි පෙළෙන් ඉදිරිපත් කෙරෙන්නේ සොබා දහමෙහි සොඳුරු බව යි. තුන් මසක් වයසැති තම සුරතල් දියණියන්ගේ සිනාව දුටු කවියා ඒ සිනාවෙන් මුළු ලොව ම පිබිදෙන බවත් සුන්දර වන බවත් කියන්නේ අපූරු ආකාරයකට යි.

සඳ එළියෙන් නැහැවෙන කුමුදු මල්, දම්පාටින් බැබළෙන අඹ දලු, සඳ එළිය තවරා ගෙන කිරි පාටින් දිලෙන කෙසෙල් ගොබ ගැන වර්ණනා කරන කවියා, නෙලුම් මල් පිබිදෙන හැටි, නෙලුම් කොළ මත දිය බිඳු සෙල්ලම් කරන හැටි, කඳු අතර වලාකුළු පාවෙන හැටි වර්ණනා කරයි. පුවක් මල් පිපී, බඩවැටිවල වැලි තලාවල කහමල් ඇතිරී, ඒවා නිල්පාටින් බැබළෙමින් පරිසරය සුන්දර වෙද්දී සේපාලිකා මල් ගස් යට තැන තැන විසිරෙයි. ගඟුලැල් ඇද හැලෙද්දී දේදුනු පායා ඇත. මේ සුන්දර සොබා දහම කවියා වර්ණනා කරන්නේ තම දියණියන් හීන දකිමින් සිනා කුමරිය සමග නටමින් සිටිනු දැකීමෙන් ලද මිහිරි හැඟීමෙන් යුක්තව යි. කවියකු වන්නට නම් පරිසරය හා සංවේදී විය යුතු බව මෙයින් පැහැදිලි වෙයි.

කවියක් නිර්මාණය කිරීමේ දී මෙන් ම රස විඳීමේ දී ද එහි අර්ථය රසවත් විය යුතු බවත් ශබ්දය ද ඊට ගැළපෙන ලෙස රසවත්ව යෙදිය යුතු බවත් සිත්හි තබා ගෙන රස කවි නිර්මාණය කරන්න. කවි නිර්මාණය කරන්නට ඔබට ඇති හැකියාවට ඉඩ හරින්න. ඔබේ අත්දැකීම කවියක් මගින් අන් අයටත් රස විඳින්නට ඉඩ ලබා දෙන්න.

## ලිඛිත අභ්‍යාස

**ඔබ කැමති ලෙස නිර්මාණය කර ගත් පද යොදා පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.**

1. මලක මලක් පිපුණු වගක්
   කවුද කියනවා.
   ඒ මල වට බඹරු ඇවිත්
   ..........................................

2. රාං රාං රූං රූං රූන ගිරවු කී‍්‍රං කී‍්‍රං
   ............................................................

3. ටික්කි ටිකිරි වතු සුදුමල්
   සිල් අරගෙන මෙනි හැමකල්
   ................................................
   ................................................

4. කිරිමදු වැල් වත්ත පුරා
   දුව පැන ඇවිදියි
   අප්පච්චි කෝටුවකින්
   ඔවුන්ට බැට දෙයි.
   ......................................
   ......................................
   ......................................
   ......................................

5. මී පැටියෝ ඔයා ඔතන මොකද කරන්නේ
   අපේ අම්මා ඤාව් කියන හඬයි ඇහෙන්නේ
   ...........................................................................
   ...........................................................................

6. බට්ටිච්චා ගහ මුදුනේ - දෙමලිච්චා දොර අයිනේ
   පොල්කිච්චා මිදුල කොනේ - .......................................................

7. රන්මැලි සෑ රැස් කිරණයි - කලා වැවේ දිය දහරයි
   දළදා හිමි රැකවරණයි - .......................................................

8. එරබදු මල් රතට රතයි - කජු පුහුලන් සුවඳ හමයි
   කොහා කොහෝ කොහෝ කියයි - .......................................................

## ප්‍රායෝගික අභ්‍යාස

1. **පහත සඳහන් කවීන් විසින් නිර්මාණය කරන ලද ළමා කවි එක් රැස් කර පුංචි කවි පොතක් සකස් කරන්න.**
   - ★ ආනන්ද රාජකරුණා කවියා
   - ★ එස්. මහින්ද හිමි
   - ★ කුමාරතුංග මුනිදාස කවියා

2. **පහත සඳහන් මාතෘකාවලට කවි දෙක බැගින් නිර්මාණය කරන්න.**
   - ★ රෝස මල
   - ★ සුරතලා
   - ★ පරිගණකය
   - ★ අලුත් සිංහල පොත
   - ★ පලතුරු



# 13 වාක්‍ය රචනය

අදහස් නිරවුල්ව හා නිවැරදිව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදීමේ නිපුණතාව සංවර්ධනය කර ගැනීම උදෙසා මාතෘකානුකූලව රචනා ලිවීමේ ක්‍රියාකාරකම යොදා ගත හැකි ය. මෙහි ලා තර්කානුකූලව අදහස් ඉදිරිපත් කරමින් උචිත ලෙස කරුණු සංවිධානය කර ගනිමින් සිත් ගන්නා ශෛලියකින් වාක්‍ය රචනය ලිවීම මූලික වේ. එහි දී නිවැරදි වාක්‍ය රටා අනුගමනය, සුදුසු පරිදි විරාම ලකුණු යෙදීම, පද නිසි ලෙස ඈත් කර ලිවීම හා පැහැදිලි අත් අකුරු යන ශිල්පීය දක්ෂතා ද ප්‍රගුණ කළ යුතු වේ. මේ අනුව සලකා බැලීමේ දී වාක්‍ය රචනය නිපුණතා රැසක් සංවර්ධනය කෙරෙන ක්‍රියාකාරකමකි. අලුත් අලුත් දෑ නිපදවීමට අවැසි නිර්මාණාත්මක ගුණාංග සංවර්ධනය කර ගැනීම සඳහා වාක්‍ය රචනා ලිවීමේ ක්‍රියාකාරකම මනා පදනමක් වෙයි.

පහත ඉදිරිපත් කර ඇති වාක්‍ය රචනය කියවන්න.

## සුන්දර හෝර්ටන් තැන්න

දෙස් විදෙස් සංචාරකයන් නිබඳව ම තමා වෙත කැඳවන හෝර්ටන් තැන්න මුහුදු මට්ටමේ සිට මීටර් 2000කට අධික උසකින් පිහිටි, අපේ රටේ උස ම තැනිතලා භූමිය යි. මේ නිසා ශීතලත්, මීදුමත් මෙහි මොහොතින් මොහොත උපදී. මේ දේශගුණික පරිසරයෙන් හැඩ වුණු පරිසර සම්පත් බොහෝ දැකුම්කලු වේ. **ඉමක් කොනක් නො පෙනෙන තැනිතලාව, ගත සිත පිනවන වටපිටාව, ලෝකාන්තය, බේකර්ස් ඇල්ල** හෝර්ටන් තැන්නේ පොහොසත් බවට සාධක වැනි ය.

හෝර්ටන් තැන්නේ තුරුලතා නිර්මාණය වී ඇත්තේ එහි නිබඳව ම පවත්නා සුළඟටත්, ශීතලටත් ඔරොත්තු දෙන ආකාරයට ය. ඒ නිසා ම තුරුලතාවල ඇත්තේ කුඩා පත්‍ර යි. මේ පත්‍ර ඝන බූවක් දරා සිටී. පත්‍ර මෙන් ම ඒවායේ කඳ ද ඝන පොත්තකින් සැරසී ඇත. එසේම තුරු අතු පතර එකිනෙක හා වෙළී ඇත්තේ චණ්ඩ මාරුතයට මුහුණ දීම සඳහා ය. මෙහි බොහෝ ශාක අඩි හය හතකට වඩා උස් ය. සෙසු ඒවා අඩි දෙක තුනකට වඩා උස නැත. මේ කුඩා වන බූටෑවට ඔබ්බෙන් සීමාවක් නො පෙන්වන දුරකට විහිදුණු, නෙතට රසඳුනක් වැනි පැහැබර තණ බිමකි. ශ්‍රී ලංකාවට ම ආවේණික පැඟිරිමාන තෘණ පඳුරු හා තුත්තිරි පවුලට නෑකම් කියන තණ පඳුරු මේ තණ පලස අරා වැජඹේ.

තැන්න මතින් ගලා බසින කුඩා දිය කඩිති හෝර්ටන් තැන්නේ මනහර දසුනකි. දිය කඩිති ගලා බසින ඉවුරු දෙපස බහුල ලෙස දිස් වන්නේ බෝවිටියා විශේෂ ය. අපූරු නිල් පැහැයකින් සුසැදි මේ බෝවිටියා මල් ඉතා කුඩා වේ. මල මෙන් ම බෝවිටියා පත්‍ර ද උඳුපියලි කොළ තරම් කුඩා ය. දිය සීරා ඇති තැන්වලින් පැන නැගුණු **කුඩලු** වර්ග, **බිගෝනියා** හා **කෝලියාස්** වර්ග ඉතා පැහැබර ය. නන් පැහැ ගත් පුංචි **කුඩලු** පුෂ්ප නෙත් සිත් පැහැර ගනියි. තැන්න පුරා දුවන පනින කුඩා දිය පහරවල **කෙකටිය** වර්ග, **දිය පාසි** වර්ග, **බෙරලිය** සහ **මීවන** විශේෂ රාශියක් ම දැක ගත හැකි ය. දැඩි ශීතල දිය රැඳුණ මේ කුඩා දිය පහරකින් දෙපා දෝවනය කර ගැනීමට ලැබීම භාග්‍යයකි. හෝර්ටන් තැන්නේ තැනින් තැන දිස් වන කොළ පැහැ උණ පඳුරු එහි නිබඳව ම හමා යන සුළං පහරින් අපූරු හඬක් නිකුත් කරන්නේ නිහැඬියාව සිඳ බිඳ ලීම සඳහා ය.

හෝර්ටන් තැන්න පුරා දුවන පනින සුනිල් දිය දහරත් නිරතුරු ඇද හැලෙන වර්ෂාවත් නිසා තැන්නේ තැනින් තැන කුඩා කුඩා පොකුණු නිර්මාණය වී තිබේ; මේවා තුළ ලතාවකට ඔබ මොබ පිහිනා යන 'ටිරවුට්' නමැති මස්සු පොකුණ අසල මඳක් නෙත් රඳවා ගනිති. පොකුණු දියෙහි ඔවුන් දක්වන රැඟුම් සංචාරක ආකර්ෂණයට හේතු වෙයි. මේ කුඩා පොකුණු වට කර සිටින **මහ ගැට කොළ, වැටැස්ස** හා **කුඩා උණ** ශාක අපූරු සිතුවමක් මවා පායි.

හෝර්ටන් තැන්න පුරා තැනින් තැන මතුව එන සුදු පැහැති මීදුම් සළුව වේදිකාවක සුදු පැහැති කඩතිරයක් මෙන් මෙතෙක් නෙත් පැහැර ගත් මනහර දසුන් වසාලයි. එහෙත් තවත් තැනකින් මීදුම් සළුව හැකිළී යත් ම ඒ දෙසින් පෙනෙන පරිසරය වඩාත් චමත්කාර වේ. ඈතින් දිස් වන, ගුවන් ගැබ සිඹින කඳු හිස් නිල් පැහැ ගත් විචිත්‍රවත් දසුනකි.

තුරු හිස් මත දැකුම්කලු කුරුල්ලෝ මියුරු හඬ නගති. තුරුහිස් මතින් අපූරු සිවුරුහන් හඬක් නගන්නේ ලංකාවට ම ආවේණික වූ **'මල් අවිච්චියන්'** රැන යි. **ගොමරිටා, හම්බු කුරුල්ලා, මහ නීල ගොයා, ලංකා මල් කුරුල්ලා, නිල් ඇසි මාරාවා, වලිකුකුළා** ආදි පක්ෂීහු මේ පරිසරය විසිතුරු කරති. ඝන ලොම් තට්ටුවකින් අලංකාර වූ වානරයෝ තුරු මත හිඳ බුකු! බුකු! හඬ නගති. එවැනි ම ඝන ලොම් තට්ටුවකින් වැසී ගිය ගෝණ රංචුව හෝර්ටන් තැන්නේ විසිතුරු තවත් වර්ධනය කරති.

මේ සුන්දර හෝර්ටන් තැන්නේ තවත් සුවිශේෂ අංගයක් වෙයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රවේශ කවුළුවේ සිට කිලෝමීටර තුනකට ඔබ්බෙන් පිහිටි මෙතැන 'ලෝකාන්තය' නම් වෙයි. ලෝකාන්තය දවසේ පැය විසිහතරෙන් වැඩි ම කාලයක් මීදුමෙන් වැසී යයි. එබඳු අවස්ථාවක සුදු පැහැති මීදුම් පටල අනන්ත අවකාශයක් පුරා පැතිර ඇති ආකාරයක් හිතට දනවයි. ගැඹුරු අගාධයක හිස මත සිට ලෝකාන්තය නැරඹිය යුත්තේ ඒ දෙස පරෙස්සමෙන් එබී බැලීමෙනි. එවිට එය නරඹන බොහෝ දෙනා තුළ ජීවිතයේ ගුප්ත බවක්, ඒ සමග ම සෞන්දර්යයක් ඉස්මතු වනු නො අනුමාන ය. හෝර්ටන් තැන්නේ අක්කර දහස් ගණනක් පුරා පැතිර තිබෙන සුන්දර තැනිතලාව ලෝකාන්ත සීමාවෙන් එක්වර ම අවසන් වෙයි. එය අපූර්ව දර්ශනයකි. ඉතා පැහැදිලි කාලගුණයක් ඇති දිනයක දී නම් මෙහි සිට නරඹන්නකුට ඈත බළංගොඩ ප්‍රදේශයේ සලකුණු ඉතා කුඩාවට දැක ගත හැකි වේ.

සුදෝ සුදු පෙණ කැටි දස දහස් ගණනාවක් මවා පාමින් ඇද හැලෙන ක්ෂීරධාරාවක් වැනි 'බේකර්ස් ඇල්ල' හෝර්ටන් තැන්නේ තවත් විචිත්‍රවත් ස්ථානයකි. සොබා සිරිය විඳ ගැනීමට රිසි බොහෝ රසවත්තු හෝර්ටන්

තැන්නේ පිහිටි බේකර්ස් දිය ඇල්ල නැරඹීමට ද අමතක නො කරති. හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය වර්ග කිලෝමීටර් 31.5ක ප්‍රමාණයකින් යුක්ත වන බැවින් ඒ හැම සිරියක් ම නැරඹීමට දින කිහිපයක් ගත කළ යුතු වේ.

අපමණ සුන්දරත්වයක් හා පාරිසරික විවිධත්වයක් කැටි කර ගත් හෝර්ටන් තැන්න, දේශීය හා විදේශීය සංචාරකයන් කැඳවන පාරාදීසයකි. විවිධ ශාක, සතුන් හා ජල තටාකවලින් සමන්විත වටපිටාව ගතට මෙන් ම සිතට ද සුවදායක ය. ලංකාවේ අගය වර්ධනය කරන මේ බිම ආරක්ෂා කර ගැනීම අප සැමගේ යුතුකමකි.

ඉහත ඔබ කියවූයේ **'සුන්දර හෝර්ටන් තැන්න'** යන මාතෘකාව යටතේ ලියූ රචනයකි. එය කිසි යම් රටාවකට අනුව ලියන ලද්දකි. එසේ 'යමක් රටාවකට අනුව ලියා ඉදිරිපත් කිරීම රචනය නම් වේ.' මේ අනුව කිසි යම් සැලසුම් ක්‍රමයකට අනුව ලිවිය යුතු ප්‍රබන්ධය රචනය වශයෙන් අපට හැඳින ගත හැකි ය. සුදුසු පද සුදුසු තැනට යොදා වාක්‍ය ගැළපීම මෙහි ලා අපේක්ෂා කෙරේ. වාක්‍ය මෙන් ම කරුණු ද ඉදිරිපත් කළ යුතු වන්නේ ක්‍රමවත් පිළිවෙළකට ය.

වාක්‍ය රචනය කිසි යම් රටාවකට අනුකූලව ලිවීම සඳහා පළමුව ආකෘතියක් පිළියෙල කර ගැනීම සුදුසු ය. මේ සඳහා අපට මෙබඳු සරල ආකෘතියක් අනුගමනය කළ හැකි ය.

1. **ප්‍රවේශය හෙවත් ආරම්භය**
2. **මාතෘකානුකූල විෂය කරුණු**
3. **සමාලෝචනය හෙවත් අවසානය** යනුවෙනි.

කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල රචනයක් ලිවීම සඳහා ඉහත ආකෘතිය අනුගමනය කිරීම ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

## රචනයක සැකිල්ල

මාතෘකානුකූලව රචනයක් ලිවිය යුත්තේ ඊට අදාළ කරුණු මැනවින් සංවිධානය කර ගැනීමෙනි. නැතහොත් කරුණු පෙළගස්වා ගැනීමෙනි. රචනයක් ලිවීමේ දී ඒ සඳහා අපට විවිධ තොරතුරු හා අත්දැකීම් පාදක කර ගැනීමට සිදු වෙයි. ඒ කරුණු සියල්ලක් ම ලියා ඉදිරිපත් කිරීම සාර්ථක රචනයක ලක්ෂණයක් නො වේ.

මෙහි මුලින් ඉදිරිපත් කර ඇති රචනය සඳහා විවිධ ඉසව් ඔස්සේ විවිධ තොරතුරු ඇතත් මෙහි ඉදිරිපත් කර ඇත්තේ වාක්‍ය රචනයක් වශයෙන් ඉදිරිපත් කළ යුතු අත්‍යවශ්‍ය ම කරුණු කිහිපයක් පමණකි. එම කරුණු,

1. ප්‍රවේශය
2. විෂය කරුණු
3. අවසානය යන පියවර අනුව ඉදිරිපත් කර තිබේ.

මේ යටතේ වාක්‍ය රචනය ලිවීම සඳහා සකස් කර ගන්නා දළ සටහන රචනා සැකිල්ල යනුවෙන් හැඳින ගත හැකි ය. මුලින් ඉදිරිපත් කර තිබූ "සුන්දර හෝර්ටන් තැන්න" යන වාක්‍ය රචනයේ සැකිල්ල මෙසේ ය.

1. හෝර්ටන් තැන්නඃ හැඳින්වීම හා පිහිටීම
2. ශාක විවිධත්වය
3. හෝර්ටන් තැන්නේ ජල මූලාශ්‍රය හා ඒ ආශ්‍රිත ශාක
4. මීදුම පැතිර යෑම
5. හෝර්ටන් තැන්නට ආවේණික පක්ෂීන් හා සිවුපා සතුන්
6. ලෝකාන්තය හා බේකර්ස් දිය ඇල්ල
7. අවසානය වශයෙනි.

මේ අනුව වාක්‍ය රචනය සඳහා සැකිලි පිළියෙල කර ගැනීමේ නිපුණතාව සංවර්ධනය කර ගැනීමට පහත ඉදිරිපත් කර ඇති රචනා සැකිලි කිහිපය ද අධ්‍යයනය කරන්න.

**වැසි දිනයක්**

වර්ෂාවට පෙර පරිසරයේ ඇති වූ වෙනස
වැසි පොද වැටීම ආරම්භ වූ ආකාරය හා පරිසරයේ ඇති වූ තත්ත්වය
කෙමෙන් මහා වර්ෂාවක් බවට පත් වූ ආකාරය
වර්ෂාව නිසා පරිසරයේ ඇති වූ වෙනස්කම්
අවසානය

### පොදු දේපල සුරකිමු

පොදු දේපළ යනු කුමක්ද?
පොදු දේපළ රැක ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට සිදු වූයේ ඇයි?
පාසල පොදු දේපළකි. එය රැක ගත යුතු ආකාරය
රෝහල රැකගත යුතු ආකාරය
ගමනාගමනය සලසන රථවාහන ආරක්ෂා කළ යුතු පිළිවෙළ
පොදු දේපළ රැක ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග
මහජනයාගේ යුතුකම
අවසානය

### වැඩිහිටියන් රැක බලා ගනිමු

වැඩිහිටියන් යනු කවුරුන් ද?
වැඩිහිටියන් රැක බලා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීමට සිදු වීම
වැඩිහිටියන්ගේ අගය, ඔවුන් සමාජයට සම්පතක් වන බව
වැඩිහිටියන් රැක බලා ගැනීම උදෙසා නිවස තුළ සිදු කළ යුතු කාර්යයන්
රජය ගත යුතු ක්‍රියා මාර්ග
සමාලෝචනය

මේ පිළිවෙළ අනිවාර්ය අංගයක් නො වූවත් මාතෘකානුකූල රචනයක

1. ආරම්භය
2. කරුණු
3. අවසානය ඉස්මතු වන අයුරින් සැකිල්ලක් පිළියෙල කර ගැනීම සාර්ථක රචනයක් ලිවීම සඳහා උපකාරී වේ. මෙසේ මනා පරිචයක් ලබා ගත් පසු දක්ෂ රචකයාට තම සිතෙන් නිර්මාණය කර ගත් සැකිල්ල අනුව සාර්ථක අයුරින් රචනය ලියා ඉදිරිපත් කළ හැකි ය. පුවත්පතක සඟරාවක පළ වන ලිපිය එවැන්නකි. එබඳු ලිපියක් දෙකක් කියවා බලා ඒවායේ සැකිලි පිළිබඳව ද කරුණු සාකච්ඡා කරන්න. දක්ෂ ලේඛකයා රචනයක සැකිල්ල පිළියෙල කර ගන්නේ තමාගේ සිතෙහි ය.

නිර්මාණාත්මකව වාක්‍ය රචනය ලිවීම ද වැදගත් ය. ඒ සඳහා වාර්තාමය බස්වහරක් වෙනුවට හැම අවස්ථාවක ම අලංකාරවත් බස්වහරක් යොදා ගැනීමට උත්සුක වන්න. "සිංහල අවුරුද්ද" ගැන ලිවීමේ දී ඔබට මෙබඳු වැකි ලිවිය හැකි ය.

"එරබදු තුරු මලින් හැඩ වේ. කොහා එය අපූරු ගීතයකට නගයි. ජම්බු ගස රත් පැහැ ගනී. අඹ, පේර ගස්වලට එල නො ඉදවා ම බැරි ය. වෙනත් තැනක ඉදුණු රඹකැන් ය. ගෙමිදුල අමුතු වෙනසකි. නිවසේ බිත්ති නව පාට ගෙන තිබේ. බඩුමුට්ටු ද අලුත් වෙලා ය. කොලුකුරුට්ටෝ කිරි කවඩි අතට ගනිති. දුර බැහැර සිට දූ දරුවෝ බර පොදි රැගෙන ගමට පැමිණෙති. ලොකු සූදානමකි."

ඉහත නිදසුන මෙන් ඔබ ද වාක්‍ය රචනය නිර්මාණාත්මකව ලිවීමට හුරු වන්න. නිර්මාණාත්මක ලේඛනයේ දී හැකි තාක් කෙටි වැකි ඉදිරිපත් කිරීම සුදුසු ය. කෙටි වැකි ලිවීමට පෙලඹීමෙන් නිවැරදි ලිඛිත භාෂාවක් ඔබට ඉදිරිපත් කළ හැකි වෙයි. වාක්‍ය රචනයේ නිවැරදි භාෂාව පිළිබඳ පන්ති කාමරයේ දී කරුණු තවදුරටත් හදාරන්න. එසේ ම වාක්‍ය රචනය ඡේද වශයෙන් ද ඉදිරිපත් කළ යුතු වෙයි. ඡේද තුළ ඇතුළත් වාක්‍ය ලිවීමේ දී නිවැරදි විරාම ලකුණු යෙදිය යුතු ද වෙයි. වාක්‍ය රචනය සඳහා හැකි තරම් පැහැදිලි අත් අකුරු ඉදිරිපත් කිරීමට උත්සුක වන්න. ඒ සියල්ල මෙන් ම ප්‍රමාණවත් වචන සංඛ්‍යාවක් ලිවීමේ නිපුණතාව ද ළඟා කර ගැනීම වැදගත් වේ.

## ලිඛිත අභ්‍යාස

1. **මේ කොටස අධ්‍යයනය කරන්න.**

"මාගේ නෙත් ඉබේ මිදුලට දිවී ය. ආලෝකයක් ගත් මිදුල මා එහි කැඳවී ය. දැන් මාගේ දෙපා මිදුල මැද ය. අපූරු පරිසරයකි. සඳ පායා රැස් මිහිතලය මතට ගලයි. සියොත් කැල ගුවන් ගැබ ඔබ මොබ සරති. සුවඳ විහිදුවමින් අවටින් පිපී එන කුසුම් ය. ගත සිත නළවන සිසිල් සුළඟ ගලා ගෙන එයි."

**ඉහත ඡේදයට විශේෂණ පද හා අලංකාර යෙදුම් එක් කර තවත් නිර්මාණාත්මකව ලියන්න.**

2. **මේ ඡේදය කෙටි වැකිවලින් ඉදිරිපත් කරන්න.**

ගමේ ගෙවිලියන් සමූහ වශයෙන් කුඹුරු යායට ගොස් තම තමන්ගේ කුඹුරුවලට බැස කවි කියමින් වැඩී ගෙන එන ගොයමේ වල් පැළ ගලවමින් පාලු තැන්වල ගොයම් පැළ සිටුවීම මනහර දර්ශනයකි.

3. 'පියකරු උදය', 'සඳපහන් රැය', 'කඳුකර අසිරිය' මෙයින් ඔබ වඩාත් කැමති මාතෘකාව යටතේ කෙටි වැකි යොදමින් නිර්මාණාත්මක ඡේද කිහිපයක් ලියන්න.

4. **පහත ඉදිරිපත් කර ඇති එක් එක් මාතෘකා සඳහා රචනා සැකිල්ල බැගින් ලියන්න.**

i. පුරාවස්තු රැක ගනිමු
ii. සිය රට දේ සිරි සැප දේ
iii. මම ගංවතුරකට මැදි වීමි
iv. අධ්‍යාපනය සාර්ථක ජීවිතයකට මං සලසයි

5. **පහත සඳහන් මාතෘකා අතුරින් ඔබ කැමති මාතෘකාවක් යටතේ රචනා සැකිල්ල පිළියෙල කර ඒ යටතේ වචන දෙසීයක පමණ වාක්‍ය රචනයක් ලියන්න.**

i. දෙමවුපියන්ගේ අගය
ii. වන අසිරිය රැක ගනිමු
iii. දහම් පාසල් අධ්‍යාපනයේ අගය
iv. අපෙන් පාසලට ඉටු විය යුතු යුතුකම්
v. ගැමි දිවියේ මිහිර



14

# නිවේදන

කිසි යම් ප්‍රවෘත්තියක් හෝ දැනුම් දීමක් හෝ අන්‍යයන්ට අවබෝධ වන පරිදි ප්‍රකාශයට පත් කිරීම නිවේදන නම් වේ.

එවැනි නිවේදනයක් අසන්නාට නිවැරදිව ග්‍රහණය කර ගත හැකි වනුයේ එය නිරවුල්ව හා පැහැදිලිව බස හසුරුවමින් ප්‍රකාශ කළ හොත් පමණි. ඒ සඳහා කථකයා හෝ නිවේදකයා හෝ අවධාරණය කළ යුතු තැන් අවධාරණය කරමින් නිසි හඬ පාලනයෙන් යුතුව එම ප්‍රකාශය සංයමයෙන් යුතුව ඉදිරිපත් කළ යුතු ය. විවිධ අවස්ථාවල දී කෙරෙන නිවේදන පිළිබඳ මේ පාඩමෙන් ඔබට මඟ පෙන්වීමක් සිදු කෙරේ. ඒ ඒ අවස්ථාව අනුව නිවේදන වෙනස් වන අයුරුත් පාඩමේ දී ඔබට අවබෝධ කර ගත හැකි ය.

(හඳුන්ගම මහා විද්‍යාලයේ සෙල්ලම් පිටියෙහි ළමයි පිරිසක් සෙල්ලම් කරමින් සිටිති.)

අසිතඃ අන්න මොකක්ද කියනවා ඇහෙනවා. සද්ද නැතිව ඉන්නකෝ, ඒක අහගන්න.

සමිතඃ මොකක් හරි වැදගත් තොරතුරක්.

මුදිතඃ තොරතුරක් නොවෙයි, නිවේදනයක්. මතක නැද්ද එදා ටීචර් කිව්වා මේ වෙලාවට නිවේදන කියවනවා කියලා.

සමිතඃ සද්ද නැතිව ඉන්නකෝ, ඒක අහගන්න.



**"මේ මස විසි අට වනදා පාසල අවසන් වීමෙන් පසු පස්වරු දෙකට නිවාස රැස්වීම් පැවැත්වේ. විජය නිවාසයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රධාන ශාලාවට ද ගැමුණු නිවාසයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමාධි ශාලාවට ද පරාක්‍රම නිවාසයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෛත්‍රී ශාලාවට ද රැස් වන්න. ඒ ඒ නිවාසය සඳහා නායක නායිකාවන්, ක්‍රීඩා නායක නායිකාවන් තෝරා ගැනීම ද එදින සිදු කෙරේ. සියලු දෙනා ම නියමිත වේලාවට පැමිණෙන්න."**

අසිතඃ විසි අට කියන්නේ අනිද්දා නේ ද?

සමිතඃ ඔව්

අසිත පරාක්‍රම නිවාසයේ නේ ද? එහෙනම් මෛත්‍රී ශාලාවට එන්න වෙන්නේ.

අසිත : ඔය රැස්වීම ඉවර වෙන කොට හවස් වෙනවා. අපිට එදාට කෑමත් අරන් එන්න වෙනවා.

මුදිත : ඉතින් ඒ නිවේදනයේ එහෙම කිව්වේ නැහැ නේ. දැන් ළමයි දන්නේ නැහැ නේ කෑම ගේන්න ඕනැ ද නැද්ද කියලා.

සමිත : ඔව්. ඒකේ කියන්න තිබුණා නේ කෑම අරන් එන්න කියලා.

අසිත : ඔන්න තව නිවේදනයක් ඇහෙනවා.

සමිත : නෑ. ඒක තව වරක් කියනවා ඇති.

අසිත : තව වරක් කියල ඉවර යි. මේ වෙන එකක්.

සමිත : ඔය අපේ අධ්‍යාපන ගමන ගැන.

අසිත : ඔව්! ඔව්! හොඳට අහගෙන ඉමු.



"සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හොඳින් සවන් දෙන්න.
මහනුවර පැවැත්වෙන කෘෂිකාර්මික ප්‍රදර්ශනය නැරඹීමේ අධ්‍යාපන චාරිකාව. කලින් සාකච්ඡා කර ගත් පරිදි මෙම චාරිකාව මාර්තු මස අට වන දා පිටත් වීමට නියමිත ය. පෙරවරු පහට පාසල අසලින් පිටත් වේ. බස්රියෙන් කොළඹට ගොස් එතැන් සිට ගමන් කරන්නේ දුම්රියෙනි.
උදෑසන පහට පෙර සියලු දෙනා ම පාසලට පැමිණෙන්න. පිරිමි ළමයින් අංක එක බස් රථයට ද ගැහැනු ළමයින් අංක දෙක බස් රථයට ද ගොඩ විය යුතු ය. උදෑසන හා දවල් ආහාර රැගෙන ආ යුතු ය. බස් රියේ දී, දුම්රියේ දී මෙන් ම ප්‍රදර්ශන භූමියේ දී සන්සුන්ව, විනීතව හැසිරෙන්න. ආපසු පාසලට පැමිණෙන විට රාත්‍රි නවය පමණ වේ. ඔබ කැඳවා ගෙන යෑම සඳහා ඒ වේලාවට පාසලට පැමිණෙන ලෙස දෙමාපියන්ට කියන්න. චාරිකාව සඳහා මුදල් ලබා දීමට නො හැකි වූ සිසුන් වෙතොත් හෙට උදේ දහයට පෙර මුණසිංහ ගුරුතුමාට මුදල් භාර දෙන්න."

සමිත : ඒ නිවේදනේ හොඳට කිව්වා. හරි පැහැදිලි යි. කරන්න ඕනෑ ඔක්කොම හොඳට තේරුණා, හරි ම පැහැදිලි යි.

• • • • •

(කොටුව දුම්රියපළ භූමියෙහි ළමයි සෝෂා කරමින් එහෙ මෙහෙ ඇවිදිති.)

මුදිත : ඔන්න සමිත, අහං ඉන්න, දුම්රියපළේ නිවේදනයක් කියනවා.



"කරුණාකර සවන් දෙන්න"
"තුන්වන වේදිකාවට දැන් පැමිණි යාල්දේවි ශීඝ්‍රගාමී දුම්රිය පෙරවරු නවය යි පහළොවට යාපනය බලා පිටත් වේ. එය නවත්වන්නේ රාගම, පොල්ගහවෙල, මහව, අනුරාධපුර, වවුනියාව යන දුම්රිය ස්ථානවල පමණි. වවුනියාව සිට යාපනය දක්වා සියලු ම දුම්රිය ස්ථානවල එම යාල් දේවි දුම්රිය නවත්වනවා ඇත."

මුදිත : අන්න ඒ නිවේදනය දෙමළෙන් කියනවා.
අසිත : ඒක හොඳයි. නැත්නම් දෙමළ අයට තේරෙන්නේ නැහැ නේ.
මුදිත : අන්න ඇහෙනව ද අසිත ඒ නිවේදනය ඉංග්‍රීසියෙනුත් කියනවා.
සමිත : ඔන්න අපි යන දුම්රිය ගැනත් කියනවා.



"කරුණාකර සවන් දෙන්න.
දෙවන වේදිකාවට දැන් පැමිණි නගරාන්තර ශීඝ්‍රගාමී දුම්රිය පෙරවරු නවය යි තිහට මහනුවර බලා පිටත් වෙයි. එම දුම්රිය නවත්වන්නේ පේරාදෙණිය දුම්රිය ස්ථානයේ පමණි."

අසිත : බලන්න සමිත ඒ දුම්රිය ගැන කියන නිවේදනය වෙන ඒවාට වැඩිය වෙනස් නේ ද?

මුදිත : අන්න! අන්න! සර් එනවා අපිත් යං කෝච්චිය ළඟට.

සමිත : මොකක් ද අසිත මේ කෝච්චිය නගරාන්තර එකක් කියලා කිව්වේ.

අසිත : ප්‍රධාන නගර අතරෙ විතර යි යන්නේ මග නවත්වන්නේ නැහැ. ඒක යි නගරාන්තර කියන්නේ.

මුදිත : එතකොට මග බහින අයට මේකෙ යන්න බැහැ.

අසිත : බැහැ පේරාදෙණියෙ යි මහනුවර යි විතර ම යි නවත්වන්නේ.
(දුම්රිය නවත්වන ශබ්දය ඇසේ)

ළමයි : පේරාදෙණිය ඉස්ටේසමේ නැවැත්තුවා.



ගුරුවරයෙක්: (ශබ්ද නගා) ළමයි කවුරුත් මෙතන බහින්න එපා. මේ පේරාදෙණිය ඉස්ටේසම. අපි බහින්නේ ඊළඟට නවත්වන තැන, මහනුවර.

තවත් ගුරුවරයෙක් : හොඳින් අහගන්න - කෝච්චිය නැවැත්තුවා ම ඔක්කොම එක පාරට ම කඩා ගෙන බහින්නේ නැහැ. එක් එක් කෙනා හිමිහිට බහින්න. බැහැලා වේදිකාවට වෙලා දෙන්නා දෙන්නා පේළියට ඉන්න.

මුදිත : සර්ලත් ඒ කිව්වේ නිවේදනයක් තමයි. දැන් අපිට මොකක් ද කරන්න ඕනෑ කියල තේරුණා නේ.

• • • • •

ළමයි : (කලබලයෙන් මෙන්)
අන්න! අන්න! ප්‍රදර්ශනේ අර සද්දේ ඇහෙන්නේ-බහිමු, බහිමු.

සමිත : එහෙම එක පාරට ම බහින්න බැහැ නේ. සර්, කිව්වෙත් එක එක්කෙනා බහින්න කියල නේ.

අසිත : ඔය ප්‍රදර්ශන භූමියෙත් නිවේදන කියවනවා ඇහෙන්නේ.

සමිත : සෙනග ගොඩක් ඉන්න හින්ද මෙතන නම් නිතර ම නිවේදන කියන්න වෙනවා ඇති.

මුදිත : අන්න! කවුද ළමයෙක් නැති වෙලාලු.



"කරුණාකර සවන් දෙන්න"
"කෑගල්ලේ සිට පැමිණි රුවනි තම දෙමාපියන් එනතුරු පිවිසුම් දොරටුව අසල රැඳී සිටී. කරුණාකර දෙමාපියන් පැමිණ එම දරුවා භාර ගන්නා ලෙස ඉල්ලා සිටිමු. ස්තුති යි, මෙයට සංවිධායක කමිටුව"

සමිත : මේ වගේ සෙනග පිරිල ඉන්න තැන්වලට ආවා ම අපිටත් ඔහොම වෙයි ද දන්නෑ.

අසිත : එහෙම මඟ හැරුණොත් කරන්න තියෙන්නේ ඒ කාර්යාලයට ගිහින් කියන එක. එතකොට ඒ ගොල්ලො මේ වාගෙ නිවේදනයක් දාලා හොයලා දෙනවා ඇති.

මුදිත : ඔව් ඉතින් දෙමාපියෝ හිටියොත් නිවේදනය අහගෙන ඉඳලා එනවා ඇති.

සමිත : ඒක නෙවෙයි සමිත බලන්නකො ඒ නිවේදනය අන්තිමට ස්තුති යි කියලත් කියනවා.

මුදිත : යමු ද ඉස්සරහට මෙතන සෙනග පිරිල නේ.

අසිත : නෑ, නෑ, යන්න එපා අපි සර්ලා එනකං ඉමු. කොයි පැත්තට යනව ද දන්නේ නැහැ නේ.



"කරුණාකර සවන් දෙන්න"
"මේ නිවේදනය ප්‍රදර්ශනය නරඹන සියලු දෙනාට යි. හැම දෙනා ම ප්‍රවේශ පත්‍ර රැගෙන ප්‍රදර්ශන භූමියට ඇතුළු වන්න. යොදා ඇති ඊතලය අනුව ගමන් කරන්න. කරුණාකර ප්‍රදර්ශන කුටිවල ඇති පැළ වර්ග හා ප්‍රදර්ශන භාණ්ඩ අත ගෑමෙන් වළකින්න. පැළ වර්ග මිල දී ගන්නේ නම් කරුණාකර රිසිට් පතක් ලබා ගන්න. ස්තුති යි."

ළමයි : අපිත් ඒ කියපු විදියට ඊතලය අනුව යමු. නැත්නම් මග හැරෙයි. අන්න! සර්ලත් එනවා.

සමිත : ප්‍රදර්ශනේ හොඳට බලන්න පුළුවන් වුණේ නිවේදනවලින් උපදෙස් දුන්නාට පස්සේ.

අසිත : අපිත් ඒ වගේ නිවේදන කියවන්න උත්සාහ කරමු.

සමිත : ඔව්, අසිත අපේ පන්තියේ කෙරෙන නිවේදන අපිට කරන්න පුළුවන් නේ.

අසිත, මුදිත : ඔව්! ඔව්! උත්සාහ කරමු.

## අවබෝධය

1. පාඩමේ සඳහන් පළමුවන නිවේදනයෙන් කියැවෙන්නේ කුමක් ගැන ද?
2. පළමු නිවේදනයේ සිසුන් දුටු අඩුපාඩු මොනවා ද?
3. පාඩමේ එන චාරිකාවේ අරමුණ කුමක් ද?
4. නිවේදනය අනුව චාරිකාව පිටත් වන වේලාව හා ආපසු පැමිණෙන වේලාව කීය ද?
5. චාරිකාව යෑමට සිසුන් රැගෙන ආ යුත්තේ මොනවා ද?
6. පාඩමේ දුම්රිය දෙකක් ගැන සඳහන් වේ. ඒවා මොනවා ද?

## ලිඛිත අභ්‍යාස

1. පාසලේ දී ඔබට අසන්නට ලැබුණු නිවේදනයක් ලියන්න.
2. ඔබට ගමේ දී අසන්නට ලැබුණු නිවේදනයක් ලියන්න.
3. ක්‍රීඩා තරගයක දී අසන්නට ලැබුණු නිවේදනයක කොටසක් ලියන්න.

## මාතෘකානුකූල කතා

නිවේදන කියවීමෙන් ලබා ගත් කථන කුසලතාව ද පදනම් කර ගෙන, කිසි යම් මාතෘකාවක් යටතේ කතා කිරීමට ද පුළුවන. එසේ කරනු ලබන මාතෘකානුකූල කතාවක් මුල, මැද, අග මැනවින් සංවිධානය වී තිබිය යුතු ය. එවැනි කතාවක ප්‍රධාන ලක්ෂණ කිහිපයකි.

- අර්ථවත් බව
- පැහැදිලි බව
- හඬ පාලනය
- අවධාරණය
- ප්‍රසන්න බව ආදිය යි.

මාතෘකානුකූල කතාවක්, ග්‍රාහක අවධානය මනාව ලබා ගනිමින්, උචිත අංග චලන භාවිත කරමින් ඉදිරිපත් කළ යුතුය.

## ප්‍රායෝගික අභ්‍යාස

1. මේ වැනි නිවේදනත් ඔබට අසන්නට ලැබී ඇද්දැයි බලන්න. කියවන්න.

| | |
|---|---|
| එන සිකුරාදා | කොකු පණු දොස්තර |
| එනවලු ළමයිනි | ඩුං ඩුං ඩුං ඩුං |
| හොර ලෙඩ අරගෙන | නැවිත් ඉන්නට |
| හොඳ නැහැ ළමයිනි | ඩුං ඩුං ඩුං ඩුං |
| බෝතල භාජන | අරං වරෙල්ලා |
| ඇහුණ ද ළමයිනි | ඩුං ඩුං ඩුං ඩුං |
| කොකු පණු බේතෙන් | පාංඩු පිප්පුම |
| සනීප වෙනවලු | ඩුං ඩුං ඩුං ඩුං |
| බේත් අරං බිවු | ළමයින් කාටත් |
| නිවාඩු දෙනවලු | ඩුං ඩුං ඩුං ඩුං |
| එදාට නැවිත් | හිටියොත් ළමයිනි |
| දඬුවම් දෙනවලු | ඩුං ඩුං ඩුං ඩුං |

එස්. මහින්ද හිමි - ළමා ගී සහ කවි

**මෙය කලකට ඉහත දී ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය වැඩසටහන් සඳහා සිදු කෙරුණු නිවේදන සිහිපත් කරන නිර්මාණයකි.**

2. ඉහත ලිඛිත අභ්‍යාසවල දී ලියූ නිවේදන පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදී කියවන්න.

3. නිවේදන කියවීමේ දී සිසුන්ගෙන් සිදු වන දුබලතා සහ ප්‍රබලතා සාකච්ඡා කරන්න.

4. පන්ති කාමරයේ දී නිවේදන සකස් කර කියවන්න.

5. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන පන්තිය ඉදිරියේ කතාවක් කරන්න. ඒ සඳහා නිශ්චිත කාලයක් තීරණය කර ගන්න.
   - පොත්පත් කියවීමේ වැදගත්කම
   - මා කැමති ම ජාතික වීරයා
   - පරිසරය රැක ගත යුතු ය



# ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය

# 15

අපි ජීවිතයේ විවිධ අරමුණු සඳහා විවිධ අවස්ථාවල දී ලේඛන කාර්යයන්හි නිරත වෙමු. එම ලේඛන විවිධ ආකාරවලින් යුක්ත වේ. විවිධ තේමා ඔස්සේ බිත්ති පුවත්පතකට, ළමා පුවත්පතකට හෝ සඟරාවකට ලිපියක් ලිවිය හැකි ය.

මෙම පාඩමට ඇතුළත් වන්නේ ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය පිළිබඳව සකස් කරන ලද ලිපියකි. එය හොඳින් කියවා පාඩමේ ඇති උපදෙස් ද අධ්‍යයනය කිරීම, බිත්ති පුවත්පතකට හෝ සඟරාවකට හෝ ලිපියක් සකස් කිරීම සඳහා හොඳ ප්‍රවේශයකි. එමෙන් ම පුවත්පත් ලිපි හා සඟරා ලිපි පිළිබඳ හැඳින්වීම් ද පාඩමට ඇතුළත් වේ.

පාඩමේ ඇතුළත් ලිපියට පාදක වී ඇත්තේ කාලීන පරිසර ගැටලුවකි. එබඳු කරුණු පිළිබඳ මනා අවධානයෙන් කටයුතු කිරීම ද අත්‍යවශ්‍ය වේ. අපේ දැනුම දියුණු කර ගැනීමට මෙන් ම එදිනෙදා ජීවිතය සාර්ථක කර ගැනීමට ද එය වැදගත් වේ.

2012 නොවැම්බර් 19 මිහිර පුවත්පතේ පළ වූ ලිපියක් ආශ්‍රයෙන් මේ පාඩම සකස් කර ඇත.

# ලොවට තර්ජනයක් වන
# විද්‍යුත් අපද්‍රව්‍ය

මේ වන විට ලොව පුරා සිටින ජනයාගෙන් වැඩි පිරිසක් තම කාර්යයන් පහසු කර ගැනීම සඳහා ඉලෙක්ට්‍රෝනික උපාංග භාවිත කරති. එහෙත් මෙම ඉලෙක්ට්‍රෝනික භාණ්ඩවලින් ඇතැම් ඒවා පාවිච්චි කිරීමෙන් පසු නැවත ප්‍රයෝජනයට ගත නො හැකි ඒවා ය. එවැනි ඉලෙක්ට්‍රෝනික හා විද්‍යුත් උපාංග ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ලෙස සැලකේ. කිසි දා දිරා පත් නො වන මෙවැනි අපද්‍රව්‍ය දැන් දැන් පරිසරයේ පැවැත්මට මහත් තර්ජනයක් වී තිබේ. වසරකට බැහැර කෙරෙන ඝන අපද්‍රව්‍ය මෙන් තුන් ගුණයක ප්‍රමාණයක් මෙලෙස ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය පරිසරයට එකතු වේ. දැනට ගණන් බලා ඇති ආකාරයට වසරකට ටොන් මිලියන 40කට වඩා අධික ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරේ.

## අහිතකර බලපෑම්

මේවා අනෙකුත් අපද්‍රව්‍යවලට වඩා බෙහෙවින් අහිතකර ලෙස පරිසරයට බලපායි. උදාහරණයක් ලෙස ග්‍රෑම් දෙකක පමණ මයික්‍රෝ චිපයක් භාවිතයෙන් පසු ඉවත දැමුව හොත් එහි ඇති මූලද්‍රව්‍ය අවට පරිසරය සමග සංයෝජනය වී කිලෝග්‍රෑම් 26ක පමණ අහිතකර මූලද්‍රව්‍ය ප්‍රමාණයක් බිහි වීමට ඉඩ තිබේ. මේ ලෙසට අප විසින් එදිනෙදා පරිසරයට මුදා හරිනු ලබන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ප්‍රමාණය දෙස බලන විට ඉන් විය හැකි හානිය සිතා ගැනීමට අසීරු ය. මෙලෙස ඉවත ලන මූලද්‍රව්‍ය, හරිතාගාර වායු ඇති කිරීමට සමත් වන අතර එමගින් ගෝලීය උණුසුම වැඩි කෙරෙයි.

## නිරන්තරයෙන් පරිසරයට එකතු වන අපද්‍රව්‍ය

★ සංයුක්ත තැටි
★ ප්‍රතිදීප්ත පහන්
★ රූපවාහිනී යන්ත්‍ර
★ ගණක යන්ත්‍ර
★ රේඩියෝ
★ ට්‍රාන්ස්ෆෝමර්ස්
★ විද්‍යුත් යතුරු පුවරු
★ කැමරා
★ පරිගණක
★ වෛද්‍ය උපකරණ
★ ජංගම දූරකථන
★ වියළි කෝෂ
★ සුසංහිත ප්‍රතිදීප්ත පහන් (CFL)
★ සංයුක්ත තැටි ක්‍රියා කරවන යන්ත්‍ර
★ බහුමාධ්‍ය ප්‍රක්ෂේපක

සංවර්ධිත රටවල් විසින් නිපදවන පරිගණක ප්‍රමාණයෙන් 50%ක පමණ ප්‍රමාණයක් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ භාවිත කිරීමට නුසුදුසු බැවින්, ඒවා බැහැර කෙරෙයි. එහෙත් ඔවුන් සංවර්ධනය වෙමින් පවතින රටවලට නො මිලයේ හෝ සුළු මුදලකට එම උපකරණ ලබා දෙන අතර, එමගින් සංවර්ධනය වෙමින් පවතින රටවල් ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය රැස් කරන්නන් බවට පත් වෙයි.

### මිනිස් දිවියට වන හානි

පරිහරණය කිරීමෙන් පසුව ආයුකාලය අවසන් වූ ඉලෙක්ට්‍රෝනික උපාංග, කසළ ලෙස විවෘත පරිසරයට මුදා හැරීම හේතුවෙන්, ඒවා යම් ආකාරයකින් පිලිස්සීමට ලක් වුවහොත් ඒවායේ අන්තර්ගත මූලද්‍රව්‍ය හා රසායනික සංයෝග පරිසරය සමග මුසු වේ. අනතුරුව මෙම සංයෝග ජලයට හා පසට මුසු වී ආහාරදාම හරහා ගමන් කොට මිනිසාට අයහපත් ප්‍රතිඵල ගෙන දිය හැකි ය. මේ නිසා අනාගතයේ දී මිනිසුන්ට වැළඳෙන රෝගාබාධ අතර,

- ★ ස්නායු පද්ධතියේ අක්‍රමිකතා
- ★ එන්සයිම ක්‍රියාකාරිත්වයට වන බලපෑම්
- ★ පිළිකා රෝග
- ★ ප්‍රජනන පද්ධතිවල අක්‍රමිකතා
- ★ ආහාර ජීර්ණය කෙරෙහි බලපෑම්
- ★ ප්‍රතිශක්තිකරණ අක්‍රමිකතා

ප්‍රධාන වේ.

**ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය අවම කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග**

- ★ඉලෙක්ට්‍රෝනික හා විද්‍යුත් උපකරණ අවශ්‍ය ම නම් පමණක් මිල දී ගැනීම
- ★අලුත්වැඩියා කර නැවත භාවිතය
- ★ නැවත භාවිතයට ගත නො හැකි උපකරණ ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම
- ★ උපකරණ පරිස්සමින් පරිහරණය කිරීම
- ★ මෙම ද්‍රව්‍ය අනාරක්ෂිත අයුරින් පරිසරයට මුදා නො හැරීම

වර්තමානයේ අප අවට පරිසරයට හානි පමුණුවන ප්‍රධාන කාරකයක් වන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය බැහැර කිරීම නිවැරදිව කළමනාකරණය කිරීම වැදගත් ය. එය අනාගත පරපුරේ පමණක් නො ව අපේ ද සුරක්ෂිතතාවට හේතු වනු ඇත.

### අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| හරිතාගාර වායු | පරිසර උෂ්ණත්වය ඉහළ යෑමට බලපාන වායු; කාබන්ඩයොක්සයිඩ්, මීතේන් ආදි වායු |
| උපාංග | කොටස් |

| | |
|---|---|
| ආහාර දාම | හරිත ශාකයකින් හෝ ශාක කොටසකින් ආරම්භ වී අනුක්‍රමයෙන් සතුන් ඔස්සේ ආහාර සම්බන්ධතා නිරූපණය කරන රේඛීය සටහන |
| එන්සයිම | යම් කිසි ක්‍රියාවක වේගය අඩු වැඩි කිරීමට උපකාරි වන රසායනික ද්‍රව්‍ය |
| ප්‍රතිශක්තිකරණ | යම්කිසි රෝගයකින් වැළකී සිටීමට තිබෙන ශක්තිය |
| ප්‍රතිචක්‍රීකරණය | යම්කිසි ද්‍රව්‍යයක් නැවත නැවත භාවිතයට ගැනීම |

ඔබ කියැවූයේ ළමා පුවත්පතකින් උපුටා ගත් ලිපියකි. එම ලිපිය සකස් කර ඇති ආකාරය පිළිබඳව පහත දක්වා ඇති කරුණු ඔස්සේ අවධානය යොමු කරන්න.

- ලිපියේ අරමුණ: කාලීන වැදගත්කමක් ඇති කරුණක් පිළිබඳව ඔබ දැනුවත් කිරීම පිණිස යි.
- ලිපියේ අරමුණ පැහැදිලි වන සේ සුදුසු මාතෘකාවක් යෙදීම
- මුලින් ම මාතෘකාව පිළිබඳ හැඳින්වීම
- අතුරු මාතෘකා යටතේ කරුණු ගොනු කිරීම
- අවසානයේ කතුවරයාගේ යෝජනා ඉදිරිපත් කිරීම
- ගැළපෙන බස් වහරක් භාවිතය

මේ අන්දමට විවිධ මාතෘකා යටතේ පුවත්පත් සඳහා ලිපි ලිවීමට ඔබට ද පුළුවන.

# පුවත්පත් ලිපි

අපට එදිනෙදා ජීවිතයේ විවිධ තොරතුරු මෙන් ම දැනුම හා විනෝදාස්වාදය සපයන මාධ්‍ය අතර පුවත්පත් වැදගත් වේ. විවිධ මට්ටම්වල පාඨකයන් ඉලක්ක කර ගනිමින් පුවත්පත් පළ කෙරෙයි. ළමා, තරුණ, සාමාන්‍ය පොදු පාඨකයන් ආදි වශයෙනි. පුවත්පත් සඳහා ලිපි ලිවීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව සැලකිලිමත් වීම සුදුසු ය.

- ලිපිය කුමන පාඨක පිරිසක් සඳහා ද යන වග
- එම පාඨක පිරිසට අදාළ වූවක් ද යන වග
- පාඨක පිරිසට ගැළපෙන සුදුසු බස් වහරක් යොදා ගත යුතු බව
- පාඨකයාගේ සිත් ඇද ගන්නාසුලු බව
- නිර්මාණාත්මක බව
- මාතෘකාවට අදාළ බව

# බිත්ති පුවත්පත් ලිපි

බිත්ති පුවත්පත ද තොරතුරු සන්නිවේදනය සඳහා යොදා ගත හැකි මාධ්‍යයකි. පාසල්වල මෙන් ම වෙනත් ආයතනවල ද බිත්ති පුවත්පත් පවත්වා ගෙන යනු දැකිය හැකි ය. පාසලක පහත දැක්වෙන අන්දමේ බිත්ති පුවත්පත් දක්නට ලැබේ.

- පාසල් බිත්ති පුවත්පත්
- පාසලේ විවිධ සංගම්වල බිත්ති පුවත්පත්
- පන්ති බිත්ති පුවත්පත්

බිත්ති පුවත්පතක ශිෂ්‍යයන්ට අදාළව දැනුම ලබා දෙන ලිපි හා රස වින්දනාත්මක නිර්මාණ ඇතුළත් කළ හැකි ය.

- ගද්‍ය ලිපි
- කවි පන්ති
- කෙටිකතා
- විවිධ තොරතුරු
- චිත්‍ර
- පාසල් ප්‍රවෘත්ති - ආදි වශයෙනි.

ඔබේ පන්තියේ සියලු දෙනා එක්ව ගුරු උපදෙස් අනුව බිත්ති පුවත්පතක් නිර්මාණය කරන්න. බිත්ති පුවත්පත ඔබේ ලේඛන හා නිර්මාණාත්මක හැකියා දියුණු කර ගැනීමට ඉවහල් වනු ඇත.

**බිත්ති පුවත්පතක් සකස් කිරීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න.**

- බිත්ති පුවත්පත දිනපතා පත්‍රයක මුල් පිටුවේ ආකෘතිය අනුව සකස් කිරීම සුදුසු ය.
- ඉහළින් ම බිත්ති පුවත්පතේ නම හා පළ කරන්නේ කවුරු ද, දිනය ආදි තොරතුරු
- ඊට පහළින් ප්‍රධාන සිරස්තලයක් සහිත වාර්තාවක්
- ඡායාරූපයක් හෝ සිතුවමක් හෝ සමග ඒ පිළිබඳ විස්තරයක්
- සංස්කාරක සටහනක්
- විවිධ මාතෘකා යටතේ ලියැවුණු ලිපි, නිර්මාණ ආදිය පහළට තීරු වශයෙන් වෙන් කර ලිවීම. A4 ප්‍රමාණයේ කඩදාසියක් දිගු අතට දෙකට නමා වෙන් කොට තීරු වශයෙන් සකස් කර ගත හැකි ය.

★ බිත්ති පුවත්පත විවිධ කලාප වශයෙන් ද පළ කළ හැකි ය.

- අලුත් අවුරුදු කලාපය
- වෙසක් කලාපය
- නත්තල් කලාපය

එමෙන්ම

- සංස්කෘතික උරුම
- ජාතික වීරයෝ
- අපේ පඬිවරු

ආදි විවිධ තේමා ඔස්සේද කලාප වශයෙන් සකස් කළ හැකි ය.

## සඟරා

★ සඟරා ද ශිෂ්‍යයන්ගේ දැනුම, රසාස්වාදය හා නිර්මාණ කුසලතා ආදිය දියුණු කිරීම සඳහා පවත්වා ගෙන යා හැකි මාධ්‍යයකි.

★ පන්ති වශයෙන්, විෂය වශයෙන්, සංගම් වශයෙන් හෝ විද්‍යාලයීය මට්ටමෙන් සඟරා පළ කළ හැකි ය.

★ සඟරා සති පතා හෝ මාස් පතා හෝ ත්‍රෛමාසික වශයෙන් හෝ කාල සීමා අනුව පළ කළ හැකි ය.

★ බිත්ති පුවත්පතකට මෙන් ම සඟරාවකට ද විවිධ නිර්මාණ, විචිත්‍රාංග ඉදිරිපත් කළ හැකි ය.

ඔබ ලියන කවර ලේඛනයක් වුව ද නිවැරදි භාෂා ව්‍යවහාරය අනුව ලිවීමට පුරුදු වන්න. ලේඛනයේ දී පද බෙදා ලිවීම අත්‍යවශ්‍ය කාරණයකි.

## පද බෙදීම

★ **වචනයක අගට යෙදෙන ප්‍රත්‍යය* එක් කොට ලිවිය යුතු ය. පහත දැක්වෙන ඡේදය කියවන්න.**

"කටු පඳුරුවලින් ගහන වූ වනයෙහි ඇවිදීම අපහසු ය. මෙහි දී වන සතුන්ගේ කුර ගැටීමෙන් සැදුණු අඩි පාරවල් දිගේ ගමන් කිරීම පහසු ය. ඒ යන අතරතුර හමු වන විල්වල ලැග සිටින කුළු මීමුන්ගෙන් අනතුරු ළඟා විය හැකි ය."

* වචනයක අගට එක් වී අර්ථ වෙනස් කිරීමට හේතු වන භාෂා කොටස ප්‍රත්‍යය නමින් හැඳින්වේ.

**මෙම ඡේදයෙහි ඇතුළත් පහත දැක්වෙන වචනවලට ප්‍රත්‍යය එක් වී ඇති අයුරු බලන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| පඳුරුවලින් | - | වලින් | වනයෙහි | - | හි |
| සතුන්ගේ | - | ගේ | අඩි පාරවල් | - | වල් |
| විල්වල | - | වල | කුළු මීමුන්ගෙන් | - | ගෙන් |

★ **උපසර්ග* වචනයක මුලට එක් කොට ලිවිය යුතු ය. පහත දැක්වෙන ඡේදය කියවන්න.**

"මවු බිමේ උපන් මාගේ දරුවනි! **පර**සිරිතට ගැති නො වව්. **අව**ගුණයට දොර වසව්. **දු**සිරිත් දුරු කරව්. **සු**සිරිත් වඩව්. ජාතියේ **අභි**මානය **සු**රකිව්. **නි**වහල් දේශයක් ගොඩ නගව්. දියුණුවේ මග **අනු**ගමනය කරව්."

**මෙහි මුලට උපසර්ග යෙදී ඇති වචන හඳුනා ගන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| පර | - | පරසිරිතට | අව | - | අවගුණයට |
| දු | - | දුසිරිත් | සු | - | සුසිරිත් |
| සු | - | සුරකිව් | අභි | - | අභිමානය |
| නි | - | නිවහල් | අනු | - | අනුගමනය |

## අවබෝධය

1. **ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය පරිසරයට හානි දායක වන්නේ ඇයි?**
2. **ගෝලීය උණුසුම වර්ධනය කිරීමට ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය බලපාන්නේ කෙසේ ද?**
3. **ඔබේ නිවසේ භාවිත කර ඉවත දමන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය දෙකක් නම් කරන්න.**
4. **ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍යවලින් පරිසරයට විය හැකි හානි අවම කළ හැක්කේ කුමන ක්‍රියා මාර්ග භාවිතයෙන් ද?**
5. **සංවර්ධනය වෙමින් පවතින රටවල් ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය රැස් කරන්නන් බවට පත් වන්නේ කෙසේ ද?**

* උපසර්ග යනු වචනයක මුලට එකතු වී අර්ථය කෙරෙහි බලපාන භාෂා ඒකකයකි.

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් ඡේදවල වැරදි ලෙස පද බෙදා ඇති වචන නිවැරදි කොට නැවත ලියන්න.**

   i. "වන්දනා සමයෙහි පූජා නගරය බැතිමතුන් ගෙන් පිරී යයි. විවිධ පළාත් වලින් පැමිණෙන ජනයා විශ්‍රාම ශාලා වල ලැගුම් ගනිති. ඔවුන් ගෙන් වැඩි දෙනෙක් ජලාශයන් හි බැස ස්නානය කිරීමට කැමති වෙති. එයින් සිදු විය හැකි අනතුරු වලින් බේරා ගැනීමට ද කටයුතු යොදා ඇත. අනතුරු සිදු විය හැකි තැන් වලින් ස්නානය කිරීමෙන් වළකින ලෙස දැනුම් දෙන දැන්වීම් පුවරු එම ස්ථාන වල සවි කොට ඇත."

   ii. එස්. මහින්ද හිමියන් විසින් රචනා කරන ලද ජාතික අනු රාගය දනවන කවි කියවීමෙන් ජාතික අභි මානය පිළිබඳ අනු වේදනීය හැඟීම් පිබිදෙයි. එතුමා අනු ශාසනා කරන්නේ පර ගැති චින්තනයෙන් මිදෙන ලෙස යි. අධි රාජ්‍යවාදීන්ගෙන් රට මුදා ගැනීම සඳහා ජනතාව පෙළ ගැස්වීම එතුමාගේ අරමුණ විය. අති රමණීය පද මාලාවන්ගෙන් සු සැදි කවිය ඒ සඳහා අවිය කර ගත්තේ ය. අර්ථ රසයෙන් හා ශබ්ද රසයෙන් පිරි පුන් සු මිහිරි පද්‍ය රචනා රැසක් එතුමා අතින් නිර්මාණය වී ඇත.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **පන්තියේ සියලු දෙනාගේ ම නිර්මාණ ඇතුළත් වන පරිදි බිත්ති පුවත් පතක් නිර්මාණය කරන්න. කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ද කළ හැකි ය.**

2. **ගුරු උපදෙස් අනුව පන්තියේ සියලු දෙනාගේ ම නිර්මාණ ඇතුළත් කොට පන්ති සඟරාවක් නිර්මාණය කරන්න.**

3. **බිත්ති පුවත්පතක, සඟරාවක හෝ ළමා පුවත්පතක හෝ පළ කිරීමට සුදුසු ලිපියක් ලියන්න.**



# සකි සඳ පෙනේ – සමනොළ ගල නැගෙනහිර

16

සමනොළ කන්ද දිවයිනේ කඳු පද්ධතියෙහි විශේෂ වැදගත්මක් උසුලන කඳු වැටියකි. ස්වාභාවික පාරිසරික සාධක වන ශාක හා සත්ත්ව ව්‍යාප්තියේ විශේෂතා ඒ අතරින් ප්‍රමුඛ වේ. මේ පර්වතය අතීතයේ පටන් ලංකාවේ විසූ ජනයාගේ ඇදහිලි විශ්වාස හා සම්බන්ධ ස්ථානයක් සේ සැලකේ. බෞද්ධයන්ගේ විශ්වාසය වන්නේ බුදුන් වහන්සේ මේ පර්වත මුදුනට වැඩම කළ බව හා තම පා සලකුණ මෙහි සටහන් කළ බව යි. හින්දූන්ගේ විශ්වාසය මේ පර්වතයෙහි ශිව දෙවියන්ගේ පා සටහන පිහිටා ඇති බව යි. යුදෙව්, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගමික සම්ප්‍රදායන්හි ආදි පුරුෂයා සේ සැලකෙන ආදම් වාසය කළ පාරාදීසය මේ පර්වතය බව එම ආගම් අදහන අය අතර ප්‍රචලිත අදහසකි. මේ හේතුවෙන් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, යුදෙව් හා ඉස්ලාම් යන ප්‍රධාන ආගම් සියල්ලේ ම බැතිමත්තු මෙය ශුද්ධ පර්වතයක් සේ සලකති. එහෙයින් සමනොළ කන්ද ලෝක වාසී ජනයා ඒකාබද්ධ කරන ස්මාරකයක් සේ සැලකිය හැකි ය.

සුර රද සමන් සමඟින් සුරඟන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
කැරපුද වඳින රැඳි මුනි සිරිපා තඹර
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත සැලළිහිණි සංදේශයේ 'ශ්‍රී පාදය' වර්ණනා කරන්නේ එලෙසිනි. මෙයින් හැඟෙන්නේ ශ්‍රී පාදස්ථානයත් සුමන සමන් දෙවියනුත් අතර පවතින සම්බන්ධය යි. බුදු රජාණන් වහන්සේ තෙවන වර ලංකාවට වැඩම කළ අවස්ථාවේ දී සමන් දෙවිඳු සිය වාසස්ථානය වූ සමන්ත කූටයට වඩින ලෙස උන් වහන්සේට ආයාචනය කළේ ය. ඒ අනුව සමන්ත කූටයට වැඩම කළ බුදුන් වහන්සේ තම පා සලකුණ එම කඳු මුදුනෙහි පිහිටුවා, පසෙක පිහිටි දිවා ගුහාවට වැඩ එහි දිවා විහරණය කළ සේක. මේ බව පතිරජ පිරුවන්පති වෛදේහ හිමි **සමන්ත කූට වර්ණනාව** නම් ග්‍රන්ථයෙහි සඳහන් කර ඇත. මඟුල් ලකුණු එක සිය අටක් ශ්‍රී පාද ලාංඡනයෙහි පිහිටා ඇති බව ද කියැවේ. මුහුදු මට්ටමේ සිට අඩි හත්දහස් තුන්සිය හැටක (7360) උසකින් පිහිටි සමන්තකූට පර්වතය සබරගමුවේ පිහිටි ප්‍රාග් ඓතිහාසික වැදගත්කමකින් යුක්ත වූ ඉතා ම සුන්දර ස්ථානයකි.

සමනොළ කන්ද මුදුනේ ඇති පා සටහන ආදම්ගේ බව මුස්ලිම්වරු විශ්වාස කරති. ආදම් කළ පව්වලට විපාක දීම් වශයෙන් පාරාදීසයේ සත්වන දෙව් ලොවින් පොළොවට දමා ගැසීමෙන් පසු මේ කඳු මුදුනෙහි ජීවත් වූ බවත් ඔහු සිටි තැන ගල එබී පා සටහන ඇති වූ බවත් ඔවුහු විශ්වාස කරති. මහා ඇලෙක්සැන්ඩර් රජු ක්‍රි. පූ. 323 දී මහ ගිරි දඹේ ගල් පඩි කප්පවා යකඩ දම්වැල් සවි කර සිරිපා මළුවට නැංගේ එහි ඇත්තේ ආදම්ගේ පා සටහන ය යන හැඟීම මත බව අෂ්රාප් නැමති පර්සියානු කවියා පවසයි.

ශිව දෙවියන් නැටුමක් වෙනුවෙන් සුර ලොවින් නර ලොවට පැමිණි අවස්ථාවේ මේ කඳු මුදුනෙහි සිය පා සටහන තබා ගිය නිසා සමනොළ කඳු මුදුන පූජනීයත්වයට පත් වූ බව ශිව භක්තිකයෝ විශ්වාස කරති. ඔවුන් 'ශිවනොළි පාදම්' යනුවෙන් හඳුන්වන්නේ ශ්‍රී පාදස්ථානය යි.

ක්‍රිස්තු භක්තිකයා පවසන්නේ ක්‍රිස්තියානි ආගමික නායකයාගේ පාද ස්පර්ශය නිසා සමනොළ කන්ද පූජනීය වූ බවකි. කෙසේ වුව ද **මහාවංශයේ** 32 පරිච්ඡේදයේ සඳහන් වන්නේ සමනොළ කන්ද බුදුන් වහන්සේට සේ ම සුමන සමන් දෙවියන්ට ද පිදූවක් බව යි. විවිධ ආගම් අදහන සියලු දෙනා ම සිරිපා කරුණා කරන්නේ හද පිරි භක්තියෙනි. මිනිසුන් පමණක් නො ව වසරක්

පාසා සිරිපා වාරයේ දී පිපී ගත් මල්වලින් රොන් ගැනීමට ලක්ෂ ගණනින් සමනලුන් සිරිපා ප්‍රදේශය පියාඹන ආකාරය ඉතා සුන්දර දසුනකි. නිල්පාටින්, කහපාටින්, සුදු පාටින් වර්ණවත් වූ සමනල් රැන් රැන් සිරිපා කඳු මුදුන දෙසට පියඹා යන්නේ සිරිපා පෙදෙසේ සොබා සොඳුරු බවේ මහිමය ලොවට ම කියා පාමිනි. ආතර් සී. ක්ලාක් ලියූ *The Fountains of Paradise* ⋆ නමැති පොතේ, ශ්‍රී පාදය පිළිබඳ කියවෙන කොටසේ දී සමනලුන්ගේ සිරිපා ගමන ගැන ද සඳහන් කර ඇත.

සිරිපා වඳින්නට යන බැතිමත්හු මාර්ග දෙකක් ඔස්සේ ගමන් කරති. රත්නපුර සිට පලාබද්දල ළිහිණිහෙළ, සීත ගඟුල, ගෙත්තම්පාන, හැරමිටිපාන, ආඬියා මළ තැන්න, ඇහැළ කණුව පසු කර ගෙන මහ ගිරි දඹය ඔස්සේ සිරිපා මළුවට සේන්දු විය හැකි ය. හැටන් සිට නල්ලතන්නිය, මකර තොරණ, සීත ගඟුල පසු කර ගෙත්තම්පාන ඔස්සේ ද මළුවට සේන්දු විය හැකි ය. කුරුවිටින් ඇරඹෙන මාර්ගය එරත්න, තේවත්ත, සීත ගඟුල පසු කර ක්‍රමයෙන් ගොස් රත්නපුර මාර්ගය හා එක් වෙයි. රජ මාවත ලෙස සැලකෙන්නේ රත්නපුර පලාබද්දල මාර්ගය යි. මේ මාර්ග ඔස්සේ සිරිපා සටහනට පූජෝපහාර කරන්නට වළගම්බා, සිවුවන මිහිඳු, ශ්‍රී සංඝබෝධි, විජයබාහු, මහා පරාක්‍රමබාහු, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල, කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු, බෝසත් විජයබාහු, හයවන පරාක්‍රමබාහු, දෙවන විමලධර්මසූරිය, ශ්‍රී විජය රාජසිංහ යන රජවරුන් සමනොළ ගිරගට නැගුණු බව ග්‍රන්ථාරූඪ වී ඇත. මෙයින් පැහැදිලි වන්නේ අනුරාධපුර යුගයේ සිට මේ දක්වා ම රාජ්‍ය නායකයන් සිරිපා වන්දනාවේ යෙදී ඇති බව යි.

එළාර රජුගේ දීඝජන්තු නම් යෝධයා, සුමන කූටයේ පිහිටි ආකාශ චෛතියට, රතු සේද රෙද්දක් පූජා කළ බව **මනෝරථපූරණී** නැමති පාලි ග්‍රන්ථයේ සඳහන් වී ඇත. හින්දුවරු මේ දක්වා ම ශ්‍රී පාද ලාංඡනයට රතු රෙදි පිදීම සිදු කරති. දුටුගැමුණු රජතුමා මරණ මංචකයේ සිට තමා කළ පින්කම් මෙනෙහි කරද්දී, සුමනකූට වාසී මලියදේව නම් වූ හිමි නමකට දානය පූජා කළ බවත් එම දානය රහතන් වහන්සේලා නවසියයක් වැළඳූ බවත් සඳහන් කර ඇත.

උඳුවප් පසළොස්වක පෝ දා ඇරඹෙන සිරිපා වාරය වෙසක් පසළොස්වක පෝ දා අවසන් වෙයි. වෙසක් පෝ දාට පසු දින සිට උඳුවප් පෝ දාට පෙර දින දක්වා සිරිපා අවාරය යි.

⋆ මෙය **පාරාදීසයේ උල්පත්** නමින් එස්. එම්. බන්දුසීල විසින් සිංහලයට පරිවර්තනය කරන ලදි.

මාස හයක් තිස්සේ බැතිමතුන්ගේ පූජෝපහාර ලබමින් වැඩ වෙසෙන දේවාරූඪ කර සඳුන් හරයකින් නිම කරන ලද සුමන සමන් දෙවි රුව සිරිපා අවාරයේ වැඩ වෙසෙන්නේ ගල්පොත්තාවල රජ මහා විහාරයේ ය. සිරිපා වාරය ආරම්භ වන්නේ සුමන සමන් දෙවි රුව පලාබද්දල හරහා වැටී ඇති රජ මාවත ඔස්සේ මහ පෙරහරින් මළුවට වැඩමවීමෙනි. සිරිපා වාරයේ දී මේ දෙවිරුව සිරිපා මළුවේ 'මහ සුමන' දේවාලයේ තැන්පත් කර තබනු ලැබේ. සමන් දෙවියන් උදෙසා පූජා කර ඇති රන්මාල දෙවිරුවේ ගෙලේ සිට දෑස දක්වා දෑස වැසී යන තරම් වුවත් එවා අත පත ගෑමට හෝ කිසිවකු ඉදිරිපත් නො වන්නේ සමන් දෙවි රුවෙහි හා දෙවියන් සතුව ඇතැයි කියන ගුප්ත බලය පිළිබඳව ඇති දැඩි විශ්වාසය හේතුවෙනි. ඒ නිසා ම සිරිපා කරුණා කරන බැතිමත්තු පූජා භූමියකට නො හොබිනා වදන් නො පැවසීමට වග බලා ගනිති.

බුද්ධං සරණේ සිරස දරා      ගෙන<br>
ධම්මං සරණේ සිත පහදා      ගෙන<br>
සංඝං සරණේ සිවුරු දරා      ගෙන<br>
ඉක්ඳැයි තුන් සරණේ අදහා      ගෙන

තුන් සරණේ කවි කියමින් සමනොළ කන්ද තරණය කරන සැදැහැවතුන් ව්‍යවහාර කරන විශේෂ වචන සමූහයක් ද වෙයි. සිරිපා කන්ද නගින්නේ නැත. 'කරුණා කරයි.' ගමන් මල්ල, 'සැහැල්ලුව'යි; තදබදයක් ඇති වූ විට ඉඩක් කඩක් ඉල්ලන්නේ 'දෙන්න අපට සංහිඳේ' කියමිනි. වන්දනාවේ යන කණ්ඩායම, 'වන්දනා නඩය'යි. එහි නායකයා, 'නඩේ ගුරා'ය. ප්‍රථම වතාවට සිරිපා වඳින්ට යන තැනත්තා 'කෝඩුකාරයා' වෙයි. සිරිපා ගමනේ දී සීත ගඟුලෙන් ස්නානය කර ගෙත්තම්පානේ දී ගෙත්තම් කළ යුතු ය. අනතුරුව මළුවට කරුණා කර දොළොස් මහේ පහනට තෙල් වත්කර ඝණ්ටාරය නාද කළ යුතු යි. අනෙකුත් බැතිමතුන් තමන් සිරිපා වන්දනා කළ වාර ගණනට ඝණ්ටා නාද පැවැත්විය යුතු ය. බදාදා හා සෙනසුරාදා යන කෙම්මුර දිනවල විශේෂ තේවාවන් සිදු කර ශ්‍රී පාද ලාංඡනයට පූජෝපහාර පැවැත්වීම චාරිත්‍රයකි.

ඉඳුනිල්මිණි මතුයෙහි තැබූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ පා සටහන වසා විශාල ගල්වලින් සිරිපා මළුව ආවරණය කොට ගල් කුළු මත පර්වතයක් තබා ඒ මත දැනට අපට දක්නට තිබෙන ශ්‍රී පාද ලාංඡනය කෙටූ බව බෞද්ධයන් අතර පැවත එන විශ්වාසය යි. 1940 දී ශක්තිමත් ලෙස ප්‍රාකාරය බන්දවා මළුව හාත්පස කැපූ ගල් අතුරුවා ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේ දොළොස් මහේ පහන එතැනින් ඉවත් කොට ඒ බිමෙහි කළුගල් ඇතිරවීමට පොළොව කනින ලදි. එහි අඳුරු හා ගැඹුරු කුහරයක් දක්නට ලැබුණු බවත්,

බාල්ක වැනි විශාල ගල් ටැම් මත මෙම පර්වතය තබා තිබෙන බව පිළිගත හැකි බවත් එවකට ශ්‍රී පාදස්ථානයේ භාරකාරවරයා පවසා ඇත.

පෙර රජ දරුවන් ශ්‍රී පාදස්ථානයට ගම්වර පූජා කළ බව අඹගමු සෙල්ලිපිය, ගිලීමලේ සෙල්ලිපිය හා ශ්‍රී නිශ්ශංකමල්ල සෙල්ලිපිය යන සෙල්ලිපිවල සඳහන්ව ඇත. 'සිරිපා ලකුණ' ගැන සටහන් තැබූ විදේශිකයෝ බොහෝ ය. මහා ඇලෙක්සැන්ඩර් රජ, අරාබි ජාතික සුලෙයිමාන්, ඉබන් බතූතා, පූර්තුගීසි ජාතික ඔඩාරොඩෝ බාර්බොසරා, චීන ජාතික හියුංසාන්, ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස්, ඇලන් වෝල්ටර්ස්, ඇමර්සන් ටෙනන්ට්, විලියම් ස්කීන් ඒ අතර සිටිති.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ශ්‍රී පාදස්ථානය ජරාවාස තත්ත්වයෙන් මුදා වැඩි දියුණු කර ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට හිමි වන පරිදි වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේට තඹ සන්නසකින් පවරා දී උදාර ශාසනික සේවයක් කළේ ය.

සමනොළ කඳු මුදුන හා සිරිපා සටහන ඇසුරෙහි පෝෂණය වූ සාහිත්‍යය විශේෂ වූවකි. **සමන්තකූට වර්ණනාව**, **සමන් සිරිත**, **ශිරෝපාදය**, **සමනළ විස්තර**, **සමනල හෑල්ල**, **අභිනව හිමගත වර්ණනාව**, **ශ්‍රී පාද අලංකාරය**, **සිරිපා වැඳුම** හා **තුන් සරණය කවි** වැනි සාහිත්‍ය නිර්මාණ ශ්‍රී පාදස්ථානය පාදක කොට ගත් කෘති කිහිපයකි. **සැලළිහිණි සන්දේශයේ** දී ශ්‍රී ලංකා මාතාවගේ සිරස ලෙස සමනොළ කන්ද වර්ණනයට ලක් කර ඇත.

සමනොළ මුහුළ මහ සමුදුර මෙවුල් බර
සුලකළ පුවළ ලක'ගන සිරි යොවුන් වර

වර්තමානයේ ද ශ්‍රී පාදස්ථානය පාදක කොට ගෙන ලියැවුණු විවිධ සාහිත්‍ය නිර්මාණ හමු වේ.

## ලිඛිත අභ්‍යාස

1. **වරහන් තුළින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.**

   i. සමන්ත කූටය ............................ (විෂ්ණු/කතරගම/සමන්) දෙවියන්ගේ වාසභූමිය සේ සැලකෙයි.

   ii. ශ්‍රී පාදස්ථානය මුහුදු මට්ටමේ සිට අඩි ............................ (7260ක්/8560ක්/7360ක්) උසින් පිහිටා ඇත.

   iii. මුල් ම වතාවට සිරිපා වඳින්නට යන්නා ........................ (නඩේ ගුරා/කෝඩුකාරයා/කරුණාවන්තයා) යන නමින් හැඳින්වේ.

   iv. සිරිපා කරුණා කරන සෑම දෙනා ම .......................... (නල්ලතන්නිය/ ළිහිණි හෙළ/සීත ගඟුල) පසු කරති.

   v. රජ මාවත ලෙස පිළිගනු ලබන්නේ .......................... (පලාබද්දල/කුරුවිට/හැටන්) පසු කරමින් මළුව වෙත කරුණා කරන මාවත යි.

   vi. සිරිපා වඳින්නට ගිය රජවරුන්ගේ නම් අතර සඳහන් නො වන්නේ .................... (වළගම්බා/මහා පරාක්‍රමබාහු/දුටුගැමුණු) රජතුමාගේ නම ය.

   vii. සිරිපා අවාරය වන්නේ .................... (උඳුවප් පෝදා සිට නවම් පෝදා දක්වා/උඳුවප් පෝදා සිට වෙසක් පෝදා දක්වා/වෙසක් පෝදා සිට උඳුවප් පෝදා දක්වා) කාලය යි.

   viii. ශ්‍රී පාද ලාංඡනය නමඳින්නට යන ගමනේ දී අසන්නට නො ලැබෙන්නේ .................... (සැහැල්ලුව/සංහිඳේ/නගිමු) යන වචනය යි.

   xi. ශ්‍රී පාදස්ථානය වෙනුවෙන් ගම්වර පූජා කළේ .................... (සෙල්ලිපිවල/ ටැම්ලිපිවල/විදේශීය වාර්තාවල) සටහන් තබමිනි.

   x. ශ්‍රී පාදස්ථානය වැඩි දියුණු කිරීමේ ගෞරවය හිමි වන්නේ .................... (ශ්‍රී වික්‍රම රාජසිංහ/කීර්ති ශ්‍රී රාජසිංහ/සීතාවක රාජසිංහ) රජතුමාට ය.

2. **පහත සඳහන් පදවලට සමාන අර්ථය දෙන පද ලියන්න.**

i. ලාංඡනය
ii. කූටය
iii. නැටුමක්
iv. සුන්දර
v. සේන්දු වීම
vi. වෙසක්
vii. උපහාරය
viii. රුව
ix. මළුව
x. දෑස
xi. බෙල්ල
xii. ගෙත්තම්
xiii. නාදය
xiv. ඉඳුනිල්මිණි
xv. ප්‍රාකාරය
xvi. ප්‍රතිසංස්කරණය
xvii. කුලුනු
xviii. බෞද්ධ
xix. සතු
xx. මාතාව

## ප්‍රායෝගික අභ්‍යාස

1. **කණ්ඩායම්වලට බෙදී තුන්සරණේ කවි ගායනා කරන්න.**
2. **'ශ්‍රී පාදස්ථානය' නමින් බිත්ති පුවත්පතක කලාපයක් නිර්මාණය කරන්න.**
3. **ශ්‍රී පාද ලාංඡනය, සමනොළ කන්ද ඇසුරෙන් නිර්මාණය වූ ගීත එක් රැස් කර පන්තිය ඉදිරියේ ගායනා කරන්න.**

උදා : i. සිරිපාදේ සමනොළ කන්ද පෙනේ - ආලෝකය සමන් කුළේ...
ii. මුනි නන්දන සිරිපාද වදිම් සමනොළ කන්දේ විහිදෙන මෝක්ෂ සුගන්දේ...

## තනි පද

තනි පද යනුවෙන් හැඳින්වෙන්නේ පද කීපයකින් හෝ වාක්‍යාංශයකින් හෝ දැක්වෙන අදහසක් එක් පදයකින් දැක්වීම යි.

පාඩමෙහි ඇතුළත් එවැනි පද හඳුනා ගනිමු.

සුරලොව - දෙවියන් වැඩ වසන ලෝකය
නරලොව - මිනිසුන් ජීවත් වන ලෝකය
ගුප්ත - නියම ස්වරූපය සැඟවී පවතින
කෝඩුකාරයා - පළමු වතාවට සිරිපා කරුණා කරන්නා
නඩේගුරා - සිරිපා කරුණා කරන කණ්ඩායමේ නායකයා

ප්‍රතිසංස්කරණය - නැවත සකස් කිරීම
ගම්වර - විහාර, දේවාලය ආදියේ නඩත්තුව සඳහා පූජා කරන ඉඩම්
සෙල්ලිපි - ගලෙහි කෙටූ ලියවිලි

## ලිඛිත අභ්‍යාස

1. **'අ' තීරුව හා 'ආ' තීරුව යා කරන්න.**

| 'අ' | 'ආ' |
|---|---|
| 1. කිසිවෙකුට බැඳීමක් නැති | පෙතිකඩ |
| 2. හඬ නගා කරන තර්ජනය | දේවදාසි |
| 3. රජුගේ ඇත් හල භාර ප්‍රධානියා | කිම්දෙන |
| 4. ගස්, කොළ, ගෙඩි ආදියේ ඇති බූව | අනුස්මරණය |
| 5. පට පණුවාගෙන් තනන රෙදි | මසුරු |
| 6. මිල මුදල් ඇතත් අනුනට නො දෙන | සේද රෙදි |
| 7. යමෙකු හෝ යමක් සිහිපත් කිරීම | සුඹුළු |
| 8. දිය යට යන | ගජනායක |
| 9. දෙවියන්ගේ ආවතේව සඳහා කැප වූ ස්ත්‍රිය | ගෝරනාඩුව |
| 10. සිතුවම් අඳින ලද වස්ත්‍රය | ස්වෛරි |


2. **පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් යෙදී ඇති වාක්‍යාංශ වෙනුවට තනි පද යොදා වාක්‍යය නැවත ලියන්න.**

   1. **ජනයා බහුලව වාසය කරන** ප්‍රදේශවල පරිසර දූෂණය ද බහුල ය.
   2. මෙවර **සී සෑම, වැපිරීම පිළිබඳ උත්සවය** පැවැත්වුණේ රාජ්‍ය අනුග්‍රහයෙනි.
   3. **කළ වරද ගැන කනගාටු වීමට** වඩා වැරදි නො කර සිටීම වැදගත් වේ.
   4. විජය රජතුමා පිළිබඳ **අතීත කතා පුවත** ක්‍රිස්තු පූර්ව යුගය දක්වා දිවෙයි.
   5. **යම් කාර්යයක් කර ගැනීමට නීත්‍යනුකූල නො වන ආකාරයට දෙන ත්‍යාගය** ලබා ගන්නා ද ලබා දෙන්නා ද නීතිය ඉදිරියේ වරදකරුවෝ ය.

6. **තමා උපන් භූමිය** වෙනුවෙන් ජීවිතය පූජා කළ රණවිරුවෝ අප සිත් තුළ සදාකල් ජීවත් වෙති.
7. **තමා ගැන පමණක් සිතා කටයුතු කරන්නා** මුළු මහත් සමාජයට ම පිළිලයකි.
8. **දිරා ගිය රෙදි කැබැල්ලක්** හැඳ සිටි යාචක ස්ත්‍රියට අම්මා මල් මල් චීත්තයක් දුන්නා ය.
9. **ඉතා වේගයෙන් ධාවනය කරන** බසයකට ඔහු ගොඩ වූයේ කල්වේලා ඇතිව නිවසට යෑමට ය.
10. **දින තිහක කාලයක්** තිස්සේ කය වෙහෙසා වැඩ කර උපයා ගන්නා වැටුප් ජීවත් වීමට තරම් ප්‍රමාණවත් නැතැයි උද්ඝෝෂකයෝ පවසති.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **තනි පද දහයක් ලියා ඒවා විස්තර කර දක්වන්න.**
2. **ඔබගේ යහළුවකු සමග තනි පද කීමේ තරගයක යෙදෙන්න. එක් නිවැරදි පිළිතුරකට ලකුණ බැගින් ලබා දී ජයග්‍රාහකයා සොයන්න.**



# 17 සුදන ගුණ

ජීවිතය සහ ආචාර ධර්ම හා සම්බන්ධ විචිත්‍ර අදහස් පද්‍යයෙන් ප්‍රකාශ කළ අවස්ථා පැරණි සාහිත්‍යයන්හි හමු වෙයි. ඒවා බොහෝ විට ආගමික නීතිය හෝ රාජ නීතිය හෝ සම්බන්ධ උපදෙස් දීමේ අරමුණින් ලියා තිබේ. එක් සාහිත්‍යයක ප්‍රචලිතව ඇති උපදේශාත්මක නිර්මාණවලින් වෙන සාහිත්‍යයන් පෝෂණය කිරීමේ සම්ප්‍රදායක් පැවති බව ද පෙනේ. ඒ අනුව පැරණි සංස්කෘත සාහිත්‍යයෙන් පාලි සාහිත්‍යයට ද ඒ දෙකින් ම දෙමළ සාහිත්‍යයට ද ඒ සියල්ලෙන් ම සිංහල සාහිත්‍යයට ද පැමිණි උපදේශාත්මක අදහස් හමු වෙයි.

සිංහල උපදේශ සාහිත්‍යය, සංස්කෘත හා දෙමළ උපදේශ කාව්‍යයන්ගෙන් පෝෂණය වී තිබේ. සිංහලයෙහි හමු වන උපදේශ කාව්‍ය වන්නේ ලෝවැඩ සඟරාව, සුභාෂිතය හා ලෝකෝපකාරය යන කෘති තුන යි.

මේ පාඩමට ඇතුළත් වන්නේ රණස්ගල්ලේ හිමියන් විසින් ලියන ලද ලෝකෝපකාරයෙන් උපුටා ගත් කවි පහක් සහ ලෝකෝපකාරයට බලපෑ තිරුක්කුරල් නමැති දෙමළ උපදේශ ග්‍රන්ථයේ සිංහල පරිවර්තනයෙන් උපුටා ගත් කවි පහකි. තිරුක්කුරල් ග්‍රන්ථයේ කතුවරයා තිරුවල්ලුවර් නමැත්තකු බව කියවෙයි. කුමන ජාතියකට කුමන ආගමකට අයත් වුව ද යහපත් ජීවිතයකට අදාළ ගුණධර්ම සැමට එක හා සමාන බව මේ පාඩමෙන් පෙන්වා දෙයි.

## තිරුක්කුරල්

**තිරුක්කුරල්** යනු ක්‍රි.ව. 3 - 6 සියවස් අතර කාලයේ ලියැවී ඇතැයි සැලකෙන දෙමළ උපදේශ කාව්‍ය සංග්‍රහයකි. එහි කතුවරයා තිරුවල්ලුවර් නමැත්තෙකු බව පිළිගැනෙයි. පරිච්ඡේද දහයකින් යුතු මෙම ග්‍රන්ථයේ ඇතුළත් උපදේශ පද්‍ය සංඛ්‍යාව 1330කි. මෙය ජාති, ආගම්, කුල භේදයකින් තොරව සමස්ත සමාජයේ ම යහ පැවැත්මට උපදෙස් ලබා දෙන කෘතියකි.

චාල්ස් ද සිල්වා මහතා **සිරි ගීය** නමින් **තිරුක්කුරල්** පරිවර්තනය කර ඇති අතර මෙම පාඩමට ඇතුළත් වන්නේ ගොරොක්ගොඩ මිසිහාමිගේ **තිරුක්කුරල්** පරිවර්තනයෙන් උපුටා ගත් කවි පහකි.

**උදව්වක් වශයෙන් කිසිවක් නො කළ කෙනෙකුට**
**කරන උපකාරය අහසටත් පොළවටත් නො සමයි**

තමාහට උපකාරයක් නො කළ කෙනෙකුට කරන උදව්ව අහසටත් පොළවටත් සම කළ නො හැකි ය. ඊටත් වඩා වටින්නේ ය.

**නිසි කලට කෙනෙකුට කළ උපකාර වූ නම්**
**එය ඉතා සුළු වුව මහා ලොවටත් වැඩි විශාලයි**

සුදුසු අවස්ථාවට කෙනෙකුහට උපකාරයක් කළ හොත් එය කුඩා උපකාරයක් වුවත් එහි වටිනාකම මුළු ලෝකයටත් වඩා විශාල ය.

**ලබන පල නොසිතා කළ උදව්වෙහි හොඳ බව**
**මනින්නට හැකි නම් මහා මුහුදට වැඩි විශාලයි**

ආපසු ලැබෙන ප්‍රයෝජන ගැන නො සිතා කළ උපකාරයක වටිනාකම, මැනීමට හැකි නම් එහි අගය මහා මුහුදටත් වඩා විශාල ය.

**කෙනෙකුන් කළ ගුණය අමතක වීම නරකයි**
**අගුණ කළ විටකදී වහා අමතක වීම යහපති**

කෙනෙකු තමාට උපකාරයක් කළ විට එය අමතක කිරීම සුදුසු නො වේ. අගුණයක් කළ හොත් ඉක්මනින් අමතක කළ යුතු ය.

**ගැලවීමට හැකි ය බිඳලුව නමුදු හැම ගුණ**
**කළ ගුණ නො තැකුවොත් නො හැකි වේ ගැලවීම ලැබුමට**

හැම ගුණ ධර්මයක් ම කඩ කළ හොත් බේරීමට හැකි ය. එහෙත් කළ ගුණ නො තැකුව හොත් ගැලවීමක් ලැබිය නො හැකි ය.

## ලෝකෝපකාරය

ලෝකෝපකාරය රණස්ගල්ලේ හිමියන් විසින් රචනා කරන ලද උපදේශ කාව්‍ය ග්‍රන්ථයකි. මෙහි කවි 238ක් දක්නට ලැබේ. යහපත් ජීවිතයක් සඳහා අවශ්‍ය උපදේශ ලබා දෙන කෘතියක් ලෙස ලෝකෝපකාරය වැදගත් වේ.

ඉහත අපගේ අවධානයට යොමු වූ තිරුක්කුරල් නම් ග්‍රන්ථයේ බලපෑම ලැබූ පොතක් ලෙස ද **ලෝකෝපකාරය** හැඳින්විය හැකි ය. පහත දැක්වෙන්නේ ලෝකෝපකාරයෙන් උපුටා ගත් කවි කිහිපයකි.

**ඉසුරෙන් පිරිහුණත්**
**සුදන තම ගුණය අඩු නො කරත්**
**බිඳුණත් රන් බඳුන**
**ඇති බර අගය අඩු නොවන මෙන්**

සම්පත්වලින් පරිහානියට පත් වුණත් සුදනෝ තම ගුණ දම් රැකීම අඩු නො කරති. කෙසේ ද යත්, රන් භාජනය කැඩුණත් එහි වටිනාකම හා බර අඩු නො වන්නාක් මෙනි.

**සුදනෝ තම සිරිත්**
**කළවුන් තමන් ලෙස ම සලකත්**
**පහනින් ගත් පහන්**
**එක ලෙස ම බබළන විලස්නෙන්**

යහපත් ජනයා තමන්ගේ ගුණ අනුගමනය කරන අය තමා සේ ම සලකති. එය පහනකින් දැල්වූ අනෙක් පහන් සියල්ල ම එක ලෙස ආලෝකයෙන් බබළන්නාක් මෙනි.

**රන් බඳුනෙහි කෙසර**
**තෙල් අඩු නොවී පවතින මෙන්**
**උතුමන් හද සපිරි**
**කුලුණු මෙත් අඩු නොවී පවතියි**

රත්රන් භාජනයෙහි තබා ඇති කේසර සිංහයාගේ තෙල් හිඳෙන්නේ නැති නිසා අඩුවක් නො වී ඒ ලෙසින් පවතී. ඒ සුදනන්ගේ/උතුම් ජනයාගේ හදවතෙහි පිරී ඇති කරුණා මෙත් ගුණය අඩුවක් නො වේ. කුලුණු මෙත් ගුණය හෙවත් කරුණාව යනු අනිත් අයගේ දුක දැක තමාගේ හද කම්පා වන, ශෝක වන ගුණය යි.

**මේග ගං පල තුරු**
**පරහට ම වැඩ පමුණුවන මෙන්**
**සුදනන් ලත් ඉසුරු**
**සව් සතට වැඩ වේ ය නිතියෙන්**

මහා වර්ෂාව, ගංගා, ගෙඩිවලින් පිරුණු ගස් අන් අයට යහපත සලසයි. එමෙන් ම සුදනෝ තමා ළඟ ඇති සම්පත් සියලු ජනයාගේ යහපතට නිතර යොදවති.

**තමහට නොසරි වන**
**සබා මැද ඉඳිනුව කර බා**
**සඳ දැක කොඳ පුබුදු**
**වනු දැක පියුම් හැකිළෙන මෙන්**

තම අදහසට නො ගැළපෙන සභාවක් මැද ඉන්නා විට නිශ්ශබ්දව සිටීම සුදුසු ය. එය චන්ද්‍රයා පායනු දැක, කුමුදු මල් පිපෙනු දැක, නෙලුම් මල් පර වෙන්නාක් මෙනි.

## අවබෝධය

1. බිඳුණු රන් භාජනය උපමාවක් ලෙස ගත්තේ කුමක් ගැන කීමට ද?
2. “කුලුණු මෙත් ගුණය” පැහැදිලි කරන්න.
3. කුලුණු මෙත් ගුණය උපමා කර ඇත්තේ කුමකට ද?
4. ස්වභාව ධර්මයේ සිදුවීමක් ගැන අවසාන කවියේ දක්වා ඇත. එය කුමක් ද?

## ලිඛිත අභ්‍යාස

1. මෙම පදවලට විරුද්ධ අර්ථ දෙන පද ලියන්න.

   i. සුදන -
   ii. සිරිත් -
   iii. පුබුදු -
   iv. වැඩ -
   v. මෙත් -

2. සමාන පදය ලියන්න

   i. ඉසුරු -
   ii. හැකිළෙත -
   iii. පියුම් -
   iv. සුදන -
   v. සඳ -

3. මෙම කවි පන්ති දෙක ඇසුරින් මිනිසුන්ගේ ජීවිතය සාර්ථක කර ගැනීමට උදවු වන සාරධර්ම ලේඛනයක් පිළියෙල කරන්න.

4. උපදේශ ග්‍රන්ථ කීපයක නම් ලියන්න.

5. මෙම පාඩමින් ඔබේ ජීවිතයට එකතු කර ගත හැකි සාරධර්ම සතරක් ලියන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ මෙම පාඩමින් උගත් කරුණු හා තවත් උපදේශ ග්‍රන්ථ කියවා කරුණු එක් රැස් කොට "සුදන ගුණ" නමින් බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.



18

# මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා

දේශාභිමානය යනු දේශය පිළිබඳ ආඩම්බරය, ගර්වය, මානය යන්න යි. තම මාතෘ භූමියේ සංස්කෘතික උරුමයත් අතීත සෞභාග්‍යය මෙන් ම ස්වභාව සෞන්දර්යය පිළිබඳ අසන්නට ලැබීමෙන් සෑම පුරවැසියකු තුළ ම දේශාභිමානී හැඟීම් පහළ වීම නියත ය. “මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා” යන්න එවන් දේශාභිමානී හැඟීම් දනවන ගීතයකි, මේ ගීතය හැත්තෑව දශකයේ ගුවන්විදුලියේ ස්වදේශීය සේවය මගින් ඉදිරිපත් කරන ලද “එඩිතර ලංකා” නම් වූ වැඩසටහනට ඇතුළත් වූවකි.

ගීතයේ රචකයා වූ කරුණාරත්න අමරසිංහ සුප්‍රසිද්ධ ජනමාධ්‍යවේදියෙකි. පරිවර්තකයකු, ගීත පද මාලා රචකයකු හා ළමා පොත් නිර්මාණකරුවකු ලෙස ද අමරසිංහ ප්‍රසිද්ධියට පත්ව ඇත. ප්‍රවීණ ටෙලි නාට්‍ය පිටපත් රචකයකු වන අමරසිංහ ගුවන්විදුලි නාට්‍ය රැසක් සඳහා රංගනයෙන් ද දායකත්වය සපයා තිබේ.

කෙනෙකුට ජීවිතයේ එක් වරක් පමණක් ලබා ගත හැකි සිග්නීස් සම්මානයෙන් ද (2005) කරුණාරත්න අමරසිංහයෝ පිදුම් ලැබූහ.

## මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා

මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා
මා දුටු මුල් සඳු පෙන්නූ ලංකා
මා ගත් මුල් සුසුමත් දුන් ලංකා
මා පණ මෙන් ඔබ රක්නෙමි ලංකා

අත් හළ පුත් කැල සිහි කොට ලංකා
ඔබ හෙළු දුක් සෝ සුසුමන් ලංකා
මහ රෑ මහ සයුරෙන් විත් ලංකා
ඔබ රක්නා දිරි වඩවයි ලංකා

මා නෙත ඔබ නිති බලනට ලංකා
මා කන ඔබ දුක අසනට ලංකා
මා සිත ඔබ ගුණ රඳනට ලංකා
මා දිවි ඔබ රැක ගැනුමට ලංකා

මා ගත ලේ බිඳු එක් කොට ලංකා
නළලත තිලකය අන්දමි ලංකා
මා ගත ඩා බිඳු එක් කොට ලංකා
ඔබ උර මුත්හර බන්දමි ලංකා

### අවබෝධය

1. ලංකාව තමා උපන් දේශය බව දැනවීම සඳහා රචකයා යොදා ඇති කාව්‍යෝක්තිය කුමක් ද?
2. ලංකාව අත් හැර ගිය අය ගැන ලංකාව දුක් වන බව පැවසීම සඳහා යොදා ඇති කවි පදය කුමක් ද?
3. රට වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරන බව පැවසෙන කවිය කුමක් ද?
4. "මා ගත ලේ බිඳු එක් කොට, මා ගත ඩා බිඳුවක් කොට" යන පදවලින් අදහස් වන්නේ කුමක් ද?
5. මවුබිම පිළිබඳ අභිමානවත් හැඟීම් දැනවෙන පද්‍ය පාඨ උපුටා දක්වන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. මේ දේශාභිමානී නිර්මාණ ද කියවන්න. ගායනා කරන්න.

ලංකා ලංකා පෙම්බර ලංකා
පිනවමු ඔබ ලංකා
හොබවමු ඔබ ලංකා දිවි දී
සුරකිමු ඔබ ලංකා -**අරීසෙන් අහුබුදු**

රත්නදීප ජන්ම භූමි
ලංකා දීප විජය භූමි
මේ අපේ උදාර වූ
මාතෘ භූමියයි -**මහගම සේකර**

සසර වසන තුරු - නිවන් දකින තුරු
පින්කෙත හෙළ රන් දෙරණේ
යළි උපදින්නට
හේතු වාසනා වේවා - හේතු වාසනා
-**ඩෝල්ටන් අල්විස්**

2. "මම මගේ රටට ආදරෙයි" යන්නෙන් වචන 150ක පමණ රචනයක් ලියන්න.
3. දේශාභිමානී හැඟීම් දනවන පද්‍යයක් නිර්මාණය කරන්න.
4. කණ්ඩායම්වලට බෙදී මේ දේශාභිමානී ගීය ගායනා කරන්න.
5. දේශාභිමානී ගී පද මාලා එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.



# 19 දුං දුමටයි අඟුරු මටයි

ගුවන්විදුලිය හෙවත් රේඩියෝව විද්‍යුත් ශ්‍රව්‍ය මාධ්‍යයකි. ගුවන්විදුලියෙන් ප්‍රචාරය වන ප්‍රවෘත්ති, සඟරා වැඩසටහන්, විචිත්‍රාංග, විවිධ විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධ සාකච්ඡා, වාර්තා වැඩසටහන්, සංගීත, නාට්‍ය ආදි විවිධ වැඩසටහන් ශ්‍රාවකයන්ගේ දැනුම වර්ධනය වීමටත් රස වින්දනයටත් හේතු වේ. අර්ථවත් ගුවන්විදුලි වැඩසටහන් තෝරා බේරා ගෙන සවන් දීමෙන් නව ලොවට ගැළපෙන සේ ඔබේ දැනුම පුළුල් කර ගැනීමටත් රසඥතාව දියුණු කර ගැනීමටත් හැකි වෙයි.

මහාචාර්ය ජේ. බී. දිසානායකගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය කරන ලද, එවක ශ්‍රාවකයන් අතර ප්‍රසාදයට පත් වූ 'තුන්පත් රටා' වැඩසටහන් මාලාව මුද්‍රිත මාධ්‍යයට පෙරළා පොත් වශයෙන් පළ කර ඇත. "තුන්පත් රටා - 3 : සිංහල සිරිත් විරිත්" නම් පොතේ පරිච්ඡේදයකින් උපුටා ගත් කොටසක් මේ පාඩමෙහි ඇතුළත් වෙයි.

"ඔන්න එකෝමත් එක රටක හිටියා රජ්ජුරු කෙනෙක්, ඒ රජ්ජුරුවන්ට හිටියා බොහොම ලස්සන දූ කුමාරිකාවක්. දවසක් දා මේ කුමාරිකාව සෙල්ලම් කර කර ඉන්න කොට, නහයෙ හිර වුණා ඔළිඳ ඇටයක්. මේ ඔළිඳ ඇටේ එළියට ගන්ට රජ වාසලේ හිටපු හැම දෙනාම උත්සාහ කළා. නමුත් කාටවත් බැරි වුණා. අන්තිමේ දී රජ්ජුරුවෝ රට පුරා ම අඬබෙර ගහලා යැව්වා, තමාගේ දූ කුමාරිකාවගේ නහයේ රැඳුණ ඔළිඳ ඇටේ අරන් දාපු කෙනෙකුට ඇතෙක් බරට වස්තුවයි රටෙන් පංගුවකුයි දෙනවා කියලා."

ඔය කියන සිද්ධිය වුණේ "එකෝමත් එක රටක" "එකෝමත් එක කාලෙක" ය. මේ සිද්ධිය වුණේ අද නම් රජ්ජුරුවන් මේ සිද්ධිය මහජනතාවට දන්වා සිටින්නේ කෙසේ ද? අඬබෙර ගැහීමෙන් ද? නැත. සමහර විට පුවත්පත් මාර්ගයෙන්, නැතහොත් ගුවන්විදුලිය මාර්ගයෙනි.

> "මෙන්න විශේෂ ගුවන්විදුලි නිවේදනයක්. ශ්‍රී ලංකාධිපති මහා රාජෝත්තමයාණන් වහන්සේගේ දූ කුමරිය හදිසි ශල්‍ය කර්මයකට භාජනය කිරීමට සිදු වී තිබේ. මේ සඳහා සියලු ම විශේෂඥ වෛද්‍යවරුන් මහවාසල දුග්ගන්නා නිලමේට හෝ අසල ම ඇති සේවා මුර පොළට හෝ වහා ම වාර්තා කළ යුතු බව රාජ්‍ය ලේකම්තුමා දන්වා සිටියි."

මේ ආකාරයෙන් අද ගුවන්විදුලියෙන් කෙරෙන්නේ එදා, සිංහල රජ්ජුරුවන්ගේ කාලයෙහි අඬබෙරයෙන් සිදු වුණු කාරිය ම ය. එදා අඬබෙරයෙන් කෙරුණේ යම්කිසි පණිවිඩයක් විශාල පිරිසක් අතරට ගෙන යෑම යි. මේ කාරිය අද හැඳින්වෙන්නේ **"ජන සන්නිවේදනය"** යන නමිනි. ජන සන්නිවේදනය, පෝස්ටරය, චිත්‍රපටය, පොත් වැනි විවිධ මාර්ගවලට **"ජන මාධ්‍ය"** යන නම ව්‍යවහාර වේ.

"සන්නිවේදනය" යන පදය අලුත් වුවත් සන්නිවේදන කාරිය අප සමාජයට අලුත් දෙයක් හෝ අපූරුවක් නො වේ. එදා අපට ගුවන්විදුලියක් හෝ රූපවාහිනියක් නො තිබුණත් එබඳු ජනමාධ්‍යවලින් ඉටු කෙරෙන කාරිය ඉටු කිරීම සඳහා වෙනත් මාර්ග පැවතිණ. මේ මාර්ග අද හැඳින්වෙන්නේ **"පාරම්පරික සන්නිවේදන ක්‍රම"** යන නමිනි. මේ ක්‍රම අඩු වැඩි වශයෙන් අද වුවත් ගම්වල පවතී. මේ පරිච්ඡේදය සිංහල ගමේ පවතින පාරම්පරික සන්නිවේදන ක්‍රම පිළිබඳව ය.

අඬ බෙරය පාරම්පරික සන්නිවේදන මාධ්‍යයකි. අඬ බෙරය ගැසීම පිණිස බෙහෝ විට යොදා ගන්නේ දවුලකි. මේ දවුලේ හඬ ඇසෙන විට, එයින්

කියවෙන්නේ මහ රජ්ජුරුවන්ගේ අණක් හෝ ආඥාවක් බව පැරණි ගැමියෝ දැන ගත්හ. මේ බෙර හඬින් ප්‍රකාශ වූයේ රජ්ජුරුවන්ගේ **"අණක්"** නිසා මෙය මුලින් හැඳින්වෙන්ට ඇත්තේ **"අණ බෙරේ"** යනුවෙනි. එය පසු කලක දී **"අඬ බෙරේ"** බවට පත් වන්නට ඇත. අදත් සමහර ගම් පළාත්වල තොරතුරු දැන්වීම උදෙසා අඬ බෙරය යොදා ගැනේ. විශේෂයෙන් ම ගම් සභාවේ රැස්වීමක් පවත්වන දිනය හෝ වැවේ වතුර මුදා හරින දිනය හෝ ගැමියන්ට දැන්වීම පිණිස මෙය භාවිත වේ.

යමක් ඕනෑවට වඩා ප්‍රචාරය කරන විට "ඕකට ඔය තරං අඬබෙර ගහන්ට ඕනෑයැ"යි සිංහලයෝ කියති.

සන්නිවේදනය සඳහා පාරම්පරිකව භාවිත වන්නේ හඬවල් පමණක් නො වේ. ඇසට පෙනෙන දේවලුත් ඒ සඳහා යොදා ගැනිණ. රෙදි, කොඩි ආදිය මෙන්ම **"දුම් ගොබ"** ආදියත් ඒ සඳහා යොදා ගැනිණ.

පණිවිඩ යැවීම සඳහා **"දුම් ගොබ"** යොදා ගැනීම රතු ඉන්දියානු ගෝත්‍රිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයකි. සමහර විට මේ දුම් ගොබයකින් කියවෙන පණිවිඩය එයින් මතු වන දුම් වළලු ගණන අනුව වෙනස් වන බවත් කියනු ලැබේ.

සිංහලයන් ද දුම් ගොබ මගින් පණිවිඩ යවා ඇති බව පෙනේ. රටට සතුරන් ආ අවස්ථාවල, ඒ පුවත රජ වාසලට වහා ම දැනුම් දෙන ලද්දේ දුම් ගොබ අහසට යැවීමෙනැයි පැරැන්නෝ කියති. මේ සඳහා කඳුමුදුන්වල මුර පොළවල් පිහිටුවා තිබිණ. එක් මුර පොළකින් දුම් ගොබයක් අහසට යැවූ විට එය දකින අනික් මුරපොළේ අය එබඳු ම දුම් ගොබයක් අහසට යවති. ඒ දුම් ගොබය දකින ඊළඟ මුර පොළේ අයත් එබඳු ම දුම් ගොබයක් අහසට යවති. මේ ආකාරයෙන් දිගින් දිගට ම දුම් ගොබ ඇති කරන විට, රජ වාසලේ සිටින මුරකාරයෝ ද මේ දුම් ගොබ දැක, ඒ පණිවිඩය මහ රජ්ජුරුවන්ට සැල කරති. රටට සතුරන් ගොඩ බැස ඇති බැවින් තම හමුදා මෙහෙයවීමට කල් පැමිණ ඇති බව එයින් රජ්ජුරුවෝ තේරුම් ගනිති.

අද දුම් ගොබ යවා පණිවිඩ යැවීමේ සිරිතක් නැතත්, ආදියෙහි එවැන්නක් පැවති බවට සිංහල ජනශ්‍රැතියෙන් නිදසුන් සොයා ගත හැකි ය. ගිනි ගොඩකින් දුමක් නැඟෙන විට සිංහල දරුවෝ මෙසේ කියමින් කෑ ගසති.

"දුං දුමටයි අඟුරු මටයි
මේ යන දුං කෝට්ටෙටයි"

මෙයින් මතකයට නැගෙන්නේ කෝට්ටේ රජ වාසල පිහිටි අවධියෙහි වූ සිදුවීමකි.

අදහස් ප්‍රකාශ කිරීම සඳහා කාහට වුවත් ලෙහෙසියෙන් ම යොදා ගත හැකි මාධ්‍යයක් නම් කටහඬ යි. "කාට ද බැරි හූ කියන්ට?" හූ කීමෙන් අදහස් පළ කිරීම ගමට අමුතු දෙයක් නො වේ.

ඈත වෙල්යාය ඉස්මත්තේ කිසිවකු යන විට ඔහුගේ අවධානය යොමු කර ගැනීමට ඇති හොඳ ම මාර්ගය මහත් හඬින් හූවක් කීම යි. ඒ හූ හඬ ඇසුණු විට ඊට පිළිතුරු ද හූ හඬින් ම නැගේ. නැති වුණු හරකා බාන සොයා කැළෑ වැදෙන ගැමියන්ට තම තමන් අතර අදහස් හුවමාරු කර ගැනීමට ඇති හොඳ ම මාර්ගයත් හූ කීම යි. නැති වුණු හරකා හමු වුණු බව කීමට සේ ම තමා ඉන්නා ඉසව්ව සෙස්සන්ට හැඟවීමටත් මේ හූ හඬ උපකාර වේ. සමහර කැළෑබද පළාත්වල, හේන් කොටන කාලයට මේ හූ හඬවල් නිතර ම නැගේ. හේනට ගිනි තබන්නට කලින්, ඒ බව අනික් හේන් ගොවියන්ට දන්වා සිටීම වැදගත් ය. මේ දැන්වීම කෙරෙන්නේ හූවක මාර්ගයෙනි. මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා තමන්ගේ ගම ගැන කී දෙයක් මගේ මතකයට නැගේ.

"ගිං ගඟ අයිනේ පිහිටි අපේ ගමේ බොහෝ දෙනා කරන්නේ ගඩොල් කැපීමේ වෘත්තියයි. දවල් බතට ගෙදර විත් මඳක් වෙලා ඇස් පියා ගෙන සිටින ගැමියන්ට අහසේ කළුවක් හෝ වැහි වලාවක් මතු වීම පෙනෙන්නේ නැත. පට්ටල් පිහිටා ඇති තැනට ළඟ ම ගෙයක සිටින කෙනෙකුට හදිසියේ ම නැඟ එන වැහි වලාවක් පෙනෙයි. මේ වන විට වේළීම සඳහා සියලු ම ගඩොල් කඳු වසා ඇති පොල් අතු ඉවත් කර ඇත. වෙලට බසින ගැමියා හූවක් කියයි. ඇඳන් මතට වී සිටිනා ගැමියෝ එහි අදහස තේරුම් ගෙන පට්ටලයට දුව ගොස් ගඩොල් කඳු වසා දමති."

තිස්ස කාරියවසම්, **ජන සන්නිවේදන ප්‍රවේශය**

කාරියවසම් මහතා ඉතා පැහැදිලිව පෙන්වා දෙන ආකාරයට මෙයින් හෙළි වන්නේ හූ හඬක් මාර්ගයෙන් සිංහල ගැමියන් සන්නිවේදනයෙහි යෙදුණු අන්දම යි.

හූ කීමෙන් අදහස් පළ කිරීමේ කාරිය සිංහලයන්ට අද ඊයේ පුරුදු වුණු කාරියකුත් නො වේ. ඈත අතීතයෙහි, රජ දවස පවා මේ සම්ප්‍රදාය තිබුණු බව පෙනේ. රජ්ජුරුවන්ගේ කාරියක් සඳහා හෙවත් **"රාජකාරියක්"** සඳහා ගැමියන්ගේ සේවාව අවශ්‍ය වූ විට ගැමියන් කැඳවා ගත්තේ කඳු මුදුනක සිට ගමට ඇසෙන සේ නඟන හූවකිනි. මේ හූ හඬ ගැමියෝ හඳුනා ගනිති.

දුටුගැමුණු රජ්ජුරුවන් කතරගම දේවාලයට ගම් බිම් දුන්නේත් හූ හඬේ ආධාරයෙනැයි ගැමියෝ කියති. ඌව පළාතේ සමහරුන් කියන හැටියට ඒ පළාතට **"ඌව"** යන නම ලැබුණෙත් මේ **"හූව"** හේතු කොට ගෙන යි. මේ හූව කියන්නේ කඳු මුදුනක සිටය. ඒ හූ හඬ යම් තාක් දුරකට ඇසේ ද ඒ තාක් දුර පිහිටි ඉඩකඩම් සියල්ල කතරගමට පැවැරූ බව ජනප්‍රවාදයෙහි එයි. සිංහල ගැමියා දුර ප්‍රමාණය වුවත් මැන්නේ හූව උපයෝගි කොට ගෙන ය. **"හූවක දුර"** යන වහර අද පවා ගැමියෝ භාවිත කරති.

මෙහි දී මෙනෙහි කළ යුතු තවත් කරුණකි. එනම්, එක් එක් කාරිය සඳහා වෙනස් වෙනස් හූ හඬවල් පැවති බවය. ඈත යන්නෙකුට කතා කරන්නට වුවමනා වූ විට නඟන හූවත්, ගමේ සූදු පොළට පොලිසියෙන් පැන්න විට නඟන හූවත්, එක හා සමාන නො වන බව ගැමියෝ දනිති. එසේ නො වීණි නම් එය සන්නිවේදනය සඳහා යොදා ගත නොහේ.

ගමේ තවත් වැදගත් සන්නිවේදන කාරියක් පන්සලේ සණ්ටාරයට පැවරේ. සාමාන්‍ය දවසක උදේ වරුවට උදේ එකොළහට පමණ ඇසෙන සණ්ටාර හඬ ගමට ගෙන යන පණිවිඩය කුමක් ද? පන්සලේ හාමුදුරුවන් බුදු ගෙට වැඩ, බුදුන් වහන්සේට ආහාර පූජා කොට අවසන් වූ බවයි. මේ සඳහා සණ්ටාරය තුන් වරක් නාද කෙරේ.

යම්කිසි වෙලාවක සණ්ටාරය ඉක්මනින් නාද කෙරේ නම් එයින් කියවෙන්නේ වෙනත් ආකාරයක පණිවිඩයකි. එනම්, ගමේ පන්සලේ කිසිවකුට හදිස්සියක් හෝ අනතුරක් සිදු වී ඇති හෙයින් ගැමියන් කැඳවීම එහි අරමුණ යි.

පන්සලට වුවද ඇතැම් දවසක සලාක දානය වරදී. එවන් දවසකට හාමුදුරුවන් කරන්නේ තවත් ආකාරයකට සණ්ටාර ගසා, ඒ පණිවිඩය ගමට දැනුම් දීමයි. ඒ හඬ තේරුම් ගන්න ගැමියෝ, ළහි ළහියේ එකතු වී, තම තමන්ට හැකි අයුරින් බත් ව්‍යංජන පන්සලට ගෙන එති.

හැන්දෑවේ ගිලන්පස පූජාවට පන්සලට එක් රැස්ව උපාසක උපාසිකාවෝ **"සද්ද පූජාවට"** ද සණ්ටාර නාද කරති. ඒ හඬ බොහෝ වේලාවක් එක දිගට වැයෙන්නකි.

සිරිපා පුදන්ට යන බැතිමතාටත් සණ්ටාරය නැතුව බැරි ය. තමා කී වරක් සිරිපා කරුණා කොට ඇද්ද යන වග ලොවට හඬ ගා කියන්නේ උඩමළුවේ ඇති සණ්ටාරය නාද කරන වාර ගණනිනි. කිසිවකු ඒ සණ්ටාරය හත් වරක්

නාද කළ හොත් එයින් කියවෙන්නේ ඔහු හත් වරක් සිරිපා වඳින්න ඇවිත් ඇති පුවත යි.

...සිංහල ගමේ පවතින පාරම්පරික ජන සන්නිවේදන මාර්ග සමහරක් මෙහි සැලකිල්ලට හසු විණ. කාලයාගේ ඇවෑමෙන් සියල්ල වෙනස් වන හෙයින් මේ සන්නිවේදන ක්‍රම ද දැන් දැන් වෙනස් වෙමින් පවතී. එදා හැන්දෑවේ ගමේ වෙල් යායේ නිසංසලය බිඳ ගෙන ආ බටනළා හඬ වෙනුවට දැන් දැන් අසන්නට ලැබෙන්නේ ට්‍රාන්සිස්ටරයකින් නිකුත් වන හින්දි චිත්‍රපට ගීතයක් විය හැකි ය.

### අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| ශල්‍යකර්මයකට | සැත්කමකට |
| දුග්ගන්නා නිලමේ | රජවාසල කටයුතු භාර නිලධාරියෙකි. |
| පට්ටල් | මැසි (ගඩොළු කැපීමට භාවිත කරන) |

## අවබෝධය

1. ජන මාධ්‍ය ලෙස වර්තමානයේ හැඳින්වෙන මාධ්‍ය දෙකක් නම් කරන්න.
2. අඬ බෙරයෙන් සිදු කෙරුණු කාර්යය කුමක් ද?
3. අඬ බෙර ගැසීම සඳහා භාවිත කළ වාද්‍ය භාණ්ඩය කුමක් ද?
4. පැරණි සිංහල සමාජයේ පණිවුඩ යැවීමට භාවිත කළ ක්‍රම දෙකක් පාඩමෙන් උපුටා දක්වන්න.
5. සණ්ටා නාදය සන්නිවේදනය සඳහා භාවිත කෙරුණේ කෙබඳු අවස්ථා සඳහා ද?

## ලිඛිත අභ්‍යාස

1. පාඩමෙහි ඇතුළත්, පැරැන්නන් විසින් භාවිත කළ සන්නිවේදන ක්‍රම හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

## විශේෂණ පද

නාම පදයක් හෝ ක්‍රියා පදයක් විස්තර කිරීමට එසේ නැති නම් වර්ණනා කිරීමට යොදන පද විශේෂණ පද නම් වේ. එසේ විශේෂණය කරනු ලබන පදය විශේෂ්‍යය නම් වේ.

උදා: සුවඳ මල

මෙහි "සුවඳ" යන්න විශේෂණ පදය යි. එයින් විස්තර වන "මල" යන්න විශේෂ්‍ය පදයයි.

විශේෂණ පද වර්ග දෙකකි.

### නාම විශේෂණ

නාම පදයක් විස්තර කරන, වර්ණනා කරන පදයක් නාම විශේෂණයක් වෙයි.

උදා: **යහපත්** ළමයි පව් නො කරති. **උණු** වතුර නිවා පානය කරන්න.
මැටි භාණ්ඩ බිඳෙන සුලු ය. **කුරුළු** නාදය කන් පිනවයි.

### ක්‍රියා විශේෂණ

ක්‍රියා පදයක් සිදු වන ආකාරය, සිදු වන කාලය, සිදු වන ස්ථානය, සිදු වීමට හේතුව ප්‍රකාශ කරන පද ක්‍රියා විශේෂණ නම් වෙයි.

උදා: ළමයි **සතුටින්** කෑගසති. කාලය **සෙමින්** ගෙවී යයි.
ගංගාව **වේගයෙන්** ගලා බසියි. මුවෝ **බියෙන්** තැති ගනිති.

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන ඡේදයේ ඇතුළත් නාම විශේෂණ පද 10ක් සොයා ලියන්න.**

ලොකු මාමා ගමට එන්නේ කලාතුරකිනි. ඔහු එන විට අපට වටිනා තෑගි ගෙන ඒමට ද අමතක නො කරයි. සිහින් සිරුරක් ඇති ඔහුට ඇත්තේ ප්‍රසන්න පෙනුමකි. ඔහු නිතර ඇන්දේ සුදු කමිසයක් සහ කළු කලිසමකි. ඔහු විශාල නගරයක පුංචි වෙළඳාමක් කරන්නෙකි. පාසල් ළමයින් සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා උපකරණ විකිණීම ඔහුගේ වෙළඳාම යි. එයින් ඔහුට ලැබුණේ සුළු ලාභයකි.

2. **පහත දැක්වෙන ඡේදයෙහි හිස් තැන් පිරවීමට සුදුසු වචන වරහන තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කොට ලියන්න.**

අහස ........................ වැහිකළු පැතිරෙයි. ........................ විදුලි කොටයි. ........................ හෙන පුපුරයි. ........................ සුළං හමයි. ගස් අතු ........................ ඇඹරෙයි. කුරුල්ලෝ ........................ කැදලි කරා යති. අම්මා ........................ වී පැදුර ගෙට ගනියි. ........................ වැහි බිඳු පතිත වෙයි. ක්‍රමයෙන් ........................ වැසි ඇද හැලෙයි. පියසි අගින් බේරෙන වැහි වතුර .......................... ගලා යයි.

(ලහිලහියේ, සෙමින් සෙමින්, ඒ මේ අතට, වසා ගෙන, තදින්, වේගයෙන්, මහ හඬින්, නොකඩවා, හනික, සුළි නගමින්)

## ප්‍රායෝගික අභ්‍යාස

1. **පාඩමේ ඇතුළත් තොරතුරු හා ඔබ සොයා ගත් තොරතුරු ඇතුළත් කරමින් "පාරම්පරික සන්නිවේදන ක්‍රම" යන මාතෘකාව යටතේ සඟරාවක පළ කිරීමට සුදුසු ලිපියක් ලියන්න.**



# 20 සකස් කඩ නො කී කට

"සකස් කඩ නොකී කට
උගේ කට හුඹස් කට"

යනුවෙන් පුරාතනයෝ කීවෝ ය. සෙසු පොත් ගැන එසේ නො කියැවුණි. අකුරු උච්චාරණය කරවීමේ අටියෙන් ම සකස් කඩ ලියැවී ඇති සෙයකි. අකුරු කරන්නට ම ලියැවුණු පැරණි පොත් දහ අටක් විය. හෝඩිය, නම්පොත, මඟුල් ලකුණ, ගණ දෙවි හැල්ල, වදන් කවි පොත, බුද්ධ ගජ්ජය, සකස් කඩ, නාමාෂ්ට ශතකය, නවරත්නය, ව්‍යාසකාරය, හිතෝපදේශය, ප්‍රත්‍යය ශතකය, අනුරුද්ධ ශතකය, බෞද්ධ ශතකය, සූර්ය ශතකය, වෘත්ත මාලාව, වෘත්ත මාලාඛ්‍යාව, අමරසිංහය යනු ඒ පොත් පෙළ යි.

සකස් කඩ නම් පොතෙන් උපුටා ගත් පාඨයක් ඔබ හය ශ්‍රේණියේ දී කියවන්නට ඇත. "සකස් කඩ කී කට" ශබ්ද උච්චාරණයේ දක්ෂයකු බිහි කරයි. ශබ්ද නගා කියවීම මගින් උච්චාරණ දෝෂ මග හරවා ගත හැකි වෙයි.

එදිනෙදා කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අපට නොයෙක් ප්‍රකාශන කියවීමට සිදු වේ. කියවීමෙන් අදහස් ලබා ගත හැකි වන අතර දැනුම වර්ධනය වේ. කියවන දේ ශ්‍රාවකයාට අවධාරණය වන්නේ ශබ්දෝච්චාරණයේ ස්වභාවය මත ය. පුවත්පතක් කියවන ආකාරයට පිරිත් ගාථාවක් හෝ ශ්ලෝකයක් හෝ සජ්ඣායනා කළ නො හැකි ය.

...පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ද සීගිරිය ප්‍රදේශයේ සිදු කළ ගවේෂණවල දී දියුණු ලෝහ කර්මාන්තයක් පැවති බවට සාධක සොයා ගෙන තිබීම ද වැදගත් වේ. සීගිරි නිම්නයේ අලකොළ වැව ප්‍රදේශයෙන් සොයා ගෙන ඇති උඳුන් හා ඒ ආශ්‍රිතව ලැබී ඇති යබොර මගින් ද ඉතා පුරාණ යුගයේ දී එම ප්‍රදේශයේ දියුණු ලෝහ කර්මාන්තයක් පැවති බවට සාධක සපය යි. එසේ ම 80 හා 90 දශකවල සමනල වැව ප්‍රදේශයේ කැණීම් සිදු කර ලෝහ නිපදවූ උඳුන් රාශියක් සොයා ගෙන තිබෙන අතර, මේවා ද ඉතා පැරණි යුගවලට අයත් සේ සැලකේ. එසේ ම අම්බලන්තොට ප්‍රදේශයේ රිදියගම ආශ්‍රයෙන් 1996 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ප්‍රංශ පුරාවිද්‍යාඥයන් සිදු කළ කැණීම්වල දී දැනට වැව් ජලයෙන් යට වී ඇති භූමියේ මීටර් 1කට වඩා විශාල විෂ්කම්භයකින් යුත් උඳුන් සොයා ගෙන ඇති අතර, මෙහි පැවතුණ ලෝහ කර්මාන්තය ක්‍රි. පූ. යුගය දක්වා ඈතට දිව යන බව පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති.

**දිවයින** - 2001 ජනවාරි 17, 23 පිට

පුවත්පත් වාර්තාවක් ඉතා සරල භාෂාවක් යොදා ගෙන ලියැවෙයි. උච්චාරණය ද අවබෝධ කර ගැනීම ද පහසු ය. එහෙත් සංස්කෘත පද බහුල සිංහල ව්‍යවහාරය ඊට වෙනස් ය. උච්චාරණය තරමක් අපහසු ය. කියවනවාත් සමග එහි කරුණු ද අවබෝධ කර ගත යුතු වෙයි. අපි එවැනි පාඨයක් කියවා බලමු. එකිනෙකට වෙනස් පාඨ කියවා කට හුරු කර ගනිමු.

“නීල වර්ණ ආස්තරණයෙක දිව්‍ය ඍෂියකු මෙන් පෙනෙනුයේ මේ කවරෙක් ද? ආශ්චර්යයෙකි. ඔහුගේ මුහුණින් රිදී රස ධාරාවෙක් එක්වන් ගලයි. එහෙත් ඔහුගේ ධූම වර්ණ වූ පොරෝනය මඳකුදු තෙමුණු බවෙක් නො පෙනේ. බලව, බලව, වර්ණ සම්පත්තියෙන් දිනනුයේ ඔහුගේ ආස්තරණය ද නොහොත් පරිශුද්ධ වූ ආකාශය දැයි විනිශ්චය කරනු පිණිස මෙන් හේ දීප්තිමත් වූ නේත්‍ර යුග්මය වරින් වර ඉහළට යොමු කෙරෙයි. ඔහුගේ මුවෙහි පළල නාසා දෙ පසෙහි වූ රැළි පෙළ! කවර ප්‍රීතියෙක් ද?

තෙල ආස්තරණයෙක් නො වේ. අභිනව තෘණ භූමියෙකි. ඒ දිව්‍ය ඍෂියෙක් නො වේ. වෘද්ධ වූ මාර්ගිකයෙකි. අර රිදී රස ධාරාවෙක් නො වේ. මුහුණ පුරා ගෙන, ළය වසා ගෙන, වයස දක්වා ගෙන, ගලන්නා වූ රවුළ ය. ඇස් යුවළ වරින් වර අහස දෙසට හරවනුයේ පැහැය මනන්නට නො වේ. දෙවියනට භක්තිය දක්වනු සඳහා ය. ප්‍රීතිය මහත් බව සැබැයි. ඔහු යනුයේ දෙවියන් මෙ ලොවට පහළ වූ තැන දී ම වඳින්නට ය; පුදන්නට ය; තමා ද සෙස්සන් ද දුකින් මුදන ලෙස යදින්නට ය. හේ මෙහි මඳක් ගමන් විඩාව දුරු කෙරෙයි.

මේ කියැවුණු මාර්ගිකයා තමාගේ ශිථිල වූ ප්‍රාවරණාභ්‍යන්තරයෙන් සුවඳ තෙල් කුපියක් ද රන් මිලක් ද අනර්ඝ වූ රක්ත මාණික්‍යයක් ද ඇද ගත; ප්‍රීතියෙන් පිරුණා වූ නේත්‍ර යුග්මයෙන් ඒ දෑ බැලීය; පෙරළ පෙරළා බැලී ය;”

මේ කුමාරතුංග මුනිදාස මහතාගේ "ශික්ෂා මාර්ගය" නම් කෘතියෙන් උපුටා ගත් කොටසකි.

එම පාඨයෙහි උච්චාරණය කිරීමට අපහසු බවක් දැනෙන වචන බහුල ය. කීප වරක් හඬ නගා උච්චාරණය කිරීමෙන් එම අපහසුතා මග හැරී යනු ඇත. අපි තවත් උච්චාරණ අභ්‍යාසයක් කරමු. පහත සඳහන් වන්නේ ශ්ලෝක කීපයකි.

1. නමස්කෘත්‍ය වන්දාමි ත්වාං
යදි පුණ්‍යං මයා කෘතම්
අන්‍යස්‍යාමපි ජාත්‍යාං මේ
ත්වමේව ජනනී භව

**(භාස)**

**අර්ථය:** ඔබට වැඳ කියන්නෙමි. ඉදින් ම විසින් කරන ලද පිනක් ඇත්නම් අන් ජන්මයන්හි දීත් ඔබ ම මගේ අම්මා වන්න.

2. විද්‍යා දදාති විනයං
විනයාද්‍යාති පාත්‍රතාම්
පාත්‍රත්වාද්ධන මාප්නොති
ධනා ධර්මං තතඃ සුඛම්

**(හිතෝපදේශය)**

**අර්ථය:** විද්‍යාව හික්මීම (විනය) ලබා දෙයි. හික්මීමෙන් යමෙක් පිළිගනු ලැබීමට පැමිණෙයි. පිළිගනු ලැබීමෙන් ධනයට පත් වෙයි. ධනයෙන් ධර්මයටත්, ධර්මයෙන් සැපතටත් පත් වෙයි.

මේ ශ්ලෝක පාඨ කියවා ඒවායේ අදහස ද හිතට ගන්න.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| ආස්තරණය | ඇතිරිල්ල |
| ඍෂි | ඍෂිවරයා/තාපසයා |
| ආශ්චර්යය | පුදුමය/විමතිය |
| රිදී රස ධාරාවක් | නො කඩවා ඇද හැලෙන රිදී පැහැති ජල දහරාවක් |
| ධූම වර්ණ | දුම් පැහැති/කළු ගැසුණු |
| විනිශ්චය | තීරණය |
| වර්ණ සම්පත්තිය | සම්පතක් ලෙස සැලකෙන ශරීර වර්ණය/පාට |
| නේත්‍ර යුග්මය | ඇස් දෙක |
| අභිනව | අලුත්/ළපටි |
| තෘණ භූමිය | තණ බිම |
| වෘද්ධ | මහලු |
| මාර්ගිකයා | මගියා |
| ශිථිල | ලිහිල්/බුරුල් |
| ප්‍රාවරණාභ්‍යන්තරයෙන් | පොරෝණය තුළින් |
| අනර්ඝ | ඉතා වටිනා |
| රක්ත මාණික්‍යය | රතු මැණික |
| සකල | සියලු |

## ප්‍රායෝගික අභ්‍යාස

1. පිරිත් ගාථා හඬ නගා සජ්ඣායනය කරන්න.

2. වැඩිහිටියන්ගෙන් අසා දැන ගත් ශ්ලෝකයක් පන්තියට ඉදිරිපත් කරන්න.

**පහත සඳහන් වචන හඬ නගා උච්චාරණය කරන්න.**

| | |
|---|---|
| සමන්ත භද්‍ර | ශීර්ෂ ප්‍රණාමය |
| දෘෂ්ටි විශේෂඥ | සමුද්‍ර බාදනය |
| බන්ධුජනෝ | ද්‍විත්වගාමිණී |
| රූක්ෂ ප්‍රතිපත්ති | පරිත්‍රාණ දේශනය |
| වෛඩූර්ය මාණික්‍යය | ස්වර්ණාභරණ |
| පුණ්‍ය කර්මය | මහාභිනිෂ්ක්‍රමණය |
| සංස්කෘත පාඨය | චන්ද්‍ර මණ්ඩලය |
| මණිමේඛලාව | අක්ෂර වින්‍යාසය |
| වෘක්ෂ වන්දනාව | ස්ථානෝචිත ප්‍රඥාව |
| කර්තෘ වාක්‍යය | ජ්‍යෝතිශ්ශාස්ත්‍රය |

# විරාම ලකුණු

විරාමය යනු නැවතීම යි. එය ලේඛනයෙහි මෙන් ම කථනයෙහි ද යෙදේ. කථනයේ දී හෙවත් කතාවේ දී යෙදෙන විරාමය සඳහා, ලේඛනයේ දී හෙවත් ලිවීමේ දී විරාම ලක්ෂණ භාවිත කෙරේ. නිසි ලෙස හා නිවැරදිව විරාම ලක්ෂණ යෙදීමෙන් අදහස් පැහැදිලිව හා ප්‍රාණවත්ව ඉදිරිපත් කළ හැකි ය.

කථනයේ දී කතා විලාසයෙන්, අංග චලනයෙන් හා හඬ උස් පහත් කිරීමෙන් අසන්නාට පහසුවෙන් අදහස වටහා දිය හැකි ය. එහෙත් ලේඛනයක අදහස ග්‍රහණය කර ගැනීම පහසු කරන්නේ විශේෂ ලකුණු යෙදීමෙනි. මේ සලකුණු හඳුන්වන්නේ 'විරාම ලකුණු' යන නමිනි.

ලේඛනයේ දී අප භාවිත කරන 'කෙටි ඉර', 'ඇල ඉර' හා 'දෙතිත' යන විරාම ලක්ෂණ හඳුනා ගනිමු.

## කෙටි ඉර (-)

**පහත සඳහන් උදාහරණ දෙස බලන්න.**

**මෙහි දී පද දෙකක් එකට යෙදෙන විට ඒ පද දෙක අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය දැක්වීම සඳහා 'කෙටි ඉර' යෙදේ. එමගින් පද සම්බන්ධ කිරීමේ කාර්යය සිදු වෙයි.**

උදා: ආර්ථික-සමාජ තත්ත්වය
ජෛව-රසායනික විපර්යාසය
ස්වර-ව්‍යඤ්ජන වශයෙන්

**සීමා දෙකක අන්තරය දැක්වීමේ දී කෙටි ඉර යෙදේ.**

උදා: පෙ.ව. 9.00-11.00 දක්වා
ක්‍රි.ව. 1505-1948 දක්වා
පිටු අංක 12-17 දක්වා

**ලිවීමේ දී පේළියක කෙළවරෙහි ඇති පදය සඳහා ඉඩ ප්‍රමාණවත් නො වූ අවස්ථාවල අවසාන පදයේ ඉතිරි කොටස ඊළඟ පේළියෙහි යෙදෙන බව දැක්වීමට කෙටි ඉර යෙදේ.**

මෙසේ වෙන් කර ලිවිය හැකි වන්නේ අකුරු හතරක් හෝ ඊට වැඩි අකුරු සංඛ්‍යාවක් ඇති පද පමණි. හල් අකුරක් දෙවැනි පේළියට එන සේ පද වෙන් කිරීම නුසුදුසු ය.

| උදා: වැරදි | නිවැරදි |
|---|---|
| නාට්‍ය කලාවෙන් ද නිදසු-<br>-න් ... | නාට්‍ය කලාවෙන් ද නිද-<br>-සුන්... |
| වෙරළෙහි බෙල්ලන් ඇහිඳි-<br>- න්නකු ... | වෙරළෙහි බෙල්ලන් ඇහි-<br>-ඳින්නකු... |

**උපුටා ගත් ප්‍රකාශයක හෝ පාඨයක හෝ කතුවරයා දැක්වීමේ දී ද කෙටි ඉර යෙදේ.**

උදා: කේරල රජයත් සම්බන්ධව මහා කවි කුමාරන් ආශාන් අනුස්මරණ සභාව විසින් පිරිනමන විශ්ව සම්මානය භාර ගැනීමට 1983 අප්‍රේල් මස මා තිරුවන්දිරම් නගරයට ගිය අවස්ථාවේ මම කමලා දාස් මහත්මිය මුණ ගැසුණෙමි.

-එදිරිවීර සරච්චන්ද්‍ර

සුදෝ සුදු වැ වලාකුළෙනි
ඇයි මේ සිල් ගත්තා වැනි
මඟුලට කළු නො නිසි බැවිනි
එය හැරැ අපි යමු මෙ වෙසිනි

-කුමාරතුංග මුනිදාස

## ඇල ඉර (/)

**විකල්පයක් හෝ තේරීමක් (වරණයක්) හෝ දැක්වීමට සිදු වන අවස්ථාවල දී ඇල ඉර යෙදේ.**

උදා: මහතා/මහත්මිය/මෙණවිය
‘ළමයින්’ යනු උක්ත රූප/අනුක්ත රූප නාම පදයකි.
ශිෂ්‍යයා පාඩම කියවයි/කියවති.
ලඝු/ලුහු/හ්‍රස්ව/කෙටි

## දෙතිත (:)

**නිදසුන් පිණිස හෝ විස්තර කරනු පිණිස හෝ කරුණු කීපයක් ඉදිරිපත් කිරීමේ දී ‘දෙතිත’ යෙදේ.**

උදා: ත්‍රිපිටක ධර්මය: සූත්‍ර, විනය, අභිධර්ම
ස්වර: ලඝු, ගුරු
න්‍යෂ්ටික පවුල: අම්මා, තාත්තා, දරුවෝ

සැ.යු.: පැමිණෙන විට පෙළපොත් ද රැගෙන එන්න.
ජලජ පැළෑටි යනුවෙන් හැඳින්වෙන්නේ ජලයේ වැඩෙන පැළෑටි වර්ග යි.

නිදසුන්: කුමුදු, දිය හබරල, දිය බෙරලිය

**ගණිත ප්‍රකාශනයක අනුපාතයක් ලියා දැක්වීමේ දී "දෙතිත" යෙදේ.**

අත් උදවුකරුවා සහ පෙදරේරුවා අතර මුදල බෙදුණේ 2:3 අනුපාතයට ය.

**සංවාදයක් ලියා දැක්වීමේ දී ද "දෙතිත" යෙදේ.**

සුප්පා දේවි: ප්‍රේමවන්ත දරුවෙනි මා හිඳිනු කන් යොමා..
සිංහබාහු: කිම් ද මෑණියනි ඔබ මේ පවසන වදනා...

**ප්‍රකාශ කළ හෝ සඳහන් කළ හෝ කරුණු දැක්වීමේ දී ද 'දෙතිත' යෙදේ.**

ඒ බමුණා වහ - වහා ම දිව ගෙන ගොස් සේනාව මැදට පැන මෙසේ කියා ලී ය: "ඇයි? කුමක් කියමු ද? මම ගොවියා පුතු නො වැන්දෙමි."

කෙටි ඉර, ඇල ඉර හා දෙතිත යන විරාම ලකුණු නිවැරදිව භාවිත කරන්නට ඉගෙන ගනිමු.

## ලිඛිත අභ්‍යාස

**සුදුසු විරාම ලක්ෂණ යොදමින් නැවත ලියන්න.**

1. ධම්මික චමින්ද නමැති ශිෂ්‍යයා ශිෂ්‍යාව පාසල් කථික තරගයෙන් ප්‍රථම දෙවන තෙවන ස්ථානය දිනා ගත්තේ ය
2. ලං ග ම ලංකා ගමනා ගමන මණ්ඩලය
3. කළුහාමි මොකද මේ කෝ අස්පයා මිනිහා හම්බ වුණේ නැද්ද
   කළු අප්පු  හම්බ වුණා කනකර බඩු උඹෙන් හන්ද මමත් මොනව හරි දෙන්න එපායැ
4. හා හා හරි හාවා    කැලේ මැදින් ආවා
   හිටැගෙන ගඟ ගාවා වට පිට ඇහැ ලෑවා
5. වඳුරෝ ගසින් ගසට පැන අතු ඉති දලු කන්නට පටන් ගත්හ
6. දිනුම් පැරදුම් දෙක ම මැදහත් සිතින් ඉවසන්න
7. ගුත්තිලයේ 277 310 කවි පාඩම් කරන්න
8. ලද පස් මල්    සුදු අඹ සමන් කැකුළු සුන්සහල් විළඳ ඊතණ
   තණ බිස්ස    ඉතා බහුලව තණ වැඩුණු බිම
   නිසර්ගයෙන් ම උපතින් ම
   ආස්වාදය    රස විඳ ගැනීම
9. පින්කිරියවත් කියවන ලියන්නෝ මෙසේ කීහ දේවයන් වහන්ස අද දක්වා නුඹ වහන්සේ එකක් අඩු විහාර සියයක් කරවූහ
10. ඒ මුදල ඔවුන් දෙදෙනා අතර 2 3 අනුපාතයට බෙදා දෙන ලදී

## ප්‍රායෝගික අභ්‍යාස

1. **ඔබ දන්නා එක් එක් විරාම ලක්ෂණය බැගින් ගෙන පෙළපොත ඇසුරෙන් ඒවාට උදාහරණ සොයන්න.**
2. **පුවත්පත් කියවා විරාම ලක්ෂණ යෙදුණු පාඨ සොයා පොතක අලවන්න.**
3. **ඒ ඒ තීරුවෙහි විරාම ලක්ෂණය, විරාම ලක්ෂණයේ නම හා උදාහරණය ඇතුළත් කර සටහන් පුවරුවක් සකසා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.**
4. **විරාම ලකුණු ගැන සැලකිලිමත් වෙමින් සංවාද කියවන්න.**



# පුස්තකාලයට පිය නගමු

# 21

පුස්තකාලය වූ කලි පොත්පත් සඟරා ඇතුළු තොරතුරු මූලාශ්‍රය තැන්පත් කර ඇති ස්ථානය (පුස්තක+ආලය*=පුස්තකාලය) යි. ඉතා දිගු ඉතිහාසයකට උරුමකම් කියන මෙම පුස්තකාල අතීතයේ හඳුන්වා ඇත්තේ පොත්ගුල ලෙස ය. අද වන විට පොත්පත් පමණක් නො ව විද්‍යුත් සඟරා, පරිගණක කෘති ආදි විවිධ වූ නවීන මාදිලියේ තොරතුරු මූලාශ්‍රය තැන්පත් කර ඇති තැනක් බවට පුස්තකාලය පත්ව තිබේ. එහෙයින් කියවීමට පමණක් නො ව ඇසීමට හා නැරඹීමට පවා අද නවීන පුස්තකාල තුළ දී හැකියාව පවතී. විවිධ ප්‍රමාණයේ මෙන් ම, විවිධ අරමුණු සහිත පුස්තකාල ද දැකිය හැකි ය. මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, ආයතනික පුස්තකාල හා පෞද්ගලික පුස්තකාල වශයෙන් විවිධ වර්ගයේ පුස්තකාල අද අපට දැක ගත හැකි අතර ජාතික පුස්තකාල (National Library) පවතින්නේ එක් රටකට එකක් පමණි. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය කොළඹ 7 නිදහස් මාවතෙහි පිහිටා ඇත.

පුස්තකාලයක පොත් එක් එක් විෂයය අනුව වර්ග කර තැබීමේ ක්‍රමයක් තිබේ. එය ඩිවි දශම වර්ගීකරණය ලෙස හැඳින්වේ. මේ පාඩම පුස්තකාල පරිහරණය පිළිබඳව සාකච්ඡා කෙරෙන්නකි.

* මෙහි 'ආලය' යන වචනය ගෘහය, නිවස යන අර්ථ ලබාදෙයි.

විවිධ විෂයයන් යටතේ වර්ග කරන ලද බොහෝ දැනුම් සම්භාරයන් පුස්තකාලයෙහි ගබඩා කර තිබේ. මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසන පරිදි ඇතැම් විට මනුෂ්‍යයෙක් වසර සියයක් ජීවත් වුව ද ලබා ගත නො හැකි දැනුම් සම්භාරයක් සහ අත්දැකීම් ගොන්නක් එක් පොතක් කියවීමෙන් ලද හැකි වෙයි. ලෝකය ජය ගත්තෝ බොහොමයක් කියවීමෙන් දිවිය සරු කර ගත්තෝ වෙති. ශ්‍රේෂ්ඨ සිංහල ගත්කතුවරුන් බොහෝමයක් ම ඊට උදාහරණ ලෙස හුවා දැක්විය හැකි ය. පාසල් පුස්තකාලය ඉගෙනුමට තෝතැන්නක් වෙයි. කුඩා කල කියවීම හුරු වූ විට එය ක්‍රමයෙන් පුරුද්දක්ව ඔබ සමග ම වැඩෙයි.

හත්වැනි ශ්‍රේණිය භාර ගුරුතුමිය පන්තියට පැමිණ හත්වැනි හා අටවැනි කාල පරිච්ඡේද දෙක පුස්තකාලය සඳහා වෙන් කළ බවත් එහි ගොස් කියවීමට සූදානම් වන ලෙසත් සිසුන්ට දැන්වූවා ය. ඔවුන්ගේ රුචි අරුචිකම් අනුව කියවීමට අවස්ථාව සලසා දීම ගුරුතුමියගේ අරමුණ විය. පන්තියේ සිසුන්ගෙන් ඇය ඒ ගැන විමසුවා ය. පන්ති නායක සුධීර පැවසුවේ එක් එක් කතුවරයා ලියූ පොත බැගින් තෝරා ගෙන කියවීම හොඳ බව ය. සිසුහු කතුවරුන් කිහිප දෙනෙකුගේ නම් හඬ නගා කීවෝ ය. “අපි මාර්ටින් වික්‍රමසිංහ, කුමාරතුංග මුනිදාස, එස්. මහින්ද හිමි, ටී. බී. ඉලංගරත්න, ජී. බී. සේනානායක යන කතුවරුන්ගේ පොත් තෝරා ගනිමු” ළමයි සියල්ලෝ ම ප්‍රකාශ කළෝ ය.

පුස්තකාලයට ගොස් අසුන් ගත් සිසුහු **මඩොල්දූව, අපේගම, හීන්සැරය, හත්පණ, මඟුල්කෑම, නිදහසේ මන්ත්‍රය, අඹ යහළුවෝ** සහ **රත් හඳුන් රූපය** යන පොත් තෝරා ගත්හ. කියවීම පටන් ගැනීමට පෙර ගුරුතුමිය සිසුන් ඇමතුවා ය. කියවීම අත්‍යවශ්‍ය බවත් කියවීමෙන් ප්‍රයෝජන රාශියක් ලබා ගත හැකි බවත් ඇය පෙන්වා දුන්නා ය. කියවා ගෙන යන අතරතුර සිත් ගත්, වැදගත් සිද්ධි, ප්‍රධාන චරිත හෝ කතුවරයා ආදි කරුණු සටහන් කර ගැනීම ද ඉතා වැදගත් බවත් ගුරුතුමිය කීවා ය. ශිෂ්‍යයන්ට තමා කැමති පොත් අදාළ රාක්ක වෙත ගොස් තෝරා ගැනීමට ගුරුතුමිය හා පුස්තකාලයාධිපතිතුමිය සහාය වූහ. එක් එක් වර්ග යටතේ පුස්තකාලයේ පොත් අසුරා තබා ඇති ආකාරය එහි දී ශිෂ්‍යයන්ගේ අවධානයට යොමු විය.

එක් එක් පුද්ගලයාගේ දැනුම් මට්ටම් හා කියවීමේ රුචිය විවිධ වන අතර කියවා ලබා ගන්නා වින්දනය ද විවිධ මට්ටම්වල පවතී. සිසුහු එකිනෙකාගේ

රුචිය අනුව පොත් තෝරා ගෙන කියවන්නට පටන් ගත්හ. වැදගත් කරුණු සිය සටහන් පොත්වල ලියා ගැනීමට ද ඔවුහු අමතක නො කළහ. පොත් කියවීමෙන් පසු ඒවා ඊට අදාළ නියමිත ස්ථානයේ තැබීමට ද ගුරුතුමියගෙන් උපදෙස් ලැබිණි. පුස්තකාලයාධිපතිනිය ඒ සඳහා ඔවුන්ට සහාය වූවා ය. නවකතා, කෙටිකතා, පින්තූර කතා, කවි පොත් මෙන් ම විවිධ විෂයයන්ට අදාළ අතිරේක කියවීම් පොත් එක් එක් රාක්කවල වෙන වෙන ම පිළිවෙළට අසුරා තිබීම සිසුන්ගේ අවධානයට නැවතත් යොමු විය. පාසල් කාල පරිච්ඡේද දෙකක් පොත් පත් පරිශීලනය කළ සිසුන්, ඒ කාලය අර්ථවත්ව භාවිත කිරීම ගැන පන්ති භාර ගුරුතුමිය සතුටට පත් වූවා ය. පුස්තකාලය තුළ ගත කළ කාලයෙන් තමන් ලබා ගත් ප්‍රයෝජන සිංහල අභ්‍යාස පොතේ ලියන ලෙස ඇය සිසුන්ට දැන්වූවා ය.

සිසුන් අභ්‍යාස පොත්වල “පුස්තකාලයෙන් ලබා ගත් ප්‍රයෝජන මොනවා ද?” යන ප්‍රශ්නයට පිළිතුරු ලියා තිබිණි. ගුරුතුමිය සිංහල කාල පරිච්ඡේදයේ දී එකිනෙකාගෙන් කරුණු ගෙන සාකච්ඡාව මෙහෙයවූවා ය. “සුධීර ලබා ගත් ප්‍රයෝජනයක් කියන්න” ගුරුතුමිය කීවා ය. “මම **මඩොල් දූව** නවකතාව කියවා වින්දනයක් ලැබුවා.” ඔහු කීවේය. ‘පොතක් නිවැරදිව පරිහරණය කිරීමට හුරුව ලැබුවා’ය යි බුද්ධික කීවේ ය. “අලුත් දැනුම ලබා ගැනීමටත්, දැනුම ගවේෂණය කිරීමටත්, විමසා බලා තීරණය කිරීමටත් අවබෝධයක් ලැබුවා” සුධීර කීවේ ය. ගුරුතුමිය සිසුන්ගේ පිළිතුරු ඇගයීමට ලක් කළා ය. “අපි විවේකය ප්‍රයෝජනවත්ව ගත කිරීමට පුරුදු වුණා” සිසුහු එක හඬින් කීහ. සිසුන් පුස්තකාලය වෙත ගෙන ගොස් පොත් පරිශීලනයට යොමු කිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු වීය යි ගුරුතුමිය සතුටු වූවා ය.

ඊළඟ සතියේ පුස්තකාලයට වෙන් වූ කාල පරිච්ඡේදය ගුරුතුමිය වෙන් කර ගත්තේ පුස්තකාලය පරිහරණය කිරීමෙන් දැනුම ලබා පොත් පත් ලියූ උගතුන් ගැන විස්තර කියා දීමට ය.

“ළමයි අපි අද කතා කරන්නේ කොළඹ මහජන පුස්තකාලයේ ඇති පොත් සියල්ල ම කියවා දැනුම ලබා ගත් උගතකු වන ජී. බී. සේනානායක මහතා ගැන යි. තම පියාගේ අභාවයෙන් පසුව පාසල් ගමන අතර මග නතර වූ පසු ඔහුගේ පාසල බවට පත් වූයේ කොළඹ මහජන පුස්තකාලය යි. ඔහු සිය පෞද්ගලික අත්දැකීම් **විනිවිදිම් අඳුර** නමැති කෘතියේ විස්තර කරනවා. තමාගේ ඇස් දෙක ම අන්ධව සිටිය දීත් විවිධ මාතෘකා ගැන ලබා ඇති දැනුම ඔස්සේ ගලා ආ සිතිවිලි සිය සොහොයුරිය සහ ඇගේ දුව ලවා

ලියවා ඔහු ග්‍රන්ථ 16ක් ම එළිදැක්වූවා. කෙටිකතා පොත් හතරක් කාව්‍ය ග්‍රන්ථ තුනක් චරිතාපදාන තුනක් එතුමා රචනා කළා. 'මගේ විශ්වවිද්‍යාලය මහජන පුස්තකාලය යැයි' ප්‍රකාශ කළ එතුමා එහි තිබූ පොත් විසි පන්දහසක් පමණ මුල් කාලයේ දී ම කියෙව්වා. ජීවිතයේ අවසාන කාලයේ දී දෙනෙත් අන්ධ වුවත් ලිවීම අත්හැරියේ නෑ. එතුමා තුළ තිබූ අප්‍රතිහත ධෛර්යයත් පුස්තකාලය පරිහරණය කිරීමෙන් ලැබූ  දැනුමත් ග්‍රන්ථ නිර්මාණය කිරීමේ කෞශල්‍යයත් නිසා ම, ඔහු සදා අනුස්මරණීය ලේඛකයෙක්. මීට අමතරව මාර්ටින් වික්‍රමසිංහ, සහ කුමාරතුංග මුනිදාස පිළිබඳවත් ඔබගේ අවධානය යොමු කළ යුතු යි" කියමින් ගුරුතුමිය සිසුන් සමග කළ සාකච්ඡාව අවසන් කළා ය.

"පුස්තකාලයට පිය නගමු"' යන මෙම පාඩම කියවීමෙන් "කියවීම මිනිසා සම්පූර්ණ කරයි" යන කියමන සත්‍යයක් බව ඔබට වැටහෙනු ඇත. පාසලේ දී අර්ථවත්ව, ඵලදායි ලෙස කාලය ගත කළ හැකි හොඳ ම තැන පාසල් පුස්තකාලය බව ඔබ සිත තුළ ධාරණය කර ගන්න.

## අවබෝධය

1. පුස්තකාලය පරිහරණය කිරීමේ දී සැලකිය යුතු කරුණු තුනක් ලියන්න.
2. පුස්තකාලය පරිහරණය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.
3. පුස්තකාලයක පොත් අසුරා තබන පිළිවෙළ සකස් වන්නේ කුමක් පදනම් කර ගෙන ද?
4. ජී. බී. සේනානායකගේ කෘතියක් පාඩමෙන් උපුටා දක්වන්න.
5. ජී. බී. සේනානායක සිය විශ්වවිද්‍යාලය ලෙස හැඳින්වූ ආයතනය කුමක් ද?

## ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ කැමති ලේඛකයකුගේ පොත් නාමාවලියක් සකස් කරන්න.
2. ලේඛක නාමාවලියක් සකස් කර ඔවුන් විසින් ලියා ඇති ග්‍රන්ථ දක්වා පොත් පිංචක් සාදන්න.



# තොප්පි වෙළෙන්දා

# 22

නාට්‍යය යනු වේදිකාවක් මත කිසියම් පිටපතකට අනුව රඟ දැක්වෙන, අසා සහ බලා රස විඳිය හැකි නිර්මාණයකි. ළමයින් සඳහා ම ළමයින්ට ගැළපෙන තේමාවක් පාදක කර ගෙන ළමයින්ට ගැළපෙන ආකාරයට සැකසුණු නාට්‍ය, ළමා නාට්‍ය ලෙස හැඳින්වේ.

මෙම පාඩම සකස් කර ඇත්තේ සෝමලතා සුබසිංහගේ (1936-2015) තොප්පි වෙළෙන්දා නාට්‍යයේ පිටපත ඇසුරෙනි. පුරෝගාමී ළමා නාට්‍ය රචිකාවක වන සෝමලතා සුබසිංහ කතන්දර දෙකක් (1979), විකෘති (1992), පුංචි අපට දැන් තේරෙයි (1998), රත්මලී, වලස් පවුල, හිම කුමරිය (2000) ආදි නාට්‍ය රාශියක් නිර්මාණය කර ඇත.

තොප්පි වෙළෙන්දා නාට්‍යයට පදනම් වී ඇත්තේ ප්‍රකට ජන කතාවකි. එම කතාවේ රසවත් සිදුවීම් ඇසුරෙන් නාට්‍යමය අවස්ථා නිර්මාණය කර ඇති ආකාරය අපූරු ය.

එබඳු කතාවක් හෝ සිදුවීමක් හෝ ඇසුරෙන් නාට්‍ය පිටපතක් රචනා කිරීමට ඔබට ද හැකි ය. ඒ සඳහා මඟ පෙන්වීමක් ද මේ පාඩමෙන් ඔබට ලැබෙනු ඇත.

**(තොප්පි වෙළෙන්දාගේ ගෙදර, බිරිඳ තොප්පි, කූඩයට අඩුක් කිරීමට තොප්පි වෙළෙන්දාට උදවු කරමින් සිටියි. දුව සහ පුතා ගල් කිරමින් සිටිති.)**

තොප්පි වෙළෙන්දා
(සිංදුව) - තොප්පි වෙළෙන්දෙක් මේ මං
තොප්පි හදා ගෙන මේ මං
ලස්සන කූඩෙක අඩුක් කරා ගෙන
තොප්පි කූඩයක් හිසේ තියා ගෙන
ගමින් ගමට ගමන් ගතෙයි.
තොප්පි ! තොප්පි !! තොප්පි !!!
මං හදාපු තොප්පි
පාට පාට තොප්පි
පුංචි පුතාටයි දුවටයි දෙන්නට
සල්ලි ගෙවා සෙල්ලම් බඩු ගන්නට
ඉස්කෝලේ පොත් පැන්සල් ගන්නට
ගමින් ගමට - ගමන් ගතෙයි.
තොප්පි ! තොප්පි !! තොප්පි !!!
කවුද ගන්නේ තොප්පි...!!!
පාට පාට තොප්පි...!!
හරි ලාබයි තොප්පි...!

දුවයි, පුතයි - තොප්පි වෙළෙන්දෙක් තාත්තා
තොප්පි හදා ගෙන තාත්තා
ලස්සන කූඩෙක අඩුක් කරා ගෙන
තොප්පි කූඩයත් හිසේ තියා ගෙන

පිරිස - අම්මා හදා දුන් බත්මුල අරගෙන
ගමින් ගමට - ගමන් ගතෙයි.

දුවයි, පුතයි - පුංචි අපට සෙල්ලම් බඩු ගන්නට
පාසැල් පොත් පැන්සල් අරගන්නට
කෑමට බීමට සල්ලි සොයන්නට
ගමින් ගමට ගමන් ගතෙයි

පිරිස - තොප්පි ! තොප්පි ! තොප්පි !!!
කවුද ගන්නෙ තොප්පි...!!!
හරි ලාබයි තොප්පි... !

**(වෙළෙන්දා නිවසින් නික්ම වේදිකාවේ වටයක් යයි. දැන් ඔහු ගම්මැද්දෙන් ගමන් ගනියි.)**

වෙළෙන්දා - පුංචි දුවට පොඩි පුතාට
අච්ච වැස්ස නො දැනෙන්නට
හැඩට වැඩට ගමන් යන්ට
මං හදාපු තොප්පි ගන්න
තොප්පි ///

පුංචි ළමයෙක් - **(දුව එමින්)**
තොප්පි ! මේ තොප්පි !!
මේ ගේන්න තොප්පි !
අම්මේ, අම්මේ, තොප්පි !
අරන් දෙන්න තොප්පි !!

වෙළෙන්දා - **(කුඩය හිසෙන් බිමට බා)**
එන්න එන්න - බබා එන්න
මෙන්න මෙන්න - මේ බලන්න

වැඩි මිල නෑ - ගජ ලාබයි
හැඩයි, හැඩයි - තොප්පි !!

ළමයා - අනේ අම්මේ - මේ බලන්න
මේ තොප්පි - හරි ලස්සන
දාගෙන ඉස්කෝලෙ යන්න
මේ තොප්පි අරන් දෙන්න.

ළමයාගේ අම්මා - මේ ළමයෝ නිකං ඉන්න
අපරාදේ ඇදල දාන්නෙ
ඕව උඹට අරන් දෙන්න
මා ළඟ මිල මුදල් කොයි ද?

වෙළෙන්දා - අනේ කමක් නෑ හාමිනේ
පුංචි අයගෙ ආසාව නෙ
හා ! හා !! හා !!! ගන්න ගන්න
කැමති එකක් ගෙන බලන්න
මට නෑ කිසි කරදරයක්
බබාලාට - ඕන හැටිය,

තෝරලා - ඇඳලා බලලා
සතුටු වන්න - මිලට ගන්න
සල්ලි නැතත් - දාල බලලා
සතුටු වන්න.

අම්මා - **(තොප්පියක් අතට ගෙන පරීක්ෂා කරමින්)**
කීය ද මේ තොප්පි ?
ගණන් ද මේ තොප්පි ?

වෙළෙන්දා - පනම් හතයි - ගජ ලාබයි !
හැම එකක් ම - එක ම මිලයි

අම්මා - පනම් හතක් නම් වැඩියි වෙළෙන්දා
පනම් දෙකක් වත් වටී ද මන්දා !
මට නම් නෑ මේවාවල අගයක්
මේ ළමයගෙ කරදරය මිසක්.

**(ගැහැනිය තොප්පිය ආපසු කූඩයට දමා ළමයාත් අතින් ඇද ගෙන යන්ට යයි.)**

වෙළෙන්දා - පනම් දෙකක් !
හරි කතාව
මේක හදා ගන්ටත් මට
පනම් පහක් වියදම්
ඔහොම තමයි දැන් කාලේ
බොහොම හිඟයි මිනිස්සුන්ට
කොහොම වුණත් උත්සාහය
කෑම වේල පිරිමහන්ට
මෙහෙම දේට කොහෙ මුදල් ද ?
මේවා කාගේ වැරදි ද ?

**(වෙළෙන්දා තොප්පි කූඩය ගෙන වේදිකාව වටේට ගමන් කරයි.)**

කවුරුත් නෑ තොප්පි ගන්නෙ
අද නෑ කිසි වාසි ලැබුණෙ
එහා ගොඩේ ඉඳලා මං
පයින් ගමන් කරලා මට

තෙහෙට්ටුවයි පිපාසයයි
මිස නෑ මට වෙන වාසි
ඉර මුදුනට ආවා - පාරත් රත් වූවා
මට මහන්සි වූවා - බඩ ගින්නත් ආවා

**(වෙළෙන්දා හොඳ සෙවණැති ගසක් දකියි)**

වෙළෙන්දා - හොඳ හැටි අතු විහිදී ගිය
ගසක් ඇතේ
සුළඟ සිසිල් කරනා
දිය ඇළක් ඇතේ
මෙතැන අගෙයි මට විඩා හරින්ටා
ගසක සිසිල් සෙවණක් ලැබ ගන්ටා
අසලින් බැස යන අර ඇළ වෙතටා
ගොස් හැකි වෙයි මට දිය නාගන්ටා.
අහල පහල කිසිවකු නැතුවා දෝ
ගමක් තොටක් බොහො
ඇතක වේදෝ
තොප්පි කුඩය රැක ගත හැකි දෝ
මඳක් ඇස පියා විඩා හරිම් දෝ

**(ගායනා කරන විට වෙළෙන්දා එය අභිරූපණය කරයි)**

පිරිස - තොප්පි වෙළෙන්දා මහන්සි - මග හරින්න වෙලා හාන්සි
හිතලා ඔහු තොප්පි කුඩෙ - හිසින් බිමට ගත්තා.
ගොස් ඇළ වෙත දියට නැමී
සිසිල් දියෙන් මුහුණ තෙමා,
දිය සිසිලයි නිල්පාටයි
දිය නාන්නට ඔහුට හිතෙයි
ඇඳුම් උනා ගොඩින් තබා
ඇළට බැසා ජබුන් ගසා
දිය පීනා ගෙන නානා
විඩා ගොසින් සිත පිරුණා
ගොඩට ඇවිත් ඇඳුම් ඇඳන්
පුංචි පුතයි, පුංචි දුවයි
උදවු කරල බිරිඳ හැදූ
බත්මුල ගෙන ලිහා බලා
සතුටින් එය කන්නේ.

| | | |
|---|---|---|
| වෙළෙන්දා | - | සිංහල හාලේ බතකුයි<br>පොල් සම්බල් හරිම රසයි<br>වත්තෙ ගහෙන් කඩල උයපු<br>පොලොස් ඇඹුල හරි කදිමයි |
| පිරිස | - | බත්මුල හරි රස වූයේ - රස නහරින් පිනා ගියේ<br>විඩාව මග හැරී ගියේ - පොඩ්ඩක් නිදිමත වූයේ<br>වට පිට බැලුවා - කිසිවකු නැතුවා<br>තොප්පි කුඩෙ ගස - මුලින් ම තැබුවා |
| වෙළෙන්දා | - | අහල පහල කිසිවකු නෑ පේන්ට<br>හැකි මට ඇල වී ටිකක් නිදන්නට<br>තොප්පි කුඩෙ මා ළඟින් තියා ගෙන<br>එක තොප්පියකින් මූණ වසා ගෙන<br><br>**(ගායනා කරන අතර තොප්පි වෙළෙන්දා අභිරූපණය කරයි)** |
| පිරිස | - | ඉර එළියෙන් ඇස වසා නිදන්නට<br>එක තොප්පියකින් මූණ වසා ගෙන<br>තොප්පි කුඩයක් ළඟින් තියා ගෙන<br>ඇස පියා ගනී ගස යට වැතිරී ගෙන.<br><br>**(වෙළෙන්දාට නින්ද යයි. එවිට ම ගස්වැල්වල එල්ලී පැද්දී එන වඳුරු රැළක් එතනට කඩා වැටෙයි.)** |
| පිරිස | - | **(ගායනා කරති. වඳුරෝ නටති. පිනුම් ගසති, ඔන්චිලි පදිති, සෙල්ලම් කරති.)**<br><br>තනම් දෙනා තම් දෙනා තනම් දෙන<br>තනම් දෙනා තනෙ නා තෙයි //<br><br>ගසින් ගසට පැන<br>ලැගුම් සොයා ගොස් //<br>කොළ දලු පලතුරු<br>අනුභව කරමින් // |

කරනම් අල්ලා - ඔංචිලි පැදලා
සෙල්ලම් කරමින් - උසුළු විසුළුවෙන්
දවස ගෙවන්නා - වඳුරු රංචුවක්
එතැනට ආවා //
කරනම් අල්ලා - සරකස් පෑවා
උසුළු විසුළුවෙන් - විනෝද වූවා
තනම් දෙනා තනෙනා තෙයි

ගස යට නිදනා - තොප්පි වෙළෙන්දා //
දැක දැන් වඳුරන් - කලබල වීලා
හෙමිහිට හෙමිහිට ළං වී - එබිකම් කර බැලුවා.

1 වැනි වඳුරා - ඇගේ මවිල් හරි පොඩ්ඩයි
රෙදි කඩමලු ඔතා ඇතෙයි
මවිල් නැතත්,
වලිග නැතත්,
හරියට වඳුරෙක් ම වගෙයි !

පිරිස - වටෙන් වටෙන් එබුණා
විපරම් කර බැලුවා
හරි පුදුමයි !
ලොකු පැනයක් !!

1 වැනි වඳුරා - අමුතු වඳුරු රාල කෙනෙක්

3 වැනි වඳුරා - මං අහලා තියෙනව බං,
මේ ලෝකෙට,
වඳුරු කුලේ එන්ට කලින්
හිටිය කියලා,
මිනිස්සු කියලා සත්තු !

4 වැනි වඳුරා - උන්ට වලිග තිබුණෙ නැතිලු,
මවිල් තිබුණෙ හරි පොඩ්ඩලු.

1 වැනි වඳුරා - හ්ම් !
මූට පිස්සු
අපට පස්සේ උන් ආවේ
අපියි ඉස්සරින් ම ආවේ. //

5 වැනි වඳුරා - උන්ට කෑම අඩු හින්දා
වලිගෙ නැතිලු
මවිල් අඩුලු

පිරිස - **(ගායනා කරති. වඳුරෝ අභිරූපණය කරති.)**
පිනුමක් ගැහුවා - හූවක් කීවා.
ගහේ එල්ලුණා - ඕංචිලි පැද්දා
කවුදැයි සිතුවා.

6 වැනි වඳුරා - පරක්කු වී ආ හින්දා
උන්ට නැතිලු වලිග ලැබුණෙ
උන්ට නැතිලු මවිල් ලැබුණෙ

3 වැනි වඳුරා - ඒ උණාට
මොළේ වැඩිලු

1 වැනි වඳුරා - මොළෙන් ඇති වැඩේ මොකක් ද?
සීතලේට පෙරෙයියැකි ද?
අපට වගේ හොඳට උන්ට
ගහෙන් ගහට පනින්ට බෑ ....

6 වැනි වඳුරා - **(කරනමක් ගසා)**
කරනම් අල්ලන්නට බෑ ....

4 වැනි වඳුරා - ගෙවල් නැතුව ඉන්නට බෑ.

3 වැනි වඳුරා - පොළොවෙ මිසක් යන්නට බෑ.

2 වැනි වඳුරා - ඇඳුම් නැතුව සීතලයි ලු.

4 වැනි වඳුරා - ඒ හැටියට අපි ....

සියල්ලෝ ම - හපන්නු

1 වැනි වඳුරා - අපියි ඉස්සරින් ම ආවේ.
උන් ආවේ අපට පස්සේ.

4 වැනි වඳුරා - උඹලගෙ වාදේ නවත්තපල්ලා
උං ගැන සොයලා
බලන්න වරෙල්ලා.

පිරිස - **(වඳුරෝ අභිරූපණය කරති)**
ඔලුව කසාලා සිතමින්,
වලිගය අල්ලා බලමින්,
කෙස් පැළෙන්න තරමට දැන්,
වඳුරෝ කල්පනා කරති.
එකා එකා වාද කරති.
නැවතත් උන් කිට්ටු කරති,
තොප්පි වෙළෙන්දාගෙ ළඟට.
විමසිල්ලෙන් විපරම් කර,
තොප්පි කූඩෙ ඇදලා බලති.
ගස යට නිදනා සතාගෙ ඔලුවේ
තියනා තොප්පිය
හොඳ හැටි බැලුවේ.
තොප්පි දැමූ වඳුරා ගජපහ වේ.
තමනුත් හිස තොප්පිය දා බැලුවේ.

වඳුරෝ - ආයි ! ආයි !!!
හරි ජාති
හැඩයි වැඩයි - හරි ප්‍රීතියි...

පිරිස - තොප්පි දමාගත් වඳුරෝ //
ප්‍රීතියෙන් පිනා ගියෝ
එකා එකා හැඩ බැලුවෝ
සන්තෝසින් පිරී ගියෝ
තොප්පි දමා ගත් වඳුරෝ
ප්‍රීතියෙන් පිනා ගියෝ
යස නැටුම් නැටූ වඳුරෝ
මහ හඬින් සිනාසුණෝ

**(වඳුරෝ සිනාසෙති)**

ඒ හඬින් වෙළෙන්දා, - ගස යට උන් නිඳා,
ඇහැරියේ තිගැස්සී, - හඬ කොහෙන් විමසී.
**(වෙළෙන්දා ඇහැරෙයි. මවිත වී බලයි)**

වෙළෙන්දාට හරි පුදුමයි. - හරි අපූරු වඳුරු රැළක්
පාට පාට තොප්පි දැමූ, - වඳුරු රැළක්

| | | |
|---|---|---|
| වෙළෙන්දා | - | සිහිනයක් වත් දෝ - මොන අරුමයක් දෝ. |
| පිරිස | - | දෙ ඇස් පිස හැර බලා<br>මවිත වී නැගිට්ටා,<br>හිස් කුඩෙ දුටුවා. |
| වෙළෙන්දා | - | **(කුඩය දැක ඒ දෙසට පනිමින්)**<br>මගේ අප්පෝ !<br>කුඩය හිස් !! |
| පිරිස | - | වෙළෙන්දාට දැන් වැටහුණි.<br>උන්ට තොප්පි කොහෙන් ලැබුණි.<br>කුඩෙ පිරිලා තොප්පි තිබුණි.<br>දැන් කුඩය හිස්ව තිබුණි.<br>දැන් කුඩය හිස්ව තිබුණි.<br>වෙළෙන්දාට එලොව පෙනුණි. |
| වෙළෙන්දා | - | පොඩි පුතාට<br>පොඩි දෝණිට<br>පොත් පත් ගන්නේ කොහොම ද?<br>සෙල්ලම් බඩු ගන්නේ කොහොම ද? |
| පිරිස | - | තොප්පි වෙළෙන්දා දුප්පත්<br>විය දැන් අන්දුන් කුන්දුන්.<br>වෙළෙන්දා හිට ගත්තා !<br>වඳුරෝ බය වුණා !<br>තොප්පි දා ගත් ගමන්<br>ගහ උඩට නැග්ගා !! |
| වෙළෙන්දා | - | දැන් කොහොම ද - තොප්පි ගන්නේ ?<br>තොප්පි නැතිව - කොහොම යන්නේ ?<br>පොඩි පුතාට පොඩි දෝණිට<br>සෙල්ලම් බඩු - කොහොම ගන්නෙ ?<br>පොත් පැන්සල්<br>කොහොම ගන්නේ ? |
| පිරිස | - | කලබල වූ වෙළෙන්දා<br>එහාට ඇවිද්දා, මෙහාට ඇවිද්දා<br>දැත් හිසේ ගසා ගත්තා. - එහෙ දිව්වා, මෙහෙ දිව්වා |

පිස්සු වැහිලා වගෙ දිව්වා.
වඳුරන් ටික බිමට බැස්සා.
වලිගය නැති සතා කරපු, - හැම දෙයක් ම ඔවුන් කළා.
කෝප වූ වෙළෙන්දා - එහෙ දිව්වා මෙහෙ දිව්වා
ඒක දැකපු වඳුරෝ ද - එහෙ දිව්වා මෙහෙ දිව්වා
කුමක් කරම් දෝ - නො දත් වෙළෙන්දා,
ඒ පස බැලුවා මේ පස බැලුවා
ඒ දුටු වඳුරෝ ද එසේ ම කෙරුවා.
ඒ පස බැලුවා මේ පස බැලුවා.
නළලේ අත ගහ ගත් විට
වෙළෙන්දා
වඳුරොත් නළලේ අත ගහ ගත්තා
දෑත් ඉණට ගත් කල ඒ වෙළෙන්දා
වඳුරොත් සිය දෑත් ඉණට ම ගත්තා.

වෙළෙන්දා - හරි කරුමයක් නේ, - මේක යස වැඩක් නේ,
වඳුරු කොලොප්පමක්.
මගේ තොප්පි හොරකම් කර,
මට කළ හදි මදිවට මුං
උසුළු විසුළු පාලා - කොලොප්පමක් පටන් ගත්තා.
කරන්නම් කො කදිම වැඩක්, - කකුල් කඩලා දානවා මං

පිරිස - **(ගායනා කරන විට නළුවෝ අභිරූපණය කරති)**
වෙළෙන්දා තරහ ගෙන, - එහෙ බලා මෙහෙ බලා,
ලොකු ගලක් අතට ගෙන, - වඳුරන්ට ගැහුවා.
ඒ දුටු වඳුරෝ ද,
එහෙ බලා,
මෙහෙ බලා,
ගල් සොයා අතට ගෙන
වෙළෙන්දාට ගැහුවා,
මේ වන විට වෙළෙන්දාට - වැටහුණේ කාරණේ
වඳුරන් කරන්නේ - ඔහුව අනුකරණයක් මිස
කොලොප්පම් නො වෙයි.

**(අතිශය විලම්බ ලයෙන් දේශනා ශෛලියෙන් ගායනා කෙරේ.)**

සන්සුන් වූ වෙළෙන්දාට
තොප්පි නැවත ලබා ගන්න
හොඳ නුවණක් පහළ වුණේ.
තම හිස මත දමා ....
තිබූ තොප්පිය වෙතට ....
යවා තම අත හෙමින් ....
එය අතට ගත්තා ....
ඒ විට වඳුරෝ ද ඕං,
අත් යවා තොප්පි වෙත,
තම තමන් හිස තිබුණු
තොප්පි ගත්තෝ අතින්.
වෙළෙන්දා ඒ ගමන,
කිට්ටු කර කූඩයට,
තම අත වූ තොප්පිය
කූඩයට දැම්මා.
වඳුරෝ ද ඒ ගමන
කිට්ටු කර කූඩයට
තම අත වූ තොප්පි ගෙන
කූඩයට දැම්මා.
වෙළෙන්දාට හරි සතුටුයි
කූඩෙ පිරිල තොප්පි ඇතෙයි //
වහා පැන්න කූඩෙ වෙතට - ගත්ත විගස කූඩෙ හිසට
ඉඩක් නො දී වඳුරන්හට - හති හතිකට දිව්වා එපිට
පසු නො බලා දිව්වා එපිට
පැන්න වඳුරො ඒ විගසට,
තොප්පි කූඩෙ තිබුණු තැනට,
කූඩෙත් නෑ ....
තොප්පිත් නෑ ....
කුමක් වුණි ද .... තේරුම් නෑ ....
වට පිට බලන්නේ
කූඩෙ අරන් ඈත දුවන,
වෙළෙන්දා දකින්නේ.

(ඇත යන වෙළෙන්දා දෙස මඳක් වෙලා බලා සිට සෙමින් ඉදිරියට හැරෙන වඳුරෝ ....)

වඳුරෝ - 1 හරි ! හරි !! හරි !!!
උෟ .... මිනිහෙක් ....!
2 හරියට හරි .... මිනිහෙක් !
3 වලිගෙ නැතත්,
4 මවිල් නැතත්,
5 මොළේ ඇතේ.

සියල්ලෝ ම - මිනිහෙක් ....!

(එවිට ම වෙළෙන්දා ඉතා ජයග්‍රාහී විලාසයෙන් එතැනින් යන්නට එයි.)

වෙළෙන්දා - තොප්පි ! තොප්පි !! තොප්පි !!

## අවබෝධය

1. තොප්පි වෙළෙන්දා නාට්‍යයේ වෙළෙන්දාගේ චරිත ලක්ෂණ මොනවා ද?
2. මිනිස් චරිත හා සත්ත්ව චරිත නිරූපණයේ දී එහි වෙනස පෙන්වීමට කතුවරිය යොදා ඇති ශිල්ප ක්‍රම මොනවා ද?
3. වඳුරන් තොප්පි වෙළෙන්දාගේ දුටු වෙනස්කම් මොනවා ද?
4. වඳුරන්ගෙන් තොප්පි ආපසු ලබා ගැනීමට වෙළෙන්දා යෙදූ උපාය කුමක් ද?
5. "සතුන් අතුරෙන් මිනිසා නුවණක්කාර සතකු බව මේ නාට්‍යයෙන් අවධාරණය කෙරේ." මේ පිළිබඳ ඔබේ අදහස් ලියන්න.

**ලිඛිත අභ්‍යාස**

1. තොප්පි ගන්නට ආ ළමයාගේ අම්මා, වෙළෙන්දා සමග වූ දෙබස ඔබේ වචනයෙන් ලියන්න.
2. වෙළෙන්දා නිදා ගත් ආකාරය කතුවරිය පවසන්නේ කෙසේ ද?
3. මිනිසා වඳුරාගෙන් වෙනස් වූ හැටි දකින වඳුරන් අතර පැවති දෙබස ලියන්න.
4. නාට්‍යෝචිත අවස්ථා දෙකක් නාට්‍යයෙන් උපුටා ලියන්න.

## ළමා නාට්‍ය (පිටපත්) රචනය

ළමයින්ගේ පෞරුෂ වර්ධනයට, බුද්ධි වර්ධනයට මෙන් ම, මානව දයාවෙන් හෙබි පුරවැසියකු වීමට අවශ්‍ය පදනම සකස් කිරීමට ද දායක වන ප්‍රබල ම මාධ්‍යයකි, ළමා නාට්‍ය.

නාට්‍යයක **පෙළ කියවා** රස විඳිය හැකි ය. නාට්‍යය **නරඹා** රස විඳිය හැකි ය. අසා සිට ද රස විඳිය හැකි ය. නාට්‍යය යනු අනුකරණය යි. එනම් තවත් කෙනෙකු අනුකරණය කිරීමකි.

නාට්‍යයක් සඳහා ප්‍රධාන වශයෙන් පිටපතක් තිබිය යුතු ය. එය නාට්‍යය පෙළ නම් වේ. මේ පාඩමට ඇතුළත් වූයේ **තොප්පි වෙළෙන්දා** නාට්‍යයේ පෙළ යි.

නාට්‍යයක පෙළ ගද්‍ය විය හැකි ය. පද්‍ය විය හැකි ය. ගද්‍ය පද්‍ය දෙකෙහි මිශ්‍රණයක් ද විය හැකි ය. පෙළ රචනා කරන්නේ දෙබස් මඟිනි. කතාවක් තෝරා ගෙන එය සිදු වන හැටි **දෙබස්** මගින් දැක්වීමෙනි.

නළු නිළියන්ගේ ප්‍රයෝජනය සඳහා පිටපතෙහි **රංග විධාන** තිබිය යුතු ය.

උදා :- වටයක් ගොස් බලා
කුඩය බිම තබා

නාට්‍යයෙහි ඇතුළත් වන පද්‍ය කොටස් යෝග්‍ය සංගීත තාල අනුව ගායනා කෙරේ.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **මේ දෙබස කියවන්න. එවැනි දෙබසක් ලියන්න.**

ලබු වැල: වැඩුණු මහ ලොකුවට
කීය ද වයස තමුසෙට

කිතුල් ගස: අහන එක පුදුම ය
දැන් මට වයස පනහ ය

ලබු වැල: මට මාස හයකුත්
දවස් හතරකි තවමත්

කිතුල් ගස: ඔබ බාල බව මම
දැන ගෙන සිටිමි හොඳට ම

ලබු වැල: නැතත් වයසක් මට
උස වෙමි ඔබේ තරමට
මට මෙන් ඉක්මනට
හැදෙන්නට බැරි මොකද තමුසෙට

කිතුල් ගස: ඉක්මනට හැදුණොත්
ඒ ඉක්මනින් නැති වෙත්
මගෙ ඇගේ වෙළිලා
මාසෙන් දෙකෙන් හැදිලා
ඔබ මෙන් මැලවිලා
දහස් ගණනක් ගියා මැරිලා

-එස්. මහින්ද හිමි-

2. **නාට්‍යයේ එන රංග විධාන ගැන සිසුන් සමග සාකච්ඡා කරන්න.**
3. **මලක් සහ බඹරකු අතර ඇති වන සංවාදයක් ලියන්න.**
4. **උදෑසන පාසලට පිටත් වන අවස්ථාවේ අයියා, මල්ලී සහ ඔබ අතර සිදු වන සංවාදයක් ලියන්න.**
5. **පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට සංවිධානය වී ඔබ කැමති පුංචි කතාවක් තෝරා ගෙන නාට්‍ය පිටපතක් ලියන්න. එය රඟ දක්වන්න.**



## 23

# යහළුවෝ

ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් යනු ලංකාවේ බෞද්ධ පාසල් රැසක් ආරම්භ කිරීමට පුරෝගාමී වූ විද්වතෙකි. පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය නමැති නිබන්ධය සඳහා ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලැබූ අදිකාරම්, සිංහල විද්‍යා අධ්‍යාපන ක්ෂේත්‍රයට ද දායකත්වය සැපයී ය. ඔහු විද්‍යාව සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා පාරිභාෂික ශබ්ද මාලාවක් සම්පාදනයට කටයුතු කළේ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් විද්‍යා අධ්‍යාපනයේ ඉහළට ම යෑමට තමාට අහිමි වූ අවස්ථාව බොහෝ දරුවන්ට උදා කර දෙමිනි. විද්‍යා පොත් හා විද්‍යා සඟරා ප්‍රකාශයට පත් කිරීමෙන් ද පුවත්පත් ලිපි ලිවීමෙන් ද ගුවන්විදුලි කතා පැවැත්වීමෙන් ද ඔහු සිංහල මාධ්‍ය විද්‍යා අධ්‍යාපනයට අනුබල දුන්නේ ය. ඔහු විසින් සම්පාදනය කරන ලද පාඨශාලීය සිංහල ශබ්දකෝෂය බෙහෙවින් ප්‍රයෝජනවත් කෘතියකි. ඔහු පාසල් පරිපාලනයේ දී හා ශිෂ්‍ය විනය සංවර්ධනයේ දී අහිංසාවාදී සිතුවිලි පදනම් කර ගත්තේ ය. සාමකාමී ලොවක් ගොඩනැගීම සඳහා ආචාර්ය අදිකාරම් විසින් කරන ලද සේවය ඇගයීමට එක්සත් ජාතීන්ගේ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවෙන් 1988 දී එතුමාට සාම ත්‍යාගය පිරිනමන ලදි. සමාජයේ චින්තනය දියුණු කිරීමේ පරමාර්ථයෙන් ආචාර්ය අදිකාරම් විසින් පළ කරන ලද සිතුවිලි සඟරා කාණ්ඩ 58කි. එහි 41 වන කාණ්ඩයෙන් උපුටා ගත් කතාවක් මේ පාඩමට ඇතුළත් වේ.

ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

ඔබ සැම දෙනාට ම කුඩා යහළුවන් ඇතැයි සිතමි. එයින් සමහර දෙනෙක් අසල් වැසියන් වන්ට පුළුවන, සමහරෙක් ඉස්කෝලයේ හෝ ඔබේ පඞ්ක්තියේ ම හෝ සිටින ළමයින් වන්ට පුළුවන.

කුඩා කාලයේ සමාන වයසක ළමයින් සමග මිත්‍ර වීම ළමා වයසෙහි දී ස්වාභාවික වශයෙන් සිදු වන දෙයකි. එය මනුෂ්‍යයාට අවශ්‍ය දෙයක් යයි ද සිතා ගැනීමට ඉඩ තිබේ.

මේ සම්බන්ධයෙන් කුඩා ළමුන් පර්යේෂණයකට භාජන කර නොමැති යි. එහෙත් ඒ වෙනුවට කුඩා වඳුරු පැටවුන් අරගෙන පර්යේෂණ පවත්වා තිබේ.

කුඩා කාලයේ දී සම වයස්ක වෙනත් වඳුරු පැටවුන් සමග සෙල්ලම් කිරීමට ඉඩ නො ලැබුණු වඳුරු පැටවු ලොකු වන විට වඳුරු සිරිත් විරිත් නො දන්නා, වඳුරු සමාජයට නො ගැළපෙන වඳුරෝ වූහ. වඳුරා මනුෂ්‍යයාට බොහෝ සෙයින් කිට්ටු සම්බන්ධකම් ඇති සත්ත්වයෙකි. එහෙයින් ඒ වඳුරු පැටවුන්ට සිදු වන දේ මනුෂ්‍යයාටත් සිදු වෙති'යි නිගමනය කිරීමට ඉඩ තිබේ...

...කුඩා කාලයේ දී ඇති වන මිත්‍රත්වය බොහෝ විට සෙල්ලම් කිරීම ආදියට සීමා වෙයි. වයසින් වැඩෙත් ම ඒ මිත්‍රයන් කෙනෙකුට නැති වී යන්ට පුළුවන. එහෙත් මිත්‍රත්වය හෙවත් යහළු බව කුඩා දරුවාගේ ජීවිතයේ වැදගත් කොටසක් වී වැඩෙන්ට පුළුවන.

සැබෑ මිත්‍රත්වය ආත්මාර්ථයෙන් හෙවත් තමා ගැන ම සිතීමෙන් තොර වූවකි. මෛත්‍රිය යයි ද මීට ම නමකි. "මෛත්‍රී" යන වචනය සෑදී තිබෙන්නේ ද "මිත්‍ර" යන්නෙන් ය. කල්‍යාණ මිත්‍රයාගේ ස්වභාවය හෙවත් හොඳ මිතුරකුගේ ගතිය මෛත්‍රිය යි.

අභාග්‍යයකට මෙන් හොඳ මිත්‍රත්වය අතිශයින් ම දුර්ලභ වූ ගතියකි. එය ප්‍රේමය නො වේ, ස්නේහය නො වේ. ආදරය යන වචනයේ පොදු තේරුම ද එහි නැත. ප්‍රේමයත් ස්නේහයත්, පොදු ව්‍යවහාරයෙහි පාවිච්චි වන ආදරයත්, ආත්මාර්ථකාමී ගති ය, තමා ම මුල් කර ගෙන ඇති වන හැඟීම් ය. කල්‍යාණ මිත්‍රතාව හෙවත් මෛත්‍රිය එවැන්නක් නො වේ. එහි තමා ය අනුන් ය යන භේදයක් නැත. කුඩා ම කාලයේ දී අම්මා කෙරෙහි ද ඊට පසු සෙල්ලම් කරන ළමයින් කෙරෙහි ද හට ගන්නා යාළුකම නො කෙලෙසී විකාශනය වන්ට ඉඩ හැරිය හොත් නියම මිත්‍රත්වය කවදා හෝ කෙනෙකු තුළ විකාශනය

වන්ට බැරි නැතැයි සිතීමට පුළුවන. දෙමවුපියන් විසින් ද ගුරුවරුන් විසින් ද ළමයෙකුට කළ හැකි ලොකු ම සේවය කුඩා කාලයේ දී ළමයෙකු තුළ හට ගන්නා ඒ මල් පොහොට්ටුව විනාශ වන්ට නො දී ආරක්ෂා කර දීම ය. ඒ මල් පොහොට්ටුවේ පිපීම සිදු කර දීමට මවුපියන්ට වත් ගුරුවරුන්ට වත් වෙන කිසිවෙකුට වත් නුපුළුවන. කළ හැකිව තිබෙන්නේ නොයෙකුත් උපද්‍රවයන් නිසා ඒ කැකුළ වියළී යන්ට වත් කැඩී බිඳී යන්ට වත් ඉඩ නො ලැබෙන සේ ආරක්ෂා කර දීම පමණ ය. පිපීම පුද්ගලයා තුළින් ම සිදු විය යුත්තකි.

මෙම සාකච්ඡාව අවසන් කිරීමට කලින් අපේ පැරණි පොතක දැක්වෙන එක්තරා පුවතක් ගැන සඳහන් කිරීම සුදුසු යයි සිතමි.

බුදුන්වන්සේ ද උන් වහන්සේගේ ඥාති සහෝදරයකු වූ ආනන්ද හාමුදුරුවන් වහන්සේ ද එක් දිනයක සවස් භාගයෙහි කථා සල්ලාපයක යෙදී සිටියහ. "ස්වාමීනි, උසස් ම ජීවිතයෙන් දෙකෙන් පංගුවක් කල්‍යාණ මිත්‍රයෙකු වීම යයි සිතමි"යි ආනන්ද හාමුදුරුවන් වහන්සේ කීවේ ලු. එවිට බුදුන්වහන්සේ මෙසේ කීවේ ය. "එසේ නො කියව ආනන්ද, එසේ නො කියව ආනන්ද, උසස් ම ජීවිතයෙන් දෙකෙන් පංගුවක් නො ව සම්පූර්ණයෙන් ම බ්‍රහ්ම චරියාව කල්‍යාණ මිත්‍රතාව වන්නේ ය."

බ්‍රහ්ම යන්නෙහි තේරුම ඉතා ම උසස් යන්න ය. චරියා යනු හැසිරීම ය. එහෙයින් බ්‍රහ්ම චරියා යනු ඉතාම උසස් හැසිරීම ය. බ්‍රහ්ම විහාර යනු ද මීට ම සමානාර්ථ වේ. විහාර යනු වාසය කිරීම ය, ජීවත් වීම ය. මෛත්‍රිය හෙවත් මිත්‍රතාව ද බොහෝ විට බ්‍රහ්ම විහාර යන නමින් ම හැඳින් වේ.

යහළුකම ඉතා උතුම් දෙයකි. එය ආත්මාර්ථයෙන් කිළිටි කළ යුතු නො වේ.

**සිතුවිලි - 4වන කාණ්ඩය**

ඉහත ඔබ කියවූ ලිපියේ මිත්‍රත්වය පිළිබඳ අපූරු විග්‍රහයක් දැක්වෙයි. ඒ, ඊ. ඩබ්ලිව්. අදිකාරම් කුඩා ළමයින්ට මිත්‍රත්වය පිළිබඳ සිය අදහස් ප්‍රකාශ කළ ආකාරය යි. කිසියම් කරුණක් පිළිබඳව ඉදිරිපත් කරනු ලබන සමස්ත පැහැදිලි අදහසක් දර්ශනයක් ලෙස හැඳින්විය හැකි ය. අදිකාරම් වැඩි වශයෙන් අවධානය යොමු කළේ ළමයින් හා තරුණ පරපුර යහමග යැවීමට ය. චින්තකයකු වශයෙන් ශ්‍රී ලංකා ජනතාවගේ චින්තනයෙහි වෙනසක් ඇති කිරීමේ අරමුණින් ඔහු නවීන විද්‍යා සඟරාව හා සිතුවිලි නම් පුස්තිකා මාලාව සම්පාදනය කළේ ය. පාරම්පරික විශ්වාස හා ඇදහිලිවලින් ඈත් වූ, ආචාර්ය අදිකාරම් පළ කළ ඇතැම් අදහස් තියුණු මත භේදයට හා විවේචනයට ද ලක්

විය. එතුමාට ජාති භේදයක්, ආගම් භේදයක් හෝ පන්ති භේදයක් නො වීය. මුළු මිනිස් වර්ගයා ම එක ම ජාතියක් ලෙස සැලකූ ඔහු වර්ගවාදී ගැටුම්වලින් තොර සාමකාමී ලොවක් ගොඩනැගීම සඳහා නිරතුරුව කැප වී කටයුතු කළේ ය. එම උදාර කැප වීම වෙනුවෙන් එතුමාට කරන ලද උපහාරයක් ලෙස 1980 දී එක්සත් ජාතීන්ගේ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාව විසින් පළමු වරට සාම ත්‍යාගය පිරිනමන ලදි. එයින් ලැබුණු රුපියල් දස දහසක් වටිනා චෙක්පත සාම කටයුතු සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානයට පරිත්‍යාග කළේ ය.

අදිකාරම්තුමාගේ අහිංසාවාදී ප්‍රතිපත්තිය රට ම දන්නා කරුණකි. පාසල් පරිපාලනයේ දී හා ශිෂ්‍ය විනය සංවර්ධනයේ දී ඔහු අනුගමනය කළ ප්‍රතිපත්ති ශිෂ්‍යයන් තුළ අහිංසාවාදී සිතුවිලි රෝපණය කිරීමට හේතු විය. “ඔවා දෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට” යන කියමන අකුරට ම අනුගමනය කළ එතුමා තම අවිහිංසාවාදී පිළිවෙත ක්‍රියාවෙන් ම සනාථ කළේ ය. සොබා දහමට පරිසරයට ඇලුම් කළ එතුමා තමා ද එහි කොටසක් ලෙස සැලකුවේ ය. අදිකාරම්තුමා විසින් ලියන ලද ලේඛනවලින් හා පවත්වන ලද දේශනවලින් ඔහුගේ අහිංසාවාදී, මානවහිතවාදී දැක්ම මනාව ප්‍රකට කෙරිණි.

## අරුත් පැහැදිලි කිරීම

| පාරිභාෂික වචන | එක් එක් විෂයට අදාළ සංකල්ප හඳුන්වන වචන |
|---|---|
| සමාන වයස්ක | සමාන වයසට අයත් |

## අවබෝධය

1. පාඩමේ ඇතුළත් පර්යේෂණ සඳහා යොදා ගෙන ඇත්තේ කවුරු ද?
2. කුඩා කාලයේ යහළුකම සීමා වන්නේ කුමන කාර්යයකට ද?
3. සැබෑ මිත්‍රත්වයේ ස්වභාවය කුමක් ද?
4. මෙහි මල් පොහොට්ටුවකට උපමා කර ඇත්තේ කුමක් ද?
5. පාඩමේ කියැවෙන ඉතා ම උසස් හැසිරීම කුමක් ද?

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන වචන සඳහා සමානාර්ථවත් පද පාඩමෙන් තෝරා ලියන්න.


   i. අවාසනාව
   ii. යහපත්
   iii. මිනිසා
   iv. චාරිත්‍ර
   v. පුෂ්ප

2. පහත දැක්වෙන වචනවලට විරුද්ධාර්ථවත් පද පාඩමෙන් තෝරා ලියන්න.

   i. යුදකාමී
   ii. වෛරය
   iii. අසමාන
   iv. භාග්‍යය
   v. ලොකු

## ප්‍රායෝගික අභ්‍යාස

1. “ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්ගේ ජාතික මෙහෙවර” යන මාතෘකාව යටතේ පාසල් බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.



24

# පොල් ලද සැටි

‘ප්‍රබන්ධය’ යනු ‘මනා කොට බඳින ලද්ද’ යන අදහස ඇතුළත් වචනයකි. කිසියම් තේමාවක් පදනම් කර ගෙන අනුපිළිවෙළින් කරුණු ගළපා රසවත් ලෙස ගොඩ නගන ලද රචනාවක් නිර්මාණාත්මක ප්‍රබන්ධයක් ලෙස හැඳින්විය හැකි ය. එය අර්ථවත් වීම ද අවශ්‍ය වේ.

සිංහල ප්‍රබන්ධ රචනය සඳහා මග පෙන්වන පොත් අතර කුමාරතුංග මුනිදාස (1887 - 1944) මහතාගේ **ප්‍රබන්ධෝපදේශය** හා **ප්‍රබන්ධ සංග්‍රහය** කෘති සුවිශේෂ වේ. මෙම පාඩමට ඇතුළත් වන්නේ **ප්‍රබන්ධ සංග්‍රහයෙන්** උපුටා ගත් කතාවකි.

සිංහල භාෂා හා සාහිත්‍ය ක්ෂේත්‍රයට විශාල මෙහෙවරක් කළ කුමාරතුංග මුනිදාස, ළමයින්ගේ භාෂා සාහිත්‍ය දැනුම වර්ධනය කිරීම සඳහා **කියවන නුවණ** නමින් පොත් පෙළක් ද සම්පාදනය කළේ ය. එතුමා ලියූ ළමා කවි ළමයින් අතර ජනප්‍රිය ය.

මෙම පාඩමේ ඇතුළත් කතාවත් එය රචනා කිරීමට පාදක වූ කතා සැකිල්ලත් පිළිබඳව අවධානය යොමු කරන්න. නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය සඳහා එය ප්‍රවේශයක් වනු නිසැක ය.

කියවන්නාට පහසුවෙන් අර්ථය වටහා ගත හැකි සහ කියවීමට ප්‍රිය උපදවන ආකාරයට නිරවුල් බස් වහරක් භාවිත කරමින් නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනා කිරීමට ඔබට ද හැකි ය.

පෙරැ ලක් දිවැ දකුණු දෙසැ මානා නම් පුරුෂයෙක් වී. හේ සවිමත් ය. තෙදවත් යැ, අවි සිප්හි කෙළ පැමිණියෙකි. ඔහු බෙහෙවින් සමත් වූයේ දඩයමට යි. ඔහු මෙන් සමත් වූ තවත් මිනිස්සු දෙ තිස් දෙනෙක් ඔහුට එකතු වූ හ. තුන් තිස් දෙන මැ කෙළි පිණිසැ ද අහර පිණිසැ ද ඇබෑසි පිණිසැ ද දවස් පතා දඩයම් කළෝ යැ.

වරක් මහ නියගෙක් පැමිණියේ යැ. දඩයම් කරන්නවුනට ඒ ඉතා හොඳ කලෙකි. වල් අසලැ වැව් ආදියෙහි දිය සිඳී-ගිය විටැ වන සත්තු පවසින් මහ දුක් විදිත්, පැන් සොයා ඒ ඒ අතැ යෙත්, ඇතැම් විටැ මහ දාවල්හි දු ගම්මානයට පවා පැමිණෙත්. ඒ නියං සමයෙහි දිනෙකැ මේ තුන් තිස් දෙන දඩයම් පිණිසැ ගියෝ යැ. රැක්මේ සිටැ, කැළෑ ගසා, සතුන් පස්සේ ඒ මේ අතැ දිවැ, ඔවුන්ගේ වෙහෙස ඉතා මහත් වියැ. හිරු රස් ගිනි මෙන් උණු යැ. එ කලැ ඇති වන පිපාසාව කෙබඳු ද යනු සිතා ගත හැකි යැ. දඩයම්කරුවෝ වන සතුන් සෙවිල්ල තිබියැ දී දිය සොයන්නට වූහ. එහෙත්, ඔවුන්ගේ ඇඟින් ගලන දිය විනා අන් දියෙක් නම් නො ලැබිණ.

පවස ඉතා මහත් වැ, ඒ සියලු දෙන මෙ ලොවැ ආසාව බුරුල් කරන්නට වන් කල්හි, ඔවුන් පෙරැ නුදුටු ගසෙක් නෙත් හමු වියැ. එහි උස සලකන කලැ කඳ සිහින් යැ. මුලැ සිටැ අග දක්වා මැ එහි වැඩි වෙනසෙක් නැති. මහත තුන් රියනක් පමණ වුව ද, දිග තිස් රියනක් පමණ වියැ. එහෙත් අතු බෙදීමෙක් නැති. ගස අගැ පමණක් පියා පත් වැනි කොළ රැසෙකි. මහ සැළි වැනි ගෙඩි කරටිය වටා පෙනිණ. 'මෙ බඳු මහත් ගෙඩි ඇතුළැ නම් පැන් පොදක් වියැ යුතු මැ යැ' යනු ඔවුනට වූ හැඟීම යි.

ඒ, සිත-සිතා ඉන්නට තැනෙක් හෝ වේලාවෙක් හෝ නො වේ. එකෙක් උත්සාහයෙන් ගසට ඇදුණේ යැ. පයට හෝ අතට හෝ ගැන්මක් නැති කඳ දිගේ ඉහළට ඇදීම පහසු නො වේ. පවසට පින් සිදු වන්නට, ඒ අපහසු කම් දැන් නො පෙනේ. ගසට ඇදුණේ, එහි කඳ කෙළවරැ වූ මහ කොළ නටුවක් අල්ලා-ගෙනැ, ඉඟෙහි වූ සිරිය ඇදැ, ගෙඩියෙකැ නටුව කපන්නට වියැ. රිළා අතක් පමණ මහත් වූ ඒ නටුව කැපීමට මිනිසාගේ සකල උත්සාහය යෙදිණ. තැන අවදානම් යැ, කටයුත්ත නුපුරුදු යැ; යෙදියැ හැක්කේ එක් අත යැ. සිරියැ මුවහත තියුණු නො වී නම් කැපීම උගහට යැ. නටුයෙන් අඩක් පමණ කැපුණු පසු, ඉවැසිලි මඳ වූ මිනිසා, අතට වැර දී සිරිය තදින් ඇද්දේ යැ. ගෙඩිය නටුයෙන් වෙන් වියැ. ගසැ මුලැ වූවෝ වහා ඉවතට පැනැ-ගත් හ. මහ හඬෙක් නැඟිණ. තිස් කළයක් ගන්නා සැළියක් පමණ වූ ගෙඩිය බිමැ පෙරැළෙන්නට වියැ.

දඩයම්කරුවෝ ගෙඩිය පිරික්සූහ. නටුව වටා මහ තැරියෙකි. ඒ, ගෙඩියට තදින් ඇලී සිටියේ යැ. එ තැන් සිටැ ගෙඩිය මහත් වැ-ගොස්, යළි දූ සිහින් වැ උලෙකින් කෙළවර වූයේ යැ. තැරියේ සිටැ එ තැනට ගෙඩිය තුන් අසකට බෙදෙන වෙහෙලි තුනෙක් මතු වැ සිටියේ යැ. එකෙක් මහ පොරොවක් ගෙනැ තැරිය දෙසින් කපන්නට වියැ. සිතූ පමණට ඒ අපහසු කාර්යයෙක් නො වී යැ. පිටත නිල් වුව ද, ඇතුළත සුදු යැ. හත් අට පහරකට පසු එක් පොරෝ පහරක් වදින්නා මැ පොරෝ-දරු ඇදැ-හෙළන තරම් වේගවත් දිය පහරෙක් ගෙඩියෙන් නික්මිණ. සියලු දෙන උමතු වූ හ. එහෙත් පුදුමය පසෙකැ තිබියැ දී ඔවුන් කෙළේ ඔවුනොවුන් පරයා පවස සන්සිඳුවා-ගැනීම යි. ඒ මිහිරි පැනෙකි. එකා දෙ තුන් වරැ මුව ළං කෙළේ යැ.

තුන් තිස් දෙනාගේ මැ පවස සන්සිඳිණ. ගෙඩිය ඇතුළේ පැන් තව ද බොහෝ යැ. ඔහු, සිදුර මහත් කොටැ එබී බැලූ හ. ආශ්චර්යයෙකි! ඔවුන්ගේ පවස පමණක් නො වැ සා ගිනි ද නිවන්නට ගෙඩිය පොහොසත් සේ යැ. ඇතුළතැ සුදු මදයෙකි. දෙඩීමට කල් නො යවා, ඔහු ඉතිරි පැනින් එකකු නහවා පිරිසිදු කොටැ, වෑයක් අතට දී, ඔහු ගෙඩිය තුළට යැවූ හ. හේ මද සැසැ සැසැ එළියට දෙයි. එළියෙහි වූවෝ එය ඇදැ ඇදැ කති. සියල්ලන්ගේ සා ගිනි කෙළවර වුව ද මදයේ කෙළවරක් නුදුටු වෑ-දරුවා ගෙඩියෙන් පිටතට පිනී යැ. සියල්ලෝ ඒ පුදුම ගෙඩිය ගැනැ මැ දොඩමින් ගම් බලා ගිය හ.

මෑත කාලයෙකැ දී ඔහු යළි දූ ඒ ගස බලන්නට ගිය හ. ගස මැනැවින් පිරික්සා බලා, පැසුණු නො පැසුණු ගෙඩි කිහිපයක් ද නෙළා-ගෙනැ, ඔහු පෙරළා ගමට අවුත්, පැසුණු ගෙඩියක් පැළ වෙන්නට ලූ හ. සුදුසු කල්හි එයින් පැළයෙක් නැඟී වැඩෙන්නට වියැ. පස් වසකට පමණ පසු එහි ගෙඩි ද හට-ගත්තේ යැ. එහෙත්, අභාග්‍යයෙකි. මිනිසුන්ගේ ඇස් වහ කට වහ වැදීමෙන් දෝ, වනයෙහි දී එ තරම් මහත් වූ ගෙඩිය, ගමෙහි දී මෙ තරම් කුඩා වියැ. කෙසේ වුව ද පොල් ගමට පැමිණියේ යැ.

පහත දැක්වෙන්නේ **ප්‍රබන්ධෝපදේශය** පොතෙන් උපුටා ගන්නා ලද 'පොල් ලද සැටි' කතාවේ සැකිල්ල යි.

1. මානා නම් දඩ නායකයා - ඔහුගේ පිරිස - දෙ තිස් දෙනා - දිනපතා දඩයම්.
2. නියං සමයේ දිනෙකැ මහ වනයේ දඩයම - මහ දාවල් පිපාසාව දිය සෙවිල්ල.
3. වන මැදැ ගස - සිහින් දිග කඳ - පියා පත් වැනි කොළ - මහත් සැළි වැනි ගෙඩි.
4. ගසට ඇදීම - ගෙඩියෙකැ නටුව මහත් උත්සාහයෙන් කැපීම - ගෙඩිය මහ හඬින් බිම හීම.
5. එකකු ගෙඩියේ මුහුණ පොරොවෙකින් බොහෝ වේලා කපා සිදුරු කිරීම - උල්පත.
6 තුන් තිස් දෙනාට මැ පැන් - ඉතිරි පැනින් එකකු නාවා පිරිසිදු කිරීම - වැයක් දී ඔහු ගෙඩිය තුළට යැවීම - ඔහු මද සැසැ පිටතට දීම - සියල්ලන් ගේ බඩ ගිනි නිවීම.
7. ඒ පිරිස පසු කාලයෙකැ දී ඒ ගසින් ගෙඩියක් ගෙනැ ගොස් ගමේ වැවීම - කැලෑවේ දී එ තරම් ලොකු ගෙඩි ගමේ දී කුඩා වීම.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| සවිමත් | ශක්තිමත් |
| තෙදවත් | තේජවන්ත/ප්‍රතාපවත්/ආනුභාව සම්පන්න |
| අවිසිප් | ආයුධ ශිල්පය/අවි ආයුධවලින් සටන් කිරීමේ ශිල්පය |
| පවසින් | පිපාසයෙන් |
| කැලෑ ගසා | වන සතුන් කොටු කර අල්ලා ගැනීම |
| නියං සමය | ඉඩෝර කාලය/වැසි නො වසින කාලය |
| බුරුල් කරන්නට | අත හරින්නට/ලිහිල් කරන්නට |
| සැළි | ලොකු මුට්ටියක් |
| කරටිය | ගහේ ඉහළ කොටස |
| ගැන්මක් | වාරුවක්/අල්ලා ගැනීමට හෝ පය තබා ගැනීමට හෝ තැනක් |
| සිරිය | කුඩා කඩුවක් වැනි ‘සිරිය’ නම් වූ ආයුධය, |
| තැරිය | නටුව වටා ඇති ගෙඩියට සවි වූ පොත්තක් වැනි කොටස |
| තුන් අසකට | තුන් පැත්තකට |
| වෙහෙලි | නාරටි |
| පොරෝ දරු | පොරොව දරන්නා |
| උමතු | පියවි සිහිය නොමැති |
| පරයා | පරාද කරමින්/අබිබවමින් |
| මුව | කට |
| ආශ්චර්යයකි | පුදුමයකි |
| සාගිනි | බඩගිනි |
| සැස සැස | රහිමින්/කප කපා |
| වෑ දරුවා | වෑය/රහින ආයුධය රැගත් තැනැත්තා |
| කටවහ | කට වචනවල ඇතැයි විශ්වාස කරන විනාශකාරි බව |

## අවබෝධය

1. මානා හා එක් වූ මිනිසුන් සංඛ්‍යාව කොපමණ ද?
2. ඔවුන් දඩයම් කළේ කුමක් සඳහා ද?
3. දඩයම්කරුවන්ට නියඟය වඩාත් වාසිදායක වන්නේ ඇයි?
4. ඔවුන් දුටු ගසෙහි ස්වභාවය විස්තර කරන්න.
5. මේ අගනා ගෙඩි වර්ගයේ නම කුමක් ද?

## රසවත් කතා ගොතමු

ඉවුම් පිහුම් කටයුතුවලදී නැතිව ම බැරි 'පොල්' අපට ලැබුණේ කෙසේ දැ'යි 'පොල් ලද සැටි' කතාවෙන් ඔබ ඉගෙන ගන්නට ඇත. ඒ කතාව ප්‍රබන්ධ කරනු ලැබුවේ කුමාරතුංග මුනිදාස සූරීන් විසිනි.

කතාවක් නිර්මාණය කරන්නට සූදානම් වන ඔබ බොහෝ දේ උගත යුතු වෙයි.

මුලින් ම භාෂාව යොදා ගන්නා ආකාරය හඳුනා ගත යුතු ය. තමන් භාවිත කරන වචන මගින් රස මවන්නටත්, කියවන්නාට ඒ පිළිබඳව දනවන්නටත් හැකි වෙයි. අපි උදාහරණයක් ගෙන බලමු.

දිවා ආහාරය සඳහා කෑම මේසය වෙත පැමිණි මා දෙස පූසා බලා සිටියි.

කෑම මේසයේ හැඳි ගැටෙන හඬ ඇසුණු සැණින් පූසා ද මා අසල ය. ඌ මා දෙස බලා සිටියේ "මටත් බඩගිනියි" කියන්නාක් මෙනි.

මේ පාඨ දෙකෙන් ම කියැවෙන්නේ එක ම දෙයක් වූවත් දෙවැනි පාඨයෙන් මේ ප්‍රකාශය කරන්නාගේ හිතේ පවතින සත්ත්ව කරුණාවත් ඉඟි කෙරෙයි. අපට ද එය හැඟෙන්නට, දැනෙන්නට පටන් ගනී. වචනවල තිබෙන බලය එයයි.

ඔබ කතාවක් නිර්මාණය කරද්දී හැඟීම් දැනෙන ලෙස වචන හැසිරවිය යුතු වන්නේ, එසේ නොමැති වූ විට ඒ නිර්මාණය රසවත් නො වන බැවිනි. නිතර නිතර පොත පත කියැවීමෙන් එවැනි රසවත් යෙදුම් උගත හැකි ය. එමෙන් ම කවියක් හෝ කතාවක් හෝ නිර්මාණය කරන්නට විවිධ වූ අත්දැකීම් තිබිය යුතු යි. අත්දැකීම් ලබා ගන්නට අප පරිසරය නිරීක්ෂණය කිරීම ඉතා වැදගත් වනු ඇත.

සඳ පහන, හිරු උදාව, හිරු බැසීම, කඳුකරය, වලාකුළු, හඳ පායා ඇති රැය, මුහුදු වෙරළ, වෙල් යාය, පොද වැස්ස, කුණාටුව, මල් පිරුණු ගස, බියකරු වනය පමණක් නොව කුඹියා, මී මැස්සා, පළඟැටියා, වේයා, සමනලයා වැනි සතුන් ගැන ද පැදුරු විවීම, දැල් ඇදීම, ලී ඉරීම, වළං තැනීම ගැන ද හේන් කෙටීම, පැල් රැකීම, ගොයම් කැපීම වැනි දේ ගැන ද අප විමසිල්ලෙන් සිටිය යුතු ය.

ඒ ඒ තැන්වල ස්වාභාවික සුන්දරත්වය, ඒ ඒ සතුන්ගේ ක්‍රියාකාරකම්, ඒ ඒ අයගේ දුක, සතුට වැනි හැඟීම් ගැන අවබෝධ කර ගත යුතු ය. එවිට ඔබටත් බොහෝ දෑ ලිවිය හැකි වනු ඇත.

අප ඉගෙන ගත් යුගල පද රූඪී, ප්‍රස්තාව පිරුළු, ආදි සාම්ප්‍රදායික යෙදුම් මෙන් ම උපමා හා රූපක ආදි අලංකාරවත් යෙදුම් ද නිර්මාණයක් රසවත් කිරීම සඳහා යොදා ගත හැකි ය. මේ බව ලිවීමෙන් ම අවබෝධ කර ගත යුතු යි.

කුමාරතුංග මුනිදාස මහතාගේ **කියවන නුවණ** පොතෙන් උපුටා ගත් තවත් කොටසක් කියවමු.

> “මුගටි දෙදෙන දෙ පසින් නයාට ළං වන්නට බලති. එකෙක් සුදුසු පමණට ළං වන්නට බලයි. නා පෙණය විදුලිය වෙසින් එ දෙසට වදී. නා මස් කොතරම් රසවත් වුව ද ඒ පහරෙහි මරුවා සැඟැවී සිටුනා බව මැනවින් දන්නා මුගටියා පස්සට පනී. ඒ අවසරයෙන් වැඩ ගන්නට සිතා අනෙක් මුගටියා බලයි ළං වන්නට. එහෙත් නයා යුදට බටුයේ ඒ බව නො දැන නො වේ. එහෙයින් අර පසට නැමුණු නා පෙණය, සිතන්නට ද පෙරැ මේ පසට පහර දෙයි. මේ මුගටියා ද පස්සට පිනීමෙන් මැ මරුවාගෙන් ගැලැවේ. දැන් මුගටි දෙදෙන දෙපසින් මඳක් ඈත්ව සිටිති.”

මේ කතාව කියවන විට අප ඉදිරියේ මැවෙන්නට පටන් ගන්නා නයි-මුගටි පොරය අපූරු ය. එපමණක් නො ව මෙහි අවසානය කුමක් දැයි දැන ගැනීමේ ආසාවක් ද ඇති වෙයි. ඒ නිසා ම කතාව කියවා හමාර කරන තුරු ඉවසිල්ලක් ද නැත. අගනා නිර්මාණයක් එක් වරක් කියවා පසෙකින් තැබීමට සිත් නො දෙයි. නැවත නැවත කියවීමට අප පොලඹවන්නේ එහි යෙදී ඇති රසවත් භාෂාව යි. ඇසූ දුටු දෙයක් රසවත්ව කියන්නට, ලියන්නට භාෂාවේ වචන බොහෝමයක් අප දැන සිටිය යුතු යි. වචන රසවත්ව යොදා ගෙන අපිත් පුංචි පුංචි කතා නිර්මාණය කරන්නට උත්සාහ කරමු.

## ලිඛිත අභ්‍යාස

1. සතියකට එක් කතාවක් කියවා, එහි කතුවරයාගේ නම, කතාවේ කියැවෙන සිදුවීම, ඔබ සිත් ගත් අවස්ථා ඇතුළත් කරමින් විස්තරයක් ලියා යහළුවන් අතර හුවමාරු කර ගන්න.

2. පහත සඳහන් කතා සැකිලි ඇසුරෙන් රසවත් කතා නිර්මාණය කරන්න.

   i.
   - විශාල කළුගල් ගොඩක් මිදුලේ පසෙකින් පෙනෙන්නට ඇත.
   - ඒ අසලින් නයෙක් ඇදී යයි.
   - මුගටියා කුරුමානම් අල්ලමින් නයා වෙත පනී.
   - නයා ජය ලබන්නේ අසීරුවෙනි.
   - මුගටියා කෑ ගසන හඬක් ඇසෙයි.

   ii.
   - සුන්දර දිය ඇල්ලක් කඩා හැලෙයි.
   - කෙළිකවට සිනා හඬ අවට පැතිරෙයි.
   - එක වර ම ළමයකු කෑ ගසන හඬක් ඇසෙයි.
   - පිරිස කලබලයට පත් වී එදෙසට දුවති.
   - නැවත සිනා හඬ මතු වෙයි.

   iii.
   - නිවස අසල උසට වැඩුණු බට පඳුරකි.
   - ලේන් අම්මා සහ තාත්තා හඬ නගමින් ඒ මේ අත දුව පනිති.
   - කූඩුව බිම වැටී ඇත.
   - ඒ දෙසට දිව එන මව සහ පුතා හඬක් නගති.
   - කපුටා කාක් කාක් හඬින් නද දී ඉවතට පියඹා යන්නේ අසතුටෙනි.

3. ඔබ දන්නා ප්‍රස්තාව පිරුළකට අදාළව කතාවක් නිර්මාණය කරන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. රසවත් ළමා කතා පොත් කියවන්න.
2. වැඩිහිටියන්ගෙන් රසවත් කතා අසා දැන ගන්න.
3. නිවසේ කුඩා පුස්තකාලයක් ආරම්භ කරන්න.

සුරක්ෂා
சுரக்ஷா
Suraksha

# සදා සුරකිමු - දැයේ දරුවන්

## தேசத்தின் பிள்ளைகளை - என்றென்றும் காத்திடுவோம்



අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ශ්‍රී ලාංකේය පාසල් දූ පුතුන් වෙනුවෙන් නොමිලේ ලබාදෙන රක්ෂණාවරණය දැන් වැඩි ප්‍රතිලාභ සමඟින් ඉදිරියට ම

- රජයේ රෝහලක ප්‍රතිකාර සඳහා දිනකට රු. 3,000ක් ඇතුළුව රෝහල්ගතවීමක දී සිසුවෙකුට රු.200,000ක ආවරණයක්.
- බාහිර රෝගියෙකු ලෙස ප්‍රතිකාර ලබා ගැනීමේ දී සිසුවෙකු සඳහා රු. 20,000ක්.
- දෙමාපියන්ගේ/භාරකරුගේ වියෝවක දී රුපියල් 200,000ක ආවරණයක් සහ සිසු වියෝවක දී රු. 150,000ක්.
- අසාධ්‍ය හෝ දිගුකාලීන රෝගාබාධ සඳහා වන ආවරණය රුපියල් 200,000ක් හෝ ඊට වැඩි (සමස්ත අවශ්‍යතාව මත)

වැඩි විස්තර සඳහා

අධ්‍යාපන අමාත්‍යාංශය - 0113641555

கல்வி அமைச்சின் மூலம் இலங்கையில் பாடசாலை மாணவர் களுக்காக வழங்கும் இலவசக் காப்புறுதித் திட்டம் இப்பொழுது மேலும் அதிக பிரதிலாபங்களுடன் தொடர்கிறது.

- அரச மருத்துவமனை ஒன்றில் சிகிச்சைக்காக நாளொன்றிற்கு ரூ. 3,000 உள்ளடங்கலாக, மருத்துவமனையில் தங்கி சிகிச்சை பெறுமிடத்து ஒரு மாணவருக்கு தலா ரூ.200,000 காப்புறுதி.
- வெளி நோயாளராக சிகிச்சை பெறும் ஒரு மாணவருக்கான காப்புறுதி ரூ.20,000.
- பெற்றோர்/பாதுகாவலர் மரணத்தின்போது ரூ.200,000 காப்புறுதி. மாணவரது மரணத்தின்போது ரூ.150,000 காப்புறுதித் தொகையாகும்.
- பாரதூரமான அல்லது நீண்டகால நோய்களுக்கான காப்புறுதி ரூ.200,000 அல்லது அதற்கு மேல் (முழுமை யான தேவையைப் பொறுத்தது.)

**மேலதிய தகவல்களுக்கு**

கல்வி அமைச்சு - 0113641555

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education